බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා: 5



විනයපිටකයෙහි

සතරවන ග්‍රන්ථය

චුල්ලවග්ගපාලි

[I කාණ්ඩය]

ලංකා බෞද්ධ මණ්ඩලයේ ආරාධනයෙන්

හාල්දඹුවන ශ්‍රී ධර්මරක්ෂිතාභිධාන

සබරගමුපළාතේ ප්‍රධාන සංඝනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

විසින්

කරනලද සිංහල පරිවර්තනය

ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

විසින්

පාඨශොධන පූර්වක වැ සංස්කරණය කරන ලදී.

ශ්‍රී ලංකා ජනරජය විසින් ප්‍රකාශිත යි.

බු: ව: 2520

ක්‍රි: ව: 1977

Buddha Jayanti Tripitaka Series 5

THE FOURTH BOOK

OF

THE VINAYA PITAKA

CULLA-VAGGA-PALI

(PART I)

WITH THE SINHALESE TRANSLATION

BY

THE VENERABLE

HALDANDUVANA DHAMMARAKKHITA

The

Chief Nayaka Thero

of

Sabaragamuva Province

PUBLISH UNDER THE PATRONAGE

OF

THE REPUBLIC OF SRI LANKA

B.E. 2520

C.E. 1977

‘‘තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො.’’

‘‘මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරන ලද ධර්මය හා විනය විවෘත වූයේ බබළයි. වැසුණේ නො ම බබළයි.’’

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත – හරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

විනයපිටකෙ

චුල්ලවග්ග පාලි

පඨමො භාගො

විනයපිටකයෙහි

චුළුවග්ග

පළමුවැනි කාණ්ඩය

ප ටු න්

සංස්කාරක නිවේදනය

ත්‍රිපිටක පර්‍යාප්තියෙහි විනය පිටකයට අයත් ග්‍රන්‍ථ පඤ්චකයෙන් සතර වැනි ග්‍රන්‍ථය වූයේ චුල්ලවග්ගපාළි යයි. එය බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්‍ථමාලායෙහි පස් වැනි ග්‍රන්‍ථය ලෙස සම්මත වැ ඇත. තෙවැනි ග්‍රන්‍ථය වූ මහාවග්ගපාළිය ප්‍රථම - ද්විතීය භාග වශයෙන් දෙකක් ලෙස මුද්‍රණය කරවන්නට සිදුවූ හෙයිනි.

දෙදහස් පන්සියයේ බුද්ධ ජයන්ති අනුස්මරණ උත්සවය නිමිත්ත කොට ගෙන ශ්‍රී ලඞ්කා බෞද්ධ මණ්ඩලය මගින් ආරම්භ කළ ත්‍රිපිටක ධර්මය සිංහල භාෂායෙන් තබාලීමෙහි ලා විනය පිටකයෙහි චුල්ලවග්ගපාළි සිංහල පරිවර්තනයට ආරාධනා ලැබුවාහු පැල්මඩුල්ලේ පුරාණ රාජමහා විහාරාධිපති හාල්දඹුවන ශාස්ත්‍රසූරි ශ්‍රී ධර්මරක්ෂිතාභිධාන සපරගමු දිශා-යෙහි ප්‍රධාන සංඝනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ යැ. උන්වහන්සේ විසින් යථා කාලයෙහි එම සිංහල පරිවර්තනය නිමහම් කොට ත්‍රිපිටක මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද්දේ ය. ත්‍රිපිටක මණ්ඩලයේ සම්මතය පරිදි කෙසෙල්වතුගොඩ රතනජෝති නායක ස්ථවිරපාදයන් වහන්සේ යැ, හාල්දඹුවන ධම්මරක්ඛිත නායක ස්ථවිරපාදයන් වහන්සේ යැ, කඩවැද්දුව සිරිනිවාස නායක ස්ථවිරපාදයන් වහන්සේ යැ යන විනය පිටක ශෝධක මණ්ඩලයේ මහ තෙරවරුන් විසින් පාඨශෝධන පූර්වක වැ සිංහල පරිවර්තනය ද සංස්කරණය කරන ලද්දේ විය.

සංස්කරණය කරන ලද සිංහල පරිවර්තනය සහිත චුල්ලවග්ගපාළිය 1962 දී ප්‍රමණ මුද්‍රණය සඳහා එක්තරා මුද්‍රණාලයකට භාර දෙන ලදුව පිටු 16 කින් යුත් ප්‍රස්තාර දෙවිස්සක් පමණ මුද්‍රණය වූ පසු කවර හේතු-වකින් හෝ මුද්‍රණය නැවතිණ. ලියා ශුද්ධ කොට දෙන ලද අත් පිට-පත් ද ලබාගත නො හැකි විය. එහෙයින් සමථක්ඛන්ධකයෙහි පටන් නැවත පරිවර්තන කිරීමේ භාරය ද ත්‍රිපිටක මණ්ඩලය කෙරෙහි පැවරිණ, ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයේ අනුශාසක, අග්ගමහාපණ්ඩිත බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහානායක ස්වාමීන්ද්‍රයෝ වැනසී ගිය කොටස නැවත පරිවර්තන කොට මුද්‍රණයට සකස් කළහ. තවද මුද්‍රණ අවස්ථායෙහි දු පැන නැඟුණු බාධක රැසෙකි. එ ද, සහකාර අධ්‍යක්ෂ තැන්පත් සෝමපාල ජයවර්ධන මහතාණන් ගේ කාලානුරූප ක්‍රියා සංවිධානය ද, දෙහිවල

'තිසර' මුද්‍රණාලයාධිකාරී ඇස්. ඩී. සපරමාදු මහතාණන්ගේ සහයෝගය ද නිසා චූලවංශපාළි – සමථක්ඛන්ධකය අවසාන කොට ඇති ඛන්ධක සතර එහි පළමු වන කාණ්ඩය ලෙස පළ කරවන්නට හැකි විය.

වර්තමාන ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයේ ස්ථවිරවරුන් විසින් නොපමාව මෙහි ශොධ්‍යපත්‍ර, සංඥා සූචි, ශබ්ද සූචි ආදිය සකස් කිරීමෙන් මේ ග්‍රන්ථ භාගය ශාසනාර්ථීන් හමුයෙහි තබන්නට හැකි වූ බව පවසන අතර මෙම අධිකාරයෙහි නියුක්ත වූ හැම දෙන ඓහික පාරත්‍රික සුබ-භාගී වෙත්වා'යි ආශංසනය කරම්හ.

මේ වගට,

ලබුගම ලඞ්කානන්ද ස්ථවිර
ප්‍රධාන සම්පාදක

1977, ජුලි 10
ත්‍රිපිටක කාර්යාලය,
මහානායක වාරිකාරාමය,
115, විජේරාම මාවත,
කොළඹ 7.

සංඥපනය

විනය:

විභඞ්ග ඛන්ධක පරිවාර විසින් ත්‍රිවිධ වූ විනය පාළිය මහාකාශ්‍යප ස්ථවිරාදි ප්‍රථම මහාසඞ්ගීතිකාරක මහරහතුන් විසින් 'පාරාජිකපාළි පාචිත්තියපාළි මහාවග්ගපාළි චුල්ලවග්ගපාළි පරිවාරපාළි' යයි ග්‍රන්ථපඤ්චක යකට නඟා සඞ්ගායනා කරන ලද්දේ ය. එහි දූ මහාවිභඞ්ග හෙවත් භික්ඛුවිභඞ්ග හා භික්ඛුනීවිභඞ්ග නම් වූ උභය විභඞ්ගය පරිජි, පචිති දෙපොත් හි බැසැගෙන සිටී, මහාවිභඞ්ගයෙහි 'පාරාජික සඞ්ඝාදිසෙස අනියත නිස්සග්ගිය' යන එකුන්පනස් ශික්ෂාපදයන් පිළිබඳ 'නිදාන පුග්ගල වත්ථු පඤ්ඤත්ති පදභාජන විනීතවත්ථු' ආදිය ඇතුළත් විනයප්‍රදෙශය පාරාජික කාණ්ඩය මුල් කොට ඇති හෙයින් 'පාරාජික පාළි'යයි ද, පාචිත්තියකාණ්ඩය පටන් භික්ඛුවිභඞ්ගය හා භික්ඛුනීවිභඞ්ගය ද ඇතුළත් කොටස පාචිත්තියකාණ්ඩය ආදි කොට ඇති හෙයින් 'පාචිත්තියපාළි' යයි ද ග්‍රන්ථ දෙකක් වශයෙන් බෙදූ ඇත. ආභිසමාචාරික ශීලය ප්‍රකාශ කරන අනුඥාත ශික්ෂාපදයෙන් යුත් පාළි' ප්‍රදෙශය 'ඛන්ධක' නම් වෙයි. එ ද බොධිකථායෙන් ආරම්භ වූ මහාක්ඛන්ධකය ආදි කොට ඇති දෙවිසි ඛන්ධකයෙකින් හෙබියේය. එහි කොසම්බියක්ඛන්ධකය අවසන් කොට ඇති ඛන්ධක දසය 'මහාවග්ගපාළි' යයි ද, කම්මක්ඛන්ධකයෙහි පටන් සත්තසතිකක්ඛන්ධකය අවසන් කොට ඇති දෙළොස් ඛන්ධකය 'චුල්ලවග්ග පාළි' යයි ද ග්‍රන්ථ දෙකක් වශයෙන් බෙදූ ඇත. 'පරිවාරපාළිය' වූ කලී මහාවිභඞ්ගයෙහි භික්ෂූන් සඳහා පනවන ලද දෙසිය විස්සක් ශික්ෂාපද යැ, භික්ඛුනීවිභඞ්ගයෙහි තුන්සිය සතරක් ශික්ෂාපද යැ යන උද්දෙසපරියාපන්න වූ පන්සිය සූවිසි ශික්ෂාපද ගෙන කත්ථපඤ්ඤත්තිවාරය ආදි කොට ඇති ආපත්තිවාර අටෙක, එබඳු වූ මැ පච්චයවාර අටෙකැයි මහාවාර සොළොස-කින් ද යළි සමුට්ඨාන සමථභෙද දැක්වීමෙන් ද උභතොවිභඞ්ගය පරිවෘත වැ ඇත. ඛන්ධක පුච්ඡායෙහි පටන් ශෙෂය දෙවිසි ඛන්ධකයෙහි ආ විනය පරිවාර යයි. මෙසෙයින් බුදුරදුන්ගේ ආඥාදෙසනා සඞ්ඛ්‍යාත විනය පිටකයට කරනලද මහාප්‍රාකාරය පරිවාර දෙශනාව යි. උභතො විභඞ්ගයෙහි ප්‍රඥප්ත ශික්ෂාපද සියල්ල ද සත්තඅධිකරණ සමථය ද සඞ්ග්‍රහ කොට භික්ඛුපාති-මොක්ඛ භික්ඛුනීපාතිමොක්ඛ වශයෙන් දෙපරිදිව සිටි ග්‍රන්ථය 'පාතිමොක්ඛ' නම් විය. උභයමාතිකා නමුදු මේ මැ යි.

චුල්ලවග්ගපාළි:

මෙහි ප්‍රස්තුත වූ 'චුල්ලවග්ගපාළිය' වනාහි කම්මක්ඛන්ධකය පටන් කොට සත්තසතිකක්ඛන්ධකය තෙක් දෙළොස් ඛන්ධකයෙන් සඞ්ගෘහීත වූ ග්‍රන්ථ ප්‍රදෙශය යි. එහි පළමුවන කම්මක්ඛන්ධකයෙහි: 1. සැවැත්නුවර

විසූ සවග මහණුන් කෙරෙහි වූ පණ්ඩුක ලොහිතක මහණුන් සඳහා භණ්ඩනකාරක කලහකාරකාදි හෙතුයෙන් පනවනලද තජ්ජනීය කර්මය ද, 2. ආපත්තිබහුල වූ ගෘහීන් හා අනනුලොමික සංසර්ග ඇති සෙය්‍යසක මහණහුට පනවනලද නිසසය කර්මය ද 3. සවග මහණුන් අතුරෙන් කීටාගිරියෙහි විසූ අසසජි පුනබ්බසුක මහණුන් සඳහා කුල දූෂණහෙතුයෙන් පනවන ලද පබ්බාජනීය කර්මය ද, 4. මච්ඡිකාසණ්ඩයෙහි විසූ සුධම්ම තෙරුන් අරහයා චිත්තගැහැවියනට අවමන් කිරීම් හෙතුයෙන් පනවනලද පටිසාරණීය කර්මය ද, 5. කොසඹෑ නුවර දී ඡන්න තෙරුන් සඳහා ඇවැතට පැමිණ ඇවැත් නො දැකීම හෙතුයෙන් පනවන ලද ඇවැත් නොදැක්මෙහි උක්ඛෙපනීය කර්මය ද, 6. ඡන්න තෙරුන් සඳහා මැ පනවන ලද ඇවතට පිළියම් නොකිරීමෙහි උක්ඛෙපනීය කර්මය ද, 7. අරිට්ඨ මහණහු සඳහා පනවන ලද පාපදෘෂ්ටි නො හැරීමෙහි උක්ඛෙපනීය කර්මය ද යන සත් වැදෑරුම් කර්ම විභාග කරන ලද්දේ යැ.

දෙවැනි පාරිවාසිකක්ඛන්ධකයෙහි පාරිවාසිකවත්ත, පරිවාස සමාදනවිධි, මූලායපටිකස්සන. මානත්ත, අබ්භාන යන විනය කර්මයන් පිළිබඳ වත් හා සමාදනවිධි ආදිය වදරන ලද්දේය.

තුන්වැනි සමුච්චයක්ඛන්ධකයෙහි පටිච්ඡන්නාපටිච්ඡන්න සංඝාදිසෙසාපත්තීන් පිළිබඳ පරිවාසදන, මානත්තදන, අබ්භාන යන විනය කර්මයන් පිළිබඳ සියලු විභාග වදරන ලද්දේ වෙයි.

සතරවැනි සමථක්ඛන්ධකයෙහි විවාදධිකරණ, අනුවාදධි කරණ, ආපත්තාධිකරණ කිච්චාධිකරණ, යන චතුර්විධ අධිකරණ හා ඒ ඒ අධිකරණය සම්මුඛාවිනය සතිවිනය, අමූළ්හවිනය, පටිඤ්ඤාතකරණ, යෙභුය්‍යසිකා, තස්සපාපියසිකා, තිණවත්ථාරක, යන සත් වැදෑරුම් සමථයෙන් සංහිඳුවාලන අයුරු වදරනලද්දේ වෙයි.

චුල්ලවග්ගපාළියෙහි මේ පළමුවන කාණ්ඩයෙහි කම්මක්ඛන්ධකාදි සතර ඛන්ධකය පමණක් ඇතුළත් කළම්හ. ඛුද්දකවත්ථු ආදි ඛන්ධකයන් පිළිබඳ හැඳින්වීම දෙවන කාණ්ඩයෙහි ලා පවසම්හ. භික්ෂූන් වහන්සේගේ කාය වාක් සංවරය සඳහා ද ආපත්ති ප්‍රතිකර්මාදියෙන් ශීලපාරිශුද්ධිය සඳහා ද චුල්ලවග්ගපාළියෙහි වදළ ඒ ඒ විනය ප්‍රදෙශයන් මැනැවින් දැන ඉගෙන ස්වාර්ථ පරාර්ථ සාධනයෙහි උත්සුක වෙත්වා'යි ආශංසනය කරම්හ.

මෙවගට,

ලබුගම ලඞ්කානන්ද ස්ථවිර,

ත්‍රිපිටක මණ්ඩලයේ ප්‍රධාන සම්පාදක.

1977. 7. 10 මොල්ලිගොඩ
ප්‍රවචනොදය පිරිවෙන.

පාලි හෝඩිය

THE PALI ALPHABET

IN SINHALA CHARACTERS

VOWELS

අ a   ආ ā   ඉ i   ඊ ī   උ u   ඌ ū   එ e   ඔ o

CONSONANTS

ක ka	ඛ kha	ග ga	ඝ gha	ඞ ṅa
ච ca	ඡ cha	ජ ja	ඣ jha	ඤ ña
ට ṭa	ඨ ṭha	ඩ ḍa	ඪ ḍha	ණ ṇa
ත ta	ථ tha	ද da	ධ dha	න na
ප pa	ඵ pha	බ ba	භ bha	ම ma

ය ya   ර ra   ල la   ව va   ස sa   හ ha   ළ ḷa   ං ṃ

ක ka	කා kā	කි ki	කී kī	කු ku	කූ kū	කෙ ke	කො ko
ඛ kha	ඛා khā	ඛි khi	ඛී khī	ඛු khu	ඛූ khū	ඛෙ khe	ඛො kho
ග ga	ගා gā	ගි gi	ගී gī	ගු gu	ගූ gū	ගෙ ge	ගො go

CONJUNCT - CONSONANTS

ක්ක kka	ඤ්ඤ ñña	ත්‍ර tra	ම්ඵ mpha
ක්ඛ kkha	ණ්හ ṇha	ද්ද dda	ම්බ mba
ක්‍ය kya	ඤ්ච ñca	ද්ධ ddha	ම්භ mbha
ක්‍රි kri	ඤ්ඡ, ñcha	ද්‍ර dra	ම්ම mma
ක්ව kva	ඤ්ජ, ñja	ද්ව, dva	ම්හ mbha
ඛ්‍ය khya	ඤ්ඣ ñjha	ධ්ව dhva	ය්‍ය, yya
ඛ්ව khva	ට්ට ṭṭa	න්ත nta	ය්හ yha
ග්ග gga	ට්ඨ, ṭṭha	න්ථ ntha	ල්ල lla
ග්ඝ ggha	ඩ්ඩ ḍḍa	න්ද nda	ල්‍ය lya
ඞ්ක ṅka	ඩ්ඪ ḍḍha	න්ධ ndha	ල්හ lha
ග්‍ර grā	ණ්ණ ṇṇa	න්න nna	ව්හ wha
ඞ්ඛ ñkha	ණ්ට ṇṭa	න්හ nha	ස්ස ssa
ඞ්ග ñga	ණ්ඨ ṇṭha	ප්ප ppa	ස්ම sma
ඞ්ඝ ṅgha	ණ්ඩ ṇḍa	ප්ඵ ppha	ස්ව sva
ච්ච cca	ත්ත tta	බ්බ bba	හ්ම hma
ච්ඡ ccha	ත්ථ ttha	බ්භ bbha	හ්ව hva
ජ්ජ jja	ත්ව tva	බ්‍ර bra	ළ්හ ḷha
ජ්ඣ jjha		ම්ප mpa	

ා ā   ි i   ී ī   ු u   ූ ū   ෙ e   ො o

ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

උපදේශක:

මහරගම වටයවත්තපාර-ශ්‍රී චන්ද්‍රශෙඛරාරාමාධිපති අග්‍රමහාපණ්ඩිත බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහාස්ථවිරපාදයන් වහන්සේ.

සභාපති:

අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨයෙහි (භික්ෂු විශ්වවිද්‍යාලයෙහි) අධිපති ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය්‍ය, රාජකීය පණ්ඩිත කෝදගොඩ ශ්‍රී ඥානාලෝක දක්ෂිණ ලඞ්කායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

ප්‍රධාන සම්පාදක:

මොල්ලිගොඩ, ප්‍රවචනොදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්‍ය්‍ය, ත්‍රිපිටක වාගීශ්වර, විමලකීර්ති ශ්‍රී රාජකීය පණ්ඩිත, ලබුගම ලඞ්කානන්ද ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්‍ම මහාසඞ්ඝ සභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

සම්පාදක:

කිරුළපන පූර්වාරාම, නාරාහේන්පිට අභයාරාම යන විහාරද්වයාධිපති ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, රද්දල්ලේ සිරි පඤ්ඤාලොක ශ්‍රී කල්‍යාණිසාමග්‍රීධර්‍ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හෙරලියාවල, සුධර්මාරාමාධිපති ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, වේඩරුවේ සිරි අනොමදස්සී බටහිර දිශායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ - මාකඩවර විහාරාධිපති රාජකීය පණ්ඩිත, කරහම්පිටිගොඩ සිරි සුමනසාර ස්ථවිරයන් වහන්සේ.

කොළඹ තිඹිරිගස්යායේ අශොකාරාමාධිපති රාජකීය පණ්ඩිත කරදන සිරි පඤ්ඤාලඞ්කාර නායක ස්ථවිරයන් වහන්සේ.

ලේඛක

කොළඹ, බෞද්ධාලොක මාවතෙහි බෞද්ධාලොක විහාරාධිපති, පණ්ඩිත, දෙරගමුවේ සිරි ධම්මපාල - කොළඹ පළාතේ ප්‍රධානසඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

සඞ්කේත නිරූපණය

සීමු - සීහළක්ඛරමුද්දිත චුල්ලවග්ගපාළි

මජසං - මරම්ම - ඡට්ඨසංගීතියා සොධිත පොත්ථකං

සයා - සයාම - තායාක්ඛරමුද්දිත චුල්ලවග්ගපාළි

PTS - Pali Text Society, Cullavagga Pali

කත්ථචි - ගන්ථන්තරානි

චූලවග්ග පාළි

විසය සූචි

1. කම්මක්ඛන්ධකං 2—157

2. පාරිවාසිකක්ඛන්ධකො 158 – 195

3. සමුච්චයක්ඛන්ධකං 196—331

4. සමථක්ඛන්ධකං 332-435

සමථක්ඛන්ධකො නිට්ඨිතො චතුත්ථො

විනයපිටකෙ

චුල්ලවග්ගපාළි

විනයපිටකෙ

චූළවග්ගපාළි

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

1.

කම්මක්ඛන්ධකං

1. තජ්ජනීයකම්මං

1. **තෙන** සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන **පණ්ඩුකලොහිතකා** භික්ඛූ අත්තනා භණ්ඩනකාරකා කලහකාරකා විවාදකාරකා භස්සකාරකා සඞ්ඝෙ අධිකරණකාරකා, යෙපි චඤ්ඤෙ භික්ඛූ භණ්ඩනකාරකා කලහකාරකා විවාදකාරකා භස්සකාරකා සඞ්ඝෙ අධිකරණකාරකා, තෙ උපසඞ්කමිත්වා එවං වදෙන්ති: "මා ඛො තුම්හෙ ආයස්මන්තො එසො අජෙසි. බලවාබලවං පටිමන්තෙථ. තුම්හෙ තෙන පණ්ඩිතතරා ච බ්‍යත්තතරා ච බහුස්සුතතරා ච අලමත්තතරා[1] ච. මා චස්ස භායිත්ථ. මයම්පි තුම්හාකං පක්ඛා භවිස්සාමා"ති. තෙන අනුප්පන්නානි චෙව භණ්ඩනානි උප්පජ්ජන්ති. උප්පන්නානි ච භණ්ඩනානි භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා, තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම පණ්ඩුකලොහිතකා භික්ඛූ අත්තනා භණ්ඩනකාරකා කලහකාරකා විවාදකාරකා භස්සකාරකා සඞ්ඝෙ අධිකරණකාරකා, යෙපි චඤ්ඤෙ භික්ඛූ භණ්ඩනකාරකා කලහකාරකා විවාදකාරකා සඞ්ඝෙ අධිකරණකාරකා, තෙ උපසඞ්කමිත්වා එවං වක්ඛන්ති: 'මා ඛො තුම්හෙ ආයස්මන්තො එසො අජෙසි. බලවාබලවං පටිමන්තෙථ. තුම්හෙ තෙන පණ්ඩිතතරා ච බ්‍යත්තතරා ච බහුස්සුතතරා ච අලමත්තතරා ච. මා චස්ස භායිත්ථ. මයම්පි තුම්හාකං පක්ඛා භවිස්සාමා'ති. තෙන අනුප්පන්නානි චෙව භණ්ඩනානි උප්පජ්ජන්ති. උප්පන්නානි ච භණ්ඩනානි භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තන්තී"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

---

1. අලමත්ථතරා, කත්ථචි.

විනයපිටකයෙහි

චුළ්වග

ඒ භාග්‍යවත් අර්හත් සම්මාසම්බුද්ධරජානන් වහන්සේට නමස්කාර වේවා.

1.

කම්මක්ඛන්ධකය

1. තජ්ජනීයකර්මය

1. එ සමයෙහි භගවත් බුදුරජුහු **සැවැත්නුවර** සමීපයෙහි **ජේතවන** නම් වූ **අනේපිඬු** සිටුහුගේ අරම්හි වැඩ වෙසෙති. එකල්හි වනාහි **පණ්ඩුකය ලොහිතකය** යන දෙ මහණහු, තුමූ ඩබර කරත්තෝ කලහ කරත්තෝ විරුද්ධ වාද කරත්තෝ වාක්කලහ කරත්තෝ සඟමැද අධිකරණ උපදවත්තෝ, ඩබර කරණ කලහ කරණ විරුද්ධ වාද කරණ වාක්කලහ ඇති කරණ සඟමැද අධිකරණ උපදවන වෙනත් යම් භික්ෂූහු වෙත් නම්, ඔවුන් කරා එළැඹ මෙසේ කියත්: "ආයුෂ්මත්-වරුනි, මේ මහණ තෙම තොප නො පරදවාවා. තෙපි ඔහුට වඩා පණ්ඩිත ද වඩා ව්‍යක්ත ද වඩා බහුශ්‍රැත ද වඩා සමර්ථ ද වවු. ඔහුට නො බවු. අපි දු තොපට පක්ෂ වත්තමු"යනු යි. එයින් නූපන් කලහ ද උපදී. උපන් කලහ ද බොහෝ වීම පිණිස විපුලබව පිණිස පවතී. යම් මහණ කෙනෙක් තුමූ අපිස් ගුණැත්තෝ ද, ලද දෑයින් සතුටු වත්තෝ ද, පවෙසි ලජ්ජා ඇත්තෝ ද, කැප නොකැප පිළිබඳ විමැසිලි ඇත්තෝ ද, හික්මෙනු කැමැත්තෝ ද, ඔහු අවඥ කෙරෙත්, දෙස් නගත්, නුගුණ පතුරුවා බෙණෙත්: "කෙසේ නම් **පණ්ඩුක ලොහිතක** භික්ෂූහු තුමූ ඩබර කරත්තෝ කලහ කරත්තෝ විවාද කරත්තෝ, වාක් කලහ කරත්තෝ, සඟමැද අධිකරණ උපදවත්තෝ, ඩබර කරණ, කලහ කරණ, විවාද කරණ, වාක්කලහ කරණ, සඟමැද අධිකරණ උපදවන, අන් යම් මහණහු වෙත් නම්, ඔවුන් කරා එළැඹ 'ආයුෂ්මත්වරුනි, මේ මහණතෙම තොප නො පරදවාවා. තෙපි වඩා බලවත් සේ ප්‍රතිවාද කරවු. තෙපි ඔහුට වඩා පණ්ඩිත ද වඩා ව්‍යක්ත ද වඩා බහුශ්‍රැත ද වඩා සමර්ථ ද වවු. ඔහුට නො බවු. අපි දු තොපට පක්ෂ වත්තමු'යි මෙසේ කීහු ද, එයින් නොඋපන් කලහ උපදී. උපන් කලහ බොහෝ වීම පිණිසත් මහත් වීම පිණිසත් පවතී" යනු යි.

2. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා භික්ඛූ පටිපුච්ඡි: "සච්චං කිර භික්ඛවෙ **පණ්ඩුකලොහිතකා** භික්ඛූ අත්තනා භණ්ඩනකාරකා කලහකාරකා විවාදකාරකා භස්සකාරකා සඞ්ඝෙ අධිකරණකාරකා, යෙපි චඤ්ඤෙ භික්ඛූ භණ්ඩනකාරකා කලහකාරකා විවාදකාරකා භස්සකාරකා සඞ්ඝෙ අධිකරණකාරකා, තෙ උපසඞ්කමිත්වා එවං වදෙන්ති: 'මා ඛො තුම්හෙ ආයස්මන්තො එසො අජෙසි. බලවාබලවං පටිමන්තෙථ. තුම්හෙ තෙන පණ්ඩිතතරා ච ව්‍යත්තතරා ච බහුස්සුතතරා ච අලමත්තතරා ච. මා චස්ස භායිත්ථ. මයම්පි තුම්හාකං පක්ඛා භවිස්සාමා'ති. තෙන අනුප්පන්නානි චෙව භණ්ඩනානි උප්පජ්ජන්ති. උප්පන්නානි ච භණ්ඩනානි භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තන්තී?"ති. "සච්චං භගවා". විගරහි බුද්ධො භගවා: 'අනනුච්ඡවිකං භික්ඛවෙ තෙසං මොඝපුරිසානං අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං. කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා අත්තනා භණ්ඩනකාරකා -පෙ- සඞ්ඝෙ අධිකරණකාරකා, යෙපි චඤ්ඤෙ භික්ඛූ භණ්ඩනකාරකා -පෙ- සඞ්ඝෙ අධිකරණකාරකා, තෙ උපසඞ්කමිත්වා එවං වක්ඛන්ති: 'මා ඛො තුම්හෙ ආයස්මන්තො එසො අජෙසි. බලවාබලවං පටිමන්තෙථ. තුම්හෙ තෙන පණ්ඩිතතරා ච ව්‍යත්තතරා ච බහුස්සුතතරා ච අලමත්තතරා ච. මා චස්ස භායිත්ථ. මයම්පි තුම්හාකං පක්ඛා භවිස්සාමා'ති. තෙන අනුප්පන්නානි චෙව භණ්ඩනානි උප්පජ්ජන්ති. උප්පන්නානි ච භණ්ඩනානි භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය පසන්නානං වා භිය්‍යොභාවාය. අථ ඛ්වෙතං භික්ඛවෙ අප්පසන්නානං චෙව අප්පසාදාය පසන්නානඤ්ච එකච්චානං අඤ්ඤථත්තායා'ති.

3. අථ ඛො භගවා තෙ භික්ඛූ අනෙකපරියායෙන විගරහිත්වා දුබ්භරතාය දුප්පොසතාය මහිච්ඡතාය අසන්තුට්ඨියා[1] සඞ්ගණිකාය කොසජ්ජස්ස අවණ්ණං භාසිත්වා අනෙකපරියායෙන සුභරතාය[2] සුපොසතාය අප්පිච්ඡස්ස සන්තුට්ඨස්ස සල්ලෙඛස්ස ධුතස්ස පාසාදිකස්ස අපචයස්ස විරියාරම්භස්ස වණ්ණං භාසිත්වා භික්ඛූනං තදනුච්ඡවිකං තදනුලොමිකං ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: තෙන හි භික්ඛවෙ සඞ්ඝො පණ්ඩුකලොහිතකානං භික්ඛූනං තජ්ජනීයකම්මං කරොතු. එවඤ්ච පන භික්ඛවෙ කාතබ්බං: පඨමං පණ්ඩුකලොහිතකා භික්ඛූ චොදෙතබ්බා. චොදෙත්වා සාරෙතබ්බා. සාරෙත්වා ආපත්ති[3] ආරොපෙතබ්බා. ආපත්තිං ආරොපෙත්වා ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

---

1. අසන්තුට්ඨතාය - ස්‍යා. 2. සුපොසතාය - මජසං. 3. ආපත්තිං - මජසං.

2. ඉක්බිති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැළ කළහ. එකල්හි භගවත්හු මේ නිදානයෙහි මේ කාරණයෙහි භික්සඟන රැස් කරවා, “සැබෑ ද, මහණෙනි **පණ්ඩුකාලොහිතක** මහණහු තුමූ ඩබර කරත්තෝ, කලහ කරත්තෝ, විවාද කරත්තෝ, වාක්කලහ කරත්තෝ, සඟමැද අධිකරණ උපදවත්තෝ, ඩබර කරණ, කලහ කරණ, විවාද කරණ, වාක්කලහ කරණ, සඟමැද අධිකරණ උපදවන, අන් යම් මහණ කෙනෙක් වෙත් නම්, ඔවුන් කරා පැමිණ, “ආයුෂ්මත්-වරුනි, මෙ තෙමේ තොප නො දිනාවා. තෙපි ඔහුට වඩා බලවත් සේ ප්‍රතිවාද කරවු... අපි දු තොපට පක්ෂ වන්නමු’යි මෙසේ කියත් ද? එයින් නො උපන් කලහ උපදී. උපන් කලහ බෝ වීම පිණිසත් මහත් වනු පිණිසත් පවතී යනු සැබෑ ද?”යි මෙසේ භික්ෂූන් පුළුවුත්හ. “සැබෑව, භාග්‍යවතුන් වහන්සැ”යි (ඒ මහණහු කීහ.) “මහණෙනි, ඒ හිස් පුරුෂයන්ගේ නුසුදුසු ක්‍රියාවෙක. සස්නට අනුලොම් නොවූයෙක. අයෝග්‍ය ක්‍රියාවෙක. මහණුනට නුසුදුසු එකෙක. නොකැපයෙක. නො කළ මනාවෙක. මහණෙනි, කෙසේ නම් ඒ හිස් පුරුෂයෝ තුමූ ඩබර කරත්තෝ... සඟමැද අධිකරණ උපදවත්තෝ, කලහ කරණ... සඟමැද අධිකරණ උපදවන යම් අන් මහණ කෙනෙක් වෙත් නම්, ඔවුන් කරා එළැඹ ‘ආයුෂ්මත්නි, මෙ තෙම තොප නො දිනාවා. තෙපි වඩා බලවත් සේ ප්‍රතිවාද කරවු... අපි දු තොපට පක්ෂ වන්නමු’යි මෙසේ කීහු ද? එයින් නො උපන් කලහ උපදී. උපන් කලහ බෝ වීම පිණිසත් මහත් වනු පිණිසත් පවතී. මහණෙනි, මේ කාරණය නොපහන් වූවන්ගේ පැහැදීම පිණිස හෝ පහන් වූවන්ගේ ප්‍රසාදය වැඩීම පිණිස හෝ නො වෙයි. වැලි මෙය නොපැහැදුනවුන්ගේ නොපැහැදීම පිණිස ද පැහැදුනු ඇතැමුන්ගේ වෙනස්බව පිණිස ද පවතී” යි භගවත් බුදුහු ගැරැහූහ.

3. ඉක්බිති භගවත්හු ඒ මහණුන් නොයෙක් කරුණින් ගරහා, දුර්භරතාවගේ ද දුෂ්පොෂතාවගේ ද මහෙච්ඡතාවගේ ද අසන්තුෂ්ටතාව-ගේ ද ගණසඞ්ගණිකාවගේ ද කුසීතභාවයාගේ ද දොස් වදරා, නොයෙක් කරුණින් සුභරතාවගේ ද සුපොෂතාවගේ ද අල්පෙච්ඡතාවගේ ද සන්තුෂ්ටතාවගේ ද සංලෙඛයාගේ ද ධූතගුණයාගේ ද ප්‍රසාද එළවන සාරූප්‍යයාගේ ද කෙලශාපචයයාගේ (කෙලෙස් බැහැර ලීමේ) ද වීර්‍ය්‍යාරම්භ-යාගේ ද අනුසස් වදරා, මහණුනට ඒ කාරණයට සුදුසු වූ ඒ කාරණයට අනුලොම් වූ ධර්මකථාවක් කොට, මහණුන් අමතා මෙසේ වදාළ සේක: ‘මහණෙනි, එසේ නම් සඞ්ඝ තෙමේ (ඇසුරු කරන්නවුන් සහිත) **පණ්ඩුක ලොහිතක** යන දෙ මහණුනට තජ්ජනියකර්මය කෙරේවා. මහණෙනි, එය කට යුත්තේ මෙසේ ය: පළමු කොට **පණ්ඩුකාලොහිතක** භික්ෂූහු චොදසිතව්‍යයහ (ඒ මහණුනට චොදනා කට යුතු ය). චොදනා කොට සමාරසිතව්‍යයහ (වරද සිහි කැරැවිය යුතු ය). සිහි කරවා ඇවැත නැංවිය යුතු ය. ඇවැත නංවා, වියත් සමත් මහණක්හු විසින් සඞ්ඝ තෙමේ (මෙසේ) දැන්විය යුත්තේ ය:

4. “සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉමෙ පණ්ඩුකලොහිතකා භික්ඛූ අත්තනා භණ්ඩනකාරකා කලහකාරකා විවාදකාරකා භස්සකාරකා සඞ්ඝෙ අධිකරණකාරකා, යෙපි චඤ්ඤෙ භික්ඛූ භණ්ඩනකාරකා කලහකාරකා භස්සකාරකා සඞ්ඝෙ අධිකරණකාරකා, තෙ උපසඞ්කමිත්වා එවං වදෙන්ති: මා ඛො තුම්හෙ ආයස්මන්තො එසො අජෙසි. බලවාබලවං පටිමන්තෙථ. තුම්හෙ තෙන පණ්ඩිතතරා ච ව්‍යත්තතරා ච බහුස්සුතතරා ච අලමත්තතරා ච. මා චස්ස භායිත්ථ. මයම්පි තුම්හාකං පක්ඛා භවිස්සාමාති. තෙන අනුප්පන්නානි චෙව භණ්ඩනානි උප්පජ්ජන්ති උප්පන්නානි ච භණ්ඩනානි භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො පණ්ඩුකලොහිතකානං භික්ඛූනං තජ්ජනීයකම්මං කරෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉමෙ පණ්ඩුකලොහිතකා භික්ඛූ අත්තනා භණ්ඩනකාරකා -පෙ- සඞ්ඝෙ අධිකරණකාරකා, යෙපි චඤ්ඤෙ භික්ඛූ භණ්ඩනකාරකා -පෙ- සඞ්ඝෙ අධිකරණකාරකා, තෙ උපසඞ්කමිත්වා එවං වදෙන්ති: මා ඛො තුම්හෙ ආයස්මන්තො එසො අජෙසි. බලවා-බලවං පටිමන්තෙථ. තුම්හෙ තෙන පණ්ඩිතතරා ච ව්‍යත්තතරා ච බහුස්සුතතරා ච අලමත්තතරා ච. මා චස්ස භායිත්ථ. මයම්පි තුම්හාකං පක්ඛා භවිස්සාමාති. තෙන අනුප්පන්නානි චෙව භණ්ඩනානි උප්පජ්ජන්ති උප්පන්නානි ච භණ්ඩනානි භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති. සඞ්ඝො පණ්ඩුකලොහිතකානං භික්ඛූනං තජ්ජනීයකම්මං කරොති. යස්සායස්මතො ඛමති පණ්ඩුකලොහිතකානං භික්ඛූනං තජ්ජනීයස්ස කම්මස්ස කරණං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දුතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. පණ්ඩුක-ලොහිතකා භික්ඛූ අත්තනා භණ්ඩනකාරකා කලහකාරකා -පෙ- සඞ්ඝෙ අධිකරණකාරකා, යෙපි චඤ්ඤෙ භික්ඛූ භණ්ඩනකාරකා -පෙ- සඞ්ඝෙ අධිකරණකාරකා, තෙ උපසඞ්කමිත්වා එවං වදෙන්ති: ‘මා ඛො තුම්හෙ ආයස්මන්තො එසො අජෙසි. බලවාබලවං පටිමන්තෙථ. තුම්හෙ තෙන පණ්ඩිතතරා ච ව්‍යත්තතරා ච බහුස්සුතතරා ච අලමත්තතරා ච. මා චස්ස භායිත්ථ. මයම්පි තුම්හාකං පක්ඛා භවිස්සාමාති. තෙන අනුප්පන්නානි චෙව භණ්ඩනානි උප්පජ්ජන්ති, උප්පන්නානි ච භණ්ඩනානි භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති. සඞ්ඝො පණ්ඩුකලොහිතකානං භික්ඛූනං තජ්ජනීයකම්මං කරොති. යස්සායස්මතො ඛමති පණ්ඩුකලොහිතකානං භික්ඛූනං තජ්ජනීයස්ස කම්මස්ස කරණං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉමෙ පණ්ඩුකලොහිතකා භික්ඛූ අත්තනා භණ්ඩනකාරකා කලහකාරකා විවාදකාරකා භස්සකාරකා සඞ්ඝෙ අධිකරණකාරකා, යෙපි චඤ්ඤෙ භික්ඛූ භණ්ඩනකාරකා -පෙ- සඞ්ඝෙ අධිකරණකාරකා, තෙ උපසඞ්කමිත්වා එවං වදෙන්ති: මා ඛො තුම්හෙ ආයස්මන්තො එසො අජෙසි. බලවා-බලවං පටිමන්තෙථ. තුම්හෙ තෙන පණ්ඩිතතරා ච ව්‍යත්තතරා ච බහුස්සුතතරා ච අලමත්තතරා ච. මා චස්ස භායිත්ථ. මයම්පි තුම්හාකං පක්ඛා භවිස්සාමා’ති. තෙන අනුප්පන්නානි චෙව භණ්ඩනානි උප්පජ්ජන්ති, උප්පන්නානි ච භණ්ඩනානි භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති. සඞ්ඝො පණ්ඩුකලොහිතකානං භික්ඛූනං තජ්ජනීයකම්මං කරොති. යස්සායස්මතො ඛමති පණ්ඩුකලොහිතකානං භික්ඛූනං තජ්ජනීයස්ස කම්මස්ස කරණං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

කතං සඞ්ඝෙන පණ්ඩුකලොහිතකානං භික්ඛූනං තජ්ජනීයකම්මං. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී”ති.

4. "වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්න අසාවා. මේ පණ්ඩුකලොහිතක භික්ෂූහු තුමූ ඩබර කරන්නාහු, කලහ කරන්නාහු, විවාද උපදවන්නාහු, වාක්කලහ කරන්නාහු, සඟමැද අධිකරණ ඇති කරන්නාහු, ඩබර කරණ, කලහ කරණ, විවාද උපදවන, වාක්කලහ කරණ, සඟමැද අධිකරණ ඇති කරණ යම් වෙනත් මහණහු ඇත් ද, ඔවුන් කරා එළැඹ 'ආයුෂ්මත්නි, මේ තෙම තොප නො දිනවා. වඩා බලවත් කොට ප්‍රතිවාද කරවු. තෙපි ඔහුට වඩා පණ්ඩිත ද වඩා ව්‍යක්ත ද වඩා බහුශ්‍රැත ද වඩා සමර්ථ ද වවු. ඔහුට නො බවු. අපි දු තොපට පක්ෂ වන්නමු'යි මෙසේ කියත්. එයින් නො උපන් ඩබර ද උපදී. උපන් ඩබර ද බොහෝ වනු පිණිස, මහත්බව පිණිස පවතී. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම්, සඞ්ඝ තෙමේ පණ්ඩුකලොහිතක මහණුනට තජ්ජනීයකර්මය කරන්නේ ය. මේ ඥප්තිය ය.

වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්න අසාවා. මේ පණ්ඩුකලොහිතක මහණහු තුමූ ඩබර කරන්නාහු,... සඟමැද අධිකරණ ඇති කරන්නාහු, ඩබර කරණ.... සඟමැද අධිකරණ ඇති කරණ යම් වෙනත් මහණහු ඇත් ද, ඔවුන් කරා එළැඹ, 'ආයුෂ්මත්නි, මේ තෙමේ තොප නො දිනාවා... අපි දු තොපට පක්ෂ වන්නමු'යි මෙසේ කියත්. එයින් නො උපන් ඩබර ද උපදී. උපන් ඩබර ද... මහත්බව පිණිස පවතී. සඞ්ඝ තෙමේ පණ්ඩුකලොහිතකමහණුනට තජ්ජනීයකර්මය කෙරෙයි. පණ්ඩුකලොහිතක මහණුනට තජ්ජනීය කර්මය කිරීම යම් ආයුෂ්මත්හට රිසියේ නම්, හේ නිහඬ වේවා. යමකුහට නො රිසියේ නම්, හේ කියාවා.

දෙවනු ද මේ කරුණ කියමි. වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්න අසාවා. මේ පණ්ඩුකලොහිතකමහණහු තුමූ ඩබර කරන්නාහු... අපි දු තොපට පක්ෂ වන්නමු'යි මෙසේ කියත්. එයින් නොඋපන් ඩබර ද උපදී. උපන් ඩබර ද... මහත්බව පිණිස පවති. සඞ්ඝ තෙමේ පණ්ඩුකලොහිතකමහණුනට තජ්ජනීයකර්මය කෙරෙයි. පණ්ඩුකලොහිතක මහණුනට තජ්ජනීයකර්මය කිරීම යම් ආයුෂ්මතක්හට රිසියේ නම්, හේ නිහඬ වේවා. යමක්හට නො රිසියේ නම්, හේ කියාවා.

තෙවනු ද මෙ කරුණ කියමි. වහන්ස, සඞ්ඝ තෙමේ මා කියන්න අසාවා.... යමක්හට නො රිසියේ නම්, හේ කියාවා.

පණ්ඩුකලොහිතකමහණුනට සඞ්ඝයා විසින් තජ්ජනීයකර්මය කරණ ලද්දේ ය. එය සඞ්ඝයාට රිසියෙයි. එ හෙයින් නිහඬ ය. මෙය මෙසේ සලකමි" යනු යි.

අධම්මකම්මද්වාදසකං

1. තීහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං අධම්ම-කම්මඤ්ච හොති අවිනයකම්මඤ්ච දුවූපසන්තඤ්ච: අසම්මුඛා කතං හොති, අප්පටිපුච්ඡා කතං හොති, අප්පටිඤ්ඤාය කතං හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං අධම්මකම්මඤ්ච හොති අවිනයකම්මඤ්ච දුවූපසන්තඤ්ච.

2. අපරෙහිපි භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං අධම්මකම්මඤ්ච හොති අවිනයකම්මඤ්ච දුවූපසන්තඤ්ච: අනාපත්තියා කතං හොති, අදෙසනාගාමිනියා ආපත්තියා කතං හොති, දෙසිතාය ආපත්තියා කතං හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං අධම්මකම්මඤ්ච හොති අවිනයකම්මඤ්ච දුවූපසන්තඤ්ච.

3. අපරෙහිපි භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං අධම්මකම්මං ච හොති අවිනයකම්මං ච දුවූපසන්තඤ්ච: අචොදෙත්වා කතං හොති, අසාරෙත්වා කතං හොති, ආපත්තිං අනාරොපෙත්වා කතං හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං අධම්ම-කම්මඤ්ච හොති අවිනයකම්මඤ්ච දුවූපසන්තඤ්ච.

4. අපරෙහිපි භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං අධම්මකම්මඤ්ච හොති අවිනයකම්මඤ්ච දුවූපසන්තඤ්ච: අසම්මුඛා කතං හොති, අධම්මෙන කතං හොති, වග්ගෙන කතං හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං අධම්මකම්මඤ්ච හොති අවිනයකම්මඤ්ච දුවූපසන්තඤ්ච.

5. අපරෙහිපි භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං අධම්මකම්මඤ්ච හොති අවිනයකම්මඤ්ච දුවූපසන්තඤ්ච: අප්පටිපුච්ඡා කතං හොති, අධම්මෙන කතං හොති, වග්ගෙන කතං හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං අධම්මකම්මඤ්ච හොති අවිනයකම්මඤ්ච දුවූපසන්තඤ්ච.

6. අපරෙහිපි භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං අධම්මකම්මඤ්ච හොති අවිනයකම්මඤ්ච දුවූපසන්තඤ්ච: අප්පටිඤ්ඤාය කතං හොති, අධම්මෙන කතං හොති, වග්ගෙන කතං හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං අධම්මකම්මඤ්ච හොති අවිනයකම්මඤ්ච දුවූපසන්තඤ්ච.

7. අපරෙහිපි භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං අධම්මකම්මඤ්ච හොති අවිනයකම්මඤ්ච දුවූපසන්තඤ්ච: අනාපත්තියා කතං හොති, අධම්මෙන කතං හොති, වග්ගෙන කතං හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං අධම්මකම්මඤ්ච හොති අවිනයකම්මඤ්ච දුවූපසන්තඤ්ච.

අධර්මකර්ම දොළොස

1. "මහණෙනි, අඞ්ග තුනෙකින් සමන්විත වූ තජ්ජනීයකර්මය අධර්මකර්ම ද අවිනයකර්ම ද, නො මනා ලෙස සංහිඳුනෙක් ද වෙයි: නො හමුයෙහි කරණ ලද්දේ වේ ද, නො පිළිවිස කරණ ලද්දේ වේ ද, පිළිණි නො ගෙණ කරණ ලද්දේ වේ ද, මහණෙනි, මේ අඞ්ග තුණින් සමන්විත තජ්ජනීයකර්මය අධර්මකර්ම ද අවිනයකර්ම ද නොමනා ලෙස සංහිඳුනෙක් ද වෙයි.

2. මහණෙනි, අනෙකුදු අඞ්ග තුණෙකින් සමන්විත තජ්ජනීයකර්මය අධර්මකර්ම ද අවිනයකර්ම ද නොමනා ලෙස සංහිඳුනෙක් ද වෙයි: නොඇවැතෙහි කරණ ලදුයේ වේ ද, දෙශනාගාමිනී නො වන ඇවැතෙහි කරණ ලදුයේ වේ ද, දෙසූ ඇවැතෙහි කරණ ලදුයේ වේ ද, මහණෙනි, මේ අඞ්ග තුණින් සමන්විත තජ්ජනීයකර්මය අධර්මකර්ම ද අවිනයකර්ම ද නො මනා ලෙස සංහිඳුනෙක් ද වෙයි.

3. මහණෙනි, අනෙකුදු අඞ්ග තුණෙකින් සමන්විත තජ්ජනීයකර්මය අධර්මකර්ම ද අවිනයකර්ම ද නොමනා ලෙස සංහිඳුනෙක් ද වෙයි: චොදනා නොකොට කරණ ලදුයේ වේ ද, සිහිපත් නො කරවා කරණ ලදුයේ වේ ද, ඇවැත නොනංවා කරණ ලදුයේ වේ ද, මහණෙනි, මේ අඞ්ග තුණින් සමන්විත තජ්ජනීයකර්මය අධර්මකර්ම ද අවිනයකර්ම ද නොමනා ලෙස සංහිඳුනෙක් ද වෙයි.

4. මහණෙනි, අනෙකුදු අඞ්ග තුණෙකින් සමන්විත තජ්ජනීයකර්මය අධර්මකර්ම ද අවිනයකර්ම ද නොමනා ලෙස සංහිඳුනෙක් ද වෙයි: නො-හමුයෙහි කරණ ලදුයේ වේ ද, අධර්මයෙන් කරණ ලදුයේ වේ ද, ව්‍යග්‍ර (නො සමග)වූ සඞ්ඝයා විසින් කරණ ලදුයේ වේ ද, මහණෙනි, මේ අඞ්ග තුණින් සමන්විත තජ්ජනීයකර්මය අධර්මකර්ම ද අවිනයකර්ම ද නොමනා ලෙස සංහිඳුනෙක් ද වෙයි.

5. මහණෙනි, අනෙකුදු අඞ්ග තුණෙකින් සමන්විත වූ තජ්ජනීයකර්මය අධර්මකර්ම ද අවිනයකර්ම ද නොමනා ලෙස සංහිඳුනෙක් ද වෙයි: නොපිළිවිස කරණ ලදුයේ වේ ද, අධර්මයෙන් කරණ ලදුයේ වේ ද, ව්‍යග්‍ර (සමග නොවූ) සඞ්ඝයා විසින් කරණ ලදුයේ වේ ද, මහණෙනි, මේ අඞ්ග තුණින් සමන්විත තජ්ජනීයකර්මය අධර්මකර්ම ද අවිනයකර්ම ද නොමනා ලෙස සංහිඳුනෙක් ද වේ.

6. මහණෙනි, අනෙකුදු අඞ්ග තුණෙකින් සමන්විත තජ්ජනීයකර්මය අධර්මකර්ම ද අවිනයකර්ම ද නොමනා සේ සංහිඳුනෙක් ද වේ: පිළිණි නො ගෙණ කරණ ලදුයේ වේ ද, අධර්මයෙන් කරණ ලදුයේ වේ ද, ව්‍යග්‍ර වූ සඞ්ඝයා විසින් කරණ ලදුයේ වේ ද, මහණෙනි, මේ අඞ්ග තුණින් සමන්විත තජ්ජනීයකර්මය අධර්මකර්ම ද අවිනයකර්ම ද නොමනා සේ සංහිඳුනෙක් ද වෙයි.

7. මහණෙනි, අනෙකුදු අඞ්ග තුණෙකින් සමන්විත තජ්ජනීයකර්මය අධර්මකර්ම ද අවිනයකර්ම ද නොමනා සේ සංහිඳුනෙක් ද වෙයි: නොඇවැතෙහි කරණ ලදුයේ වේ ද, අධර්මයෙන් කරණ ලදුයේ වේ ද, ව්‍යග්‍ර වූ සඞ්ඝයා විසින් කරණ ලදුයේ වේ ද, මහණෙනි, මේ අඞ්ග තුණින් සමන්විත තජ්ජනීයකර්මය අධර්මකර්ම ද අවිනයකර්ම ද නොමනා සේ සංහිඳුනෙක් ද වෙයි.

8. අපරෙහිපි භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං අධම්මකම්මඤ්ච හොති අවිනයකම්මඤ්ච දුවූපසන්තඤ්ච: අදෙසනාගාමිනියා ආපත්තියා කතං හොති, අධම්මෙන කතං හොති, වග්ගෙන කතං හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං අධම්ම-කම්මඤ්ච හොති අවිනයකම්මඤ්ච දුවූපසන්තඤ්ච.

9. අපරෙහිපි භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං අධම්මකම්මඤ්ච හොති අවිනයකම්මඤ්ච දුවූපසන්තඤ්ච: දෙසිතාය ආපත්තියා කතං හොති, අධම්මෙන කතං හොති, වග්ගෙන කතං හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං අධම්මකම්මඤ්ච හොති අවිනයකම්මඤ්ච දුවූපසන්තඤ්ච.

10. අපරෙහිපි භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං අධම්මකම්මඤ්ච හොති අවිනයකම්මඤ්ච දුවූපසන්තඤ්ච: අචොදෙත්වා කතං හොති, අධම්මෙන කතං හොති, වග්ගෙන කතං හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං අධම්මකම්මඤ්ච හොති අවිනයකම්මඤ්ච දුවූපසන්තඤ්ච.

11. අපරෙහිපි භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං අධම්මකම්මඤ්ච හොති අවිනයකම්මං ච දුවූපසන්තඤ්ච: අසාරෙත්වා කතං හොති, අධම්මෙන කතං හොති, වග්ගෙන කතං හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං අධම්මකම්මඤ්ච හොති, අවිනයකම්මඤ්ච දුවූපසන්තං ච.

12. අපරෙහිපි භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං අධම්මකම්මං ච හොති අවිනයකම්මං ච දුවූපසන්තං ච: ආපත්තිං අනාරො-පෙත්වා කතං හොති, අධම්මෙන කතං හොති, වග්ගෙන කතං හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං අධම්මකම්මං ච හොති අවිනයකම්මං ච දුවූපසන්තං ච.

අධම්මකම්මද්වාදසකං නිට්ඨිතං.

ධම්මකම්මද්වාදසකං

1. තීහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං ධම්ම-කම්මං ච හොති විනයකම්මං ච සුවූපසන්තං ච: සම්මුඛා කතං හොති, පටිපුච්ඡා කතං හොති, පටිඤ්ඤාය කතං හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං ධම්මකම්මං ච හොති විනයකම්මං ච සුවූපසන්තං ච.

8. මහණෙනි, අනෙකුදු අඞ්ග තුණෙකින් සමන්විත තජ්ජනීයකර්මය අධර්මකර්ම ද අවිනයකර්ම ද නොමනා සේ සංහිඳුනෙක් ද වෙයි: දෙසීමෙන් පිරිසිදු නොවන ඇවතෙහි කරණ ලද්දේ වේ ද, නොදැහැමින් කරණ ලද්දේ වේ ද, නොසමග සඞ්ඝයා විසින් කරණ ලද්දේ වේ ද, මහණෙනි, මේ අඞ්ග තුණින් සමන්විත තජ්ජනීයකර්මය අධර්මකර්ම ද අවිනයකර්ම ද නොමනා සේ සංහිඳුනෙක් ද වේ.

9. මහණෙනි, අනෙකුදු අඞ්ග තුණෙකින් සමන්විත තජ්ජනීයකර්මය අධර්මකර්ම ද අවිනයකර්ම ද නොමනා සේ සංහිඳුනෙක් ද වේ: දෙසූ ඇවැතෙහි කරණ ලද්දේ වේ ද, නොදැහැමින් කරණ ලද්දේ වේ ද, ව්‍යග්‍ර වූ (සමග නො වූ) සඞ්ඝයා විසින් කරණ ලද්දේ වේ ද, මහණෙනි, මේ අඞ්ග තුණින් සමන්විත තජ්ජනීයකර්මය අධර්මකර්ම ද අවිනයකර්ම ද නොමනා සේ සංහිඳුනෙක් ද වේ.

10. මහණෙනි, අනෙකුදු අඞ්ග තුණෙකින් සමන්විත තජ්ජනීයකර්මය අධර්මකර්ම ද අවිනයකර්ම ද නොමනා සේ සංහිඳුනෙක් ද වේ: චෝදනා නොකොට කරණ ලද්දේ වේ ද, නොදැහැමින් කරණ ලද්දේ වේ ද, ව්‍යග්‍ර වූ සඞ්ඝයා විසින් කරණ ලද්දේ වේ ද, මහණෙනි, මේ අඞ්ග තුණෙන් සමන්විත තජ්ජනීයකර්මය අධර්මකර්ම ද අවිනයකර්ම ද නොමනා සේ සංහිඳුනෙක් ද වෙයි.

11. මහණෙනි, අනෙකුදු අඞ්ග තුණෙකින් සමන්විත තජ්ජනීයකර්මය අධර්මකර්ම ද අවිනයකර්ම ද නොමනා සේ සංහිඳුනෙක් ද වෙයි: සිහි පත් නොකරවා කරණ ලදුයේ වේ ද, නොදැහැමින් කරණ ලදුයේ වේ ද, ව්‍යග්‍ර වූ සඞ්ඝයා විසින් කරණ ලදුයේ වේ ද, මහණෙනි, මේ අඞ්ග තුණින් සමන්විත තජ්ජනීයකර්මය අධර්මකර්ම ද අවිනයකර්ම ද නොමනා සේ සංහිඳුනෙක් ද වේ.

12. මහණෙනි, අනෙකුදු අඞ්ග තුණෙකින් සමන්විත වූ තජ්ජනීය කර්මය අධර්මකර්ම ද අවිනයකර්ම ද නොමනා සේ සංහිඳුනෙක් ද වෙයි: ඇවත නොනංවා කරණ ලදුයේ වේ ද, නොදැහැමින් කරණ ලදුයේ වේ ද, ව්‍යග්‍ර වූ සඞ්ඝයා විසින් කරණ ලදුයේ වේ ද, මහණෙනි, මේ අඞ්ග තුණින් සමන්විත වූ තජ්ජනීයකර්මය අධර්මකර්ම ද අවිනයකර්ම ද නොමනා සේ සංහිඳුනෙක් ද වේ.

අධර්මකර්ම දොළොස නිමි.

ධර්මකර්ම දොළොස

1. මහණෙනි, අඞ්ග තුණෙකින් සමන්විත තජ්ජනීයකර්මය ධර්මකර්මයෙක් ද විනයකර්මයෙක් ද මනා ව සංහිඳුනෙක් ද වෙයි: හමුවෙහි කරණ ලද්දේ වේ ද, පිළිවිස කරණ ලද්දේ වේ ද. ප්‍රතිඥාව ගෙණ කරණ ලද්දේ වේ ද, මහණෙනි, මේ අඞ්ග තුණෙන් සමන්විත තජ්ජනීයකර්මය ධාර්මික කර්මයෙක් ද විනයකර්මයෙක් ද මනාව සංහිඳුනෙක් ද වෙයි.

2. අපරෙහිපි භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං ධම්මකම්මං ච හොති විනයකම්මං ච සුවූපසන්තං ච: ආපත්තියා කතං හොති, දෙසනාගාමිනියා ආපත්තියා කතං හොති, අදෙසිතාය ආපත්තියා කතං හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීය-කම්මං ධම්මකම්මඤ්ච හොති විනයකම්මං ච සුවූපසන්තං ච.

3. අපරෙහිපි භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං ධම්මකම්මං ච හොති විනයකම්මං ච සුවූපසන්තං ච: චොදෙත්වා කතං හොති, සාරෙත්වා කතං හොති, ආපත්තිං ආරොපෙත්වා කතං හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං ධම්ම-කම්මං ච හොති විනයකම්මං ච සුවූපසන්තං ච.

4. අපරෙහිපි භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං ධම්මකම්මං ච හොති විනයකම්මං ච සුවූපසන්තං ච: සම්මුඛා කතං හොති, ධම්මෙන කතං හොති, සමග්ගෙන කතං හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං ධම්මකම්මං ච හොති විනයකම්මං ච සුවූපසන්තං ච.

5. අපරෙහිපි භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං ධම්මකම්මං ච හොති විනයකම්මං ච සුවූපසන්තං ච: පටිපුච්ඡා කතං හොති, ධම්මෙන කතං හොති, සමග්ගෙන කතං හොති ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං ධම්මකම්මං ච හොති විනයකම්මං ච සුවූපසන්තං ච.

6. අපරෙහිපි භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං ධම්මකම්මං ච හොති විනයකම්මං ච සුවූපසන්තං ච: පටිඤ්ඤාය කතං හොති, ධම්මෙන කතං හොති, සමග්ගෙන කතං හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං ධම්මකම්මං ච හොති විනයකම්මං ච සුවූපසන්තං ච.

7. අපරෙහිපි භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං ධම්මකම්මං ච හොති විනයකම්මං ච සුවූපසන්තං ච: ආපත්තියා කතං හොති, ධම්මෙන කතං හොති, සමග්ගෙන කතං හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං ධම්මකම්මං ච හොති විනයකම්මං ච සුවූපසන්තං ච.

2. මහණෙනි, අන්‍ය වූත් අඞ්ග තුණෙකින් සමන්විත තජ්ජනීය කර්මය ධාර්මිකකර්මයෙක් ද විනයකර්මයෙක් ද මනා ව සංහිඳුනෙක් ද වෙයි: ඇවැතෙහි කරණ ලද්දේ වේ ද, දෙසීමෙන් පිරිසිඳු වන ඇවැතෙහි කරණ ලද්දේ වේ ද, නොදෙසූ ඇවැතෙහි කරණ ලද්දේ වේ ද, මහණෙනි, මේ අඞ්ග තුණෙකින් සමන්විත තජ්ජනීයකර්මය ධාර්මිකකර්මයෙක් ද විනය කර්මයෙක් ද මනා ව සංහිඳුනෙක් ද වෙයි.

3. මහණෙනි, අන්‍ය වූත් අඞ්ග තුණෙකින් සමන්විත තජ්ජනීයකර්මය ධාර්මිකකර්මයෙක් ද විනයකර්මයෙක් ද මනා ව සංහිඳුනෙක් ද වෙයි: චොදනා කොට කරණ ලද්දේ වේ ද, සිහි පත් කරවා කරණ ලද්දේ වේ ද, ඇවැත නංවා කරණ ලද්දේ වේ ද, මහණෙනි, මේ අඞ්ග තුණෙන් යුක්ත තජ්ජනීයකර්මය ධාර්මිකකර්මයෙක් ද විනයකර්මයෙක් ද මනා ව සංහිඳු-නෙක් ද වෙයි.

4. මහණෙනි, අන්‍ය වූ ද අඞ්ග තුණෙකින් සමන්විත තජ්ජනීයකර්මය ධාර්මිකකර්මයෙක් ද, විනයකර්මයෙක් ද මනා ව සංහිඳුනෙක් ද වෙයි: හමුවෙහි කරණ ලද්දේ වේ ද ධූහැමින් කරණ ලද්දේ වේ ද, සමග්‍ර සංඝයා විසින් කරණ ලද්දේ වේ ද, මහණෙනි, මේ අඞ්ග තුණෙන් සමන්විත තජ්ජනීයකර්මය ධර්මකර්මයෙක් ද විනයකර්මයෙක් ද මනා ව සංහිඳුනෙක් ද වෙයි.

5. මහණෙනි, අන්‍ය වූ ද අඞ්ග තුණෙකින් සමන්විත තජ්ජනීයකර්මය ධර්මකර්මයෙක් ද විනයකර්මයෙක් ද මනා ව සංහිඳුනෙක් ද වෙයි: පිළිවිස කරණ ලද්දේ වේ ද, ධර්මයෙන් කරණ ලද්දේ වේ ද, සමග්‍ර සංඝයා විසින් කරණ ලද්දේ වේ ද, මහණෙනි, මේ අඞ්ග තුණෙන් සමන්විත තජ්ජනීයකර්මය ධර්මකර්මයෙක් ද මනා ව සංහිඳුනෙක් ද විනයකර්මයක් ද වෙයි.

6. මහණෙනි, අන්‍ය වූත් අඞ්ග තුණෙකින් සමන්විත තජ්ජනීය-කර්මය ධර්මකර්මයෙක් ද විනයකර්මයෙක් ද මනා සේ සංහිඳුනෙක් ද වෙයි: ප්‍රතිඥා ගෙණ කරණ ලද්දේ වේ ද, ධර්මයෙන් කරණ ලද්දේ වේ ද, සමග්‍ර සඞ්ඝයා විසින් කරණ ලද්දේ වේ ද, මහණෙනි, මේ අඞ්ග තුණින් සමන්විත තජ්ජනීයකර්මය ධර්මකර්මයෙක් ද වෙයි, විනයකර්මයෙක් ද වෙයි, මනා ව සංහිඳුනෙක් ද වෙයි,

7. මහණෙනි, අන්‍ය වූ ද අඞ්ග තුණෙකින් සමන්විත තජ්ජනීයකර්මය ධර්මකර්මයෙක් ද, විනයකර්මයෙක් ද, මනා ලෙස සංහිඳුනෙක් ද වෙයි: ඇවැතෙහි කරණ ලද්දේ වේ ද, ධර්මයෙන් කරණ ලද්දේ වේ ද, සමග්‍ර සංඝයා විසින් කරණ ලද්දේ වේ ද, මහණෙනි, මේ අඞ්ග තුණෙන් සමන්විත තජ්ජනීයකර්මය ධර්මකර්මයෙක් ද විනයකර්මයෙක් ද මනා ලෙස සංහිඳුනෙක් ද වෙයි.

8. අපරෙහිපි භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං ධම්මකම්මං ච හොති විනයකම්මං ච සුවූපසන්තං ච: දෙසනාගාමිනියා ආපත්තියා කතං හොති, ධම්මෙන කතං හොති, සමග්ගෙන කතං හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං ධම්මකම්මං ච හොති විනයකම්මං ච සුවූපසන්තං ච.

9. අපරෙහිපි භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං ධම්මකම්මං ච හොති විනයකම්මං ච සුවූපසන්තං ච: අදෙසිතාය ආපත්තියා කතං හොති, ධම්මෙන කතං හොති, සමග්ගෙන කතං හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං ධම්මකම්මං ච හොති විනයකම්මං ච සුවූපසන්තං ච.

10. අපරෙහිපි භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං ධම්මකම්මං ච හොති විනයකම්මං ච සුවූපසන්තං ච: චොදෙත්වා කතං හොති, ධම්මෙන කතං හොති, සමග්ගෙන කතං හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං ධම්මකම්මං ච හොති විනයකම්මං ච සුවූපසන්තං ච.

11. අපරෙහිපි භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං ධම්මකම්මං ච හොති විනයකම්මං ච සුවූපසන්තං ච: සාරෙත්වා කතං හොති, ධම්මෙන කතං හොති, සමග්ගෙන කතං හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං ධම්මකම්මං ච හොති විනයකම්මං ච සුවූපසන්තං ච.

12. අපරෙහිපි භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං ධම්මකම්මං ච හොති විනයකම්මං ච සුවූපසන්තං ච: ආපත්තිං ආරොපෙත්වා කතං හොති, ධම්මෙන කතං හොති, සමග්ගෙන කතං හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තජ්ජනීයකම්මං ධම්මකම්මං ච හොති විනයකම්මං ච සුවූපසන්තං ච.

ධම්මකම්මද්වාදසකං නිට්ඨිතං.

ආකඞ්ඛමානඡක්කං

1. තීහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ආකඞ්ඛමානො සඞ්ඝො තජ්ජනීයකම්මං කරෙය්‍ය: භණ්ඩනකාරකො හොති කලහකාරකො විවාදකාරකො භස්සකාරකො සඞ්ඝෙ අධිකරණකාරකො, බාලො හොති අබ්‍යත්තො, ආපත්තිබහුලො අනපදානො, ගිහිසංසට්ඨො විහරති අනනුලොමිකෙහි ගිහිසංසග්ගෙහි. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ආකඞ්ඛමානො සඞ්ඝො තජ්ජනීයකම්මං කරෙය්‍ය.

8. මහණෙනි, අන්‍ය වූ ද අඞ්ග තුණෙකින් සමන්විත තජ්ජනීය කම්මය ධම්මකම්මයෙක් ද විනයකම්මයෙක් ද මනා ලෙස සංහිඳුනෙක් ද වෙයි: දෙසීමෙන් පිරිසිඳු වන ඇවැතෙහි කරණ ලද්දේ වේ ද, ධම්මයෙන් කරණ ලද්දේ වේ ද, සමග්‍ර සංඝයා විසින් කරණ ලද්දේ වේ ද, මහණෙනි, මේ අඞ්ග තුණෙන් සමන්විත තජ්ජනීයකම්මය ධම්මකම්මයෙක් ද විනයකම්මයෙක් ද මනා ලෙස සංහිඳුනෙක් ද වෙයි.

9. මහණෙනි, අන්‍ය වූ ද අඞ්ග තුණෙකින් සමන්විත තජ්ජනීය කම්මය ධාර්මිකකම්මයෙක් ද විනයකම්මයෙක් ද මනා ලෙස සංහිඳුනෙක් ද වෙයි: නොදෙසූ ඇවතෙහි කරණ ලද්දේ වේ ද, ධම්මයෙන් කරණ ලද්දේ වේ ද, සමග්‍ර සංඝයා විසින් කරණ ලද්දේ වේ ද, මහණෙනි, මේ අඞ්ග තුණෙන් සමන්විත තජ්ජනීයකම්මය ධම්මකම්මයෙක් ද විනයකම්මයෙක් ද මනා ලෙස සංහිඳුනෙක් ද වෙයි.

10. මහණෙනි, අන්‍ය වූත් අඞ්ග තුණෙකින් සමන්විත තජ්ජනීය කම්මය ධම්මකම්මයෙක් ද විනයකම්මයෙක් ද මනා ලෙස සංහිඳුනෙක් ද වෙයි. චොදනා කොට කරණ ලද්දේ වේ ද, ධම්මයෙන් කරණ ලද්දේ වේ ද, සමග්‍ර සංඝයා විසින් කරණ ලද්දේ වේ ද, මහණෙනි, මේ අඞ්ග තුණෙන් සමන්විත තජ්ජනීයකම්මය ධම්මකම්මයෙක් ද විනයකම්මයෙක් ද මනා ලෙස සංහිඳුනෙක් ද වෙයි.

11. මහණෙනි, අන්‍ය වූත් අඞ්ග තුණෙකින් සමන්විත තජ්ජනීය-කම්මය ධම්මකම්මයෙක් ද විනයකම්මයෙක් ද මනා ලෙස සංහිඳුනෙක් ද වෙයි: සිහිපත් කරවා කරණ ලද්දේ වේ ද, ධම්මයෙන් කරණ ලද්දේ වේද, සමග්‍ර සංඝයා විසින් කරණ ලද්දේ වේ ද, මහණෙනි, මේ අඞ්ග තුණින් සමන්විත තජ්ජනීයකම්මය ධම්මකම්මයෙක් ද විනයකම්මයෙක් ද මනා ලෙස සංහිඳුනෙක් ද වෙයි.

12. මහණෙනි, අන්‍යවූත් අඞ්ග තුණෙකින් සමන්විත තජ්ජනීයකම්මය ධම්මකම්මයෙක් ද විනයකම්මයෙක් ද මනාලෙස සංහිඳුනෙක් ද වෙයි. ඇවැත නංවා කරණ ලද්දේ වේ ද, ධම්මයෙන් කරණ ලද්දේ වේ ද, සමග්‍ර සංඝයා විසින් කරණ ලද්දේ වේ ද, මහණෙනි, මේ අඞ්ග තුණෙන් සමන්විත තජ්ජනීයකම්මය ධම්මකම්මයෙක් ද විනයකම්මයෙක් ද මනා ලෙස සංහිඳුනෙක් ද වෙයි.

ධම්මකම්ම දොළොස නිමි.

ආකඞ්ඛමාන ඡක්කය

1. මහණෙනි, අඞ්ග තුණෙකින් යුක්ත මහණහට සංඝ තෙමේ කැමැත්තේ (නම්) තජ්ජනීයකම්මය කරන්නේ ය: ඩබර කරන්නේ කලහ කරන්නේ විරුද්ධවාද කරන්නේ වාක්කලහ කරන්නේ සංඝයා විෂයයෙහි අධිකරණ උපදවන්නේ වේ ද, යමක් ප්‍රකට කොට කීමෙහි අදක්ෂ වූ ඇවැත් බහුල කොට ඇති ආපත්තිපරිච්ඡෙදරහිත බාලයෙක් වේ ද, ගිහියන් හා එකට මිශ්‍ර වූයේ ශාසනයට අනුලොම් නොවූ ගෘහිසංසර්ගයෙන් යුක්ත වූයේ වෙසේ ද, මහණෙනි, මේ අඞ්ග තුණෙන් යුක්ත මහණහට සංඝ තෙමේ කැමැති නම් තජ්ජනීයකම්මය කරන්නේ ය.

2. අපරෙහිපි භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ආකඞ්ඛමානො සඞ්ඝො තජ්ජනීයකම්මං කරෙය්‍ය: අධිසීලෙ සීලවිපන්නො හොති, අජ්ඣාචාරෙ ආචාරවිපන්නො හොති, අතිදිට්ඨියා දිට්ඨිවිපන්නො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ආකඞ්ඛමානො සඞ්ඝො තජ්ජනීයකම්මං කරෙය්‍ය.

3. අපරෙහිපි භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ආකඞ්ඛමානො සඞ්ඝො තජ්ජනීයකම්මං කරෙය්‍ය: බුද්ධස්ස අවණ්ණං භාසති, ධම්මස්ස අවණ්ණං භාසති, සඞ්ඝස්ස අවණ්ණං භාසති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ආකඞ්ඛමානො සඞ්ඝො තජ්ජනීයකම්මං කරෙය්‍ය.

4. තිණ්ණං භික්ඛවෙ භික්ඛූනං ආකඞ්ඛමානො සඞ්ඝො තජ්ජනීයකම්මං කරෙය්‍ය: එකො භණ්ඩනකාරකො හොති කලහකාරකො විවාදකාරකො භස්සකාරකො සඞ්ඝෙ අධිකරණකාරකො, එකො බාලො හොති අව්‍යත්තො ආපත්ති බහුලො අනපදානො, එකො ගිහිසංසට්ඨො විහරති අනනුලොමිකෙහි ගිහිසංසග්ගෙහි. ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං භික්ඛූනං ආකඞ්ඛමානො සඞ්ඝො තජ්ජනීයකම්මං කරෙය්‍ය.

5. අපරෙසම්පි භික්ඛවෙ තිණ්ණං භික්ඛූනං ආකඞ්ඛමානො සඞ්ඝො තජ්ජනීයකම්මං කරෙය්‍ය: එකො අධිසීලෙ සීලවිපන්නො හොති, එකො අජ්ඣාචාරෙ ආචාරවිපන්නො හොති, එකො අතිදිට්ඨියා දිට්ඨිවිපන්නො හොති. ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං භික්ඛූනං ආකඞ්ඛමානො සඞ්ඝො තජ්ජනීයකම්මං කරෙය්‍ය.

6. අපරෙසම්පි භික්ඛවෙ තිණ්ණං භික්ඛූනං ආකඞ්ඛමානො සඞ්ඝො තජ්ජනීයකම්මං කරෙය්‍ය: එකො බුද්ධස්ස අවණ්ණං භාසති, එකො ධම්මස්ස අවණ්ණං භාසති, එකො සඞ්ඝස්ස අවණ්ණං භාසති. ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං භික්ඛූනං අකඞ්ඛමානො සඞ්ඝො තජ්ජනීයකම්මං කරෙය්‍ය.

ආකඞ්ඛමානඡක්කං නිට්ඨිතං.

2. මහණෙනි, අන්‍ය වූත් අඞ්ග තුණෙකින් යුක්ත මහණහට සංඝ තෙමේ කැමැති වන්නේ නම්, තජ්ජනීයකර්මය කරන්නේ ය: උත්තම ශීලයෙහි විපත් (නට) සිල් ඇත්තේ වේ ද, උත්තමආචාරයෙහි විපත් ආචාර ඇත්තේ වේ ද, උතුම් වූ සම්‍යග්දෘෂ්ටියෙහි විපත් දිටු ඇත්තේ වේ ද, මහණෙනි, මේ අඞ්ග තුණෙන් යුක්ත මහණහට සංඝ තෙමේ කැමැති වන්නේ නම්, තජ්ජනීයකර්මය කරන්නේ ය.

3. මහණෙනි, අන්‍ය වූ ද අඞ්ග තුණෙකින් යුක්ත වූ මහණහට සංඝ තෙමේ කැමැති වන්නේ නම්, තජ්ජනීයකර්මය කරන්නේ ය: බුදුරුවන්හි අගුණ කියා ද, දම්රුවන්හි අගුණ කියා ද, සඟුරුවන්හි අගුණ කියා ද, මහණෙනි, මේ අඞ්ග තුණෙන් යුක්ත මහණහට සංඝ තෙමේ කැමැති වන්නේ නම්, තජ්ජනීයකර්මය කරන්නේ ය.

4. මහණෙනි, භික්ෂූන් තිදෙනෙකුන්හට සංඝ තෙමේ කැමැති වන්නේ නම්, තජ්ජනීයකර්මය කරන්නේ ය: එක් මහණෙක් ඩබර කරන්නේ කලහ කරන්නේ විවාද කරන්නේ වාක්කලහ කරන්නේ සංඝයා විෂය-යෙහි අධිකරණ ඇති කරන්නේ වේ ද, එකෙක් යමක් ප්‍රකට කොට කීමෙහි අදක්ෂ වූයේ ඇවැත් බහුල කොට ඇත්තේ පරිච්ඡෙදරහිත ඇවැත් ඇත්තේ බාලයෙක් වේ ද, එකෙක් ගිහීන් හා එකට මිශ්‍ර වූයේ ශාසනානුලොම නොවූ ගෘහීසංසර්ගයෙන් යුක්ත වූයේ වෙසේ ද, මහණෙනි, මේ භික්ෂූන් තිදෙනාට සංඝ තෙමේ කැමැති වන්නේ නම්, තජ්ජනීයකර්මය කරන්නේ ය.

5. මහණෙනි, අන්‍ය වූත් භික්ෂූන් තිදෙනෙකුන්හට සංඝ තෙමේ කැමැති වන්නේ නම්, තජ්ජනීයකර්මය කරන්නේ ය: එකෙක් උත්තම ශීලයෙහි විපත් සිල් ඇත්තේ වේ ද, එකෙක් උතුම් ආචාරයෙහි විපත් ආචාර ඇත්තේ වේ ද, එකෙක් උතුම් දෘෂ්ටියෙහි විපත් දිටු ඇත්තේ වේ ද, මහණෙනි, මේ භික්ෂූන් තිදෙනාට සංඝ තෙමේ කැමැති වන්නේ නම්, තජ්ජනීයකර්මය කරන්නේ ය.

6. මහණෙනි, අන්‍ය වූ ද භික්ෂූන් තිදෙනෙකුන්හට සංඝ තෙමේ කැමැති වන්නේ නම්, තජ්ජනීයකර්මය කරන්නේ ය. එක් මහණෙක් බුදුරුවන්හි අගුණ කියයි ද, එක් මහණෙක් දම්රුවන්හි අගුණ කියයි ද, එක් මහණෙක් සඟුරුවන්හි අගුණ කියයි ද, මහණෙනි, මේ භික්ෂූන් තිදෙනාට සංඝ තෙමේ කැමැති වන්නේ තජ්ජනීයකර්මය කරන්නේ ය.

තජ්ජනීයකර්මය කිරීමට කැමැති වන්නන් පිළිබඳ ෂට්කය නිමි.

අට්ඨාරසවත්තං

1. තජ්ජනීයකම්මකතෙන භික්ඛවෙ භික්ඛුනා සම්මා වත්තිතබ්බං. තත්‍රායං සම්මාවත්තනා: න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො. න භික්ඛුනොවාදකසම්මුති[1] සාදිතබ්බා. සම්මතෙනපි භික්ඛුනියො න ඔවදිතබ්බා. යාය ආපත්තියා සඞ්ඝෙන තජ්ජනීයකම්මං කතං හොති සා ආපත්ති න ආපජ්ජිතබ්බා, අඤ්ඤා වා තාදිසිකා, තතො වා පාපිට්ඨතරා. කම්මං න ගරහිතබ්බං. කම්මිකා න ගරහිතබ්බා. න පකතත්තස්ස භික්ඛුනො උපොසථො ඨපෙතබ්බො. න පවාරණා ඨපෙතබ්බා. න සවචනීයං කාතබ්බං. න අනුවාදො පට්ඨපෙතබ්බො. න ඔකාසො කාරෙතබ්බො. න චොදෙතබ්බො. න සාරෙතබ්බො. න භික්ඛූහි සම්පයොජෙතබ්බන්ති.

අට්ඨාරසවත්තං නිට්ඨිතං.

නපටිප්පස්සම්භෙතබ්බඅට්ඨාරසකං

1. අථ ඛො සඞ්ඝො පණ්ඩුකලොහිතකානං භික්ඛූනං තජ්ජනීයකම්මං අකාසි. තෙ සඞ්ඝෙන තජ්ජනීයකම්මකතා සම්මා වත්තන්ති, ලොමං පාතෙන්ති, නෙත්ථාරං වත්තන්ති, භික්ඛූ උපසඞ්කමිත්වා එවං වදෙන්ති: මයං ආවුසො සඞ්ඝෙන තජ්ජනීයකම්මකතා සම්මා වත්තාම, ලොමං පාතෙම, නෙත්ථාරං වත්තාම, කථන්නු ඛො අම්හෙහි පටිපජ්ජිතබ්බන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. "තෙන හි භික්ඛවෙ සඞ්ඝො පණ්ඩුකලොහිතකානං භික්ඛූනං තජ්ජනීයකම්මං පටිප්පස්සම්භෙතු."

2. පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො තජ්ජනීයකම්මං න පටිප්පස්සම්භෙතබ්බං: උපසම්පාදෙති, නිස්සයං දෙති, සාමණෙරං උපට්ඨාපෙති, භික්ඛුනොවාදකසම්මුතිං සාදියති, සම්මතො'පි භික්ඛුනියො ඔවදති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො තජ්ජනීයකම්මං න පටිප්පස්සම්භෙතබ්බං.

3. අපරෙහි'පි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො තජ්ජනීයකම්මං න පටිප්පස්සම්භෙතබ්බං: යාය ආපත්තියා සඞ්ඝෙන තජ්ජනීයකම්මං කතං හොති තං ආපත්තිං ආපජ්ජති, අඤ්ඤං වා තාදිසිකං, තතො වා පාපිට්ඨතරං. කම්මං ගරහති. කම්මිකෙ ගරහති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො තජ්ජනීයකම්මං න පටිප්පස්සම්භෙතබ්බං.

---

1. භික්ඛු භික්ඛුනි, ස්‍යා.

අටොළොස් වත

1. මහණෙනි, තජ්ජනීයකර්මය කරණු ලැබූ මහණ විසින් මනා ව පැවැතිය යුතු යි. මේ එහි ලා මනා පැවැත්ම යි: තමා උපාධ්‍යාය වී උපසම්පදා කම් නො කළ යුතු යි. නිස නො දිය යුතු යි. හෙරණකු තමනට උවටන් පිණිස නො ගත යුතු යි. භික්ෂුණීඕවාදකසම්මතිය නො පිළිගත යුතු යි. සම්මතිය ලද්දහු විසින් ද මෙහෙණන්හට අවවාද නො කළ යුතු යි. යම් ඇවැතක් කරණ කොට සංඝයා විසින් තජ්ජනීයකර්මය කරණ ලද්දේ ද, ඒ ඇවැතට නැවත නො පැමිණිය යුතු යි. එබඳු අනෙක් ඇවැතකට හෝ නො පැමිණිය යුතු යි. එයටත් වඩා පවිටු ඇවැතකට හෝ නො පැමිණිය යුතු යි. විනයකර්මය නො ගැරහිය යුතු යි. තජ්ජනීයකර්මය කළ භික්ෂූහු නො ගැරහිය යුත්තාහ. පුවතක් මහණහුගේ උපොසථකර්මය නො තැබිය යුතු යි. පවාරණය නො තැබිය යුතු යි. සවචනීය කර්මය නොකළ යුතු යි. විහාරයෙහි දෙවුනනතුර නො දුරිය යුතු යි. චොදනාවට අවසර නොගත යුතු යි. (පියෙවි මහණකුට) චොදනා නො කළ යුතු යි. ඇවැත් සිහිපත් නො කරවිය යුතු යි. භික්ෂූන් භික්ෂූන් හා කලහයට නො යෙදිය යුතු යි.

අටොළොස් වත නිමි.

නොසංහිඳුවිය යුතු අටොළොස් වත

1. ඉක්බිති සංඝ තෙමෙ පණ්ඩුකලොහිතක භික්ෂූන්හට තජ්ජනීය කර්මය කෙළේ ය. සංඝයා විසින් තජ්ජනීයකර්මය කරණු ලැබූ ඔහු මනා ව පවතිත්. භික්ෂූන් අනුව හැසිරෙත්. නිස්තරණ වත් පුරත්. භික්ෂූන් වෙත එළඹ, "ඇවැත්නි, සංඝයා විසින් තජ්ජනීයකර්මය කරණු ලැබූ අපි මනා ව පවතිමු, අනුලොම් ව පවතිමු, වරදින් මිදෙනු වස් පැවැතිය යුතු වත පුරමු. අප විසින් කෙසේ පිළිපැදිය යුතු ද?'යි මෙසේ කියත්. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැළ කළහ. (එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක:) "මහණෙනි, එසේ නම් සංඝ තෙමේ පණ්ඩුකලොහිතක භික්ෂූන්ගේ තජ්ජනීයකර්මය සංහිඳුවාවා."

2. මහණෙනි, අඞ්ග පසෙකින් යුක්ත මහණහුගේ තජ්ජනීයකර්මය නො සංහිඳුවිය යුතු යි: උපසම්පදා කම් කරයි ද, නිස දෙයි ද, හෙරණකු ලවා උවටැන් කරවා ගණී ද, මෙහෙණනට ඔවා දීමේ සම්මතිය පිළිගණී ද, සම්මත කරණු ලැබූයේත් මෙහෙණනට ඔවා දේ ද, මහණෙනි, මේ අඞ්ග පසින් යුක්ත මහණහුගේ තජ්ජනීයකර්මය නො සංහිඳුවිය යුතු යි.

3. මහණෙනි, අන්‍යවූත් අඞ්ග පසෙකින් යුක්ත මහණහුගේ තජ්ජනීයකර්මය නො සංහිඳුවිය යුතු යි: යම් ඇවැතක් කරණ කොට සංඝයා විසින් තජ්ජනීයකර්මය කරණ ලද ද, ඒ ඇවැතට නැවත පැමිණෙයි ද, එබඳු අන් ඇවැතකට හෝ පැමිණෙයි ද, එයට වඩා පවිටු ඇවැතකට හෝ පැමිණෙයි ද, විනයකර්මය ගරහයි ද, කාරක සඟනට ගරහයි ද, මහණෙනි, මේ අඞ්ග පසෙන් යුක්ත මහණහුගේ තජ්ජනීයකර්මය නො සංහිඳුවිය යුතු යි.

4. අට්ඨහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො තජ්ජනීයකම්මං න පටිප්පස්සම්භෙතබ්බං: පකතත්තස්ස භික්ඛුනො උපොසථං ඨපෙති, පවාරණං ඨපෙති, සවචනීයං කරොති, අනුවාදං පට්ඨපෙති, ඔකාසං කාරෙති, චොදෙති, සාරෙති, භික්ඛූහි සම්පයොජෙති. ඉමෙහි ඛො භික්ඛවෙ අට්ඨහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො තජ්ජනීයකම්මං න පටිප්පස්සම්භෙතබ්බං.

න පටිප්පස්සම්භෙතබ්බඅට්ඨාරසකං නිට්ඨිතං.

පටිප්පස්සම්භෙතබ්බඅට්ඨාරසකං

1. පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො තජ්ජනීයකම්මං පටිප්පස්සම්භෙතබ්බං: න උපසම්පාදෙති, න නිස්සයං දෙති, න සාමණෙරං උපට්ඨපෙති, න භික්ඛුනොවාදකසම්මතිං සාදියති, සම්මතො'පි භික්ඛුනියො න ඔවදති, ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො තජ්ජනීයකම්මං පටිප්පස්සම්භෙතබ්බං.

2. අපරෙහි'පි භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො තජ්ජනීයකම්මං පටිප්පස්සම්භෙතබ්බං: යාය ආපත්තියා සඞ්ඝෙන තජ්ජනීයකම්මං කතං හොති තං ආපත්තිං න ආපජ්ජති, අඤ්ඤං වා තාදිසිකං, තතො වා පාපිට්ඨතරං. කම්මං න ගරහති. කම්මිකෙ න ගරහති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො තජ්ජනීයකම්මං පටිප්පස්සම්භෙතබ්බං.

3. අට්ඨහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො තජ්ජනීයකම්මං පටිප්පස්සම්භෙතබ්බං: න පකතත්තස්ස භික්ඛුනො උපොසථං ඨපෙති, න පවාරණං ඨපෙති, න සවචනීයං කරොති, න අනුවාදං පට්ඨපෙති, න ඔකාසං කාරෙති, න චොදෙති, න සාරෙති, න භික්ඛූහි සම්පයොජෙති. ඉමෙහි ඛො භික්ඛවෙ අට්ඨහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො තජ්ජනීයකම්මං පටිප්පස්සම්භෙතබ්බං.

පටිප්පස්සම්භෙතබ්බඅට්ඨාරසකං නිට්ඨිතං.

[**පටිප්පස්සම්භනං**]

1. එවඤ්ච පන භික්ඛවෙ පටිප්පස්සම්භෙතබ්බං: තෙහි භික්ඛවෙ පණ්ඩුකලොහිතකෙහි භික්ඛූහි සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා වුඩ්ඪානං භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: "මයං භන්තෙ සඞ්ඝෙන තජ්ජනීයකම්මකතා සම්මා වත්තාම, ලොමං පාතෙම, නෙත්ථාරං වත්තාම, තජ්ජනීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධිං යාචාමා"ති. දුතියම්පි යාචිතබ්බා, තතියම්පි යාචිතබ්බා. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

4. මහණෙනි, අඞ්ග අටෙකින් යුක්ත මහණහුගේ තජ්ජනීයකර්මය නො නැවැත්විය යුතු සි: ශුද්ධ භික්ෂුවගේ උපෝසථය තබයි ද, පවාරණය තබයි ද, සවචනීයකර්මය කරයි ද, වෙහෙර දෙවුකම් කරයි ද, චෝදනාවට අවසර ගණී ද, චෝදනා කරයි ද, ඇවැත් සිහිපත් කරවයි ද, භික්ෂූන් භික්ෂූන් හා කලහයට යොදයි ද, මහණෙනි, මේ අඞ්ග අටෙන් යුක්ත මහණහුගේ තජ්ජනීයකර්මය නො සංහිඳුවිය යුතු සි.

නොසංහිඳුවිය යුතු අඞ්ග අටොළොස නිමි.

සංහිඳුවිය යුතු අටොළොස

1. "මහණෙනි, අඞ්ග පසෙකින් යුක්ත මහණහුගේ තජ්ජනීයකර්මය සංහිඳුවිය යුතු යි: උපසම්පදා කම් නොකරයි ද, නිස නො දෙයි ද, හෙරණකු ලවා උවටැන් කරවා නො ගණී ද, මෙහෙණනට ඔවා දීමේ සම්මතිය නො පිළිගණී ද, සම්මතිය ලදුයේ ද මෙහෙණනට ඔවා නො දෙයි ද, මහණෙනි, මේ අඞ්ග පසින් යුක්ත මහණහුගේ තජ්ජනීයකර්මය සංහිඳුවිය යුතු සි.

2. මහණෙනි, අන්‍ය වූ ද අඞ්ග පසෙකින් යුක්ත මහණහට කළ තජ්ජනීයකර්මය සංහිඳුවිය යුතු සි. යම් ඇවැතක් නිසා සංඝයා විසින් තජ්ජනීයකර්මය කරණ ලද්දේ වේ නම් ඒ ඇවැතට නැවත නො පැමිණෙයි ද, එබඳු අන් ඇවැතකටත් නො පැමිණෙයි ද, එයටත් වඩා පවිටු ඇවැතකට හෝ නො පැමිණෙයි ද, විනයකර්මයට නො ගරහයි ද, කර්මය කළ සංඝයාට නො ගරහයි ද, මහණෙනි, මේ අඞ්ග පසින් යුක්ත මහණහට කළ තජ්ජනීයකර්මය සංහිඳුවිය යුතු සි.

3. මහණෙනි, අඞ්ග අටෙකින් යුක්ත මහණහුගේ තජ්ජනීයකර්මය සංහිඳුවිය යුතු සි: පුවතත් මහණහුගේ උපෝසථය නො තබයි ද, පවාරණය නො තබයි ද, සවචනීයකර්මය නො කරයි ද, වෙහෙර දෙවු තනතුර නො දරයි ද, චෝදනාවට අවසර නො ගණී ද, චෝදනා නො කරයි ද, ඇවැත් සිහිපත් නො කරවයි ද, භික්ෂූන් භික්ෂූන් හා කලහයට නො යොදයි ද, මහණෙනි, මේ අඞ්ග අටෙන් යුක්ත මහණහට කළ තජ්ජනීයකර්මය සංහිඳුවිය යුතු සි.

සංහිඳුවිය යුතු අටොළොස නිමි.

[සංහිඳුවීම]

1. මහණෙනි, මෙසේ තජ්ජනීයකර්මය සංහිඳුවිය යුතු සි: මහණෙනි ඒ පණ්ඩුකලොහිතක භික්ෂූන් විසින් සංඝයා වෙත එළඹ උතුරුසඟ සිවුර එකස් කොට පොරොවා වැඩි මහලු භික්ෂූන්ගේ පා වැඳ, උළුළු යෙන් හිඳ ඇඳිලි බැඳ මෙසේ කිය යුතු වෙයි: "ස්වාමීනි, සංඝයා විසින් තජ්ජනීයකර්මය කරණු ලැබූ අපි මනා ව පවතිමු. භික්ෂූනට අනුව පවතිමු, නිස්තරණ වතෙහි පවතිමු. තජ්ජනීයකර්මයාගේ සංහිඳුවීම යදිමු" යනු සි. දෙවනුවත් යැදිය යුතු සි, තෙවනුවත් යැදිය යුතු සි. ව්‍යක්ත වූ ප්‍රතිබල මහණකු විසින් සංඝ තෙමේ දැන්විය යුතු සි:

2. "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, ඉමෙ පණ්ඩුකලොහිතකා භික්ඛූ සඞ්ඝෙන තජ්ජනීයකම්මකතා සම්මා වත්තන්ති, ලොමං පාතෙන්ති, නෙත්ථාරං වත්තන්ති, තජ්ජනීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධිං යාචන්ති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො පණ්ඩුකලොහිතකානං භික්ඛූනං තජ්ජනීයකම්මං පටිප්පස්සම්භෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉමෙ පණ්ඩුකලොහිතකා භික්ඛූ සඞ්ඝෙන තජ්ජනීයකම්මකතා සම්මා වත්තන්ති, ලොමං පාතෙන්ති, නෙත්ථාරං වත්තන්ති, තජ්ජනීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධිං යාචන්ති. සඞ්ඝො පණ්ඩුකලොහිතකානං භික්ඛූනං තජ්ජනීයකම්මං පටිප්පස්සම්භෙති. යස්සායස්මතො ඛමති පණ්ඩුකලොහිතකානං භික්ඛූනං තජ්ජනීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධි, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දුතියම්පි එතමත්ථං වදාමි: සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉමෙ පණ්ඩුකලොහිතකා භික්ඛූ සඞ්ඝෙන තජ්ජනීයකම්මකතා සම්මා වත්තන්ති, ලොමං පාතෙන්ති, නෙත්ථාරං වත්තන්ති, තජ්ජනීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධිං යාචන්ති. සඞ්ඝො පණ්ඩුකලොහිතකානං භික්ඛූනං තජ්ජනීයකම්මං පටිප්පස්සම්භෙති. යස්සායස්මතො ඛමති පණ්ඩුක-ලොහිතකානං භික්ඛූනං තජ්ජනීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධි, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉමෙ පණ්ඩුකලොහිතකා භික්ඛූ සඞ්ඝෙන තජ්ජනීයකම්මකතා සම්මා වත්තන්ති, ලොමං පාතෙන්ති, නෙත්ථාරං වත්තන්ති, තජ්ජනීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධිං යාචන්ති. සඞ්ඝො පණ්ඩුකලොහිතකානං භික්ඛූනං තජ්ජනීයකම්මං පටිප්පස්සම්භෙති. යස්සායස්මතො ඛමති පණ්ඩුකලොහිත-කානං භික්ඛූනං තජ්ජනීයස්ස කම්මස්ස පටිප්පස්සද්ධි, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

පටිප්පස්සද්ධං සඞ්ඝෙන පණ්ඩුකලොහිතකානං භික්ඛූනං තජ්ජනීය-කම්මං. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී"ති.

තජ්ජනීයකම්මං නිට්ඨිතං පඨමං.

2. "වහන්ස, සංඝ තෙමේ මා කියන්න අසාවා. මේ පණ්ඩුක- ලොහිතක භික්ෂූහු සංඝයා විසින් තජ්ජනීයකර්මය කරණු ලැබූවාහු මනා ව පවතිත්. භික්ෂූන්හට අනුකූල ව පවතිත්. නිස්තරණ වතෙහි පිහිටා සිටිත්. තජ්ජනීයකර්මයාගේ සංහිඳුවීම යදිත්. ඉදින් සංඝයාට පැමිණි කල් ඇත්තේ නම් සංඝ තෙමේ පණ්ඩුකලොහිතක භික්ෂූන්හට තජ්ජනීයකර්මය සංහිඳු- වන්නේ ය. මේ ඥප්තිය යි.

වහන්ස, සංඝ තෙමේ මාගේ වචනය අසාවා. මේ පණ්ඩුකලොහිතක භික්ෂූහු සංඝයා විසින් තජ්ජනීයකර්මය කරණු ලැබූවාහු මනා ව පවතිත්. භික්ෂූන්හට අනුකූල ව පවතිත්. නිස්තරණ වතෙහි (වරදින් මිදෙනු වස් පැවැතිය යුතු වතෙහි) පවතිත්. තජ්ජනීයකර්මයාගේ සංහිඳුවීම යදිත්. සංඝ තෙමේ පණ්ඩුකලොහිතක භික්ෂූන්හට තජ්ජනීයකර්මය සංහිඳුවයි. පණ්ඩුකලොහිතක භික්ෂූන්ගේ තජ්ජනීයකර්මය සංහිඳුවීම යම් ආයුෂ්මතක් හට රුචි වෙයි ද, හෙ තෙමේ නිශශබ්ද වේවා. යමකුට රුචි නො වෙයි නම්, හෙ තෙමේ කියාවා.

දෙවනුවත් මේ කරුණ කියමි. වහන්ස, සංඝ තෙමේ මාගේ වචනය අසාවා. මේ පණ්ඩුකලොහිතක භික්ෂූහු සංඝයා විසින් තජ්ජනීය- කර්මය කරණු ලැබූවාහු මනා සේ පවතිත්. භික්ෂූන්හට අනුකූල ව පවතිත්. නිස්තරණ වතෙහි පවතිත්. තජ්ජනීයකර්මයාගේ සංහිඳුවීම යදිත්. සංඝ තෙමේ පණ්ඩුකලොහිතක භික්ෂූන්ගේ තජ්ජනීයකර්මය සංහිඳුවයි. පණ්ඩුකලොහිතක භික්ෂූන්ගේ තජ්ජනීයකර්මය නැවැත්වීම යම් ආයුෂ්මතක් හට රුචි වෙයි ද, හෙ තෙමේ නිහඬ වේවා. යමකුට රුචි නො වෙයි නම්, හෙ තෙමේ කියාවා.

තෙවෙනිවත් මේ කරුණ කියමි. වහන්ස, සංඝ තෙමේ මාගේ වචනය අසාවා. මේ පණ්ඩුකලොහිතක භික්ෂූහු සංඝයා විසින් තජ්ජනීයකර්මය කරණු ලැබූවාහු මනා ව පවතිත්. භික්ෂූන් අනුව පවතිත්. නිස්තරණ වතෙහි පවතිත්. තජ්ජනීයකර්මයාගේ සංහිඳුවීම යදිත්. සංඝ තෙමේ පණ්ඩුකලොහිතක භික්ෂූන්ගේ තජ්ජනීයකර්මය සංහිඳුවයි. පණ්ඩුකලොහිතක භික්ෂූන්ගේ තජ්ජනීයකර්මය සංහිඳුවීම යම් ආයුෂ්මතක් හට රුචි වෙයි ද, හෙ තෙමේ නිහඬ වේවා. යමකුට රුචි නො වෙයි නම්, හෙ තෙමේ කියාවා.

පණ්ඩුකලොහිතක භික්ෂූන්ගේ තජ්ජනීයකර්මය සංඝයා විසින් සංහිඳුවන ලදී. සංඝයාට එය රුචි වෙයි. එහෙයින් නිහඬ ය. මෙය මෙසේ සලකමි" යනු යි.

පළමුවන තජ්ජනීයකර්මය නිමි.

2. නියස්සකම්මං

1. තෙන ඛො පන සමයෙන ආයස්මා සෙය්‍යසකො බාලො හොති, අව්‍යත්තො ආපත්තිබහුලො අනපදානො, ගිහිසංසට්ඨො විහරති අනනුලොමිකෙහි ගිහිසංසග්ගෙහි. අපිස්සු භික්ඛූ පකතා පරිවාසං දෙන්තා, මූලාය පටිකස්සන්තා, මානත්තං දෙන්තා, අබ්භෙන්තා.

2. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා, -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා සෙය්‍යසකො බාලො භවිස්සති අබ්‍යත්තො ආපත්තිබහුලො අනපදානො, ගිහිසංසට්ඨො විහරිස්සති අනනුලොමිකෙහි ගිහිසංසග්ගෙහි. අපිස්සු භික්ඛූ පකතා පරිවාසං දෙන්තා, මූලාය පටිකස්සන්තා, මානත්තං දෙන්තා, අබ්භෙන්තා"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

3. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛු-සඞ්ඝං සන්නිපාතාපෙත්වා භික්ඛූ පටිපුච්ඡි:

"සච්චං කිර භික්ඛවෙ සෙය්‍යසකො භික්ඛු බාලො හොති අබ්‍යත්තො ආපත්තිබහුලො අනපදානො, ගිහිසංසට්ඨො විහරති අනනුලොමිකෙහි ගිහිසංසග්ගෙහි. අපිස්සු භික්ඛූ පකතා පරිවාසං දෙන්තා, මූලාය පටිකස්සන්තා, මානත්තං දෙන්තා, අබ්භෙන්තා"ති. "සච්චං භගවා".

සො සඞ්ඝං පුරිමා ආපත්තීනං අන්තරා ආපත්තීනඤ්ච අපරා ආපත්තීනං අන්තරා ආපත්තීනඤ්ච මූලායපටිකස්සනං යාචති ධම්මිකෙන කම්මෙන අකුප්පෙන ඨානාරහෙන, ධම්මෙන සමොධානපරිවාසං, ධම්මෙන මානත්තං, ධම්මෙන අබ්භානං. තං සඞ්ඝො පුරිමා ආපත්තීනං අන්තරා ආපත්තීනඤ්ච අපරා ආපත්තීනං අන්තරා අපත්තීනඤ්ච මූලායපටිකස්සති ධම්මිකෙන කම්මෙන අකුප්පෙන ඨානාරහෙන. ධම්මෙන සමොධානපරිවාසං දෙති. ධම්මෙන මානත්තං දෙති. ධම්මෙන අබ්භෙති. සො භික්ඛවෙ භික්ඛු විසුද්ධො තාහි ආපත්තීහී'ති.

දුතියමූලායපටිකස්සනවිසුද්ධිනවකං නිට්ඨිතං.

සමුච්චයක්ඛන්ධකං තතියං.

තස්සුද්දානං:

අප්පටිච්ඡන්නා එකාහ ද්වීහ තීහ චතුහ ච,
පඤ්චාහ පක්ඛදසානං ආපත්‍යාහ සුද්ධන්තො මුනි.

විබ්භන්තො පරිමාණාසු ද්වෙ භික්ඛු තතො සඤ්ඤිනො,
ද්වෙ වෙමතිකා මිස්සකදිට්ඨිනො මිස්සකෙ ගරුකදිට්ඨිනො.

මිස්සකෙ මිස්සකදිට්ඨිනො සුද්ධකෙ ගරුකදිට්ඨිනො,
සුද්ධදිට්ඨි ච ජාදෙති අථ පක්කමිතෙන ච.

උම්මත්තකදෙසනඤ්ච මූලායපටිවිසුද්ධකො,
ආචරියානං විභජ්ජවාදීනං තම්බපණ්ණිදීපපසාදකානං,
මහාවිහාරවාසීනං වාචනා සද්ධම්මට්ඨිතියාති.*

සමුච්චයක්ඛන්ධකං නිට්ඨිතං.

*උද්දානගාථානං ස්‍යාමමරම්මපොත්ථකෙසු බහුසො විසදිසතා දිස්සතෙ.

නො දැහැමින් සමෝදහන් පිරිවෙස දිනි. ඒ මම පිරිවෙසෙමි යි හඟනෙම් ඒ අතර පමණ වූ ද නො පමණ වූ ද පිළිසන් වූ ද නො පිළිසන් වූ ද බොහෝ සඟවෙසෙස් ඇවැත් අවන්මි. ඒ මම එබිම සිටියෙම් පළමු ඇවැතුන්ට අතර ඇවැත් සමරමි. පසු ඇවැතුන්ට අතර ඇවැත් ද සමරමි. මම සඞ්ඝයාගෙන් අකොප්‍ය වූ තැනට නිසි දැහැමිකම්හි පළමු ඇවැතුන්ට අතර ඇවැතුන් පිණිසත් පසු ඇවැතුන්ට අතර ඇවැතුන් පිණිසත් මුලට ඇදීම ද, දැහැමින් සමොදහන් පිරිවෙස ද, දැහැමින් මානත ද, දැහැමින් අබ්භානය ද, යදනෙම් නම් මැනවැ''යි.

හෙතෙමේ සඞ්ඝයාගෙන් අකොප්‍ය වූ තැනට නිසි ධාර්මිකකර්මයෙන් පළමු ආපත්තීන්ට අතර ආපත්තීන්ගේත් පසු ආපත්තීන්ට අතර ආපත්තීන්ගේත් මූලායපටිකස්සනය ද, දැහැමින් සමොධානපරිවාසය ද, දැහැමින් මානත ද, දැහැමින් අබ්භානය ද ඉල්ලයි. සඞ්ඝ තෙමේ ඔහුට අකොප්‍ය වූ ස්ථානාර්හ වූ ධාර්මිකකර්මයෙන් පළමු ඇවැතුන්ට අතර ඇවැතුන්ගේත් පසු ඇවැතුන්ට අතර ඇවැතුන්ගේත් මූලායපටිකස්සනය කෙරෙයි. දැහැමින් සමොධානපරිවාසය දෙයි. දැහැමින් මානත දෙයි. දැහැමින් අබ්භානකර්මය කෙරෙයි. මහණෙනි, ඒ මහණ තෙමේ ඒ ආපත්තීන්ගෙන් විශුද්ධ වූයේ වේ යි.

දෙවන මූලායපටිකස්සනවිසුද්ධිනවකය නිමියේ ය.

සමුච්චයක්ඛන්ධකය තෙවැනි යි.

එහි උද්දානය:

අපටිච්ඡන්න ය, එකාහපටිච්ඡන්න ය, ද්විහපටිච්ඡන්න ය, තීහ-පටිච්ඡන්න ය, චතුහපටිච්ඡන්න ය, පඤ්චාහපටිච්ඡන්න ය, පක්ඛ- දසාහ-පටිච්ඡන්න ය යන ඇවැත් ද සුද්ධන්තපරිවාසය ද මුනීන්ද්‍රයන් වහන්සේ වදාළ සේක

විබ්භන්තාදිවාර (සිවුසිය) ද, පරිමාණාදිවාර අට ද, ද්වෙභික්ඛුවාර එකොළොසහේ - ආපත්තිසඤ්ඤී ද, වෙමතික දෙදෙන ද, මිස්සකදිට්ඨී ද, මිස්සකයෙහි ගරුකදිට්ඨී ද,

මිස්සකයෙහි මිස්සකදිට්ඨී ද, සුද්ධකයෙහි ගරුකදිට්ඨී ද, සුද්ධදිට්ඨී ද, ආපත්තිඡාදනය ද, යලි පක්කමිත (මක්ඛධම්ම විසින් ආරොචනා නො කිරීම) සමග -

උම්මත්තක හා (පාමොක්) දෙසනා ද, මූලායපටිකස්සන- අවිසුද්ධි - විසුද්ධි (නවක තුන) ද යන මොහු තාම්‍රපර්ණිද්වීපප්‍රසාදක වූ මහාවිහාරවාසී විභජ්ජවාදී ආචාර්‍ය්‍යවරයන්ගේ ශාසනස්ථිතිය පිණිස වූ (චුල්ලවග්ග-සමුච්චයක්ඛන්ධකයෙහි) වාචනාමාර්ගයෝ යි.

සමුච්චයක්ඛන්ධකය නිමි.

4.

සමථක්ඛන්ධකං

1. සම්මුඛාවිනයො

තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ අසම්මුඛීභූතානං භික්ඛූනං කම්මානි කරොන්ති: තජ්ජනීයම්පි නියස්සම්පි පබ්බාජනීයම්පි පටිසාරණීයම්පි උක්ඛෙපනීයම්පි. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා, තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ අසම්මුඛීභූතානං භික්ඛූනං කම්මානි කරිස්සන්ති තජ්ජනීයම්පි නියස්සම්පි පබ්බාජනීයම්පි පටිසාරණීයම්පි උක්ඛෙපනීයම්පී"ති.

අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා භික්ඛූ පටිපුච්ඡි*:

සච්චං කිර භික්ඛවෙ ඡබ්බග්ගියා භික්ඛූ අසම්මුඛීභූතානං භික්ඛූනං කම්මානි කරොන්ති: තජ්ජනීයම්පි නියස්සම්පි පබ්බාජනීයම්පි පටිසාරණීයම්පි උක්ඛෙපනීයම්පීති. 'සච්චං භගවා[1]'. විගරහි බුද්ධො භගවා: අනනුච්ඡවිකං භික්ඛවෙ තෙසං මොඝපුරිසානං අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං. කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා අසම්මුඛීභූතානං භික්ඛූනං කම්මානි කරිස්සන්ති: තජ්ජනීයම්පි නියස්සම්පි පබ්බාජනීයම්පි පටිසාරණීයම්පි උක්ඛෙපනීයම්පි. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- විගරහිත්වා -පෙ-‡ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

"න භික්ඛවෙ අසම්මුඛීභූතානං භික්ඛූනං කම්මං කාතබ්බං තජ්ජනීයං වා නියස්සං වා පබ්බාජනීයං වා පටිසාරණීයං වා උක්ඛෙපනීයං වා, යො කරෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති.

අධම්මවාදීනවකං:[2]

අධම්මවාදී පුග්ගලො, අධම්මවාදී සම්බහුලා,[3] අධම්මවාදී සඞ්ඝො, ධම්මවාදී පුග්ගලො, ධම්මවාදී සම්බහුලා, ධම්මවාදී සඞ්ඝො.

1. අධම්මවාදී පුග්ගලො ධම්මවාදිං පුග්ගලං[4] සඤ්ඤාපෙති නිජ්ඣාපෙති පෙක්ඛෙති අනුපෙක්ඛෙති දස්සෙති අනුදස්සෙති: "අයං ධම්මො අයං විනයො, ඉදං සත්ථුසාසනං, ඉමං ගණ්හාහි, ඉමං රොචෙහී"ති. එවඤ්චෙ තං අධිකරණං වූපසම්මති, අධම්මෙන වූපසම්මති සම්මුඛාවිනයපතිරූපකෙන.

2. අධම්මවාදී පුග්ගලො ධම්මවාදී සම්බහුලෙ සඤ්ඤාපෙති නිජ්ඣාපෙති පෙක්ඛෙති අනුපෙක්ඛෙති දස්සෙති අනුදස්සෙති: "අයං ධම්මො, අයං විනයො, ඉදං සත්ථුසාසනං, ඉමං ගණ්හථ, ඉමං රොචෙථා"ති. එවඤ්චෙ තං අධිකරණං වූපසම්මති, අධම්මෙන වූපසම්මති සම්මුඛාවිනයපතිරූපකෙන.

---

1. භගවාති - මජසං, ස්‍යා. 2. කණ්හපක්ඛනවකානි පොත්ථකෙසු දිස්සන්ති.
3. අධම්මවාදිසම්බහුලා - සී 1, 2. 4. ධම්මවාදිපුග්ගලං - සීමු, සී 1, 2.
* පාඨොයං සීහලමුද්දිතපොත්ථකෙ න දිස්සති.
‡ පෙය්‍යාලෙහි සඞ්ඛිත්තට්ඨානානි කම්මක්ඛන්ධකෙ ආගතනයෙන වෙදිතබ්බානි.

4.

සමථක්ඛන්ධකය

1. සම්මුඛාවිනය

එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ සැවත්නුවර සමීපයෙහි අනේපිඬු සිටුහුගේ දෙව්රමෙහි වැඩ වසන සේක. එකල්හි සවග මහණහු නො හමු වූ මහණුන්ට තජ්ජනීය ද නියස්ස ද පබ්බාජනීය ද පටිසාරණීය ද උක්ඛෙපනීය ද යන කම් කෙරෙත්. අපිස් වූ සතොස් වූ ලජ්ජී වූ කුකුස් ඇති යම් ඒ මහණහු වෙත් ද, ඔහු කෙසේ නම් සවගමහණහු නො හමු වූ භික්ෂූන්ට තජ්ජනීය කම්යත් නියස්ස කම්යත් පබ්බාජනීය කම්යත් පටිසාරණීය කම්යත් උක්ඛෙපනීය කම්යත් කෙරෙත් දැ''යි අවමන් කෙරෙත්. දොස් කියත්. නුගුණ පතුරුවත්.

ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැළ කළහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ ප්‍රකරණ(ප්‍රස්තාව)යෙහි භික්ෂු සඞ්ඝයා රැස් කරවා භික්ෂූන් පිළිවිසි සේක:

මහණෙනි, සැබෑ ද? සවගමහණහු නො හමු වූ මහණුන්ට තජ්ජනීය කම්යත් නියස්ස කම්යත් පබ්බාජනීය කම්යත් පටිසාරණීය කම්යත් උක්ඛෙපනීය කම්යත් කෙරෙත් දැ යි. 'භාග්‍යවතුන් වහන්ස, සැබව.' භාග්‍යවත් බුදුරජානන් වහන්සේ ගැරහූ සේක. මහණෙනි, ඒ හිස් පුරුෂයන්ගේ නො නිසි ක්‍රියායෙකි. අනුලොම් නො වූවෙකි. පිළිරූ නො වූවෙකි. නො මහණකමෙකි. නො කැප වූවෙකි. නො කට යුත්තෙකි. මහණෙනි, කෙසේ නම් ඒ හිස් පුරුෂයෝ නො හමු වූ මහණුන්ට තජ්ජනීය කම්යත් නියස්ස කම්යත් පබ්බාජනීය කම්යත් පටිසාරණීය කම්යත් උක්ඛෙපනීය කම්යත් කළාහු ද? මහණෙනි, මෙය නො පහන් වූවන්ගේ පැහැදීම පිණිස නො වේ ... ගරහා ... දැහැමි කථා කොට භික්ෂූන් ඇමතූ සේක:

"මහණෙනි, නො හමු වූ මහණුන්ට තජ්ජනීය හෝ නියස්ස හෝ පබ්බාජනීය හෝ පටිසාරණීය හෝ උක්ඛෙපනීය හෝ කම්ය නො කළ යුතු. යමෙක් කෙරේ නම් ඔහුට දුකුළා වේ''යි.

අධම්වාදිනවකය:

අධම්මවාදී පුග්ගල ය, අධම්මවාදී සම්බහුල ය, අධම්මවාදී සඞ්ඝ ය, ධම්මවාදී පුග්ගල ය, ධම්මවාදී සම්බහුල ය, ධම්මවාදී සඞ්ඝ ය (යි මාතිකා සයෙකි.)

1. අධම්වාදී පුද්ගල තෙමේ "මේ ධම්ය, මේ විනය ය, මේ ශාස්තෘ-ශාසන ය, මෙය ගණුව, මෙය රුස්ව''යි ධම්වාදී පුද්ගලයාට හඟවයි. සිතවයි. දක්වයි. පුනපුනා දක්වයි. පෙන්වයි. පුනපුනා පෙන්වයි. ඉදින් මෙසේ ඒ අධිකරණය සන්හිදේ නම් සම්මුඛාවිනය පිළිරූ වූ නො දැහැමින් සන්හිදෙයි.

2. අධම්වාදී පුද්ගල තෙමේ "මේ ධම් ය, මේ විනය ය, මේ ශාස්තෘ-ශාසන ය, මෙය ගණිවූ, මෙය රුස්වවූ''යි ධම්වාදී බොහෝ මහණුන්ට හඟවයි. සිතවයි. දක්වයි. පුනපුනා දක්වයි. පෙන්වයි පුනපුනා පෙන්වයි ඉදින් මෙසේ ඒ අධිකරණය සන්හිදේ නම් සම්මුඛාවිනය පිළිරූ වූ නො දැහැමින් සන්හිදෙයි.

3. අධම්මවාදී පුග්ගලො ධම්මවාදිං සඞ්ඝං සඤ්ඤාපෙති නිජ්ඣාපෙති පෙක්ඛති අනුපෙක්ඛති දස්සෙති අනුදස්සෙති: "අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනං, ඉමං ගණ්හාහි, ඉමං රොචෙහී"ති. එවඤ්චෙ තං අධිකරණං වූපසම්මති, අධම්මෙන වූපසම්මති සම්මුඛාවිනයපතිරූපකෙන.

4. අධම්මවාදී සම්බහුලා ධම්මවාදිං පුග්ගලං[1] සඤ්ඤාපෙන්ති නිජ්ඣාපෙන්ති පෙක්ඛන්ති අනුපෙක්ඛන්ති දස්සෙන්ති අනුදස්සෙන්ති: "අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනං, ඉමං ගණ්හාහි, ඉමං රොචෙහී"ති. එවඤ්චෙ තං අධිකරණං වූපසම්මති, අධම්මෙන වූපසම්මති සම්මුඛාවිනයපතිරූපකෙන.

5. අධම්මවාදී සම්බහුලා ධම්මවාදී සම්බහුලෙ සඤ්ඤාපෙන්ති නිජ්ඣාපෙන්ති පෙක්ඛන්ති අනුපෙක්ඛන්ති දස්සෙන්ති අනුදස්සෙන්ති: "අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනං, ඉමං ගණ්හථ, ඉමං රොචෙථා"ති. එවඤ්චෙ තං අධිකරණං වූපසම්මති, අධම්මෙන වූපසම්මති සම්මුඛාවිනයපතිරූපකෙන.

6. අධම්මවාදී සම්බහුලා ධම්මවාදිං සඞ්ඝං[2] සඤ්ඤාපෙන්ති නිජ්ඣාපෙන්ති පෙක්ඛන්ති අනුපෙක්ඛන්ති දස්සෙන්ති අනුදස්සෙන්ති: "අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනං, ඉමං ගණ්හාහි, ඉමං රොචෙහී"ති. එවඤ්චෙ තං අධිකරණං වූපසම්මති, අධම්මෙන වූපසම්මති සම්මුඛාවිනයපතිරූපකෙන.

7. අධම්මවාදී සඞ්ඝො ධම්මවාදිං පුග්ගලං සඤ්ඤාපෙති නිජ්ඣාපෙති පෙක්ඛති අනුපෙක්ඛති දස්සෙති අනුදස්සෙති: "අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනං, ඉමං ගණ්හාහි, ඉමං රොචෙහී"ති. එවඤ්චෙ තං අධිකරණං වූපසම්මති, අධම්මෙන වූපසම්මති සම්මුඛාවිනයපතිරූපකෙන.

8. අධම්මවාදී සඞ්ඝො ධම්මවාදී සම්බහුලෙ සඤ්ඤාපෙති නිජ්ඣාපෙති පෙක්ඛති අනුපෙක්ඛති දස්සෙති අනුදස්සෙති: "අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනං, ඉමං ගණ්හථ, ඉමං රොචෙථා"ති. එවඤ්චෙ තං අධිකරණං වූපසම්මති, අධම්මෙන වූපසම්මති සම්මුඛාවිනයපතිරූපකෙන.

9. අධම්මවාදී සඞ්ඝො ධම්මවාදිං සඞ්ඝං සඤ්ඤාපෙති නිජ්ඣාපෙති පෙක්ඛති අනුපෙක්ඛති දස්සෙති අනුදස්සෙති: "අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනං, ඉමං ගණ්හාහි, ඉමං රොචෙහී"ති. එවඤ්චෙ තං අධිකරණං වූපසම්මති, අධම්මෙන වූපසම්මති සම්මුඛාවිනයපතිරූපකෙනාති.

අධම්මවාදිනවකං නිට්ඨිතං.

ධම්මවාදිනවකං:

1. ධම්මවාදී පුග්ගලො අධම්මවාදිං පුග්ගලං සඤ්ඤාපෙති නිජ්ඣාපෙති පෙක්ඛති අනුපෙක්ඛති දස්සෙති අනුදස්සෙති: "අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනං, ඉමං ගණ්හාහි, ඉමං රොචෙහී"ති. එවඤ්චෙ තං අධිකරණං වූපසම්මති, ධම්මෙන වූපසම්මති සම්මුඛාවිනයෙන.

1. ධම්මවාදිපුග්ගලං - සී 1, 2. සීමු. 2. ධම්මවාදිසඞ්ඝං - සී. 1. 2 සීමු

3. අධම්මවාදී පුද්ගල තෙමේ "මේ දහම ය මේ විනය ය මේ ශාස්තෘශාසන ය, මෙය ගණුව, මෙය රුස්ව"යි ධම්මවාදීසඞ්ඝයාට හඟවයි. සිතවයි. දක්වයි. පුනපුනා දක්වයි. පෙන්වයි. පුනපුනා පෙන්වයි. ඉදින් මෙසේ ඒ අධිකරණය සන්හිඳේ නම් සම්මුඛාවිනය පිළිරූ වූ නො දැහැමින් සන්හිඳෙයි.

4. අධම්මවාදී බොහෝ මහණහු "මේ දහම ය මේ විනය ය මේ ශාස්තෘශාසන ය, මෙය ගණුව, මෙය රුස්ව"යි ධම්මවාදී පුද්ගලයාට හඟවත්. සිතවත්. පුනපුනා දක්වත්. පෙන්වත්. පුනපුනා පෙන්වත්. ඉදින් මෙසේ ඒ අධිකරණය සන්හිඳේ නම් සම්මුඛාවිනය පිළිරූ වූ නො දැහැමින් සන්හිඳෙයි.

5. අධම්මවාදී බොහෝ මහණහු "මේ දහම ය මේ විනය ය මේ ශාස්තෘශාසන ය, මෙය ගණිවු, මෙය රුස්වවු" යි ධම්මවාදී බොහෝ මහණුන්ට හඟවත්. සිතවත්. දක්වත්. පුනපුනා දක්වත් පෙන්වත්. පුනපුනා පෙන්වත්. ඉදින් මෙසේ ඒ අධිකරණය සන්හිඳේ නම් සම්මුඛාවිනය පිළිරූ වූ නො දැහැමින් සන්හිඳෙයි.

6. අධම්මවාදී බොහෝ මහණහු "මේ දහම ය මේ විනය ය මේ ශාස්තෘශාසන ය, මෙය ගණුව, මෙය රුස්ව"යි ධම්මවාදී සඞ්ඝයාට හඟවත්. සිතවත්. දක්වත්. පුනනා දක්වත් පෙන්වත් පුනපුනා පෙන්වත්. ඉදින් මෙසේ ඒ අධිකරණය සන්හිඳේ නම් සම්මුඛාවිනය පිළිරූ වූ නො දැහැමින් සන්හිඳේ.

7. අධම්මවාදී සඞ්ඝ තෙමේ "මේ දහම ය. මේ විනය ය මේ ශාස්තෘශාසන ය, මෙය ගණුව, මෙය රුස්ව"යි ධම්මවාදී පුගුලාට හඟවයි සිතවයි. දක්වයි. පුනපුනා දක්වයි. පෙන්වයි පුනපුනා පෙන්වයි. ඉදින් මෙසේ ඒ අධිකරණය සන්හිඳේ නම් සම්මුඛාවිනය පිළිරූ වූ නො දැහැමින් සන්හිඳේ.

8. අධම්මවාදී සඞ්ඝ තෙමේ "මේ දහම ය මේ විනය ය මේ ශාස්තෘශාසන ය, මෙය ගණිවු, මෙය රුස්වවු"යි. ධම්මවාදී බොහෝ මහණුන්ට හඟවයි. සිතවයි. දක්වයි. පුනපුනා දක්වයි පෙන්වයි. පුනපුනා පෙන්වයි. ඉදින් ඒ අධිකරණය මෙසේ සන්හිඳේ නම් සම්මුඛාවිනය පිළිරූ වූ නො දැහැමින් සන්හිඳේ.

9. අධම්මවාදී සඞ්ඝ තෙමේ "මේ දහම ය මේ විනය ය මේ ශාස්තෘශාසන ය, මෙය ගණුව, මෙය රුස්වයි ධම්මවාදී සඞ්ඝයාට හඟවයි. සිතවයි. දක්වයි. පුනපුනා දක්වයි. පෙන්වයි. පුනපුනා පෙන්වයි. ඉදින් මෙසේ ඒ අධිකරණය සන්හිඳේ නම් සම්මුඛාවිනය පිළිරූ වූ නො දැහැමින් සන්හිඳේ යි.

අධම්මවාදිනවකය නිමි.

ධම්මවාදිනවකය

1. ධම්මවාදී පුද්ගල තෙමේ "මේ දහම ය මේ විනය ය මේ ශාස්තෘශාසන ය, මෙය ගණුව, මෙය රුස්ව"යි අධම්මවාදී පුද්ගලයාට හඟවයි. සිතවයි. දක්වයි පුනපුනා දක්වයි. බලවයි. පුනපුනා බලවයි. ඉදින් මෙසේ ඒ අධිකරණය සන්හිඳේ නම් සම්මුඛාවිනය වූ දැහැමින් සන්හිඳේ.

2. ධම්මවාදී පුග්ගලො අධම්මවාදී සම්බහුලෙ සඤ්ඤාපෙති නිජ්ඣාපෙති පෙක්ඛති අනුපෙක්ඛති දසෙසති අනුදසෙසති: "අයං ධම්මො, අයං විනයො, ඉදං සත්ථුසාසනං, ඉමං ගණ්හථ, ඉමං රොචෙථා"ති. එවඤ්චෙ තං අධිකරණං වූපසම්මති, ධම්මෙන වූපසම්මති සම්මුඛාවිනයෙන.

3. ධම්මවාදී පුග්ගලො අධම්මවාදිං සඞ්ඝං සඤ්ඤාපෙති නිජ්ඣාපෙති පෙක්ඛති අනුපෙක්ඛති දසෙසති අනුදසෙසති: "අයං ධම්මො, අයං විනයො, ඉදං සත්ථුසාසනං, ඉමං ගණ්හාහි, ඉමං රොචෙහී"ති. එවඤ්චෙ තං අධිකරණං වූපසම්මති, ධම්මෙන වූපසම්මති සම්මුඛාවිනයෙන.

4 ධම්මවාදී සම්බහුලා අධම්මවාදිං පුග්ගලං සඤ්ඤාපෙන්ති නිජ්ඣාපෙන්ති පෙක්ඛන්ති අනුපෙක්ඛන්ති දසෙසන්ති අනුදසෙසන්ති: "අයං ධම්මො, අයං විනයො, ඉදං සත්ථුසාසනං, ඉමං ගණ්හාහි, ඉමං රොචෙහී"ති. එවඤ්චෙ තං අධිකරණං වූපසම්මති, ධම්මෙන වූපසම්මති සම්මුඛාවිනයෙන.

5. ධම්මවාදී සම්බහුලා අධම්මවාදී සම්බහුලෙ සඤ්ඤාපෙන්ති නිජ්ඣාපෙන්ති පෙක්ඛන්ති අනුපෙක්ඛන්ති දසෙසන්ති අනුදසෙසන්ති: "අයං ධම්මො, අයං විනයො, ඉදං සත්ථුසාසනං, ඉමං ගණ්හථ, ඉමං රොචෙථා"ති. එවඤ්චෙ තං අධිකරණං වූපසම්මති, ධම්මෙන වූපසම්මති සම්මුඛාවිනයෙන.

6. ධම්මවාදී සම්බහුලා අධම්මවාදිං සඞ්ඝං සඤ්ඤාපෙන්ති නිජ්ඣාපෙන්ති පෙක්ඛන්ති අනුපෙක්ඛන්ති දසෙසන්ති අනුදසෙසන්ති: "අයං ධම්මො, අයං විනයො, ඉදං සත්ථුසාසනං, ඉමං ගණ්හාහි, ඉමං රොචෙහී"ති. එවඤ්චෙ තං අධිකරණං වූපසම්මති, ධම්මෙන වූපසම්මති සම්මුඛාවිනයෙන.

7. ධම්මවාදී සඞ්ඝො අධම්මවාදිං පුග්ගලං සඤ්ඤාපෙති නිජ්ඣාපෙති පෙක්ඛති අනුපෙක්ඛති දසෙසති අනුදසෙසති: "අයං ධම්මො, අයං විනයො, ඉදං සත්ථුසාසනං, ඉමං ගණ්හාහි, ඉමං රොචෙහී"ති. එවඤ්චෙ තං අධිකරණං වූපසම්මති, ධම්මෙන වූපසම්මති සම්මුඛාවිනයෙන.

8. ධම්මවාදී සඞ්ඝො අධම්මවාදී සම්බහුලෙ සඤ්ඤාපෙති නිජ්ඣාපෙති පෙක්ඛති අනුපෙක්ඛති දසෙසති අනුදසෙසති: "අයං ධම්මො, අයං විනයො, ඉදං සත්ථුසාසනං, ඉමං ගණ්හථ, ඉමං රොචෙථා"ති. එවඤ්චෙ තං අධිකරණං වූපසම්මති, ධම්මෙන වූපසම්මති සම්මුඛාවිනයෙන

9. ධම්මවාදී සඞ්ඝො අධම්මවාදිං සඞ්ඝං සඤ්ඤාපෙති නිජ්ඣාපෙති පෙක්ඛති අනුපෙක්ඛති දසෙසති අනුදසෙසති "අයං ධම්මො අයං විනයො, ඉදං සත්ථුසාසනං, ඉමං ගණ්හාහි, ඉමං රොචෙහී"ති. එවඤ්චෙ තං අධිකරණං වූපසම්මති, ධම්මෙන වූපසම්මති සම්මුඛාවිනයෙනාති.

ධම්මවාදිනවකං නිට්ඨිතං.

2. ධම්මවාදී පුද්ගල තෙමේ "මේ දහම ය මේ විනය ය මේ ශාස්තෘශාසන ය මෙය ගණිවු මෙය රුස්වවු යි" අධම්මවාදී බොහෝ මහණුන්ට හඟවයි. සිතවයි. පෙන්වයි. පුනපුනා පෙන්වයි. දක්වයි. පුනපුනා දක්වයි. ඉදින් මෙසේ ඒ අධිකරණය සන්හිඳේ නම් සම්මුඛාවිනය වූ දැහැමින් සන්හිඳේ.

3. ධම්මවාදී පුද්ගල තෙමේ "මේ දහම ය මේ විනය ය මේ ශාස්තෘශාසන ය මෙය ගණුව මෙය රුස්ව"යි අධම්මවාදී සඞ්ඝයාට හඟවයි. සිතවයි. පෙන්වයි. පුනපුනා පෙන්වයි. දක්වයි. පුනපුනා දක්වයි. ඉදින් මෙසේ ඒ අධිකරණය සන්හිඳේ නම් සම්මුඛාවිනය වූ දැහැමින් සන්හිඳේ.

4. ධම්මවාදී බොහෝ මහණහු "මේ දහම ය මේ විනය ය මේ ශාස්තෘශාසන ය මෙය ගණුව මෙය රුස්ව"යි අධම්මවාදී පුද්ගලයාට හඟවත්. සිතවත්. පෙන්වත්. පුනපුනා පෙන්වත්. දක්වත්. පුනපුනා දක්වත්. ඉදින් මෙසේ ඒ අධිකරණය සන්හිඳේ නම් සම්මුඛාවිනය වූ දැහැමින් සන්හිඳේ.

5. ධම්මවාදී බොහෝ මහණහු "මේ දහම ය මේ විනය ය මේ ශාස්තෘශාසන ය මෙය ගණිවු මෙය රුස්වවු"යි අධම්මවාදී බොහෝ මහණුන්ට හඟවත්. සිතවත්. පෙන්වත්. පුනපුනා පෙන්වත්. දක්වත්. පුනපුනා දක්වත්. ඉදින් මෙසේ ඒ අධිකරණය සන්හිඳේ නම් සම්මුඛාවිනය වූ දැහැමින් සන්හිඳේ.

6. ධම්මවාදී බොහෝ මහණහු "මේ දහම ය. මේ විනය ය මේ ශාස්තෘශාසන ය මෙය ගණුව මෙය රුස්ව"යි අධම්මවාදී සඞ්ඝයාට හඟවත්. සිතවත්. පෙන්වත්. පුනපුනා පෙන්වත්. දක්වත්. පුනපුනා දක්වත්. ඉදින් මෙසේ ඒ අධිකරණය සන්හිඳේ නම් සම්මුඛාවිනය වූ දැහැමින් සන්හිඳේ.

7. ධම්මවාදී සඞ්ඝ තෙමේ "මේ දහම ය මේ විනය ය මේ ශාස්තෘශාසන ය මෙය ගණුව මෙය රුස්ව"යි අධම්මවාදී පුද්ගලයාට හඟවයි. සිතවයි. පෙන්වයි. පුනපුනා පෙන්වයි. දක්වයි. පුනපුනා දක්වයි. ඉදින් මෙසේ ඒ අධිකරණය සන්හිඳේ නම් සම්මුඛාවිනය වූ දැහැමින් සන්හිඳේ.

8 ධම්මවාදී සඞ්ඝ තෙමේ "මේ දහම ය මේ විනය ය මේ ශාස්තෘශාසන ය මෙය ගණිවු මෙය රුස්වවු"යි අධම්මවාදී බොහෝ මහණුන්ට හඟවයි. සිතවයි. පෙන්වයි. පුනපුනා පෙන්වයි. දක්වයි. පුනපුනා දක්වයි. ඉදින් මෙසේ ඒ අධිකරණය සන්හිඳේ නම් සම්මුඛාවිනය වූ දැහැමින් සන්හිඳේ.

9. ධම්මවාදී සඞ්ඝ තෙමේ "මේ දහම ය මේ විනය ය මේ ශාස්තෘශාසන ය මෙය ගණුව මෙය රුස්ව"යි අධම්මවාදී සඞ්ඝයාට හඟවයි. සිතවයි. පෙන්වයි. පුනපුනා පෙන්වයි. දක්වයි. පුනපුනා දක්වයි. ඉදින් මෙසේ ඒ අධිකරණය සන්හිඳේ නම් සම්මුඛාවිනය වූ දැහැමින් සන්හිඳේ යි.

ධම්මවාදීනවකය නිමි.

2. සතිවිනයො

1. තෙන සමයෙන බුද්ධො භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන ආයස්මතා දබ්බෙන මල්ලපුත්තෙන ජාතියා සත්තවස්සෙන අරහත්තං සච්ඡිකතං හොති. යං කිඤ්චි සාවකෙන පත්තබ්බං, සබ්බං තෙන අනුප්පත්තං හොති. නත්ථි චස්ස කිඤ්චි උත්තරිං කරණීයං[1], කතස්ස වා පතිචයො. අථ ඛො ආයස්මතො දබ්බස්ස මල්ලපුත්තස්ස රහොගතස්ස පතිසල්ලීනස්ස[2] එවං චෙතසො පරිවිතක්කො උදපාදි: මයා ඛො ජාතියා සත්තවස්සෙන අරහත්තං සච්ඡිකතං. යං කිඤ්චි සාවකෙන පත්තබ්බං, සබ්බං මයා අනුප්පත්තං. නත්ථි ච මෙ කිඤ්චි උත්තරිං කරණීයං, කතස්ස වා පතිචයො. කින්නු ඛො අහං සඞ්ඝස්ස වෙය්‍යාවච්චං කරෙය්‍ය"න්ති. අථ ඛො ආයස්මතො දබ්බස්ස මල්ලපුත්තස්ස එතදහොසි: "යන්නූනාහං[3] සඞ්ඝස්ස සෙනාසනඤ්ච පඤ්ඤපෙය්‍යං[4], භත්තානි ච උද්දිසෙය්‍ය"න්ති.

2. අථ ඛො ආයස්මා දබ්බො මල්ලපුත්තො සායන්හසමයං පතිසල්ලානා වුට්ඨිතො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා දබ්බො මල්ලපුත්තො භගවන්තං එතදවොච: "ඉධ මය්හං භන්තෙ රහොගතස්ස පතිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි: 'මයා ඛො ජාතියා සත්තවස්සෙන අරහත්තං සච්ඡිකතං. යං කිඤ්චි සාවකෙන පත්තබ්බං සබ්බං මයා අනුප්පත්තං. නත්ථි ච මෙ කිඤ්චි උත්තරිං කරණීයං, කතස්ස වා පතිචයො. කින්නු ඛො අහං සඞ්ඝස්ස වෙය්‍යාවච්චං කරෙය්‍ය'න්ති. තස්ස මය්හං භන්තෙ එතදහොසි: 'යන්නූනාහං සඞ්ඝස්ස සෙනාසනඤ්ච පඤ්ඤපෙය්‍යං, භත්තානි ච උද්දිසෙය්‍ය'න්ති. ඉච්ඡාමහං භන්තෙ සඞ්ඝස්ස සෙනාසනඤ්ච පඤ්ඤපෙතුං, භත්තානි ච උද්දිසිතුන්ති. "සාධු සාධු දබ්බ, තෙන හි ත්වං දබ්බ, සඞ්ඝස්ස සෙනාසනඤ්ච පඤ්ඤපෙහි, භත්තානි ච උද්දිසාහී"ති. එවං භන්තෙති ඛො ආයස්මා දබ්බො මල්ලපුත්තො භගවතො පච්චස්සොසි.

3. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: තෙන හි භික්ඛවෙ සඞ්ඝො දබ්බං මල්ලපුත්තං සෙනාසනපඤ්ඤාපකඤ්ච භත්තුද්දෙසකඤ්ච සම්මන්නතු. එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බො: පඨමං දබ්බො යාචිතබ්බො. යාචිත්වා ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං සෙනාසනපඤ්ඤාපකඤ්ච භත්තුද්දෙසකඤ්ච සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.

---

1. උත්තරිකරණීයං - මජසං, සයා
2. පටිසල්ලීනස්ස, මජසං.
3. යංනූනාහං, මජසං.
4. පඤ්ඤපෙය්‍යං, මජසං.

2. සතිවිනය

1. එ සමයෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ. රජගහනුවර සමීපයෙහි කලන්දකනිවාප නම් වේළුවනාරාමයෙහි වැඩවසන සේක. එ කල්හි උපතින් සත්වස් ඇති ආයුෂ්මත් දබ්බ මල්ලපුත්‍ර විසින් රහත්බව පසක් කරණ ලද්දේ වෙයි. සව්වකු විසින් පැමිණිය යුතු (ලැබිය යුතු) යම් කිසිවක් ඇත්නම් ඒ සියල්ල උහු විසින් ලබන ලද්දේ වෙයි. උහුට මත්තෙහි කටයුතු කිසිවක් ද නැත. කරණ ලද්දෙහි නැවත වැඩීමෙක් ද නැත. ඉක්බිති එකලා ව විවේකයෙන් හුන් ආයුෂ්මත් දබ්බමල්ලපුත්හට මෙබඳු චිත්තවිතර්කයෙක් පහළ විය: "උපතින් සත් වස් ඇති මා විසින් රහත්බව පසක් කරණ ලදී. සව්වකු විසින් ලැබිය යුතු යම් කිසිවක් වේ නම් මවිසින් ඒ සියල්ල ලබන ලදී. මට මතු කටයුතු කිසිවක් ද, කරණ ලද්දෙහි නැවත වැඩීමෙක් ද නැත. මම සඟහට වතාවතක් කරනෙම් නම් කිම්දෝයි. ඉක්බිති ආයුෂ්මත් දබ්බමල්ලපුත්හට මෙබඳු සිතෙක් විය: මම සඟනට සෙනසුන් ද පනවම් නම් බත් ද උදෙසම් නම් මනාමැනු"යි.

2. ඉක්බිති ආයුෂ්මත් දබ්බමල්ලපුත් තෙමේ සවස්කල පිළිසලනින් නැඟී සිටියේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව හිඳ. එකත්පස් ව හුන් මල්ලපුත් ආයුෂ්මත් දබ්බ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය: "වහන්ස, මෙහි එකලා ව විවේකයෙන් හුන් මට මෙබඳු සිත්හසරෙක් පහළ විය: උපතින් සත්වස් ඇති මා විසින් රහත්බව පසක් කරණ ලදී. සව්වකු විසින් යම් කිසිවක් ලැබිය යුතු නම් ඒ සියල්ල මවිසින් ලබන ලදී. මතු කිසි කටයුත්තෙක් ද මට නැත කරණ ලද්දෙහි නැවත වැඩීමෙක් ද නැත. මම සඟනට වතාවතක් කරම් නම් කිම්දැ"යි. වහන්ස, ඒ මට මෙබඳු සිතෙක් විය: "මම සඟනට සෙනසුන් ද පනවම් නම් බතුදු උදෙසම් නම් මනා මැනු"යි. "වහන්ස, මම සඟනට සෙනසුන් පනවන්නට ද බත් උදෙසන්නට ද කැමැත්තෙමි"යි. "දබ්බ මැනැවි. මැනැවි. දබ්බ එසේ නම් සඟනට සෙනසුන් ද පනවවු. බතුදු උදෙසවු" යි. එසේ ය වහන්සැයි ආයුෂ්මත් දබ්බමල්ලපුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දිනි.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ ප්‍රස්තාවයෙහි දැහැමිකතා කොට භික්ෂූන් ඇමතූ සේක: මහණෙනි, එසේ නම් සඞ්ඝ තෙමේ දබ්බමල්ලපුතු සෙනසුන් පනවන්නකු කොට ද බත් උදෙසන්නකු කොට ද සම්මත කෙරේවා. මහණෙනි, මෙසේ සම්මත කළ යුතු: පළමු කොට දබ්බ යැද්ද යුතු. යැද වියත් පබල මහණකු විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුතු:

"වහන්ස, සඞ්ඝ තෙමේ මා වදන් අසාවා: ඉදින් සඟනට පැමිණි කල් ඇත්තේ නම් සඞ්ඝ තෙමේ ආයුෂ්මත් දබ්බමල්ලපුතු සෙනසුන් පනවන්නකු කොට ද බත් උදෙසන්නකු කොට ද සම්මත කරන්නේ ය. මේ දැන්වීම යි.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: සඞ්ඝො ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං සෙනාසනපඤ්ඤාපකඤ්ච භත්තුද්දෙසකඤ්ච සම්මන්නති. යස්සායස්මතො ඛමති ආයස්මතො දබ්බස්ස මල්ලපුත්තස්ස සෙනාසනපඤ්ඤාපකස්ස ච භත්තුද්දෙසකස්ස ච සම්මුති[1], සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

සම්මතො සඞ්ඝෙන ආයස්මා දබ්බො මල්ලපුත්තො සෙනාසනපඤ්ඤාපකො ච භත්තුද්දෙසකො ච. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී''ති.

4. සම්මතො ච පනායස්මා දබ්බො මල්ලපුත්තො සභාගානං සභාගානං භික්ඛූනං[2] එකජ්ඣං සෙනාසනං පඤ්ඤාපෙති: යෙ තෙ භික්ඛූ සුත්තන්තිකා තෙසං එකජ්ඣං සෙනාසනං පඤ්ඤාපෙති "තෙ අඤ්ඤමඤ්ඤං සුත්තන්තං සඞ්ගායිස්සන්තී''ති. යෙ තෙ භික්ඛූ විනයධරා තෙසං එකජ්ඣං සෙනාසනං පඤ්ඤාපෙති "තෙ අඤ්ඤමඤ්ඤං විනයං විනිච්ඡිනිස්සන්තී''[3]ති. යෙ තෙ භික්ඛූ ධම්මකථිකා තෙසං එකජ්ඣං සෙනාසනං පඤ්ඤාපෙති "තෙ අඤ්ඤමඤ්ඤං ධම්මං සාකච්ඡිස්සන්තී''ති. යෙ තෙ භික්ඛූ ඣායිනො තෙසං එකජ්ඣං සෙනාසනං පඤ්ඤාපෙති "තෙ අඤ්ඤමඤ්ඤං න ව්‍යාබාධිස්සන්තී''ති. යෙ තෙ භික්ඛූ තිරච්ඡානකථිකා කායදඩ්ඪිබහුලා[4] විහරන්ති, තෙසම්පි එකජ්ඣං සෙනාසනං පඤ්ඤාපෙති "ඉමායපිමෙ[5] ආයස්මන්තො[6] රතියා අච්ඡිස්සන්තී''ති. යෙපි තෙ[7] භික්ඛූ විකාලෙ ආගච්ඡන්ති, තෙසම්පි තෙජොධාතුං සමාපජ්ජිත්වා තෙනෙව ආලොකෙන සෙනාසනං පඤ්ඤාපෙති.

5. අපිස්සු භික්ඛූ සඤ්චිච්ච විකාලෙ ආගච්ඡන්ති "මයං ආයස්මතො දබ්බස්ස මල්ලපුත්තස්ස ඉද්ධිපාටිහාරියං පස්සිස්සාමා''ති. තෙ ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං උපසඞ්කමිත්වා එවං වදෙන්ති: "අම්හාකං ආවුසො දබ්බ සෙනාසනං පඤ්ඤාපෙහී''ති. තෙ ආයස්මා දබ්බො මල්ලපුත්තො එවං වදෙති: කත්ථ ආයස්මන්තා ඉච්ඡන්ති? කත්ථ පඤ්ඤාපෙමීති? තෙ සඤ්චිච්ච දූරෙ අපදිසන්ති: "අම්හාකං ආවුසො දබ්බ ගිජ්ඣකූටෙ පබ්බතෙ සෙනාසනං පඤ්ඤාපෙහි. අම්හාකං ආවුසො චොරපපාතෙ සෙනාසනං පඤ්ඤාපෙහි. අම්හාකං ආවුසො ඉසිගිලිපස්සෙ කාළසිලායං සෙනාසනං පඤ්ඤාපෙහි. අම්හාකං ආවුසො වෙභාරපස්සෙ සත්තපණ්ණිගුහායං සෙනාසනං පඤ්ඤාපෙහි. අම්හාකං ආවුසො සීතවනෙ සප්පසොණ්ඩිකපබ්භාරෙ සෙනාසනං පඤ්ඤාපෙහි. අම්හාකං ආවුසො ගොතමකන්දරායං[8] සෙනාසනං පඤ්ඤාපෙහි. අම්හාකං ආවුසො තින්දුකකන්දරායං[9] සෙනාසනං පඤ්ඤාපෙහි. අම්හාකං ආවුසො තපොදකන්දරායං[10] සෙනාසනං පඤ්ඤාපෙහි අම්හාකං ආවුසො තපොදාරාමෙ සෙනාසනං පඤ්ඤාපෙහි. අම්හාකං ආවුසො ජීවකම්බවනෙ සෙනාසනං පඤ්ඤාපෙහි. අම්හාකං ආවුසො මද්දකුච්ඡිස්මිං[11] මිගදායෙ සෙනාසනං පඤ්ඤාපෙහී''ති.

---

1. සම්මති - සයා.
2. සභාගානං භික්ඛූනං - මජසං.
3. විනිච්ඡිස්සන්ති - PTS.
4. කායදළ්හිබහුලා - මජසං. සයා. සීමු.
5. ඉමායපි ඉමෙ - PTS.
6. ආයස්මන්තා - සී 1. 2. සීමු. සයා.
7. යෙ තෙ - සී 1, 2.
8. ගොතමකකන්දරායං - මජසං.
9. තිණ්ඩුකකන්දරායං - මජසං. සයා.
10. කපොතකන්දරායං - සීමු මජසං.
11. මද්දකුච්ඡිම්හි - මජසං. සයා.

වහන්ස, සඞ්ඝ තෙමේ මාගේ වදන අසාවා. සඞ්ඝ තෙමේ ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍ර සෙනසුන් පනවන්නකු කොට ද බත් උද්දෙසන්නකු කොට ද සම්මත කෙරෙයි. ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍ර සෙනසුන් පනවන්නකු කොට ද බත් උද්දෙසන්නකු කොට ද සම්මත කිරීම යම් ආයුෂ්මතකුහට රුස්නේ නම් හෙ තෙමේ නිහඬ වන්නේ ය. යමකුහට රිසි නො වේ නම් ඔහු තෙමේ බණන්නේ ය.

සඟ විසින් ආයුෂ්මත් දබ්බමල්ලපුත්තෙමේ සෙනසුන් පනවන්නකු කොට ද බත් උද්දෙසන්නකු කොට ද සම්මත කරණ ලදී. සඟහට රිසියෙයි. එහෙයින් නිහඬ ය. මෙසේ මෙය දරමි''යි.

4. සම්මත කරණ ලද ආයුෂ්මත් දබ්බ මල්ලපුත් තෙමේ සභාග සභාග භික්ෂූන්ට එක්තැනෙක සෙනසුන් පනවයි: යම් භික්ෂූහු සූත්‍රාන්තිකයෝ නම් 'ඔහු ඔවුනොවුන් සූත්‍රාන්ත සඞ්ගායනා කරන්නාහ' යි ඔවුනට එක්තැනෙක සෙනසුන් පනවයි. යම් භික්ෂූහු විනයධරයෝ නම් 'ඔහු ඔවු- නොවුන් විනය විසඳන්නාහු ය' යි ඔවුනට එක්තැනෙක සෙනසුන් පනවයි. යම් භික්ෂූහු ධර්මකථිකයෝ (ආභිධම්මිකයෝ) නම් 'ඔහු ඔවුනොවුන් ධර්ම සාකච්ඡා කරන්නාහ' යි ඔවුනට එක්තැනෙක සෙනසුන් පනවයි. යම් භික්ෂූහු ධ්‍යානලාභීහු නම් 'ඔහු ඔවුනොවුන් නො පෙළන්නාහ' යි ඔවුනට එක්තැනෙක සෙනසුන් පනවයි. යම් භික්ෂූහු තිරශ්චීන කථා ඇති ව කය තරකිරීමෙහි තත්පර ව වෙසෙත් නම් 'මේ ආයුෂ්මත්හු මේ තිරශ්චීන කථා රතියෙනුදු වෙසෙන්නාහ'යි ඔවුනට ද එක්තැනෙක සෙනසුන් පනවයි. යම් භික්ෂූහු නො කල්හි පැමිණෙත් නම් ඔවුනට ද තෙජෝධාතුවට සමවැද ඒ ආලොකයෙන් ම සෙනසුන් පනවයි.

5. භික්ෂූහු දැන දැන 'අපි ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රගේ ඉද්ධිපෙළහර දක්නමෝ' යි නොකල්හි නිතර පැමිණෙත්. ඔහු ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍ර වෙත එළඹ ඇවැත්නි, දබ්බයෙනි, අපට සෙනසුන් පනවාලුව යි මෙසේ කියත්. ආයුෂ්මත් දබ්බමල්ලපුත් තෙමේ ඔවුනට 'ආයුෂ්මත්හු කොතැන්හි කැමැති වෙද්ද, කොතැන්හි පනවම් දැ'යි මෙසේ කියයි. ඔහු දැන දැන දුර තැන් දක්වත්. "ඇවැත්නි, අපට ගිජ්ඣකූළපව්වෙහි සෙනසුන් පනවාලුව. ඇවැත්නි, අපට සොරපපාතයෙහි සෙනසුන් පනවාලුව. ඇවැත්නි, අපට ඉසිගිලිපස කළුගල්තලායෙහි සෙනසුන් පනවාලුව. ඇවැත්නි, අපට වෙභාරපව්පස සත්තපණ්ණිගුහෙහි සෙනසුන් පනවාලුව. ඇවැත්නි, අපට සීතවනෙහි සප්පසොණ්ඩිකපබ්භාරයෙහි සෙනසුන් පනවාලුව. ඇවැත්නි, අපට ගොතමක කඳුරැලියෙහි සෙනසුන් පනවාලුව. ඇවැත්නි, අපට තින්දුක කඳුරැලියෙහි සෙනසුන් පනවාලුව. ඇවැත්නි, අපට තපොද කඳුරැලියෙහි සෙනසුන් පනවාලුව. ඇවැත්නි, අපට තපොදාරාමයෙහි සෙනසුන් පනවාලුව. ඇවැත්නි, අපට ජීවක අඹවෙනෙහි සෙනසුන් පනවාලුව. ඇවැත්නි, අපට මද්දකුච්ඡි නම් මුවලැව්හි සෙනසුන් පනවාලුව"යි.

6. තෙසං ආයස්මා දබ්බො මල්ලපුත්තො තෙජොධාතුං සමාපජ්ජිත්වා අඞ්ගුලියා ජලමානාය පුරතො පුරතො ගච්ඡති. තෙපි තෙනෙව ආලොකෙන ආයස්මතො දබ්බස්ස මල්ලපුත්තස්ස පිට්ඨිතො පිට්ඨිතො ගච්ඡන්ති. තෙසං ආයස්මා දබ්බො මල්ලපුත්තො එවං සෙනාසනං පඤ්ඤපෙති: අයං මඤ්චො, ඉදං පීඨං, අයං භිසි, ඉදං බිම්බොහනං[1], ඉදං වච්චට්ඨානං, ඉදං පස්සාවට්ඨානං, ඉදං පානීයං, ඉදං පරිභොජනීයං, අයං කත්තරදණ්ඩො, ඉදං සඞ්ඝස්ස කතිකසණ්ඨානං[2], ඉමං කාලං පවිසිතබ්බං, ඉමං කාලං නික්ඛමිතබ්බන්ති. තෙසං ආයස්මා දබ්බො මල්ලපුත්තො එවං සෙනාසනං පඤ්ඤපෙත්වා පුනදෙව වෙළුවනං පච්චාගච්ඡති.

7. තෙන ඛො පන සමයෙන මෙත්තියභුම්මජකා[3] භික්ඛූ නවකා චෙව හොන්ති අප්පපුඤ්ඤා ච. යානි සඞ්ඝස්ස ලාමකානි සෙනාසනානි තානි තෙසං පාපුණන්ති ලාමකානි ච භත්තානි. තෙන ඛො පන සමයෙන රාජගහෙ මනුස්සා ඉච්ඡන්ති ථෙරානං භික්ඛූනං අභිසඞ්ඛාරිකං දාතුං - සප්පිම්පි තෙලම්පි උත්තරිභඞ්ගම්පි. මෙත්තියභුම්මජකානං පන භික්ඛූනං පාකතිකං දෙන්ති - යථාරද්ධං[4] කණාජකං[5] බිලඞ්ගදුතියං. තෙ පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තා ථෙරෙ භික්ඛූ පුච්ඡන්ති: 'තුම්හාකං ආවුසො භත්තග්ගෙ කිං අහොසි, තුම්හාකං කිං අහොසී'ති. එකච්චෙ ථෙරා එවං වදෙන්ති: 'අම්හාකං ආවුසො සප්පි අහොසි. තෙලං අහොසි. උත්තරිභඞ්ගං අහොසී'ති. මෙත්තියභුම්මජකා[3] පන භික්ඛූ එවං වදෙන්ති: අම්හාකං ආවුසො න කිඤ්චි අහොසි - පාකතිකං යථාරද්ධං[4] කණාජකං- බිලඞ්ගදුතියන්ති.

8. තෙන ඛො පන සමයෙන කල්‍යාණභත්තිකො ගහපති සඞ්ඝස්ස චතුක්කභත්තං දෙති නිච්චභත්තං. සො භත්තග්ගෙ සපුත්තදාරො උපතිට්ඨිත්වා පරිවිසති- අඤ්ඤෙ ඔදනෙන පුච්ඡන්ති, අඤ්ඤෙ සූපෙන පුච්ඡන්ති, අඤ්ඤෙ තෙලෙන පුච්ඡන්ති, අඤ්ඤෙ උත්තරිභඞ්ගෙන පුච්ඡන්ති. තෙන ඛො පන සමයෙන කල්‍යාණභත්තිකස්ස ගහපතිනො භත්තං ස්වාතනාය මෙත්තියභුම්මජකානං භික්ඛූනං උද්දිට්ඨං හොති. අථ ඛො කල්‍යාණභත්තිකො ගහපති ආරාමං අගමාසි කෙනචිදෙව කරණීයෙන. සො යෙනායස්මා දබ්බො මල්ලපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො කල්‍යාණභත්තිකං ගහපතිං ආයස්මා දබ්බො මල්ලපුත්තො ධම්මියා කථාය සන්දස්සෙසි, සමාදපෙසි, සමුත්තෙජෙසි, සම්පහංසෙසි.

9. අථ ඛො කල්‍යාණභත්තිකො ගහපති ආයස්මතා දබ්බෙන මල්ලපුත්තෙන ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං එතදවොච: කස්ස භන්තෙ අම්හාකං ඝරෙ ස්වාතනාය භත්තං උද්දිට්ඨන්ති? මෙත්තියභුම්මජකානං ඛො ගහපති භික්ඛූනං තුම්හාකං ඝරෙ ස්වාතනාය භත්තං උද්දිට්ඨන්ති. අථ ඛො කල්‍යාණභත්තිකො ගහපති අනත්තමනො අහොසි: කථං හි නාම පාපභික්ඛූ අම්හාකං ඝරෙ භුඤ්ජිස්සන්තීති. ඝරං ගන්ත්වා දාසිං ආණාපෙසි: ''යෙ ජෙ ස්වෙ භත්තිකා ආගච්ඡන්ති, තෙ කොට්ඨකෙ ආසනං පඤ්ඤපෙත්වා කණාජකෙන බිලඞ්ගදුතියෙන පරිවිසා''ති. එවං අය්‍යාති ඛො සා දාසී කල්‍යාණභත්තිකස්ස ගහපතිනො පච්චස්සොසි.

---

1. බිබ්බොහනං - මඡසං. 2. කතිකාසණ්ඨානං, සීමු.
3. මෙත්තියභුම්මජකා - මඡසං. 4. යථාරන්ධං, මඡසං. 5. කාණාජකං - සනා.

6. ආයුෂ්මත් දබ්බමල්ලපුත් තෙමේ තෙජොධාතුවට සමවැද ඇඟිල්ල දල්වෙන එළියෙන් ඔවුන්ට පෙරටුව පෙරටුව යෙයි. ඔහු ද ඒ එළියෙන් ම ආයුෂ්මත් දබ්බ මල්ලපුත්තුගේ පිටුපස පිටුපස යෙත්. ආයුෂ්මත් දබ්බමල්ලපුත් තෙමේ ඔවුන්ට මෙසේ සෙනසුන් පනවයි: මේ ඇඳ ය, මේ පුටුව ය, මේ බිස්ස ය, මේ කොට්ටය ය, මේ වැසිකිළිය ය, මේ කෙසකිළිය ය, මේ පැන් ය, මේ පිරිබොඳුනි ජල ය, මේ සැරයටිය, මේ සඟුන්ගේ කතිකවත ය, මෙ කල පිවිසිය යුතු, මෙ කල නික්මිය යුතු යි. ආයුෂ්මත් දබ්බමල්ලපුත් තෙමේ ඔවුනට මෙසේ සෙනසුන් පනවා නැවත වෙළුවනයට පෙරළා එයි.

7. එසමයෙහි මෙත්තියභූම්මජක මහණහු නවකයෝ ද මඳ පිණැත්තෝ ද වෙති. සඞ්ඝයාගේ යම් ලමු සෙනසුන් ද ලමු බත් ද වෙත් නම් ඔහු ඔවුන්ට පැමිණෙති. එ සමයෙහි රජගහනුවර මිනිස්සු තෙර මහණුන්ට නොයෙක් දැයින් මැනැවින් සකස් කළ බොජුන් - ගිතෙල් ද තෙල් ද මසවුළු ද දෙත්තම කැමැති වෙත්. මෙත්තියභූම්මජක මහණුන්ට කාඩිකලකැඳ දෙවෙනි කොට ඇති පිසූ පරිදි නිමුඩුසාලේ පියවි බත දෙත්. ඔහු පසු බත පිණ්ඩපාතයෙන් වැළකුණහු "ඇවැත්නි, තොපගේ බත්හලෙහි කිමෙක් වී ද තොපගේ බත්හලෙහි කිමෙක් වී ද?"යි තෙරමහණුන් පුළුවුසිත්. ඇතැම් තෙරහු "ඇවැත්නි, අපට ගිතෙල් වී ය. තෙල් වී ය. මසවුළුවී" යයි මෙසේ කියත්. මෙත්තියභූම්මජක මහණහු "ඇවැත්නි. අපට කාඩි දෙවෙනි කොට ඇති පිසූ පරිදි නිමුඩුසාලේ පියවි බත හැර කිසිවක් නො වී ය" යි මෙසේ කියත්

8. එ සමයෙහි කල්‍යාණභත්තික ගැහැවි තෙමේ සඟනට නිතිබත් කොට බත් සතරක් දෙයි. හෙ තෙමේ අඹුදරුවන් සමග බත්හලෙහි එළඹ සිට වළඳවයි. අත්නු බතින් පුළුවුසිත්. අත්නු සූපයෙන් පුළුවුසිත්. අත්නු තෙලින් පුළුවුසිත්. අත්නු මසවුළින් පුළුවුසිත්. එ කල්හි කල්‍යාණභත්තික ගැහැවියාගේ සෙට පිණිස බත වාර විසින් (මෙත්තියභූම්මජක) භික්ෂූන් සඳහා උදෙසුනයේ වෙයි. ඉක්බිතිව කල්‍යාණභත්තික ගැහැවි තෙමේ කිසියම් කටයුත්තක් සඳහා අරමට ගියේ ය. හෙ තෙමේ ආයුෂ්මත් දබ්බමල්ලපුත්තු වෙත එළඹියේ ය. එළඹ ආයුෂ්මත් දබ්බමල්ලපුත්තු වැඳ එකත්පස් ව හිත. එකත් පස් ව හුන් කල්‍යාණභත්තික ගැහැවිහු ආයුෂ්මත් දබ්බමල්ලපුත් තෙමේ දැහැමි කථාවෙන් කරුණු දක්වී ය. සමාදන් කරවී ය. තෙද ගැන්වී ය. සතුටු කරවී ය.

9. ඉක්බිති කල්‍යාණභත්තික ගැහැවි තෙමේ ආයුෂ්මත් දබ්බමල්ලපුත්තු විසින් කරුණු දක්වන ලදුයේ සමාදන් කරවනු ලදුයේ තෙද ගන්වනු ලදුයේ සතුටු කරවනු ලදුයේ ආයුෂ්මත් දබ්බමල්ලපුත්හට "වහන්ස, අපගේ ගෙයි සෙට පිණිස බත කවරකුට උදෙසන ලද්දේ ද"යි මෙය කී ය. ගැහැවි ය, තොපගේ ගෙයි සෙට පිණිස වූ බත මෙත්තියභූම්මජක භික්ෂූන්ට උදෙසන ලදැ යි. එ කල්හි කල්‍යාණභත්තික ගැහැවි තෙමේ "කෙසේ නම් ලාමකභික්ෂූහු අපගේ ගෙයි වළඳත්තාහු ද"යි නො සතුටු සිත් ඇත්තේ විය. ගෙට ගොස් "එම්බල දැස්ස, සෙට බත්ගන්නා යම් කෙනෙක් පැමිණෙත් නම් දොරකොටුයෙහි අසුන් පණවා කාඩි දෙවැනි කොට ඇති නිවුඩු බතින් වළඳව"යි දැස්ස ඇණවී ය. 'එසේ ය හිමියනි' යි ඒ දැස්ස කල්‍යාණභත්තික ගැහැවියාට පිළිවදන් ඇස්වූ ය.

10. අථ ඛො මෙත්තියභුම්මජකා භික්ඛූ "හිය්‍යො ඛො ආවුසො අම්හාකං කල්‍යාණභත්තිකස්ස ගහපතිනො භත්තං උද්දිට්ඨං. ස්වෙ අම්හෙ කල්‍යාණභත්තිකො ගහපති සපුත්තදාරො උපතිට්ඨිත්වා පරිවිසිස්සති: අඤ්ඤෙ ඔදනෙන පුච්ඡිස්සන්ති. අඤ්ඤෙ සූපෙන පුච්ඡිස්සන්ති. අඤ්ඤෙ තෙලෙන පුච්ඡිස්සන්ති. අඤ්ඤෙ උත්තරිභඞ්ගෙන පුච්ඡිස්සන්තී"ති තෙ තෙනෙව සොමනස්සෙන න චිත්තරූපං රත්තියා සුපිංසු.

11. අථ ඛො මෙත්තියභුම්මජකා භික්ඛූ පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙන කල්‍යාණභත්තිකස්ස ගහපතිනො නිවෙසනං තෙනුපසඞ්කමිංසු. අද්දසා ඛො සා දාසී මෙත්තියභුම්මජකෙ භික්ඛූ දූරතොව ආගච්ඡන්තෙ. දිස්වාන කොට්ඨකෙ ආසනං පඤ්ඤපෙත්වා මෙත්තියභුම්මජකෙ භික්ඛූ එතදවොච: නිසීදථ භන්තෙති. අථ ඛො මෙත්තියභුම්මජකානං භික්ඛූනං එතදහොසි: නිස්සංසයං ඛො න තාව භත්තං සිද්ධං භවිස්සති යථා මයං කොට්ඨකෙ නිසීදාපීයාමාති[1]. අථ ඛො සා දාසී කණාජකෙන[2] බිලඞ්ගදුතියෙන උපගඤ්ඡි භුඤ්ජථ භන්තෙති. 'මයං ඛො භගිනි නිච්චභත්තිකා'ති. "ජානාමි අය්‍යා නිච්චභත්තිකාති. අපි චාහං හිය්‍යොව ගහපතිනා ආණත්තා: 'යෙ ජෙ ස්වෙ භත්තිකා ආගච්ඡන්ති, තෙ කොට්ඨකෙ ආසනං පඤ්ඤපෙත්වා කණාජකෙන බිලඞ්ගදුතියෙන පරිවිසා'ති. භුඤ්ජථ භන්තෙ"ති.

12. අථ ඛො මෙත්තියභුම්මජකා භික්ඛූ "හිය්‍යො ඛො ආවුසො, කල්‍යාණභත්තිකො ගහපති ආරාමං අගමාසි දබ්බස්ස මල්ලපුත්තස්ස සන්තිකෙ. නිස්සංසයං ඛො මයං දබ්බෙන මල්ලපුත්තෙන ගහපතිනො අන්තරෙ[3] පරිභින්නා"ති. තෙ තෙනෙව දොමනස්සෙන න චිත්තරූපං භුඤ්ජිංසු. අථ ඛො මෙත්තියභුම්මජකා භික්ඛූ පච්ඡාභත්තං පිණ්ඩපාත-පටික්කන්තා ආරාමං ගන්ත්වා පත්තචීවරං පටිසාමෙත්වා බහාරාමකොට්ඨකෙ සඞ්ඝාටිපල්ලත්ථිකාය නිසීදිංසු - තුණ්හීභූතා පත්තක්ඛන්ධා අධොමුඛා පජ්ඣායන්තා අප්පටිභානා.

13. අථ ඛො මෙත්තියා භික්ඛුනී යෙන මෙත්තියභුම්මජකා භික්ඛූ තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මෙත්තියභුම්මජකෙ භික්ඛූ එතදවොච: 'වන්දාමි අය්‍යා'ති. එවං වුත්තෙ මෙත්තියභුම්මජකා භික්ඛූ නාලපිංසු. දුතියම්පි ඛො -පෙ- තතියම්පි ඛො මෙත්තියා භික්ඛුනී මෙත්තිය-භුම්මජකෙ භික්ඛූ එතදවොච: 'වන්දාමි අය්‍යා'ති. තතියම්පි ඛො මෙත්තිය-භුම්මජකා භික්ඛූ නාලපිංසු. 'ක්‍යාහං අය්‍යානං අපරජ්ඣාමි, කිස්ස මං අය්‍යා නාලපන්තී'ති? "තථා හි පන ත්වං භගිනි, අම්හෙ දබ්බෙන මල්ලපුත්තෙන විහෙඨියමානෙ අජ්ඣුපෙක්ඛසී"ති. 'ක්‍යාහං අය්‍යා කරොමී'ති. "සචෙ ඛො ත්වං භගිනි, ඉච්ඡෙය්‍යාසි, අජ්ජෙව භගවා ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං නාසාපෙය්‍යා"ති. 'ක්‍යාහං අය්‍යා කරොමි, කිං මයා සක්කා කාතුන්ති?'

1. නිසීදාපෙය්‍යාමාති - සී 1, 2. 2. කාණාජකෙන - ස්‍යා. 3. සන්තිකෙ - ස්‍යා.

10. එ කල්හි මෙත්තිය භූමජක මහණහු "ඇවැත්නි, ඊයේ අපට කල්‍යාණභත්තික ගැහැවිහුගේ බත උදෙසන ලදි. සෙට අඹුදරුවන් සහිත කල්‍යාණභත්තික ගැහැවි තෙමේ එළඹ සිට අප වළඳවන්නේ ය: කෙනෙක් බතින් පුළුවුස්නාහ. කෙනෙක් සූපයෙන් පුළුවුස්නාහ. කෙනෙක් තෙලින් පුළුවුස්නාහ. කෙනෙක් මසවුළින් පුළුවුස්නාහ"යි ඔහු ඒ සොම්නසින් ම සිතූසේ රෑ නිදි නොගත්හ.

11. ඉක්බිති මෙත්තිය භූමජක මහණහු පෙරවරු හැඳ පෙරව පාසිවුරු ගෙණ කල්‍යාණභත්තික ගැහැවිහුගේ නිවෙසන වෙත එළඹියහ. ඒ දාසිය එන්නා වූ මෙත්තිය භූමජක මහණුන් දුරදීම දුටු. දැක දොරකොටුයෙහි අසුන් පණවා "වහන්ස, හුන මැනැවැ"යි මෙත්තිය භූමජක මහණුන්ට මෙය කියූ. එ කල්හි මෙත්තිය භූමජක මහණුන්ට "එකැත්තෙන් ම බත නො නිමියේ වන. එහෙයින් අපි කොටුයෙහි හිඳුවනු ලබමෝ"යි මේ සිත විය. එ කල ඒ දාසිය "වහන්ස, වළඳනු මැනැවැ"යි කාඩි දෙවෙනි කොට ඇති කුඩු සහිත (නිවුඩු) බතින් යුතුව එළඹ සිටියා ය. "නැගනියෙනි, අපි මෙහි නිතිබත් ඇත්තමෝ වම්හ"යි. "හිමිහු 'නිතිබත් ඇත්තහ'යි දනිමි. එහෙත් මම ඊයේ ම ගැහැවිහු විසින් 'එම්බා දාසිය, හෙට බත් ගන්නා යම් කෙනෙක් එද්ද, කොටුයෙහි අසුන් පණවා කාඩි දෙවෙනි කොට ඇති නිවුඩු සාලේ බතින් (ඔවුන්) වළඳව'යි අණවන ලද්මූ. වහන්ස, වළඳනු මැනවැ"යි.

12. ඉක්බිති මෙත්තිය භූමජක මහණහු "ඇවැත්නි, ඊයේ කල්‍යාණභත්තික ගැහැවි තෙමේ අරමට දබ්බමල්ලපුත්‍ර ලඟට ගියේ ය. එකැතින් ම දබ්බමල්ලපුත්‍ර විසින් අපි ගැහැවිහු කෙරෙහි බිඳුවන ලද්දමෝ"යි. ඔහු ඒ දොම්නසින් ම සිතූ සේ නො වැළඳූහ. එ කල්හි මෙත්තියභූමජක මහණහු බතින් පසු පිණ්ඩපාතයෙන් වැළකුණාහු අරමට ගොස් පාසිවුරු තැන්පත් කොට තබා - නිහඬ වූවාහු මකු වූවාහු නැමුනු කඳැට ඇත්තාහු යටිහුරු කළ මුව ඇත්තාහු සිතිවිලි සිතමින් කිසිවක් නො වැටහෙන්නාහු බිහි දොරකොටුවෙහි සඟළසිවුරින් අකවටු අවුලුවා ගෙණ හුන්හ.

13. ඉක්බිති මෙත්තියා මෙහෙණ මෙත්තියභූමජක මහණුන් වෙත එළඹියා ය. එළඹ මෙත්තියභූමජක මහණුන්ට 'හිමියෙනි, වඳිමි'යි මෙය කියූ. එසේ කී කල්හි මෙත්තියභූමජක මහණහු නො බිණූහ. දෙවන වටදු ... තෙවන වටදු මෙත්තියා මෙහෙණ මෙත්තියභූමජක මහණුන්ට 'හිමියෙනි, වඳිමි' යි මෙය කියූ. තෙවන වටදු මෙත්තියභූමජක මහණහු නො බිණූහු. "ආර්‍ය්‍යයනට මම කිනම් අපරාධයක් කෙළෙම් ද? ආර්‍ය්‍යයෝ කුමක් හෙයින් මා හා නො බෙණෙත් ද" යි. "නැගනියෙනි, ඒ එසේ ම ය. දබ්බමල්ලපුත්‍ර විසින් අප වෙහෙසනු ලබනුවන් නී උපෙක්ෂා කෙරෙහි"යි. 'ආර්‍ය්‍යයෙනි, මම කුමක් කෙරෙම් දැ' යි. නැගනියෙනි, ඉදින් නී රිසියවූ නම් අද ම භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍ර නාසාලන සේකැ"යි. 'ආර්‍ය්‍යයෙනි, මම් කුම් කෙරෙම් ද? මවිසින් කිමෙක් කට හැක්කේ දැ' යි.

14 “එහි ත්වං භගිනි, යෙන භගවා තෙනුපසඞ්කම. උපසඞ්කමිත්වා භගවන්තං එවං වදෙහි: ඉදං භන්තෙ, නච්ඡන්නං නප්පතිරූපං. යායං භන්තෙ දිසා අභයා අනීතිකා අනුපද්දවා, සායං දිසා සභයා සඊතිකා සඋපද්දවා. යතො නිවාතං තතො පවාතං[1]. උදකං මඤ්ඤෙ ආදිත්තං. අය්‍යෙනම්හි දබ්බෙන මල්ලපුත්තෙන දූසිතා”ති. එවං අය්‍යාති ඛො මෙත්තියා භික්ඛුනී මෙත්තියභුම්මජකානං භික්ඛූනං පටිස්සුත්වා[2] යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො සා මෙත්තියා භික්ඛුනී භගවන්තං එතදවොච: “ඉදං භන්තෙ, නච්ඡන්නං නප්පතිරූපං. යායං භන්තෙ දිසා අභයා අනීතිකා අනුපද්දවා, සායං දිසා සභයා සඊතිකා සඋපද්දවා. යතො නිවාතං තතො පවාතං. උදකං මඤ්ඤෙ ආදිත්තං. අය්‍යෙනම්හි දබ්බෙන මල්ලපුත්තෙන දූසිතා”ති.

15. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං පටිපුච්ඡි: “සරසි ත්වං දබ්බ, එවරූපං කත්තා යථායං භික්ඛුනී ආහා”ති. “යථා මං භන්තෙ භගවා ජානාතී”ති. දුතියම්පි ඛො භගවා ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං එතදවොච: “සරසි ත්වං දබ්බ, එවරූපං කත්තා යථායං භික්ඛුනී ආහා”ති. “යථා මං භන්තෙ, භගවා ජානාතී”ති. තතියම්පි ඛො භගවා ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං එතදවොච: “සරසි ත්වං දබ්බ, එවරූපං කත්තා යථායං භික්ඛුනී ආහා”ති “යථා මං භන්තෙ භගවා ජානාතී”ති. න ඛො දබ්බ, දබ්බා එවං නිබ්බෙඨෙන්ති. සචෙ තයා කතං, කතන්ති වදෙහි, සචෙ අකතං, අකතන්ති වදෙහීති. “යතොහං භන්තෙ, ජාතො නාභිජානාමි සුපිනන්තෙනපි[3] මෙථුනං ධම්මං පටිසෙවිතා, පගෙව ජාගරො”ති. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: තෙන හි භික්ඛවෙ, මෙත්තියං භික්ඛුනිං නාසෙථ. ඉමෙ ච භික්ඛූ අනුයුඤ්ජථාති. ඉදං වත්වා භගවා උට්ඨායාසනා විහාරං පාවිසි.

16. අථ ඛො තෙ භික්ඛූ මෙත්තියං භික්ඛුනිං නාසෙසුං. අථ ඛො මෙත්තියභුම්මජකා භික්ඛූ තෙ භික්ඛූ එතදවොචුං: “මා ආවුසො, මෙත්තියං භික්ඛුනිං නාසෙථ. න සා කිඤ්චි අපරජ්ඣති. අම්හෙහි සා උස්සාහිතා කුපිතෙහි අනත්තමනෙහි චාවනාධිප්පායෙහී”ති. “කිං පන තුම්හෙ ආවුසො, ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං අමූලිකාය සීලවිපත්තියා අනුද්ධංසෙථා”ති. ‘එවමාවුසො’ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: “කථං හි නාම මෙත්තියභුම්මජකා භික්ඛූ ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං අමූලිකාය සීලවිපත්තියා අනුද්ධංසෙස්සන්තී”ති.

---

1. සවාතං - මජ්සං. 2. පටිස්සුණිත්වා - සස්‍යා. 3. සුපිනන්තෙනාපි - සී2.

14. "නැඟනියෙනි, එවූ. තෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹෙව. එළඹ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කියව: වහන්ස, මෙය නො තිසි ය. නො සරුප් ය. වහන්ස, යම් මේ දිශාවක් බිය රහිත නම් උවදුරු රහිත නම් පීඩා රහිත නම් ඒ මේ දිශාව බිය සහිත ය උවදුරු සහිත ය, පීඩා සහිත ය. යම් තැනෙක මදද සුළඟෙකුදු න දීද එහි මහ සුළං නැඟිණ. දිය ඇවිලගත්තාක් මෙනි. ආයසී දබ්බමල්ලපුත්‍ර හිමියන් විසින් මම් දූෂිතයමු"යි. 'එසේ ය, ආයසීයෙනි'යි මෙත්තියාමෙහෙණ මෙත්තිය-භුම්මජක මහණුන්ට පිළිතුරු දී භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියා ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස් ව සිටියා ය. එකත්පස් ව සිටි ඒ මෙත්තිය මෙහෙණ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කළාය: "වහන්ස, මෙය නො තිසි ය. නො සරුප් ය. වහන්ස, යම් මේ දිශාවක් බිය රහිත ද පීඩා රහිත ද උවදුරු රහිත ද ඒ මේ දිශාව බිය සහිත ය. පීඩා සහිත ය. උවදුරු සහිත ය. යම් තැනෙක සුළඟෙක් නොවී ද එහි සැඩ සුළං නැඟිණි. දිය ඇවිල ගත්තාක් මෙනි. ආයසීදබ්බමල්ලපුත්‍රයන් විසින් දූෂිතයමු"යි.

15. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ නිදානයෙහි මේ ප්‍රස්තාවයෙහි භික්ෂූන් රැස් කරවා ආයුෂ්මත් දබ්බමල්ලපුතු පුළුවුත් සේක. "දබ්බ, යම්සේ මේ මෙහෙණ කීවුද "තෙපි මෙබන්දක් කළහු සිහි කරවු දැ"යි. "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ යම් සේ මා දන්නා සේක් ද (-එසේ මම් දතයුතු වෙමියි)" දෙවන වටදු භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් දබ්බමල්ලපුතුට මෙය වදාළ සේක: "දබ්බ, මේ මෙහෙණ යම්සේ කීවුද තෙපි මෙබන්දක් කළහු සිහි කරවු දැ"යි. "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ යම්සේ මා දන්නා සේක් ද (-එසේ මම් දතයුතු වෙමියි.)" තෙවන වටදු භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් දබ්බමල්ලපුතුට මෙය වදාළ සේක. "දබ්බ, යම්සේ මේ මෙහෙණ කීවුද, තෙපි මෙබන්දක් කළහු සිහි කරවු දැ"යි? "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ යම්සේ මා දන්නා සේක්ද (-එසේ මම් දතයුතු වෙමියි.)" දබ්බ, දබ්බ (පණ්ඩිත)යෝ මෙසේ පරප්‍රත්‍යයෙන් (අනුන් පිහිටෙන්) නිරවුල් නොකෙරෙත්. ඉදින් තා විසින් කරණ ලද නම් කරණ ලදැ යි කියව, ඉදින් නො කරණලද නම් නො කරණ ලදැ යි කියව යි. "වහන්ස, මම උපන් තැන් පටන් සිහිනෙනුදු මෙවුන්දම් සෙවුනෙම් නො ම දනිමි. පිබිදියෙම් කියනු ම කවරේ දැ"යි. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් ඇමතූ සේක: "මහණෙනි, එසේ නම් මෙත්තියා මෙහෙණ (ශ්‍රමණලිංග නාසනායෙන්) නසවු. මේ (මෙහෙයු) මහණුන් ද විමසවු"යි. මෙය වදාරා භාග්‍යවතුන් වහන්සේ හුනස්නෙන් නැඟී වෙහෙරට වැඩි සේක.

16. ඉක්බිති ඒ භික්ෂූහු මෙත්තියා මෙහෙණ නැසූහ. (සිවුරු හැරවූහ). එ කල්හි මෙත්තියභුම්මජක මහණහු ඒ භික්ෂූන්ට මෙය කීහු: "ඇවැත්නි, මෙත්තියා මෙහෙණ තනමක් නසවු. ඕ තොමෝ කිසි අපරාධයක් නො කෙරෙයි. කිපියා වූ නො සතුටු සිත් ඇති තෙරණ අදහස් ඇති අප විසින් ඕ උත්සාහවත් කරණ ලදු" යි. ඇවැත්නි, කිමෙක් ද? තෙපි ආයුෂ්මත් දබ්බමල්ලපුතුට අමූලික සීලවිපත්තියෙන් චෝදනා කරවු දැ යි? 'ඇවැත්නි, එසේ' යි. යම් ඒ මහණහු අපිස් වූවාහු ... ඔහු අවමත් කෙරෙත්, නුගුණ කියත්, දෙස් පහළ කෙරෙත්: කෙසේ නම් මෙත්තියභුම්මජක මහණහු ආයුෂ්මත් දබ්බමල්ලපුතුට අමූලික සීලවිපත්තියෙන් චෝදනා කෙරෙත් දැ යි.

17. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- සච්චං කිර භික්ඛවෙ, මෙත්තියභුම්මජකා භික්ඛූ දබ්බං මල්ලපුත්තං අමූලිකාය සීලවිපත්තියා අනුද්ධංසෙන්තීති?. 'සච්චං භගවා'. විගරහි බුද්ධො භගවා -පෙ- විගරහිත්වා -පෙ- භික්ඛූනං තදනුච්ඡවිකං තදනුලොමිකං ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

18. තෙන හි භික්ඛවෙ, සඞ්ඝො දබ්බස්ස මල්ලපුත්තස්ස සතිවෙපුල්ලප්පත්තස්ස සතිවිනයං දෙතු. එවඤ්ච පන භික්ඛවෙ දාතබ්බො: තෙන භික්ඛවෙ දබ්බෙන මල්ලපුත්තෙන සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා වුඩ්ඪානං භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: "ඉමෙ මං භන්තෙ, මෙත්තියභුම්මජකා භික්ඛූ අමූලිකාය සීලවිපත්තියා අනුද්ධංසෙන්ති. සොහං භන්තෙ සතිවෙපුල්ලප්පත්තො සඞ්ඝං සතිවිනයං යාචාමී"ති. දුතියම්පි යාචිතබ්බො -පෙ- තතියම්පි යාචිතබ්බො: "ඉමෙ මං භන්තෙ මෙත්තියභුම්මජකා භික්ඛූ අමූලිකාය සීලවිපත්තියා අනුද්ධංසෙන්ති. සොහං සතිවෙපුල්ලප්පත්තො. තතියම්පි භන්තෙ සඞ්ඝං සතිවිනයං යාචාමී"ති.

19. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: ඉමෙ මෙත්තියභුම්මජකා භික්ඛූ ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං අමූලිකාය සීලවිපත්තියා අනුද්ධංසෙන්ති. ආයස්මා දබ්බො මල්ලපුත්තො සතිවෙපුල්ලප්පත්තො සඞ්ඝං සතිවිනයං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ආයස්මතො දබ්බස්ස මල්ලපුත්තස්ස සතිවෙපුල්ලප්පත්තස්ස සතිවිනයං දදෙය්‍ය. එසා ඤත්ති

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: ඉමෙ මෙත්තියභුම්මජකා භික්ඛූ ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං අමූලිකාය සීලවිපත්තියා අනුද්ධංසෙන්ති. ආයස්මා දබ්බො මල්ලපුත්තො සතිවෙපුල්ලප්පත්තො සඞ්ඝං සතිවිනයං යාචති. සඞ්ඝො ආයස්මතො දබ්බස්ස මල්ලපුත්තස්ස සතිවෙපුල්ලප්පත්තස්ස සතිවිනයං දෙති. යස්සායස්මතො ඛමති ආයස්මතො දබ්බස්ස මල්ලපුත්තස්ස සතිවෙපුල්ලප්පත්තස්ස සතිවිනයස්ස දානං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දුතියම්පි එතමත්ථං වදාමි -පෙ- තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: ඉමෙ මෙත්තියභුම්මජකා භික්ඛූ ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං අමූලිකාය සීලවිපත්තියා අනුද්ධංසෙන්ති. ආයස්මා දබ්බො මල්ලපුත්තො සතිවෙපුල්ලප්පත්තො සඞ්ඝං සතිවිනයං යාචති. සඞ්ඝො ආයස්මතො දබ්බස්ස මල්ලපුත්තස්ස සතිවෙපුල්ලප්පත්තස්ස සතිවිනයං දෙති. යස්සායස්මතො ඛමති ආයස්මතො දබ්බස්ස මල්ලපුත්තස්ස සතිවෙපුල්ලප්පත්තස්ස සතිවිනයස්ස දානං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

දින්නො සඞ්ඝෙන ආයස්මතො දබ්බස්ස මල්ලපුත්තස්ස සතිවෙපුල්ලප්පත්තස්ස සතිවිනයො. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී"ති.

17. ඉක්බිති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ සැල කළහ... මහණෙනි, සැබෑ ද, මෛත්‍රියභුම්මජක මහණහු දබ්බමල්ලපුතුට අමූලික සීලවිපත්තියෙන් චෝදනා කෙරෙද් ද යි? 'භාග්‍යවතුන් වහන්ස, සැබෑවි'. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගැරහූ සේක... ගරහා... භික්ෂූන්ට එයට සුදුසු වූ එයට අනුලොම් වූ දැහැමි කථා කොට භික්ෂූන් ඇමතූ සේක:

18. මහණෙනි, එසේ නම් සඞ්ඝ තෙමේ සිහියෙන් විපුලබවට පැමිණි දබ්බමල්ලපුතුට සතිවිනය දේවා. මහණෙනි, මෙසේ දිය යුතු: මහණෙනි, ඒ දබ්බමල්ලපුතු විසින් සඞ්ඝයා වෙත එළඹ උතුරුසඟ එකස් කොට මහලු මහණුන්ගේ පා වැද උළුක්ලෙන් හිඳ ඇඳිලි බැඳ මෙසේ කියයුතු වන්නේ ය: "වහන්ස, මේ මෛත්‍රියභුම්මජක මහණහු අමූලික සීල-විපත්තියෙන් මට චෝදනා කෙරෙත්. වහන්ස, ඒ මම සමෘතිවිපුලත්වයට (සමෘතිඅවිප්‍රවාසයට) පැමිණියෙමි සඞ්ඝයාගෙන් සතිවිනය යදිමි'' යි. දෙවන වටදු යැද්ද යුතු ...තෙවන වටදු යැද්ද යුතු:. වහන්ස, මේ මෛත්‍රිය භුම්මජක මහණහු අමූලික සීලවිපත්තියෙන් මට චෝදනා කෙරෙති. ඒ මම සමෘති විපුලත්වයට පැමිණියෙමි. වහන්ස, තෙවන වටදු සඞ්ඝයාගෙන් සතිවිනය යදිමි'' යි.

19. ව්‍යක්තප්‍රබල මහණකු විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ ය:

"වහන්ස, සඞ්ඝ තෙමේ මා වදන අසාවා. මේ මෛත්‍රියභුම්මජක මහණහු ආයුෂ්මත් දබ්බමල්ලපුතුට අමූලික සීලවිපත්තියෙන් චෝදනා නඟත්. ආයුෂ්මත් දබ්බමල්ලපුත් තෙමේ සිහිවිපුල බවට පැමිණියේ සඞ්ඝයාගෙන් සතිවිනය යදී. ඉදින් සඟනට පැමිණි කල් ඇත්තේ නම් සඞ්ඝ තෙමේ සිහිවිපුල බවට පැමිණි ආයුෂ්මත් දබ්බමල්ලපුතුට සතිවිනය දෙන්නේය. මේ ඥප්තිය යි.

වහන්ස, සඞ්ඝ තෙමේ මා වදන අසාවා. මේ මෛත්‍රියභුම්මජක මහණහු ආයුෂ්මත් දබ්බමල්ලපුතුට මුල් නැති සිල්විපතින් චෝදනා නඟත්. ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍ර තෙමේ සමෘතිවිපුලත්වයට පැමිණියේ සඞ්ඝයාගෙන් සමෘතිවිනය ඉල්ලයි. සඞ්ඝ තෙමේ සමෘතිවිපුලත්වයට පැමිණි ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රයාට සමෘතිවිනය දෙයි. සමෘතිවිපුලත්වයට පැමිණි ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රහට සමෘතිවිනය දීම යම් ආයුෂ්මතකුහට රිසියේ නම් හේ නිහඬ වන්නේ ය. යමකුහට රිසි නො වේ නම් හේ බණන්නේ ය.

දෙවන වටදු මේ අරුත කියමි ... තෙවන වටදු මේ අරුත කියමි: වහන්ස, සඞ්ඝ තෙමේ මා වදන අසාවා. මේ මෛත්‍රියභුම්මජක මහණහු මුල් නැති සිල්විපතින් ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රහට චෝදනා නඟත්. ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍ර තෙමේ සමෘතිවිපුලත්වයට පැමිණියේ සඞ්ඝයාගෙන් සතිවිනය යදියි. සඞ්ඝ තෙමේ සමෘතිවිපුලත්වයට පැමිණි ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රහට සතිවිනය දෙයි. සමෘතිවිපුලත්වයට පැමිණි ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රහට සතිවිනය දීම යම් ආයුෂ්මතකුහට රිසියේ නම් හේ නිහඬ වන්නේ ය. යමකුහට රිසි නො වේ නම් හේ බණන්නේ ය.

සමෘතිවිපුලත්වයට පැමිණි ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රහට සඞ්ඝයා විසින් සතිවිනය දෙන ලදී. සඞ්ඝයාට රිසියේ. එහෙයින් නිහඬ ය. මෙසේ මෙය දරමි'' යි.

පඤ්චිමානි භික්ඛවෙ ධම්මිකානි සතිවිනයස්ස දානානි: සුද්ධො හොති භික්ඛු අනාපත්තිකො, අනුවදන්ති ච නං, යාචති ච, තස්ස සඞ්ඝො සතිවිනයං දෙති, ධම්මෙන සමග්ගා[1] ඉමානි ඛො භික්ඛවෙ, පඤ්ච ධම්මිකානි සතිවිනයස්ස දානානීති.*

සතිවිනයො නිට්ඨිතො.

3. අමූළ්හවිනයො

1. තෙන ඛො පන සමයෙන ගග්ගො භික්ඛු උම්මත්තකො හොති චිත්තවිපරියාසකතො. තෙන උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං හොති භාසිතපරික්කන්තං.[2] භික්ඛූ ගග්ගං භික්ඛුං උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන අජ්ඣාචිණ්ණෙන ආපත්තියා චොදෙන්ති: "සරතායස්මා එවරූපිං ආපත්තිං ආපජ්ජිතා"ති. සො එවං වදෙති: "අහං ඛො ආවුසො, උම්මත්තකො අහොසිං චිත්තවිපරියාසකතො. තෙන මෙ උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං භාසිතපරික්කන්තං. නාහං තං සරාමි. මූළ්හෙන මෙ එතං කත"න්ති. එවම්පි නං වුච්චමානා චොදෙන්තෙව: "සරතායස්මා එවරූපං ආපත්තිං ආපජ්ජිතා"ති.

2. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛූ ගග්ගං භික්ඛුං උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන අජ්ඣාචිණ්ණෙන ආපත්තියා චොදෙස්සන්ති: 'සරතායස්මා එවරූපිං ආපත්තිං ආපජ්ජිතා'[3]ති. සො එවං වදෙති: 'අහං ඛො ආවුසො, උම්මත්තකො අහොසිං චිත්තවිපරියාසකතො. තෙන මෙ උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං භාසිතපරික්කන්තං. නාහං තං සරාමි. මූළ්හෙන මෙ එතං කත'න්ති. එවම්පි නං වුච්චමානා චොදෙන්තෙව: "සරතායස්මා එවරූපිං ආපත්තිං ආපජ්ජිතා"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. සච්චං කිර භික්ඛවෙ -පෙ- සච්චං. භගවා විගරහි බුද්ධො භගවා -පෙ-. විගරහිත්වා -පෙ- ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

3. තෙන හි භික්ඛවෙ, සඞ්ඝො ගග්ගස්ස භික්ඛුනො අමූළ්හස්ස අමූළ්හවිනයං දෙතු. එවඤ්ච පන භික්ඛවෙ දාතබ්බො: තෙන භික්ඛවෙ, ගග්ගෙන භික්ඛුනා සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා වුඩ්ඪානං භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: "අහං භන්තෙ, උම්මත්තකො අහොසිං චිත්තවිපරියාසකතො. තෙන මෙ උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං භාසිතපරික්කන්තං. මං භික්ඛූ උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන අජ්ඣාචිණ්ණෙන ආපත්තියා චොදෙන්ති: "සරතායස්මා එවරූපිං ආපත්තිං ආපජ්ජිතා"ති. ත්‍යාහං එවං වදාමි:-

---

1. සමග්ගෙන - PTS.

* "එත්ථ සුද්ධස්ස අනාපත්තිකස්ස දානං එකං, අනුවදිතස්ස එකං, යාචිතස්ස එකං, සඞ්ඝෙන දානං එකං, ධම්මෙන සමග්ගෙහි දානං එකන්ති එවං පඤ්ච. එතානි පන එකෙක අඞ්ගවසෙන න ලබ්භන්ති. තස්මා දෙසනාමත්තමෙවෙතං" - සමන්තපාසාදිකා

2. භාසිතපරික්කන්තං - මජසං, ස්‍යා. 3. 'ආපජ්ජිත්වා'තිපි පාඨො, - අට්ඨකථා

19. මහණෙනි, මේ දැහැමි සතිවිනය දීම් පසෙකි: මහණ තෙමේ ඇවැත් නැත්තේ පිරිසිදු වූයේ වෙයි. ඔහුට චෝදනාත් කෙරෙයි. (ගෙනෙමින්) යදී. ඔහුට සඞ්ඝ තෙමේ සතිවිනය දෙයි. දැහැමින් සමඟ ව දෙයි මහණෙනි, මේ දැහැමි සතිවිනය දීම් පසයි.*

සතිවිනය නිමියේ ය.

3. අමූළ්හවිනය

1. එ සමයෙහි ගග්ග මහණ තෙමේ සිත් පෙරළියෙන් වූ උමතු ඇතියේ වෙයි. සිත් පෙරළීමෙන් උමතු වූ ඔහු විසින් බසින් බිණූ කයින් මැඩූ බොහෝ නො සරුප්කම් කරණ ලද්දේ වෙයි. සිත් පෙරළුනු උමතුවූවහු විසින් කරණ ලද නො සරුප්කම් හෙතු කොට ගෙණ භික්ෂූහු ගග්ග මහණහට "මෙබඳු ඇවැත් අවත් ආයුෂ්මත් ඒ ඇවැත සිහි කෙරේවා" යි ඇවැතින් චෝදනා කෙරෙත්. හෙ තෙමේ මෙසේ කියයි: "ඇවැත්නි, මම සිත් පෙරළීමෙන් උමතු වීම්. සිත් පෙරළීමෙන් උමතු වූ මා විසින් වචනයෙන් කියූ කයින් මැඩූ බොහෝ නො සරුප්කම් කරණ ලදී. මම එය නො සමරම්. මුළා වූ මා විසින් මෙය කරණ ලදැ"යි. මෙසේ කියනු ලබන්නාහු ද "මෙබඳු ඇවැත් අවත් ආයුෂ්මත් ඒ ඇවැත සිහි කෙරේවා"යි ඔහුට චෝදනා කෙරෙත් ම ය.

2. යම් මහණහු අපිස් වූවාහු නම් ... ඔහු අවමන් කෙරෙත්, නුගුණ කියත්, දෙස් පතල කෙරෙත්: "සිත් පෙරළීමෙන් උමතු වූවහු විසින් කළ කම් හෙතු කොට ගෙණ භික්ෂූහු කෙසේ නම් ගග්ග මහණහට 'මෙබඳු ඇවැත් අවත් ආයුෂ්මත් ඒ ඇවැත සිහි කෙරේවා'යි ඇවැතින් චෝදනා කළාහු ද – හෙ තෙමේ මෙසේ කියයි: 'ඇවැත්නි, මම සිත් පෙරළීමෙන් උමතු වීම්. සිත් පෙරළීමෙන් උමතු වූ ඒ මා විසින් බසින් බිණූ කයින් මැඩූ බොහෝ නො සරුප්කම් කරණ ලදී. මම එය නො සමරම්. මුළාවූ මා විසින් මෙය කරණ ලදැ'යි. මෙසේ කියනු ලබන්නාහු ද 'මෙබඳු ඇවැත් අවත් ආයුෂ්මත් ඒ ඇවැත සිහි කෙරේවා' යි ඔහුට චෝදනා කෙරෙත් ම ය. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙ කරුණ සැල කළහ. මහණෙනි, සැබෑ ද ... 'භාග්‍යවතුන් වහන්ස, සැබෑව්.' භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ගැරහූ සේක... ගරහා... දැහැමි කථා කොට භික්ෂූන් ඇමතූ සේක:

3. මහණෙනි, එසේ නම් සඞ්ඝ තෙමේ ගග්ග මහණහට අමූළ්හවිනය දේවා. මහණෙනි, මෙසේ දිය යුතු: මහණෙනි, ගග්ග මහණහු විසින් සඞ්ඝ වෙත එළඹ උතුරුසඟල එකස් කොට වැඩිමහලු මහණුන්ගේ පා වැඳ උළුක්කෙන් හිඳ ඇඳිලි බැඳ මෙසේ කිය යුතු වන්නේ ය: වහන්ස, මම සිත් පෙරළීමෙන් උමතු වීම්. සිත් පෙරළීමෙන් උමතු වූ ඒ මා විසින් බසින් කියනලද කයින් මඩනා ලද බොහෝ නො සරුප්කම් කරණ ලදී. සිත් පෙරළුනු උමතු වූවහු විසින් කරණ ලද නො සරුප්කම් හේතු කොට ගෙණ "මෙබඳු ඇවැතකට පැමිණි ආයුෂ්මත් ඒ ඇවැත සිහි කෙරේවා"යි භික්ෂූහු මට ඇවතින් චෝදනා කෙරෙත් ඔවුන්ට මම මෙසේ කියම්: –

* සතිවිනය දීම මේ පස් කරුණින් යුක්තවූයේ දැහැමිකම් වේ යනු මෙහි අදහසි.

"අහං ඛො ආවුසො, උම්මත්තකො අහොසිං චිත්තවිපරියාසකතො තෙන මෙ උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං භාසිතපරික්කන්තං. නාහන්තං සරාමි. මූළ්හෙන මෙ එතං කතන්ති. එවම්පි මං වුච්චමානා චොදෙන්තෙව: 'සරතායස්මා එවරූපිං ආපත්ති ආපජ්ජිතා'ති. සොහං භන්තෙ අමූළ්හො සඞ්ඝං අමූළ්හවිනයං යාචාමී"ති. දුතියම්පි යාචිතබ්බො -පෙ- තතියම්පි යාචිතබ්බො: "අහං භන්තෙ උම්මත්තකො අහොසිං චිත්තවිපරියාසකතො. තෙන මෙ උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං භාසිතපරික්කන්තං. මං භික්ඛූ උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන අජ්ඣාචිණ්ණෙන ආපත්තියා චොදෙන්ති. 'සරතායස්මා එවරූපිං ආපත්තිං ආපජ්ජිතා'ති. ත්‍යාහං එවං වදාමි: අහං ඛො ආවුසො උම්මත්තකො අහොසිං චිත්තවිපරියාසකතො, තෙන මෙ උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං භාසිතපරික්කන්තං. නාහන්තං සරාමි. මූළ්හෙන මෙ එතං කත"න්ති. එවම්පි මං වුච්චමානා චොදෙන්තෙව: 'සරතායස්මා එවරූපිං ආපත්තිං ආපජ්ජිතා'ති. සොහං භන්තෙ අමූළ්හො. තතියම්පි භන්තෙ, සඞ්ඝං අමූළ්හවිනයං යාචාමී"ති.

4. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: අයං ගග්ගො භික්ඛු උම්මත්තකො අහොසි චිත්තවිපරියාසකතො. තෙන උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං භාසිතපරික්කන්තං. භික්ඛූ ගග්ගං භික්ඛුං උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන අජ්ඣාචිණ්ණෙන ආපත්තියා චොදෙන්ති: 'සරතායස්මා එවරූපිං ආපත්තිං ආපජ්ජිතා'ති. සො එවං වදෙති: 'අහං ඛො ආවුසො උම්මත්තකො අහොසිං චිත්තවිපරියාසකතො. තෙන මෙ උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං භාසිතපරික්කන්තං. නාහං තං සරාමි. මූළ්හෙන මෙ එතං කතන්ති. එවම්පි නං වුච්චමානා චොදෙන්තෙව. 'සරතායස්මා එවරූපිං ආපත්තිං ආපජ්ජිතා'ති. සො අමූළ්හො සඞ්ඝං අමූළ්හවිනයං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ගග්ගස්ස භික්ඛුනො අමූළ්හස්ස අමූළ්හවිනයං දදෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: අයං ගග්ගො භික්ඛු උම්මත්තකො අහොසි චිත්තවිපරියාසකතො. තෙන උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං භාසිතපරික්කන්තං. භික්ඛූ ගග්ගං භික්ඛුං උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන අජ්ඣාචිණ්ණෙන ආපත්තියා චොදෙන්තෙව 'සරතායස්මා එවරූපිං ආපත්තිං ආපජ්ජිතා'ති. සො එවං වදෙති:

''ඇවැත්නි, මම වූ කලි සිත් පෙරළීමට පත් උමතුවෙකිම් වීමි, සිත් පෙරළීමට පත් උමතුවකු වූ ඒ මා විසින් බසින් කියන ලද, කයින් කරණ ලද බොහෝ අශ්‍රාමණක දෑ (මහණුන් විසින් නො කටයුතු නොසරුප්කම්) කරණ ලදී. මම එය නො සමරමි. සිහි මුළා වූ මා විසින් එය කරණ ලදී යනුවෙනි.'' මෙසේත් (මා විසින්) කියනු ලබන ඒ මහණහු මට ''ආයුෂ්මත් තෙමේ මෙ බඳු ඇවතකට පැමිණියා සිහි කෙරේවා''යි චෝදනා කෙරෙත් ම ය. වහන්ස ඒ මම් (දැන්) පහ වූ සිහි මුළාව ඇත්තෙම් (සිහිමුළායෙන් මිදුනෙම්) සංඝයා වෙතින් අමූළ්හ විනයය ඉල්ලමි''යි යාච්ඤා කළ යුතු. දෙවෙනි වර ද ......යාච්ඤා කළ යුතු. තෙවෙනි වර ද, ''වහන්ස, මම සිත් පෙරළීමට පත් උමතුවෙකිම් වීමි. සිත්පෙරළීමට පත් උමතුවකු වූ ඒ මා විසින් බසින් කියන ලද කයින් කරණ ලද බොහෝ අශ්‍රාමණක දෑ (මහණුන් විසින් නොකටයුතු නො සරුප්කම්) කරණ ලදි. සිත් පෙරළීමට පත් උමතුවකු වූ මා විසින් කරණ ලද දෑ කරණ කොට ගෙන, ''ආයුෂ්මත්තෙමේ මෙ බඳු ඇවැතකට පැමිණියා සිහි කෙරේවා''යි මට ඇවැතින් චෝදනා කෙරෙත්. මම ඔවුනට මෙසේ කියමි: ''ඇවැත්නි, මම වූ කලි සිත් පෙරළීමට පත් උමතුවෙකිම් වීමි. සිත්පෙරළීමට පත් උමතුවකු වූ ඒ මා විසින් බසින් කියන ලද කයින් කරණ ලද බොහෝ අශ්‍රාමණක දෑ (මහණුන් විසින් නොකටයුතු නොසරුප්කම්) කරණ ලදී. මම එය නො සමරමි. සිහි මුළා වූ මා විසින් එය කරණ ලදී'' යනුවෙනි. මෙසේත් (මා විසින්) කියනු ලබන ඒ මහණහු මට ''ආයුෂ්මත් තෙමේ මෙ බඳු ඇවැතකට පැමිණියා සිහි කෙරේවා''යි චෝදනා කෙරෙත් ම ය. වහන්ස, ඒ මම් (දැන්) පහ වූ සිහි මුළාව ඇත්තෙම් (සිහි මුළායෙන් මිදුණෙම්) තුන්වැනි වරද සංඝයා වෙතින් අමූළ්හ විනයය ඉල්ලමි''යි යාච්ඤා කළ යුතු.

4. ව්‍යක්ත වූ ප්‍රබල වූ මහණක්හු විසින් සංඝ තෙමේ මෙසේ දැන්විය යුතු: ''වහන්ස, සංඝ තෙමේ මගේ වචනය අසාවා: මේ ගර්ග මහණ තෙම උමතු වූයේ සිත් පෙරළීමට පැමිණියේ විය. උමතු වූ සිත් පෙරළියට පත් වචනයෙන් කියන ලද්දවූ ද කයින් කරණ ලද්දවූ ද බොහෝ අශ්‍රාමණක දෑ (මහණුනට නො සරුප් වූ බොහෝ දෑ) කරණ ලද්දේ ය. මහණහු උමතු වූ සිත් පෙරළියට පැමිණ කරණ ලද දෑ කරණ කොට ගෙන ගර්ග මහණහට ''ආයුෂ්මත් තෙමේ මෙබඳු ඇවැතකට පැමිණියා සිහි කෙරේවා''යි ඇවැතින් චෝදනා කෙරෙත්. හෙ තෙම ඇවැත්නි, මම වූ කලි උමතු වූයෙම් සිත් පෙරළියට පැමිණියෙම් වීමි. උමතු වූ සිත් පෙරළියට පැමිණි ඒ මා විසින් වචනයෙන් ද කයින් ද බොහෝ අශ්‍රාමණක නොසරුප් කම් කරණ ලදී. මම ඒ දෑ නො සමරමි. ඒ දෑ සිහි මුළා වූ මා විසින් කරණ ලද්දේ යැ' යි මෙසේ කියයි. ඔහු මෙසේ කියනු ලබන්නාහු ද ඒ මහණහට 'ආයුෂ්මත් තෙමේ මෙබඳු ඇවැතකට පැමිණියා සිහි කෙරේවා'යි චෝදනා කෙරෙත් ම ය. සිහි මුළායෙන් මිදුණු හෙතෙම සංඝයා වෙතින් අමූළ්හ විනය යදී. ඉදින් සංඝයාට පැමිණි කල් ඇත්තේ වී නම්, සංඝ තෙමේ සිහිමුළා බැවින් මිදුණු ගර්ග මහණහට අමූළ්හ විනය දෙන්නේ ය. මේ ඥප්ති යි (දැනුම් දීම යි).

වහන්ස, සංඝ තෙමේ මගේ වචනය අසාවා: මේ ගර්ග මහණ තෙම සිත් පෙරළියට පැමිණි උමතුවෙක් විය. සිත් පෙරළියට පත් උමතු වූ ඔහු විසින් වාචසික වූ ද කායික වූ ද බොහෝ අශ්‍රාමණක දෑ (මහණුනට නො සරුප් දෑ) කරණ ලදී. මහණහු සිත් පෙරළියට පැමිණි උමතු වූ මොහු විසින් කරණ ලද දෑ කරණ කොට ගෙන 'ආයුෂ්මත් තෙමේ මෙබඳු ඇවැතකට පැමිණියා සිහි කෙරේවා''යි ගර්ග මහණහට ඇවැතින් චෝදනා කෙරෙත් ම ය. (එවිට) හෙ තෙමේ මෙසේ කියයි:

අහං ඛො ආවුසො උම්මත්තකො අහොසිං චිත්තවිපරියාසකතො. තෙන මෙ උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං භාසිතපරික්කන්තං. නාහං තං සරාමි. මූළ්හෙන මෙ එතං කතන්ති. එවම්පි නං වුච්චමානා චොදෙන්තෙව 'සරතායස්මා එවරූපිං ආපත්තිං ආපජ්ජිතා'ති. සො අමූළ්හො සඞ්ඝං අමූළ්හවිනයං යාචති. සඞ්ඝො ගග්ගස්ස භික්ඛුනො අමූළ්හස්ස අමූළ්හවිනයං දෙති. යස්සායස්මතො ඛමති ගග්ගස්ස භික්ඛුනො අමූළ්හස්ස අමූළ්හවිනයස්ස දානං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

දුතියම්පි එතමත්ථං වදාමි -පෙ- තතියම්පි එතමත්ථං වදාමි -පෙ- දින්නො සඞ්ඝෙන ගග්ගස්ස භික්ඛුනො අමූළ්හස්ස අමූළ්හවිනයො. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමීති.

5. තීණිමානි භික්ඛවෙ අධම්මිකානි අමූළ්හවිනයස්ස දානානි. තීණි ධම්මිකානි.

කතමානි තීණි අධම්මිකානි අමූළ්හවිනයස්ස දානානි? ඉධ පන භික්ඛවෙ භික්ඛු ආපත්තිං ආපන්නො හොති තමෙනං චොදෙති සඞ්ඝො වා සම්බහුලා වා එකපුග්ගලො වා: සරතායස්මා එවරූපිං ආපත්තිං ආපජ්ජිතාති. සො සරමානො ව එවං වදෙති: න ඛො අහං ආවුසො සරාමි එවරූපිං ආපත්තිං ආපජ්ජිතාති. තස්ස සඞ්ඝො අමූළ්හවිනයං දෙති. අධම්මිකං අමූළ්හවිනයස්ස දානං.

ඉධ පන භික්ඛවෙ භික්ඛු ආපත්තිං ආපන්නො හොති තමෙනං චොදෙති සඞ්ඝො වා සම්බහුලා වා එකපුග්ගලො වා: සරතායස්මා එවරූපිං ආපත්තිං ආපජ්ජිතාති. සො සරමානො ව එවං වදෙති: සරාමි ඛො අහං ආවුසො යථා සුපිනන්තෙනාති. තස්ස සඞ්ඝො අමූළ්හවිනයං දෙති. අධම්මිකං අමූළ්හවිනයස්ස දානං.

ඉධ පන භික්ඛවෙ භික්ඛු ආපත්තිං ආපන්නො හොති. තමෙනං චොදෙති සඞ්ඝො වා සම්බහුලා වා එකපුග්ගලො වා: සරතායස්මා එවරූපිං ආපත්තිං ආපජ්ජිතාති. සො අනුම්මත්තකො උම්මත්තකාලයං කරොති: අහම්පි ඛො එවං කරොමි, තුම්හෙපි එවං කරොථ, මය්හම්පි එතං කප්පති, තුම්හාකම්පෙතං කප්පතීති. තස්ස සඞ්ඝො අමූළ්හවිනයං දෙති. අධම්මිකං අමූළ්හවිනයස්ස දානං. ඉමානි තීණි අධම්මිකානි අමූළ්හවිනයස්ස දානානි.

'ඇවැත්නි, සිත් පෙරළියට පැමිණි උමතුවෙක් වීමි...' යනුවෙනි. හේ සිහි මුළාවෙන් මිදුනේ සංඝයා වෙතින් අමූළ්හවිනයය ඉල්ලයි, සංඝ තෙමේ සිහිමුළාවෙන් මිදුණු ගග්ග මහණහට අමූළ්හවිනයය දෙයි. ගග්ග මහණහට අමූළ්හ විනයය දීම යම් ආයුෂ්මතක්හට රිසියෙයි නම් හේ නිහඬ වේවා. යම් ආයුෂ්මතක් හට නො රිසියෙයි නම් හේ කියාවා.

දෙවනු ව ද මෙ කරුණ කියමි... තෙවනු ව ද මෙ කරුණ කියමි... සංඝයා විසින් සිහිමුළාවෙන් මිදුණු ගග්ග මහණහට අමූළ්හ විනයය දෙන ලද්දේ ය. එය සඞ්ඝයාට රිසියෙයි. එ හෙයින් නිහඬ වෙයි. මෙසේ මෙ කරුණ නුවණින් සලකමි''.

5. මහණෙනි, මේ නො දැහැමි වූ අමූළ්හවිනයය දීම් තුනෙකි. දැහැමි වූ අමූළ්හවිනයය දීම් තුනෙකි.

නොදැහැමි වූ අමූළ්හවිනය දන තුන කවර? යත්: මහණෙනි, මෙහි මහණ තෙම ඇවැතකට පැමිණියේ වෙයි. ඔහුට සංඝ තෙමේ හෝ බොහෝ භික්ෂූහු හෝ එක් පුහුලෙක් හෝ ''ආයුෂ්මත් තෙමේ 'මෙබඳු ඇවැතකට පැමිණියෙමි'යි සිහි කෙරේ වා''යි චෝදනා කෙරෙයි. හේ සිහි කරන්නේ ම ''ඇවැත්නි මෙබඳු ඇවැතකට පැමිණියෙම් වෙමියි නො ම සිහි කරමි''යි මෙසේ කියයි. සඞ්ඝයා ඔහුට අමූළ්හවිනය දෙයි. මේ නො දැහැමි වූ අමූළ්හවිනය දීමෙකි.

මහණෙනි, මෙහි මහණෙක් ඇවැතකට පැමිණියේ වෙයි. ඔහුට සංඝ තෙමේ හෝ බොහෝ මහණහු හෝ එක් පුහුලෙක් හෝ 'මෙබඳු ඇවැතකට පැමිණියෙමි යි ආයුෂ්මත් තෙමේ සිහි කෙරේවා'යි ඔහුට චෝදනා කෙරෙයි. හේ සිහි කරන්නේ ම 'ඇවැත්නි, සිහිනයෙකින් මෙන් සිහි කරම්'යි මෙසේ කියයි. ඔහුට සංඝයා අමූළ්හ විනය දෙයි. මේ නොදැහැමි වූ අමූළ්හවිනයය දීමෙකි.

මහණෙනි, මෙහි මහණෙක් ඇවැතකට පැමිණියේ වෙයි. සංඝ තෙමේ හෝ බොහෝ මහණහු හෝ එක් පුද්ගලයෙක් හෝ 'මෙබඳු ඇවැතකට පැමිණියෙම් වෙමි'යි ආයුෂ්මත් තෙමේ සිහි කෙරේවා' යි ඔහුට චෝදනා කෙරෙයි, හේ උමතු නොවන්නේ ම 'මමත් මෙසේ කෙරෙමි, තෙපිත් මෙසේ කරහු, මටත් මෙය කැප ය, තොපටත් මෙය කැප වේ'යැ යි උමතුවක්හු සේ කථා කෙරෙයි. සංඝයා ඔහුට අමූළ්හවිනයය දෙයි. මේ නොදැහැමි වූ අමූළ්හවිනය දනයෙකි. මෙසේ අමූළ්හවිනයයාගේ මේ නොදැහැමි වූ දීම් තුනෙකි.

6. කතමානි තීණි ධම්මිකානි අමූළ්හවිනයස්ස දානානි? ඉධ පන භික්ඛවෙ භික්ඛු උම්මත්තකො හොති චිත්තවිපරියාසකතො. තෙන උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං හොති භාසිතපරික්කන්තං. තමෙනං චොදෙන්ති සඞ්ඝො වා සම්බහුලා වා එකපුග්ගලො වා; සරතායස්මා එවරූපිං ආපත්තිං ආපජ්ජිතාති. සො අසරමානො'ව එවං වදෙති. න ඛො අහං ආවුසො සරාමි එවරූපිං ආපත්තිං ආපජ්ජිතාති. තස්ස සඞ්ඝො අමූළ්හවිනයං දෙති. ධම්මිකං අමූළ්හවිනයස්ස දානං.

ඉධ පන භික්ඛවෙ භික්ඛු උම්මත්තකො හොති චිත්තවිපරියාසකතො. තෙන උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං හොති භාසිතපරික්කන්තං. තමෙනං චොදෙන්ති සඞ්ඝො වා සම්බහුලා වා එකපුග්ගලො වා: සරතායස්මා එවරූපිං ආපත්තිං ආපජ්ජිතාති. සො අසරමානො'ව එවං වදෙති: සරාමි ඛො අහං ආවුසො යථාසුපිනන්තෙනාති. තස්ස සඞ්ඝො අමූළ්හවිනයං දෙති. ධම්මිකං අමූළ්හවිනයස්ස දානං.

ඉධ පන භික්ඛවෙ භික්ඛු උම්මත්තකො හොති චිත්තවිපරියාසකතො. තෙන උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං හොති භාසිතපරික්කන්තං. තමෙනං චොදෙන්ති සඞ්ඝො වා සම්බහුලා වා එකපුග්ගලො වා: සරතායස්මා එවරූපිං ආපත්තිං ආපජ්ජිතාති. සො උම්මත්තකො උම්මත්තකාලයං කරොති: අහම්පි එවං කරොමි, තුම්හෙපි එවං කරොථ. මය්හම්පි එතං කප්පති, තුම්හාකම්පෙතං කප්පතීති. තස්ස සඞ්ඝො අමූළ්හවිනයං දෙති. ධම්මිකං අමූළ්හවිනයස්ස දානං.

ඉමානි තීණි ධම්මිකානි අමූළ්හවිනයස්ස දානානීති.

පටිඤ්ඤාතකරණං

7. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ අපටිඤ්ඤාය භික්ඛූනං කම්මානි කරොන්ති තජ්ජනීයම්පි නියස්සම්පි පබ්බාජනීයම්පි පටිසාරණීයම්පි උක්ඛෙපනීයම්පි. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ අපටිඤ්ඤාය භික්ඛූනං කම්මානි කරිස්සන්ති තජ්ජනීයම්පි පබ්බාජනීයම්පි නියස්සම්පි පටිසාරණීයම්පි උක්ඛෙපනීයම්පීති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- සච්චං කිර භික්ඛවෙ -පෙ-

6. දැහැමි වූ අමූළ්හ විනයයා ගේ දීම තුන කවර යත්: මහණෙනි, මෙහි මහණෙක් සිත් පෙරළියට ගිය උමතුවෙක් වෙයි. සිත් පෙරළියට ගිය උමතු වූ ඔහු විසින් වාචසික වූ ද කායික වූ ද බොහෝ අශ්‍රාමණක දෑ කරන ලද්දේ වෙයි. සංඝයා හෝ බොහෝ භික්ෂූහු හෝ එක් පුඟුලෙක් හෝ 'තමා මෙබඳු ඇවැතකට පැමිණෙන්නා ආයුෂ්මත් තෙමේ සිහි කෙරේවා' යි ඔහුට චෝදනා කෙරෙයි. හේ සිහි නොකරන්නේ ම 'ඇවැත්නි, මෙබඳු ඇවැතකට පැමිණියෙමි'යි මම නො ම සිහි කෙරෙමි'යි මෙසේ කියයි. සංඝ තෙමේ ඔහුට අමූළ්හවිනයය දෙයි. අමූළ්හවිනයයා ගේ ඒ දීම දැහැමි ය.

මහණෙනි, මෙහි මහණෙක් වනාහි සිත් පෙරළියට ගිය උමතුවෙක් වෙයි. සිත් පෙරළියට පැමිණි උමතු වූ ඔහු විසින් වාචසික වූ ද කායික වූ ද බොහෝ අශ්‍රාමණක දෑ කරන ලද්දේ වෙයි. සංඝයා හෝ බොහෝ මහණහු හෝ එක් පුඟුලෙක් හෝ තමා මෙබඳු ඇවැතකට පැමිණියා ආයුෂ්මත් තෙමේ සිහි කෙරේවා'යි ඔහුට චෝදනා කෙරෙයි. හේ සිහි නො කරනුයේ ම 'ඇවැත්නි, මම සිහිනෙන් මෙන් සිහි කෙරෙමි යි මෙසේ කියයි. සංඝයා ඔහුට අමූළ්හවිනය දෙයි. ඒ අමූළ්හවිනයයා ගේ දනය දැහැමි යි.

මහණෙනි, මෙහි මහණෙක් වනාහි සිහි පෙරළියට ගිය උමතුවෙක් වෙයි. සිහි පෙරළියට ගිය උමතු වූ ඔහු විසින් වාචසික වූ ද කායික වූ ද බොහෝ අශ්‍රාමණක දෑ කරන ලද්දේ වෙයි සංඝයා හෝ බොහෝ මහණහු හෝ එක් පුඟුලෙක් (එක් මහණෙක්) හෝ ඔහුට 'මෙබඳු ඇවැතකට තමා පැමිණියා ආයුෂ්මත් තෙමේ සිහි කෙරේවා' යි චෝදනා කෙරෙයි. හේ උමතු වූයේ 'මමත් මෙසේ කරමි, තෙපිත් මෙසේ කරවු, මටත් මෙය කැප ය, තොපටත් මෙය කැප යැ'යි උමතු අයුරක් කරයි. සංඝ තෙමේ ඔහුට අමූළ්හවිනයය දෙයි. අමූළ්හවිනයයාගේ ඒ දීම දැහැමි යි.

මේ දැහැමි වූ අමූළ්හවිනය දීම් තුන ය.''

ප්‍රතිඥතකරණය

7. එ සමයෙහි වනාහි ෂඩ්වර්ගික භික්ෂූහු අප්‍රතිඥයෙන් (වරද කළම්හ යි වුදිතයන්ගේ ප්‍රතිඥවක් නැති ව) මහණුනට තජ්ජනීය කර්‍මය ද නියස්සකර්‍මය ද පබ්බාජනීය කර්‍මය ද පටිසාරණීයකර්මය ද උක්ඛෙපනීය කර්මය ද කරත්. යම් මහණ කෙනෙක් අල්පේච්ඡ ද ... ඔහු කෙසේ නම් සවැගි මහණහු ප්‍රතිඥා රහිත ව මහණුනට තජ්ජනියකර්මයත් නියස්ස කර්මයත් පබ්බාජනියකර්මයත් පටිසාරණියකර්මයත් උක්ඛෙපනීය කර්මයත් කෙරෙත් දැ'යි දවමන් කෙරෙත් දෙස් කියත්, නුගුණ පතුරුවත්. ඉක්බිති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළහ... මහණෙනි, ඒ සැබෑ ද?... අසා වදාළ සේක.

සච්චං භගවා –පෙ– විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: න භික්ඛවෙ අපටිඤ්ඤාය භික්ඛූනං කම්මං කාතබ්බං තජ්ජනීයං වා නියස්සං වා පබ්බාජනීයං වා පටිසාරණීයං වා උක්ඛෙපනීයං වා. යො කරෙය්‍ය[1] ආපත්ති දුක්කටස්ස.

8. එවං ඛො භික්ඛවෙ අධම්මිකං හොති පටිඤ්ඤාතකරණං: එවං ධම්මිකං. කථඤ්ච භික්ඛවෙ අධම්මිකං හොති පටිඤ්ඤාතකරණං? භික්ඛු පාරාජිකං අජ්ඣාපන්නො හොති. තමෙනං චොදෙති සඞ්ඝො වා සම්බහුලා වා එකපුග්ගලො වා: පාරාජිකං ආයස්මා අජ්ඣාපන්නොති. සො එවං වදෙති: න ඛො අහං ආවුසො පාරාජිකං අජ්ඣාපන්නො සඞ්ඝාදිසෙසං අජ්ඣාපන්නොති තං සඞ්ඝො සඞ්ඝාදිසෙසෙන කාරෙති අධම්මිකං පටිඤ්ඤාතකරණං.

භික්ඛු පාරාජිකං අජ්ඣාපන්නො හොති. තමෙනං චොදෙති සඞ්ඝො වා සම්බහුලා වා එකපුග්ගලො වා පාරාජිකං ආයස්මා අජ්ඣාපන්නොති. සො එවං වදෙති: න ඛො අහං ආවුසො පාරාජිකං අජ්ඣාපන්නො ථුල්ලච්චයං –පෙ– පාචිත්තියං –පෙ– පාටිදෙසනීයං –පෙ– දුක්කටං –පෙ– දුබ්භාසිතං අජ්ඣාපන්නො'ති. තං සඞ්ඝො දුබ්භාසිතෙන කාරෙති අධම්මිකං පටිඤ්ඤාතකරණං. භික්ඛු සඞ්ඝාදිසෙසං –පෙ– ථුල්ලච්චයං –පෙ– පාචිත්තියං –පෙ– පාටිදෙසනීයං –පෙ– දුක්කටං –පෙ– දුබ්භාසිතං අජ්ඣාපන්නො හොති. තමෙනං චොදෙති සඞ්ඝො වා සම්බහුලා වා එකපුග්ගලො වා: දුබ්භාසිතං ආයස්මා අජ්ඣාපන්නොති. සො එවං වදෙති: න ඛො අහං ආවුසො දුබ්භාසිතං අජ්ඣාපන්නො පාරාජිකං අජ්ඣාපන්නොති තං සඞ්ඝො පාරාජිකෙන කාරෙති අධම්මිකං පටිඤ්ඤාතකරණං.

භික්ඛු දුබ්භාසිතං අජ්ඣාපන්නො හොති. තමෙනං චොදෙති සඞ්ඝො වා සම්බහුලා වා එකපුග්ගලො වා: දුබ්භාසිතං ආයස්මා අජ්ඣාපන්නොති. සො එවං වදෙති: න ඛො අහං ආවුසො දුබ්භාසිතං අජ්ඣාපන්නො සඞ්ඝාදිසෙසං අජ්ඣාපන්නොති –පෙ– ථුල්ලච්චයං –පෙ– පාචිත්තියං –පෙ– පාටිදෙසනීයං –පෙ– දුක්කටං අජ්ඣාපන්නොති. තං සඞ්ඝො දුක්කටෙන කාරෙති, අධම්මිකං පටිඤ්ඤාතකරණං. එවං ඛො භික්ඛවෙ අධම්මිකං හොති පටිඤ්ඤාතකරණං.

9. කථඤ්ච භික්ඛවෙ ධම්මිකං හොති පටිඤ්ඤාතකරණං: භික්ඛු පාරාජිකං අජ්ඣාපන්නො හොති. තමෙනං චොදෙති සඞ්ඝො වා සම්බහුලා වා එකපුග්ගලො වා: පාරාජිකං ආයස්මා අජ්ඣාපන්නොති. සො එවං වදෙති: ආමාවුසො පාරාජිකං අජ්ඣාපන්නොති. තං සඞ්ඝො පාරාජිකෙන කාරෙති ධම්මිකං පටිඤ්ඤාතකරණං.

1. කාරෙය්‍ය — මජසං,

'සැබැව, භාග්‍යවතුන්වහන්සැ'යි මහණහු පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ... ගරහා දැහැමි කතා කොට, "මහණෙනි, ප්‍රතිඥා නැති වැ මහණුනට තජ්ජනියකර්මය හෝ නියස්සකර්මය හෝ පබ්බාජනිය කර්මය හෝ පටිසාරණීයකර්මය හෝ උක්ඛෙපනීයකර්මය හෝ නො කළ යුතු. යමෙක් එය කරන්නේ නම්, ඔහුට දුකුළා ඇවැත් වන්නේ ය.

8. මහණෙනි පටිඤ්ඤාතකරණය මෙසේ (මතු දැක්වෙන පරිදි) නො දැහැමි වේ, මෙසේ දැහැමි වේ. මහණෙනි, පටිඤ්ඤාතකරණය කෙසේ නො දැහැමි වේ ද යත්: මහණෙක් පරිජි ඇවැතට පැමිණියේ වෙයි. ඔහුට සංඝයා හෝ බොහෝ මහණහු හෝ එක් මහණෙක් හෝ 'ආයුෂ්මත් තෙමේ පරිජි ඇවැතට පැමිණියේ වේ යැ යි චොදනා කෙරෙයි. එවිට හෙතෙම 'ඇවැත්නි, මම පරිජි ඇවැතට නොපැමිණියෙමි. සඟවෙසෙස් ඇවැතට පැමිණියෙමි'යි මෙසේ කියයි. සංඝ තෙමේ ඔහුට සඟවෙසෙස් ඇවැතින් විනයකර්මය කරවයි. මේ නො දැහැමි ප්‍රතිඥාතකරණ යි.

මහණෙක් පරිජි ඇවැතකට පැමිණියේ වෙයි. ඔහුට සංඝයා හෝ බොහෝ මහණහු හෝ එක් මහණෙක් හෝ 'ආයුෂ්මත් තෙමේ පරිජි ඇවැතට පැමිණියේ වේ' යැ යි චොදනා කෙරෙයි. හෙතෙම 'ඇවැත්නි, මම පරිජි ඇවැතට නො පැමිණියෙමි. මම තුලැසි ඇවැතට පැමිණියෙමි... පචිති ඇවැතට ... පාටිදෙසනිය ඇවැතට ... දුකුළා ඇවැතට ... දුබැසි ඇවැතට පැමිණියෙමි යි මෙසේ කියයි. සංඝ තෙමේ ඔහුට දුබැසි ඇවැතින් විනයකර්ම කරවයි. මේ ද නොදැහැමි ප්‍රතිඥාතකරණ යි.

මහණෙක් දුබැසි ඇවැතකට පැමිණියේ වෙයි. ඔහුට සංඝයා හෝ බොහෝ මහණහු හෝ එක් පුහුලෙක් හෝ 'ආයුෂ්මත් තෙමේ දුබැසි ඇවැතට පැමිණියේ වේ යැ'යි චොදනා කෙරෙයි. ඒ මහණ තෙම 'ඇවැත්නි මම දුබැසි ඇවැතට නො පැමිණියෙමි. සඟවෙසෙස් ඇවැතට පැමිණියෙමි' යි ... 'තුලැසි ඇවැතට පැමිණියෙමි'යි ... 'පචිති ඇවැතට ... පාටිදෙසනිය ඇවැතට... දුකුළා ඇවැතට පැමිණියෙමි'යි මෙසේ හේ කියයි. සංඝ තෙමේ ඔහුට දුකුළා ඇවැතින් විනයකර්මය කරවයි. මේ ප්‍රතිඥතකරණය නො දැහැමි වේ. මහණෙනි, මෙසේ ම ප්‍රතිඥාතකරණය නොදැහැමි වේ.

9. මහණෙනි, ප්‍රතිඥාතකරණය කෙසේ නම් දැහැමි වේ ද? යත්: මහණෙක් පරිජි ඇවැතට පැමිණියේ වෙයි. ඔහුට සංඝයා හෝ බොහෝ මහණහු හෝ එක් පුහුලෙක් හෝ 'ආයුෂ්මත් තෙමේ පරිජි ඇවැතට පැමිණියේ වේ යැ' යි චොදනා කෙරෙයි. හෙ තෙම 'එසේ ය, ඇවැත්නි, පරිජි ඇවැතට පැමිණියෙමි යි මෙසේ කියයි. සංඝ තෙමේ ඔහුට පරිජි ඇවැතින් විනයකර්මය කරවයි. මේ ප්‍රතිඤ්ඤතකරණය දැහැමි වේ.

භික්ඛු සඞ්ඝාදිසෙසං -පෙ- ථුල්ලච්චයං -පෙ- පාචිත්තියං -පෙ- පාටිදෙසනීයං -පෙ- දුක්කටං -පෙ- දුබ්භාසිතං අජ්ඣාපන්නො හොති තමෙනං චොදෙති සඞ්ඝො වා සම්බහුලා වා එකපුග්ගලො වා: දුබ්භාසිතං ආයස්මා අජ්ඣාපන්නොති. සො එවං වදෙති: ආම වූසො දුබ්භාසිතං අජ්ඣාපන්නොති. තං සඞ්ඝො දුබ්භාසිතෙන කාරෙති. ධම්මිකං පටිඤ්ඤාතකරණං.

එවං ඛො භික්ඛවෙ ධම්මිකං හොති පටිඤ්ඤාතකරණන්ති.

යෙභුය්‍යසිකා

10. තෙන ඛො පන සමයෙන භික්ඛු සඞ්ඝමජ්ඣෙ භණ්ඩනජාතා කලහජාතා විවාදපන්නා අඤ්ඤමඤ්ඤං මුඛසත්තීහි විතුදන්තා විහරන්ති. න සක්කොන්ති තං අධිකරණං වූපසමෙතුං. භගවතො එතමත්ථං ආරොචෙසුං. අනුජානාමි භික්ඛවෙ එවරූපං අධිකරණං යෙභුය්‍යසිකාය වූපසමෙතුං.

11. පඤ්චහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු සලාකගාහාපකො සම්මන්නිතබ්බො: යො න ඡන්දාගතිං ගච්ඡෙය්‍ය, න දොසාගතිං ගච්ඡෙය්‍ය, න මොහාගතිං ගච්ඡෙය්‍ය, න භයාගතිං ගච්ඡෙය්‍ය, ගහිතාගහිතඤ්ච ජානෙය්‍ය: එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බො: පඨමං භික්ඛු යාචිතබ්බො. යාචිත්වා ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

''සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං සලාකගාහාපකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං සලාකගාහාපකං සම්මන්නති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො සලාකගාහාපකස්ස සම්මුති, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය. සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු සලාකගාහාපකො. ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී''ති.

මහණෙක් සඟවෙසෙස් ඇවැතට... ථුල්ලැසි ඇවැතට... පචිති ඇවැතට ... පාටිදෙසනිය ඇවැතට... දුකුළා ඇවැතට... දුබැසි ඇවැතට පැමිණියේ වෙයි. ඔහුට සංඝ තෙමේ හෝ බොහෝ මහණහු හෝ එක් පුඟුලෙක් හෝ ‘ආයුෂ්මත් තෙමේ දුබැසි ඇවැතට පැමිණියේ යැ’යි චොදනා කෙරෙයි. හේ ‘එසේ යැ ඇවැත්නි දුබැසි ඇවැතට පැමිණියෙමි’යි මෙසේ කියයි. ඔහුට සංඝ තෙමේ දුබැසි ඇවැතින් විනයකර්‍මය කරවයි. මේ ප්‍රතිඥාතකරණය දැහැමි වේ.

මහණෙනි, මෙසේ ම ප්‍රතිඥාතකරණය දැහැමි වේ.

යෙභුය්‍යසිකාව

10. එ සමයෙහි වනාහි භික්ෂූහු සංඝයා මැදදී උපන් කලහ ඇත්තාහු, හටගත් ඩබර ඇත්තාහු, විවාදපන්න වූවාහු ඔවුනොවුන් මුඛ නැමැති අඩයැටිවලින් විදුනෝ වැ වෙසෙත්. ඒ අධිකරණය සන්හිඳුවන්නට (භික්ෂූහු) සමත් නො වෙත්. භාග්‍යවතුන් වහන්සේට මෙ කරුණ සැලකළහ. “මහණෙනි, මෙබඳු අධිකරණය යෙභුය්‍යසිකායෙන් (ධර්‍මවාදීන් වැඩිතරම දෙනකුගේ මතින් කරන ශමථයෙන්) සන්හිඳුවන්නට අනුදනිමි”යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

(නව ද එය කරන සැටි මෙසේ ද වදාළ සේක:)

11. “මහණෙනි, යම් මහණෙක් ඡන්දයෙන් අගතියට නො යන්නේ ද, ද්වේෂයෙන් අගතියට නො යන්නේ ද, මොහයෙන් අගතියට නො යන්නේ ද, බියෙන් අගතියට නො යන්නේ ද, ගත් නොගත් සලාකා දන්නේ ද මෙ කී අංග පසින් යුත් මහණ තෙම සලාකා ගන්වන්නෙක් කොට සම්මත කටයුතු. මහණෙනි, මෙසේ වනාහි සම්මත කටයුතු: ‘පළමු කොට මහණෙක් යැදියැ යුතු: යැද, ව්‍යක්ත ප්‍රතිබල මහණක්හු විසින් සංඝ තෙමේ මෙසේ දැන්වියැ යුතු:

‘වහන්ස, සංඝ තෙමේ මගේ වචනය අසාවා. ඉදින් සංඝයාට පැමිණි කල් ඇත්තේ වී නම් (මෙයට සුදුසු කාලය යැ යි හැඟේ නම්) සංඝ තෙමේ මෙ නම් මහණහු සලාකගන්වන්නකු කොට සම්මත කරන්නේ ය. මේ ඥප්තිය (දැනුම් දීම) යි.

වහන්ස, සංඝ තෙමේ මගේ වචනය අසාවා. සංඝ තෙමේ මෙ නම් මහණහු සලාකා ගන්වන්නකු කොට සම්මත කෙරෙයි. මෙ මහණහු සලාකා ගන්වන්නකු කොට සම්මත කිරීම යම් ආයුෂ්මතක්හට රිසියේ නම්, හේ නිහඬ වේවා. යම් ආයුෂ්මතක්හට නො රිසියෙන්නේ නම්, හේ කියා වා. සඞ්ඝයා විසින් මෙ නම් මහණ තෙම සලාකා ගන්වන්නෙක් කොට සම්මත විය. සඞ්ඝයාට එය රිසියෙයි. එ හෙයින් නිහඬ ය. මෙසේ මෙය දරමි (සලකමි”) යනුවෙනි.

12. දස ඉමෙ භික්ඛවෙ අධම්මිකා සලාකග්ගාහා, දස ධම්මිකා.

කතමෙ දස අධම්මිකා සලාකග්ගාහා: ඔරමත්තකඤ්ච අධිකරණං හොති. න ච ගතිගතං හොති. න ච සරිතසාරිතං හොති. ජානාති 'අධම්මවාදී බහුතරා'ති. අප්පෙව නාම අධම්මවාදී බහුතරා අස්සූති. ජානාති සඞ්ඝො භිජ්ජිස්සතීති අප්පෙව නාම සඞ්ඝො භිජ්ජෙය්‍යාති. අධම්මෙන ගණ්හන්ති. වග්ගා ගණ්හන්ති, න ච යථාදිට්ඨියා ගණ්හන්ති, ඉමෙ දස අධම්මිකා සලාකග්ගාහා.

කතමෙ දස ධම්මිකා සලාකග්ගාහා: න ච ඔරමත්තකං අධිකරණං හොති, ගතිගතඤ්ච හොති, සරිතසාරිතඤ්ච හොති, ජානාති ධම්මවාදී බහුතරාති. අප්පෙව නාම ධම්මවාදී බහුතරා අස්සූති. ජානාති සඞ්ඝො න භිජ්ජිස්සතීති අප්පෙව නාම සඞ්ඝො න භිජ්ජෙය්‍යාති. ධම්මෙන ගණ්හන්ති, සමග්ගා ගණ්හන්ති, යථාදිට්ඨියා ච ගණ්හන්ති, ඉමෙ දස ධම්මිකා සලාකග්ගාහාති.

තස්සපාපියසිකා

13. තෙන ඛො පන සමයෙන උවාළො[1] භික්ඛු සඞ්ඝමජ්ඣෙ ආපත්තියා අනුයුඤ්ජියමානො අවජානිත්වා පටිජානාති, පටිජානිත්වා අවජානාති, අඤ්ඤෙන අඤ්ඤං පටිචරති, සම්පජානමුසා භාසති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: කථං හි නාම උවාළො භික්ඛු සඞ්ඝමජ්ඣෙ ආපත්තියා අනුයුඤ්ජියමානො අවජානිත්වා පටිජානිස්සති, පටිජානිත්වා අවජානිස්සති, අඤ්ඤෙන අඤ්ඤං පටිචරිස්සති, සම්පජානමුසා භාසිස්සතීති.

1. උපවාළො - මජසං

12. "මහණෙනි, මේ නො දැහැමි සලාකා ගැන්වීම් දසයෙක, දැහැමි සලාකා ගැන්වීම් දසයෙක.

නොදැහැමි සලාකා ගැන්වීම් දසය කවර යැ: අධිකරණය අල්පමාත්‍ර එකෙක් වෙයි, ආවාස දෙක තුනකට නො ගියේ වෙයි (නොහොත් දෙතුන් වරක් විනිශ්චය නො කරන ලද්දේ වෙයි). දෙතුන් වරක් ඒ මහණුන් විසින් සිහි නො කරන ලද්දේ ද අනුන් ලවා සිහි නොකරවන ලද්දේ ද වෙයි. අධර්මවාදීහු වැඩිතරම් යැ යි දනී. අධර්මවාදීහු වැඩිතරම් වන්නාහු නම් ඉතා යෙහෙකැ යි සිතා සලාකා ගන්වයි. සඞ්ඝයා බිඳෙතැ යි දනී. සංඝයා බිඳෙතොත් ඉතා යෙහෙකැ යි සිතා සලාකා ගන්වයි. නො දැහැමින් (අධර්මවාදී අපි වඩා බලවත් වන්නමු. යි සිතා සලාකා දෙක දෙක බැගින්) ගනිත්. ව්‍යග්‍ර වැ (ධර්මවාදී) සලාකා අඩු වනු පිණිස ධර්මවාදී දෙදෙනෙක් එක් සලාකාව බැගින්) ගනිත්. තමන් ගේ දෘෂ්ටිය වූ පරිදි සලාකා නො ගනිත්. මේ නොදැහැමි සලාකා ගැනුම් දසය යැ.

දැහැමි සලාකා ගැනුම් දසය කවර යැ: අධිකරණය අල්පමාත්‍ර නො වෙයි, ආවාසයනට ගියේ වෙයි (නොහොත් දෙතුන් වරක් විනිශ්චය කරන ලද්දේ වෙයි, ඒ මහණුන් විසින් දෙතුන් වරක් සිහි කරන ලද්දේ ද අනුන් ලවා සිහි කරවන ලද්දේ ද වෙයි. ධර්මවාදීන් ඉතා වැඩිතරම් ගණනෙක් වෙති යි දනී, සංඝයා නො බිඳෙන්නේ යැ යි, සංඝයා නො බිඳෙන්නේ නම් ඉතා යෙහෙකැ යි දනී. දැහැමින් සලාකා ගනිත්, (දෙදෙනෙක් එක සලාකාවක් නො ගෙන) සමග වැ සලාකා ගනිත්, (පක්ෂය තර කැර ගැන්ම පිණිස නො වැ) තමන් ගේ දෘෂ්ටිය පරිදි සලාකා ගනිත්. මේ දැහැමි සලාකා ගැනුම් දසය යැ''යි ද වදාළ සේක.

තස්සපාපියාසිකාව

13. එ සමයෙහි වනාහි උවාළ නම් මහණ තෙම සඟ මැදදී ඇවැතින් පිරික්සනු ලබනුයේ, අවඥ කොට ප්‍රතිඥ කෙරෙයි. ප්‍රතිඥ කොට අවඥ කෙරෙයි. එකෙකින් අනෙකක් වසාලයි, දැන බොරු කියයි. යම් මහණ කෙනෙක් අල්පේච්ඡ ද, ඔහු ... උවාළ මහණ තෙම කෙසේ නම් සඟ මැදදී ඇවැතින් පිරික්සනු ලබනුයේ කෙසේ නම් අවඥ කොට ප්‍රතිඥ කරන්නේ ද, ප්‍රතිඥ කොට අවඥ කරන්නේ ද, එකෙකින් අනෙකක් වසාලන්නේ ද, දැන දැන බොරු කියන්නේ ද'යි පහත් කොට සිතත්, දෙස් කියත්, අගුණ පතුරුවත්.

14. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. 'සච්චං කිර භික්ඛවෙ -පෙ-' 'සච්චං භගවා -පෙ-' විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: තෙන හි භික්ඛවෙ සඞ්ඝො උවාළස්ස භික්ඛුනො තස්සපාපියසිකාකම්මං කරොතු. එවඤ්ච පන භික්ඛවෙ කාතබ්බං: පඨමං උවාළෙ භික්ඛු චොදෙතබ්බො: චොදෙත්වා සාරෙතබ්බො: සාරෙත්වා ආපත්තිං ආරොපෙතබ්බො: ආපත්තිං ආරොපෙත්වා ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

''සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අයං උවාළො භික්ඛු සඞ්ඝමජ්ඣෙ ආපත්තියා අනුයුඤ්ජියමානො අවජානිත්වා පටිජානාති. පටිජානිත්වා අවජානාති. අඤ්ඤෙන අඤ්ඤං පටිචරති. සම්පජානමුසා භාසති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො උවාළස්ස භික්ඛුනො තස්සපාපියසිකාකම්මං කරෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: අයං උවාළො භික්ඛු -පෙ- සම්පජානමුසා භාසති. සඞ්ඝො උවාළස්ස භික්ඛුනො තස්සපාපියසිකාකම්මං කරොති. යස්සායස්මතො ඛමති උවාළස්ස භික්ඛුනො තස්සපාපියසිකාකම්මස්ස කරණං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය. දුතියම්පි එතමත්ථං වදාමි -පෙ- තතියම්පි එතමත්ථං වදාමි -පෙ-.

කතං සඞ්ඝෙන උවාළස්ස භික්ඛුනො තස්සපාපියසිකාකම්මං. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී''ති.

පඤ්චිමානි භික්ඛවෙ ධම්මිකානි තස්සපාපියසිකාකම්මස්ස කරණානි: අසුචි ච හොති අලජ්ජී ච සානුවාදො ච, තස්ස සඞ්ඝො තස්සපාපියසිකාකම්මං කරොති ධම්මෙන සමග්ගෙහ.[1] ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච ධම්මිකානි තස්සපාපියසිකාකම්මස්ස කරණානි.

1. සමග්ගෙන - මජසං

14. ඉක්බිති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහු ය. 'මහණෙනි, ... සැබෑ ද?' යි භාග්‍යවතුන් වහන්සේ අසා වදාළ සේක. 'සැබැව වහන්සැ'යි මහණහු පිළිවදන් දුන්හ ... භාග්‍යවතුන් වහන්සේ ... ගරහා දැහැමි කථා කොට මහණුන් බණවා, 'මහණෙනි, එසේ වී නම් සඞ්ඝ තෙමේ උවාළ මහණහට තස්සපාපියාසිකා කර්‍මය (පාපෝත්සන්න පුද්ගලයාට කළ යුතු විනයකර්‍මය) කෙරේ වා. මහණෙනි, මෙසේ එය කළ යුතු: පළමු කොට උවාළ තෙම චොදයිතව්‍ය ය. චොදනා කොට ඇවැත සිහි කැරවිය යුතු. සිහි කරවා ඇවැත නැංවිය යුතු. ඇවැත නංවා ව්‍යක්ත ප්‍රතිබල මහණක්හු විසින් සඞ්ඝ තෙමේ මෙසේ දැන්විය යුතු:

''සඞ්ඝ තෙමේ මගේ වචනය අසාවා. මේ උවාළ මහණ තෙම සඟ මැදදී ඇවැතින් පිරික්සනු ලබන්නේ, අවමන් කොට පිළින කෙරෙයි, පිළින කොට අවමන් කෙරෙයි. එකෙකින් අනෙකක් වසාලයි, දැන දැන බොරු කියයි. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ (සුදුසු කල් ඇත්තේ) වී නම්, සංඝ තෙමේ උවාළ මහණ හට තස්සපාපියාසිකාකර්‍මය කරන්නේ ය. මේ ඤප්තිය යැ.

වහන්ස, සංඝ තෙමේ මගේ වචනය අසවා. මේ උවාළ මහණ තෙම... දැන දැන බොරු කියයි. සංඝ තෙමේ උවාළ මහණහට තස්සපාපියාසිකාකර්‍මය කෙරෙයි. උවාළ මහණහට තස්සපාපියාසිකාකර්‍මය කිරීම යම් මහණකුහට රිසියෙයි ද හේ නිහඬ වේවා. යම් මහණකුට නොරිසියෙයි ද හේ කියාවා. දෙවැනි වර ද මෙ කරුණ කියමි. ... තෙවෙනි වර ද මෙ කරුණ කියමි......

සංඝයා, විසින් උවාළ මහණහට තස්සපාපියාසිකාකර්‍මය කරණ ලදී. එය සංඝයාට රිසියෙයි, එහෙයින් නිහඬ ය. මෙසේ මේ කරුණ දරමි (සලකමි)'' යනුවෙනි.

මහණෙනි, දැහැමි වූ මේ තස්සපාපියාසිකාකර්‍ම කිරීම පසෙකි. මහණ තෙම අපිරිසිදු වූ කාය වාක් කර්‍ම ඇත්තේ වේ ද, අලජ්ජී වේ ද (දැන දැන ඇවැත් අවදනා සුලුවේ ද), උපවාද සහිත වේ ද, ඔහුට සංඝ තෙමේ තස්සපාපියාසිකාකර්‍මය කෙරෙයි ද, එ ද සමග වූ සංඝ තෙමේ ධර්‍මය වූ පරිදි කෙරෙයි ද — මහණෙනි, මේ දැහැමි වූ තස්සපාපියාසිකා කර්‍මය කිරීම් පස ය.

අධම්මකම්ම ද්වාදසකං

15. තීහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතං තස්සපාපියසිකා කම්මං අධම්මකම්මඤ්ච හොති අවිනයකම්මඤ්ච දුවූපසන්තඤ්ච: අසම්මුඛා කතං හොති, අපටිපුච්ඡා කතං හොති, අපටිඤ්ඤාය කතං හොති. -පෙ-

ආපත්තිං අනාරොපෙත්වා කතං හොති අධම්මෙන කතං හොති වග්ගෙන කතං හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තස්සපාපියසිකාකම්මං අධම්මකම්මඤ්ච හොති අවිනයකම්මඤ්ච දුවූපසන්තඤ්ච. (යථා තජ්ජනීයකම්මං එවං විත්ථාරෙතබ්බං.)

ධම්මකම්ම ද්වාදසකං

16. තීහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතං තස්සපාපියසිකා කම්මං ධම්මකම්මඤ්ච හොති විනයකම්මඤ්ච සුවූපසන්තඤ්ච: සම්මුඛා කතං හොති, පටිපුච්ඡා කතං හොති, පටිඤ්ඤාය කතං හොති -පෙ- ආපත්තිං ආරොපෙත්වා කතං හොති, ධම්මෙන කතං හොති, සමග්ගෙන කතං හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතං තස්සපාපියසිකාකම්මං ධම්මකම්මඤ්ච හොති විනය කම්මඤ්ච සුවූපසන්තඤ්ච (යථා තජ්ජනීයකම්මෙ සුක්කපක්ඛං එවං විත්ථාරෙතබ්බං.)

ආකඞ්ඛමාන ඡක්කං

17. තීහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ආකඞ්ඛමානො සඞ්ඝො තස්සපාපියසිකාකම්මං කරෙය්‍ය: භණ්ඩනකාරකො හොති කලහකාරකො විවාදකාරකො භස්සකාරකො සඞ්ඝෙ අධිකරණකාරකො, බාලො හොති අව්‍යත්තො ආපත්තී බහුලො අනපදානො ගිහීසංසට්ඨො විහරති අනනුලොමිකෙහි ගිහීසංසග්ගෙහි: ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො අකඞ්ඛමානො සඞ්ඝො තස්සපාපියසිකා කම්මං කරෙය්‍ය.

අධර්ම කර්ම දෙළොස

15. මහණෙනි, අඞ්ග තුනෙකින් සමන්විත වූ තස්සපාපියාසිකා කර්මය අධර්මකර්මයෙක් ද අවිනය කර්මයෙක් ද නොමනාසේ සන්සිඳුනෙක් ද වෙයි. (කවර අංග තුනෙකින් ද? යත්:) නො හමුයෙහි කරණ ලද්දේ වේ ද, නොපිළිවිස කරණ ලද්දේ වේ ද, පිළිණ නොගෙන කරණ ලද්දේ වේ ද, මේ අඞ්ග තුනින් සමන්විත තස්සපාපියාසිකා කර්මය අධර්මකර්ම ද අවිනය කර්ම ද නොමනා ලෙස සන්හිඳුනෙක් ද වෙයි. ......

ඇවැත නො නඟා කරණ ලද්දේ වේ ද, නො දැනැමෙන් කරණ ලද්දේ වේ ද, ව්‍යග්‍ර වූ සංඝයා විසින් කරණ ලද්දේ වේ ද මේ අංග තුනින් සමන්විත වූ තස්සපාපියාසිකා කර්මය අධර්ම කර්ම ද අවිනයකර්ම ද නොමනා ලෙස සන්හිඳුනෙක් ද වෙයි.

ධර්ම කර්ම දෙළොස

16. මහණෙනි, අඞ්ග තුනෙකින් සමන්විත වූ තස්සපාපියාසිකා කර්මය ධර්මකර්ම ද විනයකර්ම ද මොනොවට සංහිඳුනෙක් ද වෙයි. (කවර අඞ්ග තුනෙකින් සමන්විත කර්මයෙක් ද යත්:) හමුයෙහි කරණ ලද්දේ වේ ද, පිළිවිස කරණ ලද්දේ වේ ද, ප්‍රතිඥයෙන් (ප්‍රතිඥා ගෙන) කරණ ලද්දේ වේ ද — මේ අඞ්ග තුනෙන් සමන්විත කර්මය යි.

.........ඇවැත නංවා කරණ ලද්දේ වේ ද, ධර්මයෙන් කරණ ලද්දේ වේ ද, සමග්‍ර සඞ්ඝයා විසින් කරණ ලද්දේ වේ ද — මහණෙනි, මේ අංග තුනින් සමන්විත තස්සපාපියාසිකා කර්මය ධර්මකර්මයක් ද විනය කර්මයෙක් ද මොනොවට සංසිඳුනු කර්මයෙක් ද වෙයි. [තජ්ජනිය කර්මයෙහි ශුක්ල පක්ෂය යම්සේ ද එසේ විස්තර කළ යුතු.]

ආකාංක්ෂමාණ ෂට්කය

17. මහණෙනි, අඞ්ග තුනෙකින් සමන්විත වූ මහණහට සංඝ තෙමේ කැමැති වන්නේ නම් තස්සපාපියාසිකා කර්මය කරන්නේ ය: ඩබර කරන්නේ 'කලහ කරන්නේ විවාද කරන්නේ වාක්කලහ කරන්නේ වේ ද, සංඝයා විෂයයෙහි අධිකරණ උපදවන්නේ වේ ද, අනුවණ වූයේ නොවියත් වූයේ ඇවැත් බහුල කොට ඇත්තේ සස්නට අනුලොම් නොවූ ගෘහී සංසර්ගයෙන් ගිහියන් හා මිශ්‍ර ව වෙසේ ද, මහණෙනි, මෙසේ වූ අඞ්ග තුනෙකින් යුත් මහණහට සංඝ තෙමේ කැමැති වන්නේ නම් තස්සපාපියාසිකා කර්මය කරන්නේ ය.

අපරෙහි පි භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ආකඞ්ඛමානො සඞ්ඝො තස්සපාපියසිකාකම්මං කරෙය්‍ය: අධිසීලෙ සීලවිපන්නො හොති. අජ්ඣාචාරෙ ආචාරවිපන්නො හොති, අතිදිට්ඨියා දිට්ඨිවිපන්නො හොති, ඉමෙහි ඛො භික්ඛවෙ තීහි -පෙ-3

අපරෙහි පි භික්ඛවෙ තීහි -පෙ- බුද්ධස්ස අවණ්ණං භාසති; ධම්මස්ස අවණ්ණං භාසති, සඞ්ඝස්ස අවණ්ණං භාසති: ඉමෙහි ඛො භික්ඛවෙ තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ආකඞ්ඛමානො සඞ්ඝො තස්සපාපියසිකාකම්මං කරෙය්‍ය.4

තිණ්ණං භික්ඛවෙ භික්ඛූනං ආකඞ්ඛමානො සඞ්ඝො තස්සපාපියසිකාකම්මං කරෙය්‍ය: එකො භණ්ඩනකාරකො හොති -පෙ- එකො සඞ්ඝෙ අධිකරණකාරකො, එකො බාලො හොති අව්‍යත්තො ආපත්තිබහුලො අනපදානො. එකො ගිහිසංසට්ඨො විහරති අනනුලොමිකෙහි ගිහිසංසග්ගෙහි: ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං භික්ඛූනං ආකඞ්ඛමානො සඞ්ඝො තස්සපාපියසිකාකම්මං කරෙය්‍ය.4

අපරෙසම්පි භික්ඛවෙ තිණ්ණං භික්ඛූනං ආකඞ්ඛමානො සඞ්ඝො තස්ස පාපියසිකාකම්මං කරෙය්‍ය: එකො අධිසීලෙ සීලවිපන්නො හොති, එකො අජ්ඣාචාරෙ ආචාරවිපන්නො හොති, එකො අතිදිට්ඨියා දිට්ඨිවිපන්නො හොති, ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං -පෙ-5

අපරෙසම්පි භික්ඛවෙ තිණ්ණං -පෙ- එකො බුද්ධස්ස අවණ්ණං භාසති, එකො ධම්මස්ස අවණ්ණං භාසති, එකො සඞ්ඝස්ස අවණ්ණං භාසති, ඉමෙසං ඛො භික්ඛවෙ තිණ්ණං භික්ඛූනං ආකඞ්ඛමානො සඞ්ඝො තස්සපාපියසිකා කම්මං කරෙය්‍ය.6

ආකඞ්ඛමාන ඡක්කං නිට්ඨිතං.

මහණෙනි, අන් අඞ්ග තුනෙකින් ද සමන්විත වූ මහණහට සංඝ තෙමේ කැමැති වන්නේ නම් තස්සපාපියාසිකාකර්මය කරන්නේ ය: අධිශීල විෂයයෙහි (උපසම්පද ශීලයෙහි) විපන් සිල් ඇත්තේ වේ ද, උත්තම ආචාර විෂයයෙහි (ශ්‍රමණාචාරයෙහි) විපන් ආචාර ඇත්තේ වේ ද, උත්තම දෘෂ්ටි විෂයයෙහි (සම්‍යග්දෘෂ්ටියෙහි) විපන් දෘෂ්ටි ඇත්තේ වේ ද, මහණෙනි, මෙසේ වූ අඞ්ග තුනෙකින් යුත් මහණහට සංඝ තෙමේ කැමැති වන්නේ නම් තස්සපාපියාසිකාකර්මය කරන්නේ ය. 2

මහණෙනි, අන් අඞ්ග තුනෙකින් ද සමන්විත මහණහට සංඝ තෙමේ කැමැත්තේ නම් තස්සපාපියාසිකාකර්මය කරන්නේ ය; බුදුනට දෙස් නඟා ද, දහමට දෙස් කියා ද සඟනට දෙස් කියා ද මහණෙනි, මේ අඞ්ග තුනින් යුත් මහණහට සංඝ තෙමේ කැමැත්තේ නම්, තස්සපාපියාසිකා කර්මය කරන්නේ ය. 3

මහණෙනි, සංඝ තෙමේ කැමැත්තේ තුන් මහණ කෙනකුනට තස්සපාපියාසිකා කර්මය කරන්නේ ය: එක් මහණෙක් ඩබර කරන්නේ වෙයි ද... එක් මහණෙක් සංඝයා කෙරෙහි අධිකරණ කරන්නේ වෙයි ද... එක් මහණෙක් අඥනත් අව්‍යක්තත් වේ ද, ආපත්ති බහුල කොටැත්තේ ආපත්තිපරිච්ඡෙදය ද නො දන්නේ වේ ද ... එක් මහණෙක් පැවිද්දනට අනුලොම් නොවූ ගෘහීසංසර්ගයෙන් ගිහියන් හා මිශ්‍ර වැ වෙසේ ද මහණෙනි, සංඝ තෙමේ කැමැත්තේ නම් මේ තුන් මහණුනට තස්සපාපියාසිකාකර්මය කරන්නේ ය. 4

මහණෙනි, අන් තුන් මහණ කෙනකුනට සංඝ තෙමේ කැමැති වන්නේ තස්සපාපියාසිකාකර්මය කරන්නේ ය. එක් මහණෙක් අධිශීලයෙහි ශීලවිපන්න වෙයි, එකෙක් අධ්‍යාචාරයෙහි (උතුම් ශ්‍රමණාචාරයෙහි) ආචාරවිපන්න වෙයි, එකෙක් අතිදෘෂ්ටියෙහි (සම්‍යග්දෘෂ්ටියෙහි) දෘෂ්ටිවිපන්න වෙයි. මහණෙනි, මේ තුන් මහණුනට සංඝ තෙමේ කැමැත්තේ නම් තස්සපාපියාසිකාකර්මය කරන්නේ ය. 5

මහණෙනි, අන් තුන් මහණ කෙනකුනට සංඝ තෙමේ කැමැති වන්නේ තස්සපාපියාසිකාකර්මය කරන්නේ ය: එක් මහණෙක් බුදුනට දෙස් කියයි, එකෙක් දහමට දෙස් කියයි, එකෙක් සංඝයාට දෙස් කියයි. මහණෙනි, මේ තුන් මහණුනට සංඝ තෙමේ කැමැත්තේ තස්සපාපියාසිකා කර්මය කරන්නේ ය. 6

ආකාංක්ෂමාණ ෂට්කය නිමියේ ය.

අට්ඨාරස වත්තං

18. තස්සපාපියසිකාකම්මකතෙන භික්ඛවෙ භික්ඛුනා සම්මා වත්තිතබ්බං. තත්‍රායං සම්මා වත්තනා: න උපසම්පාදෙතබ්බං, න නිස්සයො දාතබ්බො, න සාමණෙරො උපට්ඨාපෙතබ්බො, න භික්ඛුනොවාදකසම්මුති සාදිතබ්බා, සම්මතෙනපි භික්ඛුනියො න ඔවදිතබ්බා -පෙ- න භික්ඛූහි සම්පයොජෙතබ්බන්ති.

අථ ඛො සඞ්ඝො උවාළස්ස භික්ඛුනො තස්සපාපියසිකාකම්මං අකාසි.

තිණවත්ථාරකං

19. තෙන ඛො පන සමයෙන භික්ඛූනං භණ්ඩනජාතානං කලහජාතානං විවාදාපන්නානං විහරතං බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං හොති භාසිතපරික්කන්තං. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි: අම්හාකං ඛො භණ්ඩනජාතානං කලහජාතානං විවාදාපන්නානං විහරතං බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං භාසිතපරික්කන්තං සචෙ මයං ඉමාහි ආපත්තීහි අඤ්ඤමඤ්ඤං කාරෙස්සාම සියා පි තං අධිකරණං කක්ඛළත්තාය වාළත්තාය භෙදාය සංවත්තෙය්‍ය: කථන්නු ඛො අම්හෙහි පටිපජ්ජිතබ්බන්ති.

20. භගවතො එතමත්ථං ආරොචෙසුං. ඉධ පන භික්ඛවෙ භික්ඛූනං භණ්ඩනජාතානං කලහජාතානං විවාදාපන්නානං විහරතං බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං හොති භාසිතපරික්කන්තං, තත්‍ර චෙ භික්ඛූනං එවං හොති අම්හාකං ඛො භණ්ඩනජාතානං කලහජාතානං, විවාදාපන්නානං විහරතං බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං භාසිතපරික්කන්තං සචෙ මයං ඉමාහි ආපත්තීහි අඤ්ඤමඤ්ඤං කාරෙස්සාම සියා පි තං අධිකරණං කක්ඛළත්තාය වාළත්තාය භෙදාය සංවත්තෙය්‍යාති අනුජානාමි භික්ඛවෙ එවරූපං අධිකරණං තිණවත්ථාරකෙන වූපසමෙතුං.

අටළොස් වත

18. මහණෙනි, තස්සපාපියසිකාකර්මය කරණු ලැබූ මහණහු විසින් මැනැවින් පැවැතිය යුතු. එහි ලා මේ මනා පැවැත්ම යි: ඔහු විසින් (තමා උපාධ්‍යාය ව උපසම්පදා නො කළ යුතු යි, (තමා ආචාර්ය ව) නිස නො දිය යුතු යි, හෙරණකු තමා වෙත නො තබා ගත යුතු යි, භික්ඛුනීඕවාදක සම්මතිය නො ඉවැසිය යුතු යි, සම්මතිය ලද මහණහු විසින් ද මෙහෙණනට ඕවා නො දිය යුතු යි, ... භික්ෂූන් ඔවුනොවුන් හා කලහ පිණිස නො යෙදවිය යුතු යි.[1]

ඉක්බිති සංඝ තෙමේ උවාළ මහණහට තස්සපාපියසිකාකර්මය කළේ ය.

තෘණාවස්තාරකය

19. එ සමයෙහි වනාහි උපන් ඩබර ඇති, උපන් කලහ ඇති, විවාදපන්න ව වසන මහණුන් විසින් වාචසික වූ ද කායික වූ ද බොහෝ අශ්‍රාමණක කම් කරණ ලද්දේ වෙයි. එ කල වනාහි ඒ මහණුනට මේ සිත විය; "උපන් ඩබර ඇති ව උපන් කලහ ඇති ව විවාදපන්න ව වසන අප විසින් වාචසික වූ ද කායික වූ ද බොහෝ ආශ්‍රාමණක දෑ කරණ ලද්දේ වෙයි. ඉදින් අපි මේ ඇවැත්වලින් ඔවුනොවුනට පිළියම් කරවන්නමෝ නම්, ඒ අධිකරණය රළු බව පිණිස, සැඩ බව පිණිස, භේදය පිණිස පවතින්නේ ය. මෙහි අප විසින් කෙසේ පිළිපැදිය යුතු වන්නේ ද?" යනුවෙනි.

20. ඔහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහ. (භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක:) "මහණෙනි, මෙහි උපන් ඩබර ඇති ව, උපන් කළහ ඇති ව විවාදපන්න ව වසනා මහණුන් විසින් වාචසික වූ ද කායික වූ ද බොහෝ අශ්‍රාමණක ක්‍රියා කරණ ලද්දේ වේ ද, ඉදින් එහි මහණුනට 'උපන් ඩබර ඇති ව උපන් කලහ ඇති ව විවාදපන්න ව වසන අප විසින් වාචසික වූත් කායික වූත් බොහෝ අශ්‍රාමණක ක්‍රියා කරණ ලද්දේ ය, ඉදින් අපි මේ ඇවැත්වලින් ඔවුනොවුනට චෝදනා කරන්නමෝ නම් ඒ අධිකරණය කර්කශ බව පිණිස, චණ්ඩ බව පිණිස, භෙදය පිණිස පවත්නේ ය යන්න විය හැක්කැ'යි මෙසේ සිතෙක් වන්නේ නම්, මහණෙනි, මෙබඳු අධිකරණය තෘණාවස්තාරකයෙන් (තණකොළින් කසළ වසාලන්නාක් මෙන් කිරීමෙන්) සන්සිඳුවන්නට අනුදනිමි"යි යනු යි.

---

1. මෙහි සම්පූර්ණ පාඨය මෙහි ම 34, 35 පිටු බලා දත යුතු.

එවඤ්ච පන භික්ඛවෙ වූපසමෙතබ්බං: සබ්බෙහෙව එකජ්ඣං සන්නිපතිතබ්බං: සන්නිපතිත්වා ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො: සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අම්හාකං භණ්ඩනජාතානං බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං -පෙ- සචෙ මයං ඉමාහි ආපත්තීහි අඤ්ඤමඤ්ඤං කාරෙස්සාම, සියා පි තං අධිකරණං කක්ඛළත්තාය වාළත්තාය භෙදාය සංවත්තෙය්‍ය යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉමං අධිකරණං තිණවත්ථාරකෙන වූපසමෙය්‍ය ඨපෙත්වා ථුල්ලවජ්ජං ඨපෙත්වා ගිහිපටිසංයුත්තන්ති.

21. එකතො පක්ඛිකානං භික්ඛූනං ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සකො පක්ඛො ඤාපෙතබ්බො: සුණන්තු මෙ ආයස්මන්තා. අම්හාකං භණ්ඩනජාතානං -පෙ- භාසිතපරික්කන්තං. සචෙ මයං ඉමාහි ආපත්තීහි අඤ්ඤමඤ්ඤං කාරෙස්සාම සියා පි තං අධිකරණං කක්ඛළත්තාය වාළත්තාය භෙදාය සංවත්තෙය්‍ය. යදායස්මන්තානං පත්තකල්ලං අහං යා චෙව ආයස්මන්තානං ආපත්ති, යා ච අත්තනො ආපත්ති, ආයස්මන්තානඤ්චෙව අත්ථාය අත්තනො ච අත්ථාය සඞ්ඝමජ්ඣෙ තිණවත්ථාරකෙන දෙසෙය්‍යං ඨපෙත්වා ථුල්ලවජ්ජං ඨපෙත්වා ගිහිපටිසංයුත්තන්ති.

අථාපරෙසං එකතො පක්ඛිකානං භික්ඛූනං ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සකො පක්ඛො ඤාපෙතබ්බො:

සුණන්තු මෙ ආයස්මන්තා. අම්හාකං භණ්ඩනජාතානං -පෙ- භෙදාය සංවත්තෙය්‍ය. යදායස්මන්තානං පත්තකල්ලං අහං යා චෙව ආයස්මන්තානං ආපත්ති, යා ච අත්තනො ආපත්ති ආයස්මන්තානඤ්චෙව අත්ථාය අත්තනො ච අත්ථාය සඞ්ඝමජ්ඣෙ තිණවත්ථාරකෙන දෙසෙය්‍යං ඨපෙත්වා ථුල්ලවජ්ජං ඨපෙත්වා ගිහිපටිසංයුත්තන්ති.

22. එකතො පක්ඛිකානං භික්ඛූනං ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො: සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අම්හාකං භණ්ඩනජාතානං -පෙ- භෙදාය සංවත්තෙය්‍ය. යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං යා චෙව ඉමෙසං ආයස්මන්තානං ආපත්ති යා ච අත්තනො ආපත්ති ඉමෙසං චෙව ආයස්මන්තානං අත්ථාය අත්තනො ච අත්ථාය සඞ්ඝමජ්ඣෙ තිණවත්ථාරකෙන දෙසෙය්‍යං ඨපෙත්වා ථුල්ලවජ්ජං, ඨපෙත්වා ගිහිපටිසංයුත්තං: **එසා ඤත්ති.**

මහණෙනි, මෙසේ එය සංසිඳුවිය යුතු: ''සියලු දෙනා ම එක් තැනෙක රැස් විය යුතු. රැස් වැ ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණක්හු විසින් 'වහන්ස, සඞ්ඝ තෙමේ මගේ වචනය අසා වා. උපන් ඩබර ඇති......අප විසින්......බොහෝ අශ්‍රාමණක ක්‍රියා කරණ ලද්දේ ය. ඉදින් අපි මේ ඇවැත්වලින් ඔවුනොවුනට චෝදනා කරන්නමෝ නම්, ඒ අධිකරණය ඇතැම් විට කර්කශ බව පිණිස, චණ්ඩ බව පිණිස, භේදය පිණිස පැවැතිය හැක්ක. ඉදින් සංඝයාට ප්‍රාප්ත කාලය ඇත්තේ වේ නම් සංඝ තෙමේ දළ වරද හැර, ගිහියනට ගැරැහුම් ආදියෙන් යුත් වරද හැර, ඉතිරි මේ සියලු අධිකරණය තෘණාවස්තාරකයෙන් සංසිඳුවන්නේ යැ'යි මෙසේ සංඝ තෙමේ දැන්විය යුතු.

21. එක් පක්ෂයෙක වූ මහණුන් අතුරෙන් ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණක්හු විසින් 'ආයුෂ්මත්හු මගේ වචනය අසත් වා. උපන් ඩබර ඇති ......අප විසින් වාචසික වූ ද කායික වූ ද බොහෝ අශ්‍රාමණක ක්‍රියා කරණ ලද්දේ වෙයි. ඉදින් අපි මේ ඇවැත්වලින් ඔවුනොවුනට චෝදනා කරන්නමෝ නම් ඒ අධිකරණය කර්කශ බව පිණිස, චණ්ඩ බව පිණිස, භෙදය පිණිස, පවතිනු ඇත. ඉදින් ආයුෂ්මතුන්හට පැමිණි කල් ඇත්තේ වී නම්, මම්, ආයුෂ්මතුන් ගේ යම් ඇවැතෙක් වේ ද, තමා ගේ යම් ඇවැතෙක් වේ ද, ඒ හැම ආයුෂ්මතුනට වැඩ පිණිස ද තමාට වැඩ පිණිස ද, දළවරද හැරපියා, ගිහියනට නිගා කිරීම් ආදි විසින් වූ (ගෘහීප්‍රතිසංයුක්ත) වරද ද හැර පියා, සභ මැද දී තෘණාවස්තාරකයෙන් දෙසන්නෙමි'යි සවකීය පක්ෂය ඥපයිතව්‍ය ය (සිය පසට දැන්විය යුතු).

එ කල්හි එක් පක්ෂයෙක වූ අනිත් මහණුන් අතුරෙන් ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණක්හු විසින්,

ආයුෂ්මත්හු මගේ වචනය අසත් වා. උපන් ඩබර ඇති...... අප විසින් වචසික වූ ද කායික වූ ද බොහෝ අශ්‍රාමණක ක්‍රියා කරණ ලද්දේ වෙයි. ඉදින් අපි මේ ඇවැත් වලින් ඔවුනොවුනට චෝදනා කරන්නමෝ නම්...... භේදය පිණිස පවතිනු ඇත. ඉදින් ආයුෂ්මතුන්හට පැමිණි කල් ඇත්තේ වී නම්, මම්, ආයුෂ්මතුන්ගේ යම් ඇවැතෙක් වේ ද, තමාගේ යම් ඇවැතෙක් වේ ද, ඒ හැම ආයුෂ්මතුනට වැඩ පිණිස ද තමහට වැඩ පිණිස ද, දළ වරද හැර පියා ගිහියනට ගැරැහුම ආදි විසින් වූ (ගෘහීප්‍රතිසංයුක්ත) වරද ද හැර පියා, සභ මැද දී තෘණවස්තාරකයෙන් දෙසන්නෙමි යි සිය පසට දැන්විය යුතු.

22. එක් පසෙක වූ මහණුන් අතුරෙන් ව්‍යක්ත ප්‍රතිබල මහණක්හු විසින් සංඝ තෙමේ මෙසේ දැන්විය යුතු: වහන්ස, සඞ්ඝ තෙමේ මගේ වචනය අසා වා, උපන් ඩබර ඇති......අප විසින්......බොහෝ අශ්‍රාමණක ක්‍රියා කරණ ලද්දේ වෙයි......භේදය පිණිස පැවැතිය හැක්ක. ඉදින් සඞ්ඝයාට පැමිණිකල් ඇත්තේ වී නම්, මම්, මේ ආයුෂ්මතුන්ගේ යම් ඇවැතෙක් වේ ද, තමාගේ යම් ඇවැතෙක් වේ ද, මේ ආයුෂ්මතුන් හට වැඩ පිණිස ද, තමහට වැඩ පිණිස ද, සභ මැද දී ස්ථූල වරදත් ගිහියනට ගැරැහුම් ආ විසින් කළ වරදත් හැර ඒ ඉතිරි සියලු වරද තෘණවස්තාරකයෙන් දෙසන්නෙමි. මේ ඥප්තිය යි.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අම්හාකං භණ්ඩනජාතානං -පෙ- භෙදාය සංවත්තෙය්‍ය. අහං යා චෙව ඉමෙසං ආයස්මන්තානං ආපත්ති යා ච අත්තනො ආපත්ති, ඉමෙසඤ්චෙව ආයස්මන්තානං අත්ථාය අත්තනො ච අත්ථාය සඞ්ඝමජ්ඣෙ තිණවත්ථාරකෙන දෙසෙමි ඨපෙත්වා ථුල්ලවජ්ජං ඨපෙත්වා ගිහිපටිසංයුත්තං. යස්සායස්මතො ඛමති අම්හාකං ඉමාසං ආපත්තීනං සඞ්ඝමජ්ඣෙ තිණවත්ථාරකෙන දෙසනා ඨපෙත්වා ථුල්ලවජ්ජං ඨපෙත්වා ගිහිපටිසංයුත්තං සො තුණ්හස්ස යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

දෙසිතා අම්හාකං ඉමා ආපත්තියො සඞ්ඝමජ්ඣෙ තිණවත්ථාරකෙන ඨපෙත්වා ථුල්ලවජ්ජං ඨපෙත්වා ගිහිපටිසංයුත්තං ඛමති සඞ්ඝස්ස. තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමීති.

23. අථාපරෙසං එකතො පක්ඛිකානං භික්ඛූනං ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො: සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අම්හාකං භණ්ඩනජාතානං -පෙ- භෙදාය සංවත්තෙය්‍ය. යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං -පෙ- සඞ්ඝමජ්ඣෙ තිණවත්ථාරකෙන දෙසෙය්‍යං, ඨපෙත්වා ථුල්ලවජ්ජං ඨපෙත්වා ගිහිපටිසංයුත්තං. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අම්හාකං භණ්ඩනජාතානං -පෙ- භෙදාය සංවත්තෙය්‍ය. අහං -පෙ- සඞ්ඝමජ්ඣෙ තිණවත්ථාරකෙන දෙසෙමි ඨපෙත්වා ථුල්ලවජ්ජං ඨපෙත්වා ගිහිපටිසංයුත්තං. යස්සායස්මතො ඛමති අම්හාකං ඉමාසං ආපත්තීනං සඞ්ඝමජ්ඣෙ තිණවත්ථාරකෙන දෙසනා ඨපෙත්වා ථුල්ලවජ්ජං ඨපෙත්වා ගිහිපටිසංයුත්තං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

දෙසිතා අම්හාකං ඉමා ආපත්තියො සඞ්ඝමජ්ඣෙ තිණවත්ථාරකෙන ඨපෙත්වා ථුල්ලවජ්ජං ඨපෙත්වා ගිහිපටිසංයුත්තං. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී'ති.

එවඤ්ච පන භික්ඛවෙ තෙ භික්ඛූ තාහි ආපත්තීහි වුට්ඨිතා හොන්ති ඨපෙත්වා ථුල්ලවජ්ජං ඨපෙත්වා ගිහිපටිසංයුත්තං ඨපෙත්වා දිට්ඨාවිකම්මං ඨපෙත්වා යෙ න තත්ථ හොන්තීති.

වහන්ස, සඞ්ඝ තෙමේ මගේ වචනය අසා වා. උපන් ඩබර ඇති......අප විසින්......බොහෝ අශ්‍රාමණක ක්‍රියා කරණ ලද්දේ වෙයි. එය......භෙදය පිණිස පවතින්නේ ය. මේ ආයුෂ්මතුන්ගේ යම් ඇවැතෙක් වේ ද, තමාගේ යම් ඇවැතෙක් වේ ද, ඒ හැම, සුලු වරදත් ගෘහී ප්‍රතිසංයුක්ත වරදත් හැර මේ ආයුෂ්මත්නට වැඩ පිණිස ද තමහට වැඩ පිණිස ද සහ මැද දී මම දෙසමි. ස්ථූල වරදත් ගෘහීප්‍රතිසංයුක්ත වරදත් හැරපියා අපගේ මේ සෙසු සියලු ඇවැතුන් තෘණාවස්තාරකයෙන් දෙසීම යම් ආයුෂ්මතකුට රිසියෙන්නේ ද හේ නිහඬ වේවා, යමකුට නො රිසියෙන්නේ ද හේ කියාවා.

ස්ථූල වරද ද ගෘහී ප්‍රතිසංයුක්ත වරද ද හැර පියා, මේ සෙසු ඇවැත්හු අප විසින් සහ ම ද දී දෙසන ලදහ. සංඝයාට රිසියෙයි. එහෙයින් නිහඬ වෙයි. මෙසේ මෙය සලකමි'යි යනුවෙනි.

23. අනතුරු ව අන් එක් පසෙක වූ මහණුන් අතුරෙන් ව්‍යක්ත ප්‍රතිබල මහණක්හු විසින් සංඝ තෙමේ මෙසේ දැන්විය යුතු:

වහන්ස, සංඝ තෙමේ මගේ වචනය අසාවා. උපන් ඩබර ඇති ,... අප විසින් ...... බොහෝ අශ්‍රාමණක ක්‍රියා කරණ ලද්දේ වෙයි. එය.... .. භේදය පිණිස පවතින්නේ ය. ඉදින් සංඝයාට පැමිණි කල් ඇත්තේ වී නම්, මේ ආයුෂ්මතුන්ගේ යම් ඇවැතෙක් වේ ද, තමාගේ යම් ඇවැතෙක් වේ ද, ඒ හැම ස්ථූල වරදත් ගෘහීප්‍රතිසංයුක්ත වරදත් හැරපියා මේ ආයුෂ්මතුන් හට වැඩ පිණිස ද, සහ මැද දී මම් දෙසන්නෙමි. මේ ඥප්තිය යි.

වහන්ස, සංඝ තෙමේ මගේ වචනය අසාවා. උපන් ඩබර ඇති...... අප විසින් ...... බොහෝ අශ්‍රාමණක ක්‍රියා කරණ ලද්දේ වෙයි......එය ...භේදය පිණිස පවත්තේ ය. මේ ආයුෂ්මතුන්ගේ යම් ඇවැතෙක් වේ ද, තමාගේ යම් ඇවැතෙක් වේ ද, ඒ හැම ස්ථූල වරදත් ගෘහී ප්‍රතිසංයුක්ත වරදත්, හැර මේ ආයුෂ්මතුන්හට වැඩ පිණිස ද තමහට වැඩ පිණිස ද සහ මැද දී මම් දෙසමි. ස්ථූල වරදත් ගෘහීප්‍රතිසංයුක්ත වරදත් හැර පියා අපගේ මේ සෙසු සියලු ඇවැතුන් තෘණාවස්තාරකයෙන් දෙසීම යම් ආයුෂ්මතකුට රිසියෙන්නේ ද හේ නිහඬ වේවා, යමක්හට නො රිසියෙන්නේ ද, හේ කියාවා.

ස්ථූල වරද ද ගෘහීප්‍රතිසංයුක්ත වරද ද හැරපියා මේ සෙසු ඇවැත්හු අප විසින් සහ මැද දී දෙසන ලදහ. සංඝයාට රිසියෙයි. එහෙයින් නිහඬ වෙයි. මෙසේ මෙය සලකමි' යනුවෙනි.

මහණෙනි, මෙසේ වනාහි ඒ මහණහු ස්ථූල ඇවැතුත් හැර, ගෘහී-ප්‍රතිසංයුක්ත ඇවැතුත් හැර, යම් කෙනෙකුනට මෙය නො රිසියෙන්නේ නම් ඔවුන් ගේ එ බව පැවසීම හැර, යම් කෙනෙක් එහි නො වෙත් නම් ඔවුන් ද හැර, ඉතිරි හැම ඇවැත් කෙරෙන් නැඟි සිටියාහු වෙත්.''

චත්තාරි අධිකරණානි

24. තෙන ඛො පන සමයෙන භික්ඛූ'පි භික්ඛුනීහි විවදන්ති, භික්ඛුනියො පි භික්ඛූහි විවදන්ති. ඡන්නො පි භික්ඛු භික්ඛුනීනං අනුපඛජ්ජ භික්ඛූහි සද්ධිං විවදති, භික්ඛුනීනං පක්ඛං ගාහෙති, යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: කථං හි නාම ඡන්නො භික්ඛු භික්ඛුනීනං අනුපඛජ්ජ භික්ඛූහි සද්ධිං විවදිස්සති, භික්ඛුනීනං පක්ඛං ගාහෙස්සතීති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. 'සච්චං කිර භික්ඛවෙ -පෙ-' 'සච්චං භගවා -පෙ-'.

විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

25. චත්තාරිමානි භික්ඛවෙ අධිකරණානි විවාදධිකරණං අනුවාදධිකරණං ආපත්ත්‍යධිකරණං කිච්චාධිකරණං.

තත්ථ කතමං විවාදධිකරණං? ඉධ පන භික්ඛවෙ භික්ඛූ විවදන්ති ධම්මොති වා අධම්මොති වා විනයොති වා අවිනයොති වා භාසිතං ලපිතං තථාගතෙනාති වා අභාසිතං අලපිතං තථාගතෙනාති වා ආචිණ්ණං තථාගතෙනාති වා, අනාචිණ්ණං තථාගතෙනාති වා. පඤ්ඤත්තං තථාගතෙනාති වා අපඤ්ඤත්තං තථාගතෙනාති වා ආපත්තීති වා අනාපත්තීති වා ලහුකා ආපත්තීති වා ගරුකා ආපත්තීති වා සාවසෙසා ආපත්තීති වා අනවසෙසා ආපත්තීති වා දුට්ඨුල්ලා ආපත්තීති වා අදුට්ඨුල්ලා ආපත්තීති වා, යං තත්ථ භණ්ඩනං කලහො විග්ගහො විවාදො නානාවාදො අඤ්ඤථාවාදො විපච්චතාය වොහාරො මෙධකං[1] ඉදං වුච්චති විවාදධිකරණං.

තත්ථ කතමං අනුවාදධිකරණං? ඉධ පන භික්ඛවෙ භික්ඛූ භික්ඛුං අනුවදන්ති සීලවිපත්තියා වා ආචාරවිපත්තියා වා දිට්ඨිවිපත්තියා වා ආජීවවිපත්තියා වා, යො තත්ථ අනුවාදො අනුවදනා අනුල්ලපනා අනුභණනා අනුසම්පවඞ්කතා අබ්භුස්සහනතා අනුබලප්පදානං, ඉදං වුච්චති අනුවාදධිකරණං.

---

1. මෙධගං (මජසං)

සතර අධිකරණ

24. එ සමයෙහි වනාහි මහණහු ද මෙහෙණන් හා විවාද කෙරෙත්, මෙහෙණහු ද මහණුන් හා විවාද කෙරෙත්. ඡන්න මහණ ද මෙහෙණන්... මැදට වැද මහණුන් හා විවාද කෙරෙයි. මෙහෙණන්ගේ පක්ෂය ගන්වයි. අල්පේච්ඡ වූ ... යම් මහණ කෙනෙක් වෙත් ද, ඔහු ඡන්න මහණ තෙම කෙසේ නම් මෙහෙණන් මැදට වැද මහණුන් හා විවාද කරන්නේ ද? මෙහෙණන්ගේ පක්ෂය ගන්වන්නේ දැ?'යි අවඥ කෙරෙත්, දොස් නඟත්, අගුණ පතුරුවා බෙණෙත්. ඉක්බිති ඒ මහණහු භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහ. 'මහණෙනි, එය සැබෑ දැ?'යි භාග්‍යවතුන් වහන්සේ අසා වදාළ සේක. 'වහන්ස සබැවැ'යි ඒ මහණහු පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ ඔවුන් ගරහා, දැහැමි කතා කොට, ඔවුන් බණවා මෙය වදාළ සේක:

25. ''මහණෙනි, විවාදධිකරණය, අනුවාදධිකරණය, ආපත්‍යාධිකරණය, කෘත්‍යාධිකරණයැ යි මේ සතර අධිකරණ කෙනෙක් වෙත්.

එහි විවාදධිකරණය කවර යැ මහණෙනි, මෙහි මහණහු 'මේ දහමැ යි කියා හෝ නොදහමැ යි කියා හෝ විනයයැ යි කියා හෝ අවිනයයැ යි කියා හෝ තථාගතයන් විසින් වදරණ ලද්දේ ය, පවසන ලද්දේයැ යි කියා හෝ තථාගතයන් විසින් නො වදරණ ලද්දේ ය, නො පවසන ලද්දේ යැ යි කියා හෝ තථාගතයන් විසින් ආචීර්ණ (කරණ ලද) යැ යි කියා හෝ තථාගතයන් විසින් අනාචීර්ණයැ යි කියා හෝ තථාගතයන් විසින් පණවන ලදැ යි කියා හෝ තථාගතයන් විසින් නො පණවන ලදැ යි කියා හෝ මේ ඇවැතැ යි කියා හෝ මෙ නො ඇවැතැ යි කියා හෝ මේ ලුහු ඇවැතැ යි කියා හෝ මේ ගරු ඇවැතැයි කියා හෝ මේ සාවශෙෂ ඇවැතැයි කියා හෝ මේ අනවශෙෂ ඇවැතැයි කියා හෝ මේ දුළුල් ඇවැතැ යි කියා හෝ මේ නොදුළුල් ඇවැතැ යි කියා හෝ විවාද කෙරෙත් ද, එහි යම් අරගලයෙක් කලහයෙක් විග්‍රහයෙක් විවාදයෙක් නානා වාදයෙක් අන්‍යථාවාදයෙක් විරුද්ධ ව්‍යවහාරයෙක් (පරුෂවචනයෙක්) කල බැගෑනියෙක් වෙයි ද මේ විවාදධිකරණ යැ යි කියනු ලැබේ.

එහි අනුවාදධිකරණ නම් කවර යැ? මහණෙනි, මෙහි මහණහු ශීලවිපත්තියෙන් හෝ ආචාරවිපත්තියෙන් හෝ දෘෂ්ටිවිපත්තියෙන් හෝ ආජීව විපත්තියෙන් හෝ චෝදනා කෙරෙත් ද, එහි යම් අනුවාදයෙක් (චෝදනාවෙක්), අනුවදනයෙක්, පුන පුනා දොස් නැඟීමෙක් පුන පුනා දොස් කීමෙක් පුන පුනා අවනත කරන බවෙක්, දිරිගන්වා කීමෙක්, අනුබල දීමෙක් වේ ද, මෙය අනුවාදධිකරණ නමැ යි කියනු ලැබේ.

තත්ථ කතමං ආපත්තාධිකරණං? පඤ්චපි ආපත්තික්ඛන්ධා ආපත්තාධිකරණං, සත්තපි ආපත්තික්ඛන්ධා ආපත්තාධිකරණං: ඉදං වුච්චති ආපත්තාධිකරණං.

තත්ථ කතමං කිච්චාධිකරණං? යා සඞ්ඝස්ස කිච්චයතා කරණීයතා අපලොකනකම්මං ඤත්තිකම්මං ඤත්තිදුතියකම්මං ඤත්තිචතුත්ථකම්මං ඉදං වුච්චති කිච්චාධිකරණං.

25. විවාදාධිකරණස්ස කිං මූලං? ඡ විවාදමූලානි විවාදාධිකරණස්ස මූලං, තීණිපි අකුසලමූලානි විවාදාධිකරණස්ස මූලං තීණිපි කුසලමූලානි විවාදාධිකරණස්ස මූලං.

කතමානි ඡ විවාදමූලානි විවාදාධිකරණස්ස මූලං? ඉධ භික්ඛවෙ භික්ඛු කොධනො හොති උපනාහී. යො සො භික්ඛවෙ භික්ඛු කොධනො හොති උපනාහී. සො සත්ථරි පි අගාරවො විහරති අප්පතිස්සො, ධම්මෙ පි අගාරවො විහරති අප්පතිස්සො, සඞ්ඝෙ පි අගාරවො විහරති අප්පතිස්සො, සික්ඛාය පි න පරිපූරකාරී හොති. යො සො භික්ඛවෙ භික්ඛු සත්ථරි පි අගාරවො විහරති අප්පතිස්සො, ධම්මෙපි -පෙ- සඞ්ඝෙපි -පෙ- සික්ඛාය පි න පරිපූරකාරී, සො සඞ්ඝෙ විවාදං ජනෙති. සො හොති විවාදො බහුජන අහිතාය බහුජන අසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං. එවරූපඤ්චෙ තුම්හෙ භික්ඛවෙ විවාදමූලං අජ්ඣත්තං වා බහිද්ධා වා සමනුපස්සෙය්‍යාථ, තත්‍ර තුම්හෙ භික්ඛවෙ තස්සෙව පාපකස්ස විවාදමූලස්ස පහානාය වායමෙය්‍යාථ. එවරූපඤ්චෙ තුම්හෙ භික්ඛවෙ විවාදමූලං අජ්ඣත්තං වා බහිද්ධා වා න සමනුපස්සෙය්‍යාථ, තත්‍ර තුම්හෙ භික්ඛවෙ තස්සෙව පාපකස්ස විවාදමූලස්ස ආයතිං අනවස්සවාය පටිපජ්ජෙය්‍යාථ, එවමෙතස්ස පාපකස්ස විවාදමූලස්ස පහානං හොති. එවමෙතස්ස පාපකස්ස විවාදමූලස්ස ආයතිං අනවස්සවො හොති.

එහි ආපත්තාධිකරණ නම් කවර යැ? ඇවැත් කඳු පස ම ආපත්තාධිකරණ යි, ඇවැත්කඳු සත ම ආපත්තාධිකරණ යි. මේ ආපත්තාධිකරණ නමැ යි කියනු ලැබේ.

එහි කිච්චාධිකරණ නම් කවර යැ? අපලොකනකර්‍මය, ඤප්තිකර්‍මය, ඤප්තිද්විතීයකර්‍ම ය, ඤප්තිචතුර්ථකර්‍ම යැ යි සංඝයාගේ යම් ඒකාන්තයෙන් කර්මය කළ යුතු බවෙක්, කාර්ය භාවයෙක් වේ ද, මේ කිච්චාධිකරණයැ යි කියනු ලැබේ.

25. විවාදධිකරණයාගේ මුල කවර යැ? විවාද මූල සය විවාදධිකරණයට මුල් ය. තුන් අකුසල් මුල් ද විවාදධිකරණයට මුල් ය. තුන් කුසල් මුල් ද විවාදධිකරණයට මුල් ය.

කවර විවාද මුල් සයෙක් විවාදධිකරණයට මුල වේ ද යත්: මහණෙනි, මෙහි මහණෙක් ක්‍රෝධ කරන්නේ වේ ද, බද්ධ වෛර ඇත්තේ වේ ද, හේ ශාස්තෘන් වහන්සේ කෙරෙහි ද ගෞරව නැත්තේ යටත් පැවතුම් නැත්තේ වෙසෙයි, ධර්මය කෙරෙහි ද ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි, සඞ්ඝයා කෙරෙහි ද ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි, ශික්ෂායෙහි ද පරිපූරකාරී (සම්පූර්ණ කරන්නේ) නො වෙයි, මහණෙනි, යම් මහණෙක් ශාස්තෘන් වහන්සේ කෙරෙහි ද ගෞරව නැත්තේ යටත් පැවතුම් නැත්තේ වෙසෙයි ද, ධර්මය කෙරෙහි ද ...... සඞ්ඝයා කෙරෙහි ද ...... ශික්ෂායෙහි ද පරිපූරකාරී නො වෙයි ද, හේ සඞ්ඝයා කෙරෙහි විවාද උපදවයි. ඒ විවාදය බොහෝ දෙනාට අවැඩ පිණිස, බොහෝ දෙනාට නො සුව පිණිස බොහෝ දෙනාට අනර්ථ පිණිස, දෙව් මිනිසුන් හට අහිත පිණිස දුක් පිණිස වෙයි. මහණෙනි, මෙබඳු විවාද මූලය ඉදින් තමා කෙරෙහි හෝ තමාගෙන් පිටත්හි හෝ දක්නේ නම්, මහණෙනි, එහි තෙපි ලාමක වූ ඒ විවාදමූලයේ ම ප්‍රහාණය පිණිස වෑයම් කරවු. මහණෙනි, ඉදින් තෙපි එබඳු විවාදමූලයක් තමන් කෙරෙහි හෝ තමන්ගෙන් පිටත්හි හෝ (අනුන් කෙරෙහි හෝ) නො දක්නහු නම්, මහණෙනි, තෙපි එහි ලා ඒ විවාදමූලයාගේ ම මත්තෙහි තමන් කෙරෙහි පහළ නොවන්නට පිළිපදිවු. මෙසේ මේ ලාමක වූ විවාදමූලයාගේ ප්‍රහාණය වෙයි, මෙසේ මේ විවාදමූලයාගේ මත්තෙහි නොඉපැද්ම වේ.

26. පුන ච පරං භික්ඛවෙ භික්ඛු මක්ඛී හොති පළාසී -පෙ- ඉස්සුකී හොති මච්ඡරී -පෙ- සඨො හොති මායාවී -පෙ- පාපිච්ඡො හොති මිච්ඡාදිට්ඨී -පෙ- සන්දිට්ඨිපරාමාසී හොති ආධානගාහී දුප්පටිනිස්සග්ගී. යො සො භික්ඛවෙ භික්ඛු සන්දිට්ඨිපරාමාසී හොති අධානගාහී දුප්පටිනිස්සග්ගී. සො සත්ථරි පි අගාරවො විහරති අප්පතිස්සො. ධම්මෙ පි අගාරවො විහරති අප්පතිස්සො. සඞ්ඝෙ පි අගාරවො විහරති අප්පතිස්සො. සික්ඛාය පි න පරිපූරකාරී හොති. යො සො භික්ඛවෙ භික්ඛු සත්ථරි පි අගාරවො විහරති අප්පතිස්සො. ධම්මෙ පි -පෙ- සඞ්ඝෙපි -පෙ- සික්ඛාය පි න පරිපූරිකාරී, සො සඞ්ඝෙ විවාදං ජනෙති. සො හොති විවාදො බහුජන අහිතාය බහුජන අසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං. එවරූපඤ්චෙ තුම්හෙ භික්ඛවෙ විවාදමූලං අජ්ඣත්තං වා බහිද්ධා වා සමනුපස්සෙය්‍යාථ තත්‍ර තුම්හෙ භික්ඛවෙ තස්සෙව පාපකස්ස විවාදමූලස්ස පහානාය වායමෙය්‍යාථ. එවරූපඤ්චෙ තුම්හෙ භික්ඛවෙ විවාදමූලං අජ්ඣත්තං වා බහිද්ධා වා න සමනුපස්සෙය්‍යාථ, තත්‍ර තුම්හෙ භික්ඛවෙ තස්සෙව පාපකස්ස විවාදමූලස්ස ආයතිං අනවස්සවාය පටිපජ්ජෙය්‍යාථ. එවමෙතස්ස පාපකස්ස විවාදමූලස්ස පහානං හොති. එවමෙතස්ස පාපකස්ස විවාදමූලස්ස ආයතිං අනවස්සවො හොති. ඉමානි ඡ විවාදමූලානි විවාදධිකරණස්ස මූලං.

27. කතමානි තීණි අකුසලමූලානි විවාදධිකරණස්ස මූලං? ඉධ භික්ඛවෙ භික්ඛු ලුද්ධචිත්තා විවදන්ති, දුට්ඨචිත්තා විවදන්ති, මූළ්හචිත්තා විවදන්ති, ධම්මොති වා අධම්මොති වා විනයොති වා අවිනයොති වා භාසිතං ලපිතං තථාගතෙනාති වා අභාසිතං අලපිතං තථාගතෙනාති වා, ආචිණ්ණං තථාගතෙනාති වා අනාචිණ්ණං තථාගතෙනාති වා පඤ්ඤත්තං තථාගතෙනාති වා අපඤ්ඤත්තං තථාගතෙනාති වා ආපත්තීති වා අනාපත්තීති වා ලහුකාපත්තීති වා ගරුකාපත්තීති වා, සාවසෙසා ආපත්තීති වා අනවසෙසා ආපත්තීති වා, දුට්ඨුල්ලා ආපත්තීති වා අදුට්ඨුල්ලා ආපත්තීති වා, ඉමානි තීණි අකුසලමූලානි විවාදධිකරණස්ස මූලං.

26. තවද අනෙකක් කියමි. මහණෙනි, මහණෙක් ගුණමකු වූයේ වේ ... ඊර්ෂ්‍යා ඇත්තේ මසුරු වේ, ... ශඨ වූයේ මායා සහිත වේ, ... ලාමක ඊප්සා ඇත්තේ මිසදිටු වේ, ... තමා ගත් දෘෂ්ටිය දැඩි කොට ගත්තේ ආධානගාහී වූයේ තමාගේ දෘෂ්ටිය දුරලිය නො හැක්කේ වේ. මහණෙනි, යම් මහණෙක් තමාගේ දෘෂ්ටි දැඩි කොට ගත්තේ ආධානගාහී (දෘඪග්‍රාහී වූයේ) ත් දුක සේ බැහැර කළයුතු දෘෂ්ටි ඇත්තේත් වේ නම්, හේ ශාස්තෘහු කෙරෙහි ද ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි, ධර්මය කෙරෙහි ද ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි, සඞ්ඝයා කෙරෙහි ද ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි, ශික්ෂායෙහි ද පරිපූරකාරී නො වෙයි. මහණෙනි, යමෙක් ශාස්තෘහු කෙරෙහිත් ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසේ නම්, ධර්මය කෙරෙහිත් ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසේ නම්, සඞ්ඝයා කෙරෙහිත් ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසේ නම්, ශික්ෂායෙහි ද පරිපූරකාරී නො වේ නම්, හේ සඞ්ඝයා කෙරෙහි විවාද උපදවයි. ඒ විවාදය බොහෝ දෙනාට අවැඩ පිණිස, බොහෝ දෙනාට නොසුව පිණිස, බොහෝ දෙනාට අනර්ථ පිණිස, දෙවිමිනිසුනට අහිත පිණිස, දුක් පිණිස වෙයි. මහණෙනි, මෙබඳු වූ විවාදමූලයක් තෙපි තමන් කෙරෙහි හෝ තමන්ගෙන් පිටත්හි හෝ දක්නහු නම්, මහණෙනි, එහි ලා තෙපි ඒ ලාමක වූ විවාදමූලයාගේ ම ප්‍රහාණය පිණිස වැයම් කරවු. මහණෙනි, මෙබඳු වූ විවාදමූලයක් තමන් කෙරෙහි හෝ තමන්ගෙන් පිටත්හි හෝ තෙපි නො දක්නහු නම්, මහණෙනි, එහි ලා තෙපි ඒ ලාමක විවාදමූලයාගේ ම මත්තෙහි තමන් සතන්හි නො පහළ වනුවට පිළිපදිවු. මෙසේ ඒ ලාමක වූ විවාදමූලයාගේ ප්‍රහාණය වෙයි. මෙසේ මේ ලාමක වූ විවාදමූලයාගේ මත්තෙහි නොඉපැද්ම වෙයි. මේ විවාදමූල සය විවාදධිකරණයට මුල ය.

27. කවර අකුසල් මුල් තුනෙක් විවාදධිකරණයට මුල වේ ද යත්: මහණෙනි, මෙහි මහණහු 'දහමැ යි කියා හෝ නොදහමැ යි කියා හෝ විනයයැ යි කියා හෝ අවිනයයැ යි කියා හෝ තථාගතයන් වහන්සේ විසින් වදරණලද්දේ ය, පවසන ලද්දේ යැ යි කියා හෝ තථාගතයන් වහන්සේ විසින් නොවදරණ ලද්දේ ය. නො පවසන ලද්දේ යැ යි කියා හෝ තථාගතයන් වහන්සේ විසින් ආචීර්ණ යැ යි කියා හෝ තථාගතයන් වහන්සේ විසින් අනාචීර්ණ යැ යි කියා හෝ තථාගතයන් වහන්සේ විසින් පණවන ලදැ යි කියා හෝ තථාගතයන් වහන්සේ විසින් නො පණවන ලදැ යි කියා හෝ ඇවැතැ යි කියා හෝ නොඇවැතැ යි කියා හෝ ලුහු ඇවැතැ යි කියා හෝ ගුරු ඇවැතැ යි කියා හෝ සාවශෙෂ ඇවැතැ යි කියා හෝ අනවශෙෂ ඇවැතැ යි කියා හෝ දුළුල් ඇවැතැ යි කියා හෝ නොදුළුල් ඇවැතැ යි කියා හෝ ලුබ්ධ සිතැත්තෝ විවාද කෙරෙත් ද, ද්විෂ්ට සිතැත්තෝ විවාද කෙරෙත් ද. මූඪ සිතැත්තෝ විවාද කෙරෙත් ද, මෙසේ මේ තුන් අකුසල් මුල් විවාදධිකරණයට මුල් වේ.

කතමානි තීණි කුසලමූලානි විවාදධිකරණස්ස මූලං? ඉධ භික්ඛවෙ භික්ඛූ අලුද්ධචිත්තා විවදන්ති, අදුට්ඨචිත්තා විවදන්ති, අමූළ්හචිත්තා විවදන්ති: ධම්මොති වා අධම්මොති වා -පෙ- දුට්ඨුල්ලා ආපත්තීති වා අදුට්ඨුල්ලං ආපත්තීති වා ඉමානි තීණි කුසලමූලානි විවාදධිකරණස්ස මූලං.

28. අනුවාදධිකරණස්ස කිං මූලං? ඡ අනුවාදමූලානි අනුවාදධිකරණස්ස මූලං. තීණි පි අකුසලමූලානි අනුවාදධිකරණස්ස මූලං. තීණි පි කුසලමූලානි අනුවාදධිකරණස්ස මූලං. කායො පි අනුවාදධිකරණස්ස මූලං වාචාපි අනුවාදධිකරණස්ස මූලං.

කතමානි ඡ අනුවාදමූලානි අනුවාදධිකරණස්ස මූලං? ඉධ භික්ඛවෙ භික්ඛු කොධනො හොති උපනාහී. යො සො භික්ඛු කොධනො හොති උපනාහී සො සත්ථරි පි අගාරවො විහරති අප්පතිස්සො, ධම්මෙ පි අගාරවො විහරති අප්පතිස්සො, සඞ්ඝෙ පි අගාරවො විහරති අප්පතිස්සො, සික්ඛාය පි න පරිපූරකාරී හොති. යො සො භික්ඛවෙ භික්ඛු සත්ථරි පි අගාරවො විහරති අප්පතිස්සො, ධම්මෙ පි -පෙ- සඞ්ඝෙ පි -පෙ- සික්ඛාය පි න පරිපූරකාරී. සො සඞ්ඝෙ අනුවාදං ජනෙති. සො හොති අනුවාදො බහුජන අහිතාය බහුජන අසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං. එවරූපඤ්චෙ තුම්හෙ භික්ඛවෙ අනුවාදමූලං අජ්ඣත්තං වා බහිද්ධා වා සමනුපස්සෙය්‍යාථ, තත්‍ර තුම්හෙ භික්ඛවෙ තස්සෙව පාපකස්ස අනුවාදමූලස්ස පහානාය වායමෙය්‍යාථ. එවරූපඤ්චෙ තුම්හෙ භික්ඛවෙ අනුවාදමූලා අජ්ඣත්තං වා බහිද්ධා වා න සමනුපස්සෙය්‍යාථ, තත්‍ර තුම්හෙ භික්ඛවෙ තස්සෙව පාපකස්ස අනුවාදමූලස්ස ආයතිං අනවස්සවාය පටිපජ්ජෙය්‍යාථ. එවමෙතස්ස පාපකස්ස අනුවාදමූලස්ස පහානං හොති. එවමෙතස්ස පාපකස්ස අනුවාදමූලස්ස ආයතිං අනවස්සවො හොති.

1. යො හොති- න. ම

කවර කුසල්මුල් තුනෙක් විවාදධිකරණයට මුල් වේ ද යත්: මහණෙනි, මෙහි මහණ කෙනෙක් දහමැ යි කියා හෝ නොදහමැ යි කියා හෝ ... දුළුල් ඇවැතැ යි කියා හෝ නොදුළුල් ඇවැතැ යි කියා හෝ ලුබ්ධ නොවූ සිතැත්තාහු විවාද කෙරෙත් ද, විෂ්ට නොවූ සිතැත්තාහු විවාද කෙරෙත් ද, මූඪ නොවූ සිතැත්තාහු විවාද කෙරෙත් ද, මෙහි මේ තුන් කුසල් මුල් විවාදධිකරණයට මුල් වේ.

28. අනුවාදධිකරණයට මුල කවර යැ? අනුවාදයට (චෝදනාවට) මුල් වූ දැ සය අනුවාදධිකරණයට මුල් වේ. තුන් අකුසල් මුල් ද අනුවාදධිකරණයට මුල් වේ. තුන් කුසල් මුල් ද අනුවාදධිකරණයට මුල් වේ. කය ද අනුවාදධිකරණයට මුල් වේ, වචනය ද අනුවාදධිකරණයට මුල් වේ.

කවර නම් අනුවාදමූල සයෙක් අනුවාදධිකරණයට මුල් වේ ද යත්: මහණෙනි, මෙහි මහණෙක් ක්‍රෝධ කරන්නේ, බැඳගත් වෛර ඇත්තේ වෙයි. මහණෙනි, යම් මහණෙක් ක්‍රෝධ කරන්නේ, බඩ වෛර ඇත්තේ වේ ද, හෙ තෙම ශාස්තෘහු කෙරෙහි ද ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි, ධර්මය කෙරෙහි ද ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි, සඞ්ඝයා කෙරෙහි ද ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි, ශික්ෂායෙහි ද පරිපූරකාරී නො වෙයි. මහණෙනි, යම් මහණෙක් ශාස්තෘහු කෙරෙහි ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි ද, ධර්මය කෙරෙහි ද...සඞ්ඝයා කෙරෙහි ද ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි ද, ශික්ෂායෙහි ද පරිපූරකාරී නො වෙයි ද, හෙ තෙම සඞ්ඝයා කෙරෙහි චෝදනා උපදවයි. ඒ චෝදනාව බොහෝ දෙනාට අහිත පිණිස, බොහෝ දෙනාට නොසුව පිණිස, බොහෝ දෙනාට අවැඩ පිණිස, දෙවිමිනිසුන්හට අහිත පිණිස දුක් පිණිස වෙයි. මහණෙනි, ඉදින් තෙපි මෙබඳු අනුවාදමූලයක් තමන්කෙරෙහි හෝ තමන්ගෙන් බැහැරැ හෝ දක්නහු නම්, මහණෙනි, තෙපි එහි ඒ ලාමක වූ අනුවාදමූලයාගේ ම ප්‍රහාණය පිණිස වැයම් කරවු. මහණෙනි, ඉදින් තෙපි මෙබඳු අනුවාදමූලයක් තමන් කෙරෙහි හෝ තමන්ගෙන් බැහැරැ හෝ නො දක්නහු නම්, මහණෙනි, එහි ලා තෙපි ඒ ලාමක වූ අනුවාදමූලයාගේ ම මත්තෙහි නොඉපැද්ම පිණිස පිළිපදිවු. මෙසේ මේ ලාමක වූ අනුවාදමූලයේ ප්‍රහාණය වෙයි, මෙසේ මේ ලාමක වූ අනුවාදමූලයේ මත්තෙහි නොඉපැද්ම වෙයි.

29. පුන ච පරං භික්ඛවෙ භික්ඛු මක්ඛී හොති පළාසී -පෙ- ඉස්සුකී හොති මච්ඡරී -පෙ- සඨො හොති මායාවී -පෙ- පාපිච්ඡො හොති මිච්ඡාදිට්ඨී -පෙ- සන්දිට්ඨිපරාමාසී හොති ආධානගාහී දුප්පටිනිස්සග්ගී. යො සො භික්ඛවෙ භික්ඛු සන්දිට්ඨිපරාමාසී හොති ආධානගාහී දුප්පටිනිස්සග්ගී. සො සත්ථරි පි අගාරවො විහරති අප්පතිස්සො, ධම්මෙ පි අගාරවො විහරති අප්පතිස්සො, සඞ්ඝෙ පි අගාරවො විහරති අප්පතිස්සො, සික්ඛාය පි න පරිපූරකාරී හොති. යො සො භික්ඛවෙ භික්ඛු සත්ථරි පි අගාරවො විහරති අප්පතිස්සො, ධම්මෙ පි -පෙ- සඞ්ඝෙ පි -පෙ- සික්ඛාය න පරිපූරකාරී, සො සඞ්ඝෙ අනුවාදං ජනෙති. සො හොති[1] අනුවාදො බහුජන අහිතාය බහුජනඅසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං. එවරූපං චෙ තුම්හෙ භික්ඛවෙ අනුවාදමූලං අජ්ඣත්තං වා බහිද්ධා වා සමනුපස්සෙය්‍යාථ, තත්‍ර තුම්හෙ භික්ඛවෙ තස්සෙව පාපකස්ස අනුවාදමූලස්ස පහානාය වායමෙය්‍යාථ. එවරූපං චෙ තුම්හෙ භික්ඛවෙ අනුවාදමූලං අජ්ඣත්තං වා බහිද්ධා වා න සමනුපස්සෙය්‍යාථ, තත්‍ර තුම්හෙ භික්ඛවෙ තස්සෙව පාපකස්ස අනුවාදමූලස්ස ආයතිං අනවස්සවාය පටිපජ්ජෙය්‍යාථ. එවමෙතස්ස පාපකස්ස අනුවාදමූලස්ස පහානං හොති. එවමෙතස්ස පාපකස්ස අනුවාදමූලස්ස ආයතිං අනවස්සවො හොති. ඉමානි ඡ අනුවාදමූලානි අනුවාදාධිකරණස්ස මූලං.

30. කතමානි තීණි අකුසලමූලානි අනුවාදාධිකරණස්ස මූලං? ඉධ භික්ඛවෙ භික්ඛූ භික්ඛුං ලුද්ධචිත්තා අනුවදන්ති, දුට්ඨචිත්තා අනුවදන්ති, මූළ්හචිත්තා අනුවදන්ති, සීලවිපත්තියා වා ආචාරවිපත්තියා වා දිට්ඨිවිපත්තියා වා ආජීවවිපත්තියා වා, ඉමානි තීණි අකුසලමූලානි අනුවාදාධිකරණස්ස මූලං.

කතමානි තීණි කුසලමූලානි අනුවාදාධිකරණස්ස මූලං? ඉධ භික්ඛවෙ භික්ඛූ භික්ඛුං අලුද්ධචිත්තා අනුවදන්ති, අදුට්ඨචිත්තා අනුවදන්ති, අමූළ්හචිත්තා අනුවදන්ති, සීලවිපත්තියා වා ආචාරවිපත්තියා වා දිට්ඨිවිපත්තියා වා ආජීවවිපත්තියා වා ඉමානි තීණි කුසලමූලානි අනුවාදාධිකරණස්ස මූලං.

---

1. යො හොති– න. ම.

2. දුද්දසයිකො– න. ම

29. තව ද අනෙකක් කියමි. මහණෙනි, මහණෙක් ගුණමකු වූයේ ඊර්ෂ්‍යාකරණුයේ මසුරු වූයේ වෙයි, ශඨ වූයේ මායා ඇත්තේ ... ලාමක ඊප්සා ඇත්තේ ... මිසදිටු වෙයි ... තමාගේ දෘෂ්ටිය දැඩි කොට ගන්නා සුලු වූයේ ආධානගාහී දුප්පටිනිශශී (දුරලීමට දුෂකර දෘෂ්ටි ඇත්තේ) වෙයි. හේ ශාස්තෘහු කෙරෙහි ද ගෞරව නැත්තේ, යටත්පැවැතුම් නැත්තේ වෙසෙයි, ධර්මය කෙරෙහි ද ගෞරව නැත්තේ, යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි, සඞ්ඝයා කෙරෙහි ද ගෞරව නැත්තේ, යටත් පැවැතුම් නැත්තේ වෙසෙයි, ශික්ෂායෙහි ද පරිපූරකාරී නො වෙයි. මහණෙනි, යම් මහණෙක් ශාස්තෘහු කෙරෙහි ද ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසෙන්නේ ද, ධර්මය කෙරෙහි ද ... සඞ්ඝයා කෙරෙහි ද ගෞරව නැත්තේ යටත් පැවැතුම් නැත්තේ වෙසෙන්නේ ද, ශික්ෂායෙහි පරිපූරකාරී නොවන්නේ ද, හේ සඞ්ඝයා කෙරෙහි අනුවාද (චෝදනා) උපදවයි. ඒ අනුවාදය බොහෝ දෙනාට අහිත පිණිස බොහෝ දෙනාට නොසුව පිණිස, බොහෝ දෙනාට අවැඩ පිණිස, දෙවිමිනිසුනට අහිත පිණිස, දුක් පිණිස වෙයි. මහණෙනි, ඉදින් තෙපි මෙබඳු අනුවාදමූලයක් තමා කෙරෙහි හෝ තමන්ගෙන් බැහැර හෝ දක්නහු නම්, මහණෙනි, එහි ලා ඒ ලාමක වූ අනුවාදමූලයේ ප්‍රහාණය පිණිස වෑයම් කරවු, මහණෙනි, ඉදින් මෙබඳු අනුවාදමූලයක් තමන් කෙරෙහි හෝ තමන්ගෙන් බැහැර හෝ නො දක්නහු නම්, මහණෙනි, තෙපි එහි ලා ඒ ලාමක අනුවාදමූලයේ මත්තෙහි නො ඉපැද්ම පිණිස පිළිපදිවු. මෙසේ මේ ලාමක අනුවාදමූලයේ ප්‍රහාණය වෙයි. මෙසේ මේ ලාමක අනුවාදමූලයේ මත්තෙහි නොඉපැද්ම වෙයි. මේ අනුවාදමූල සය අනුවාදධිකරණයේ මුල ය:

30. කවර තුන් අකුසල්මුල් කෙනෙක් අනුවාදධිකරණයට මුල් වෙත් ද යත්: මහණෙනි, මෙහි මහණ කෙනෙක් ශීලවිපත්තියෙන් හෝ ආචාරවිපත්තියෙන් හෝ දෘෂ්ටිවිපත්තියෙන් හෝ ආජීවවිපත්තියෙන් හෝ මහණකුට ලුබ්ධ සිතැත්තාහු චෝදනා කෙරෙත් ද, ද්විෂ්ට සිතැත්තාහු චෝදනා කෙරෙත් ද, මූඪ සිතැත්තාහු චෝදනා කෙරෙත් ද, (මෙහිලා) මේ තුන් අකුසල් මුල්හු අනුවාදධිකරණයට මුල් වෙත්.

කවර තුන් කුසල්මුල් කෙනෙක් අනුවාදධිකරණයට මුල් වෙත් ද යත්: මහණෙනි, මෙහි මහණහු මහණකුට ශීලවිපත්තියෙන් හෝ ආචාරවිපත්තියෙන් හෝ දෘෂ්ටිවිපත්තියෙන් හෝ ආජීවවිපත්තියෙන් හෝ අලුබ්ධ සිතැත්තාහු චෝදනා කෙරෙත් ද, අද්විෂ්ට සිතැත්තාහු චෝදනා කෙරෙත් ද අමූඪ සිතැත්තාහු චෝදනා කෙරෙත් ද, (මෙසේ) මේ තුන් කුසල්මුල්හු අනුවාදධිකරණයට මුල් වෙත්.

31. කතමො කායො අනුවාදධිකරණස්ස මූලං? ඉධෙකච්චො දුබ්බණ්ණො හොති දුද්දසිකො ඔකොටිමකො බව්හාබාධො කාණො වා කුණී වා ඛඤ්ජො වා පක්ඛහතො වා යෙන නං අනුවදන්ති. අයං කායො අනුවාදධිකරණස්ස මූලං.

කතමා වාචා අනුවාදධිකරණස්ස මූලං? ඉධෙකච්චො දුබ්බචො හොති මම්මනො එළගලවාචො යායං නං අනුවදන්ති, අයං වාචා අනුවාදධිකරණස්ස මූලං.

32. ආපත්තාධිකරණස්ස කිං මූලං? ඡ ආපත්තිසමුට්ඨානා ආපත්තාධිකරණස්ස මූලං. අත්ථාපත්ති කායතො සමුට්ඨාති න වාචාතො න චිත්තතො. අත්ථාපත්ති වාචාතො සමුට්ඨාති න කායතො න චිත්තතො. අත්ථාපත්ති කායතො ච වාචාතො ච සමුට්ඨාති න චිත්තතො. අත්ථාපත්ති කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචාතො. අත්ථාපත්ති වාචාතො ච චිත්තතො ච සමුට්ඨාති න කායතො. අත්ථාපත්ති කායතො ච වාචාතො ච චිත්තතො ච සමුට්ඨාති. ඉමෙ ඡ ආපත්තිසමුට්ඨානා ආපත්තාධිකරණස්ස මූලං.

33. කිච්චාධිකරණස්ස කිං මූලං? කිච්චාධිකරණස්ස එකං මූලං: සඞ්ඝො.

34. විවාදධිකරණං කුසලං අකුසලං අබ්‍යාකතං. විවාදධිකරණං සියා කුසලං සියා අකුසලං සියා අබ්‍යාකතං. තත්ථ කතමං විවාදධිකරණං කුසලං? ඉධ භික්ඛවෙ භික්ඛූ කුසලචිත්තා විවදන්ති ධම්මොති වා අධම්මොති වා -පෙ- දුට්ඨුල්ලා ආපත්තීති වා අදුට්ඨුල්ලා ආපත්තීති වා. යං තත්ථ භණ්ඩනං කලහො විග්ගහො විවාදො නානාවාදො අඤ්ඤථාවාදො විපච්චතාය වොහාරො මෙධගං ඉදං වුච්චති විවාදධිකරණං කුසලං.

තත්ථ කතමං විවාදධිකරණං අකුසලං? ඉධ භික්ඛවෙ භික්ඛූ අකුසලචිත්තා විවදන්ති ධම්මොති වා අධම්මොති වා -පෙ- දුට්ඨුල්ලා ආපත්තීති වා අදුට්ඨුල්ලා ආපත්තීති වා. යං තත්ථ භණ්ඩනං කලහො විග්ගහො විවාදො නානාවාදො අඤ්ඤථාවාදො විපච්චතාය වොහාරො මෙධගං ඉදං වුච්චති විවාදධිකරණං අකුසලං.

31. කවර කයෙක් අනුවාදධිකරණයට මුල් වේ ද? යත්: මෙහි එක්තරා මහණෙක් යමෙකින් සෙස්සෝ ඔහුට චෝදනා කරන්නාහු නම් එසේ වූ නොමනා පැහැ ඇත්තේ, නොමනා දැකුම් ඇත්තේ, අඟුටුමිටි වූයේ, බොහෝ ආබාධ ඇත්තේ, කණෙක් හෝ කොරෙක් හෝ පිළෙක් හෝ පක්ෂඝාතියෙක් හෝ වෙයි. මේ ඔහුගේ කය (මෙසේ) අනුවාදධිකරණයට මුල් වෙයි.

කවර වචනයෙක් අනුවාදධිකරණයට මුල් වෙයි ද? යත්: මෙහි එක්තරා මහණෙක් යමෙකින් සෙස්සෝ ඔහුට චෝදනා කෙරෙද්ද එසේ වූ දුර්වචයෙක්, මුමුනන්නෙක්, කෙලතොලුවෙක් වෙයි. මෙහි මේ වචනය අනුවාදධිකරණයට මුල් වන නියා යි.

32. ආපත්‍යධිකරණයට මුල කවර යැ ආපත්තිසමුට්ඨාන සය ආපත්‍යධිකරණයට මුල් වෙයි. යම් ඇවැතෙක් කයෙන් නැඟේ ද, වචනයෙන් නො නැඟේ ද සිතින් නො නැඟේ ද එසේ වූ ඇවැතෙක් ඇත. යම් ඇවැතෙක් වචනයෙන් නැඟේ ද, කයින් නො නැඟේ ද සිතින් නො නැඟේ ද එසේ වූ ඇවැතෙක් ඇත. යම් ඇවැතෙක් කයිනුත් වචනයෙනුත් නැඟේ ද, සිතින් නො නැඟේ ද, එසේ වූ ඇවැතෙක් ඇත. යම් ඇවැතෙක් කයිනුත් සිතිනුත් නැඟේ ද, වචනයෙන් නො නැඟේ ද, එසේ වූ ඇවැතෙක් ඇත. යම් ඇවැතෙක් වචනයෙනුත් සිතිනුත් නැඟේ ද, කයින් නො නැඟේ ද, එසේ වූ ඇවැතෙක් ඇත. යම් ඇවැතෙක් කයිනුත් වචනයෙනුත් සිතිනුත් නැඟේ ද, එසේ වූ ඇවැතෙක් ඇත. මේ ආපත්තිසමුට්ඨාන සය ආපත්‍යධිකරණයට මුල් ය.

33. කෘත්‍යාධිකරණයට මුල කවර යැ? කෘත්‍යාධිකරණයට එක් මුලෙකි. ඒ සඞ්ඝ තෙමේ ය.

34. විවාදධිකරණය කුසල් වේ ද? අකුසල් වේ ද? නැතහොත් අව්‍යාකෘත වේ ද? යත්: විවාදධිකරණය ඇතැම් එකෙක් කුසල් වන්නේ ය, ඇතැම් එකෙක් අකුසල් වන්නේ ය, ඇතැම් එකෙක් අව්‍යාකෘත වන්නේ ය. ඔවුන් අතුරෙන් කුසල් වූ විවාදධිකරණය කවර යැ? මහණෙනි, මෙහි මහණ කෙනෙක් කුසල් සිතැත්තාහු මේ ධර්මයැ යි කියා හෝ අධර්මයැ යි කියා හෝ ... දුළුල් ඇවැතැ යි කියා හෝ නො දුළුල් ඇවැතැ යි කියා හෝ විවාද කෙරෙත්. එහි යම් ඩබරයෙක් කලහයෙක් විග්‍රහයෙක් විවාදයෙක් නානාවාදයෙක් අන්‍යථාවාදයෙක් පරුෂ ව්‍යවහාරයෙක් අරගලයෙක් වේ ද, මේ කුසල් වූ විවාදධිකරණයැ යි කියනු ලැබේ.

එහි අකුසල් වූ විවාදධිකරණය කවර යැ? මහණෙනි, මෙහි මහණ-කෙනෙක් අකුසල් සිතැත්තාහු ධර්මයැ යි කියා හෝ අධර්මයැ යි කියා හෝ ... දුළුල් ඇවැතැ යි කියා හෝ නොදුළුල් ඇවැතැ යි කියා හෝ විවාද කෙරෙත්. එහි යම් ඩබරයෙක් කලහයෙක් පරුෂ ව්‍යවහාරයෙක්, අරගල-යෙක් වේ ද, මේ අකුසල් වූ විවාදධිකරණයැ යි කියනු ලැබේ.

තත්ථ කතමං විවාදාධිකරණං අව්‍යාකතං? ඉධ භික්ඛවෙ භික්ඛූ අව්‍යාකතචිත්තා විවදන්ති ධම්මොති වා අධම්මොති වා –පෙ– දුට්ඨුල්ලා ආපත්තීති වා අදුට්ඨුල්ලා ආපත්තීති වා. යං තත්ථ භණ්ඩනං කලහො –පෙ– වොහාරො මෙධගං ඉදං වුච්චති විවාදාධිකරණං අව්‍යාකතං.

අනුවාදාධිකරණං කුසලං, අකුසලං, අව්‍යාකතං. අනුවාදාධිකරණං සියා කුසලං සියා අකුසලං සියා අව්‍යාකතං.

තත්ථ කතමං අනුවාදාධිකරණං කුසලං? ඉධ භික්ඛවෙ භික්ඛූ භික්ඛුං කුසලචිත්තා අනුවදන්ති සීලවිපත්තියා වා ආචාරවිපත්තියා වා දිට්ඨිවිපත්තියා වා ආජීවවිපත්තියා වා. යො තත්ථ අනුවාදො අනුවදනා අනුල්ලපනා අනුභණනා අනුසම්පවඞ්කතා අබ්භුස්සහනතා අනුබලප්පදානං ඉදං වුච්චති අනුවාදාධිකරණං කුසලං.

තත්ථ කතමං අනුවාදාධිකරණං අකුසලං? ඉධ භික්ඛවෙ භික්ඛූ භික්ඛුං අකුසලචිත්තා අනුවදන්ති සීලවිපත්තියා වා –පෙ– ආජීවවිපත්තියා වා, යො තත්ථ අනුවාදො –පෙ– අබ්භුස්සහනතා අනුබලප්පදානං ඉදං වුච්චති අනුවාදාධිකරණං අකුසලං. තත්ථ කතමං අනුවාදාධිකරණං අව්‍යාකතං? ඉධ භික්ඛවෙ භික්ඛූ භික්ඛුං අව්‍යාකතචිත්තා අනුවදන්ති සීලවිපත්තියා වා –පෙ– ආජීවවිපත්තියා වා. යො තත්ථ අනුවාදො –පෙ– අනුබලප්පදානං ඉදං වුච්චති අනුවාදාධිකරණං අව්‍යාකතං.

36. ආපත්තාධිකරණං අකුසලං අව්‍යාකතං? ආපත්තාධිකරණං සියා අකුසලං සියා අව්‍යාකතං. නත්ථි ආපත්තාධිකරණං කුසලං.

තත්ථ කතමං ආපත්තාධිකරණං අකුසලං? යං ජානන්තො සඤ්ජානන්තො චෙච්ච අභිවිතරිත්වා වීතික්කමො, ඉදං වුච්චති ආපත්තාධිකරණං අකුසලං.

එහි අව්‍යාකෘත වූ විවාදාධිකරණය කවර යැ? මහණෙනි, මෙහි මහණහු අව්‍යාකෘත සිතැත්තාහු, මේ දහමැ යි කියා හෝ නොදහමැ යි කියා හෝ ... මේ දුළුල් ඇවැතැ යි කියා හෝ මේ නොදුළුල් ඇවැතැ යි කියා හෝ විවාද කෙරෙත්. එහි යම් ඩබරයෙක්, කලහයෙක් පරුෂ ව්‍යවහාරයෙක්, අරගලයෙක් වේ ද, මෙය අව්‍යාකෘත විවාදධිකරණයැ යි කියනු ලැබේ.

35. අනුවාදධිකරණය කුසල් වේ ද? අකුසල් වේ ද? අව්‍යාකෘත වේ ද? අනුවාදධිකරණය ඇතැම් එකෙක් කුසල් වන්නේ ය, ඇතැම් එකෙක් අකුසල් වන්නේ ය, ඇතැම් එකෙක් අව්‍යාකෘත වන්නේ ය.

ඔවුන් අතුරෙන් කුසල් වූ අනුවාදධිකරණය කවරේ ද? යත්: මහණෙනි, මෙහි මහණ කෙනෙක් කුසල් සිතැත්තෝ මහණකුට ශීලවිපත්තියෙන් ආචාරවිපත්තියෙන් හෝ දෘෂ්ටිවිපත්තියෙන් හෝ ආජීවවිපත්තියෙන් හෝ චෝදනා කෙරෙත්. එහි යම් චෝදනාවෙක්, දෙස් නැඟීමෙක්, පුන පුනා දෙස් මතු කොට කීමෙක්, පුන පුනා දෙස් ගිණීමෙක්, පුන පුනා තිදෙරින් නැමීමෙක්, වෙසෙසින් උත්සාහ කිරීමෙක්, අනුබල දීමෙක් වේ ද, මේ කුසල් වූ අනුවාදධිකරණයැ යි කියනු ලැබේ.

එහි අකුසල් වූ අනුවාදධිකරණය කවරේ ද යත්: මහණෙනි, මෙහි මහණ කෙනෙක් අකුසල් සිතැත්තෝ මහණකුට ශීලවිපත්තියෙන් හෝ ... ආජීවවිපත්තියෙන් හෝ චෝදනා කෙරෙත් ද, එහි යම් චෝදනාවෙක් ... උත්සාහ කිරීමෙක්, අනුබල දීමෙක් වේ ද, මේ අකුසල් වූ අනුවාදධිකරණයැ යි කියනු ලැබේ.

එහි අව්‍යාකෘත වූ අනුවාදධිකරණය කවරේ වේ ද? මහණෙනි, මෙහි මහණ කෙනෙක් අව්‍යාකෘත සිතැත්තෝ මහණකුට ශීලවිපත්තියෙන් හෝ ... ආජීවවිපත්තියෙන් හෝ චෝදනා කෙරෙත් ද ... එහි යම් චෝදනාවෙක් ... අනුබල දීමෙක් වේ ද, මෙය අව්‍යාකෘත අනුවාදධිකරණයැ යි කියනු ලැබේ.

36. ආපත්‍යධිකරණය අකුසල් වේ ද? අව්‍යාකෘත වේ ද? කිසි ආපත්‍යධිකරණයෙක් (ඇවැත් පිළිබඳ නඩුවෙක්) අකුසල් වන්නේ ය, කිසි ආපත්‍යධිකරණයෙක් අව්‍යාකෘත වන්නේ ය. කුසල් වූ ආපත්ත්‍යධිකරණයෙක් නැත.

එහි අකුසල් වූ ආපත්ත්‍යධිකරණය කවරේ ද? දන්නේ, හඳුනන්නේ, සිතා, උපක්‍රම විසින් මැඩ යම් සිකපදයක්හු පිළිබඳ ව්‍යතික්‍රමයෙක් වේ ද, මේ අකුසල් වූ ආපත්ත්‍යධිකරණයැ යි කියනු ලැබෙ.

තත්ථ කතමං ආපත්තාධිකරණං අබ්‍යාකතං? යං අජානන්තො අසඤ්ජානන්තො අචෙච්ච අනභිවිතරිත්වා වීතික්කමො, ඉදං වුච්චති ආපත්තාධිකරණං අබ්‍යාකතං.

37. කිච්චාධිකරණං කුසලං අකුසලං අබ්‍යාකතං? කිච්චාධිකරණං සියා කුසලං, සියා අකුසලං, සියා අබ්‍යාකතං.

තත්ථ කතමං කිච්චාධිකරණං කුසලං? යං සඞ්ඝො කුසලචිත්තො කම්මං කරොති අපලොකනකම්මං ඤත්තිකම්මං ඤත්තිදුතියකම්මං ඤත්තිචතුත්ථකම්මං, ඉදං වුච්චති කිච්චාධිකරණං කුසලං.

තත්ථ කතමං කිච්චාධිකරණං අකුසලං? යං සඞ්ඝො අකුසලචිත්තො කම්මං කරොති අපලොකනකම්මං ඤත්තිකම්මං ඤත්තිදුතියකම්මං ඤත්තිචතුත්ථකම්මං, ඉදං වුච්චති කිච්චාධිකරණං අකුසලං.

තත්ථ කතමං කිච්චාධිකරණං අබ්‍යාකතං? යං සඞ්ඝො අබ්‍යාකතචිත්තො කම්මං කරොති අපලොකනකම්මං ඤත්තිකම්මං ඤත්තිදුතියකම්මං ඤත්තිචතුත්ථකම්මං, ඉදං වුච්චති කිච්චාධිකරණං අබ්‍යාකතං.

38. විවාදො විවාදාධිකරණං, විවාදො නො අධිකරණං, අධිකරණං නො විවාදො, අධිකරණඤ්චෙව විවාදො ච. සියා විවාදො විවාදාධිකරණං, සියා විවාදො නො අධිකරණං, සියා අධිකරණං නො විවාදො, සියා අධිකරණඤ්චෙව විවාදො ච.

තත්ථ කතමො විවාදො විවාදාධිකරණං? ඉධ භික්ඛූ භික්ඛූ විවදන්ති ධම්මොති වා අධම්මොති වා -පෙ- දුට්ඨුල්ලා ආපත්තීති වා අදුට්ඨුල්ලා ආපත්තීති වා. යං තත්ථ භණ්ඩනං කලහො විග්ගහො විවාදො නානාවාදො අඤ්ඤථාවාදො විපච්චතාය වොහාරො මෙධගං, අයං විවාදො විවාදාධිකරණං.

එහි අව්‍යාකෘත වූ ආපත්ත්‍යාධිකරණය කවරේ ද යත්: නොදන්නේ, නොහඳුනන්නේ, නො සිතා, උපක්‍රම නො කොට යම් සිකපදයක් පිළිබඳ ව්‍යතික්‍රමයෙක් වේ ද, මේ අව්‍යාකෘත වූ ආපත්ත්‍යාධිකරණයැ යි කියනු ලැබේ.

37. කෘත්‍යාධිකරණය කුසල් ද අකුසල් ද අව්‍යාකෘත ද යත්: ඇතැම් කෘත්‍යාධිකරණයෙක් කුසල් වන්නේ ය, ඇතැම් එකෙක් අකුසල් වන්නේ ය, ඇතැම් එකෙක් අව්‍යාකෘත වන්නේ ය.

එහි කුසල් වූ කෘත්‍යාධිකරණය කවරේ ද සඞ්ඝ තෙමේ කුසල් සිතැත්තේ අපලෝකනකර්ම ඥප්තිකර්ම, ඥප්තිවිතීයකර්ම, ඥප්ති චතුර්ථ කර්ම යන යම් කර්මයක් කරන්නේ ද, මේ කුසල් වූ කෘත්‍යාධි-කරණයැ යි කියනු ලැබේ.

එහි අකුසල් වූ කෘත්‍යාධිකරණය කවරේ ද? සඞ්ඝ තෙමේ අකුසල් සිතැත්තේ අපලෝකනකර්ම, ඥප්තිකර්ම, ඥප්තිද්විතීයකර්ම, ඥප්ති චතුර්ථකර්ම යන යම් කර්මයක් කරන්නේ ද, මේ අකුසල් වූ කෘත්‍යාධි-කරණයැ යි කියනු ලැබේ.

එහි අව්‍යාකෘත වූ කෘත්‍යාධිකරණය කවරේ ද? සඞ්ඝ තෙමේ අව්‍යාකෘත සිතැත්තේ ආලෝකනකර්ම, ඥප්තිකර්ම, ඥප්තිවිතීයකර්ම, ඥප්ති චතුර්ථ කර්ම යන යම් කර්මයක් කරන්නේ ද, මෙය අව්‍යාකෘත වූ කෘත්‍යාධි-කරණයැ යි කියනු ලැබේ.

38. විවාදයෙක් වූ විවාදාධිකරණයෙකි, විවාදයෙක් වූ අධිකරණ නො වූවෙකි, අධිකරණයෙක් වූ විවාද නො වූයෙකි, අධිකරණ ද විවාද ද වූවෙකි. ඇතැම් විවාදයෙක් විවාදාධිකරණ වන්නේ ය, ඇතැම් විවාදයෙක් අධිකරණ නො වන්නේය, ඇතැම් අධිකරණයෙක් විවාද නො වන්නේ ය, ඇතැම් එකෙක් අධිකරණ ද විවාද ද වන්නේ ය.

එහි කවර විවාදයෙක් විවාදාධිකරණ වේ ද යත්: මහණෙනි, මෙහි මහණහු ධර්ම යැ යි කියා හෝ අධර්ම යැ යි කියා හෝ ... දුළුල් ඇවැතැ යි කියා හෝ නොදුළුල් ඇවැතැ යි කියා හෝ විවාද කෙරෙත්. එහි යම් අරගලයෙක්, කලහයෙක්, උනුනට විරුද්ධ ගැන්මෙක්, විරුද්ධ වාදයෙක්, නානාවාදයෙක්, අන් පරිද්දෙකින් වූ වාදයෙක්, සිතැ දුක් පහළ කරනු පිණිස වූ වචනයෙක්, රළු බස් දෙඩුමෙක් වේ ද, මේ විවාදය විවාදාධිකරණ වෙයි.

තත්ථ කතමො විවාදො නො අධිකරණං? මාතා පි පුත්තෙන විවදති, පුත්තො පි මාතරා විවදති, පිතා පි පුත්තෙන විවදති, පුත්තො පි පිතරා විවදති, භාතා පි භාතරා විවදති, භාතා පි භගිනියා විවදති, භගිනී පි භාතරා විවදති, සහායො පි සහායෙන විවදති. අයං විවාදො නො අධිකරණං.

තත්ථ කතමං අධිකරණං නො විවාදො? අනුවාදාධිකරණං ආපත්තාධිකරණං කිච්චාධිකරණං, ඉදං අධිකරණං නො විවාදො.

තත්ථ කතමං අධිකරණඤ්චෙව විවාදො ච? විවාදාධිකරණං අධිකරණඤ්චෙව විවාදො ච.

39. අනුවාදො අනුවාදාධිකරණං, අනුවාදො නො අධිකරණං, අධිකරණං නො අනුවාදො, අධිකරණඤ්චෙව අනුවාදො ච, සියා අනුවාදො අනුවාදාධිකරණං, සියා අනුවාදො නො අධිකරණං, සියා අධිකරණං නො අනුවාදො, සියා අධිකරණඤ්චෙව අනුවාදො ච.

තත්ථ කතමො අනුවාදො අනුවාදාධිකරණං? ඉධ භික්ඛවෙ භික්ඛූ භික්ඛුං අනුවදන්ති සීලවිපත්තියා වා ආචාරවිපත්තියා වා දිට්ඨිවිපත්තියා වා ආජීවවිපත්තියා වා. යො තත්ථ අනුවාදො අනුවදනා අනුල්ලපනා අනුභණනා අනුසම්පවඞ්කතා අබ්භුස්සහනතා අනුබලප්පදානං, අයං අනුවාදො අනුවාදාධිකරණං.

තත්ථ කතමො අනුවාදො නො අධිකරණං? මාතා පි පුත්තං අනුවදති, පුත්තො පි මාතරං අනුවදති, පිතා පි පුත්තං අනුවදති, පුත්තො පි පිතරං අනුවදති, භාතා පි භාතරං අනුවදති, භාතා පි භගිනිං අනුවදති, භගිනී පි භාතරං අනුවදති, සහායො පි සහායං අනුවදති, අයං අනුවාදො නො අධිකරණං.

තත්ථ කතමං අධිකරණං නො අනුවාදො? ආපත්තාධිකරණං කිච්චාධිකරණං විවාදාධිකරණං, ඉදං අධිකරණං නො අනුවාදො.

තත්ථ කතමො අධිකරණඤ්චෙව අනුවාදො ච? අනුවාදාධිකරණං අධිකරණඤ්චෙව අනුවාදො ච.

එහි කවර විවාදයෙක් අධිකරණ නො වේ ද යත්: මව ද පුතු හා විවාද කෙරෙයි, පුතා ද මව හා විවාද කෙරෙයි, පියා ද පුතු හා විවාද කෙරෙයි, පුතා ද පියා හා විවාද කෙරෙයි, බෑයා ද බිහිනිය හා විවාද කෙරෙයි, බිහිනි ද බෑයා හා විවාද කෙරෙයි, යහළුවා ද යහළුවා හා විවාද කෙරෙයි. මේ විවාදය යි, අධිකරණයෙක් නො වේ.

එහි කවර දෑයෙක් අධිකරණ වේ ද? විවාදයෙක් නො වේ ද? යත්: අනුවාදධිකරණය ද ආපත්තාධිකරණය ද යන කෘත්‍යාධිකරණය ද යන මෙය අධිකරණ වෙයි, විවාදයෙක් නො වෙයි.

එහි කවරෙක් අධිකරණයත් විවාදයත් වේ ද යත්: විවාදධිකරණය අධිකරණයත් විවාදයත් වේ.

39. අනුවාද වූ අනුවාදධිකරණයෙකි, අනුවාදවූ අධිකරණ නො වූයෙකි, අධිකරණ වූ අනුවාද නොවූයෙකි, අධිකරණ ද අනුවාද වූයෙකි, ඇතැම් අනුවාදයෙක් අනුවාදධිකරණ වන්නේ ය, ඇතැම් අනුවාදයෙක් අධිකරණ නො වන්නේ ය, ඇතැම් අධිකරණයෙක් අනුවාද නො වන්නේ ය, ඇතැම් එකෙක් අධිකරණ ද අනුවාද ද වන්නේ ය.

එහි කවර අනුවාදයෙක් අනුවාදධිකරණ වේ ද යත්: මහණෙනි, මෙහි මහණහු මහණකුට ශීලවිපත්තියෙන් හෝ ආචාරවිපත්තියෙන් හෝ දෘෂ්ටිවිපත්තියෙන් හෝ ආජීවවිපත්තියෙන් හෝ චෝදනා කෙරෙත්. එහි යම් අනුවාදයෙක් (චෝදනාවෙක්) දොස් නැඟීමෙක්, පුන පුනා දොස් මතු කොට කීමෙක්, පුන පුනා දොස් බිණීමෙක්, පුන පුනා තිදෙරින් නැමීමෙක්, වෙසෙසින් උත්සාහ කිරීමෙක්, අනුබල දීමෙක් වෙයි ද, මේ අනුවාදය අනුවාදධිකරණ වේ.

එහි කවර අනුවාදයෙක් අධිකරණ නො වේ ද යත්: මව ද පුතුට චෝදනා කෙරෙයි, පුතා ද මවට චෝදනා කෙරෙයි, පියා ද පුතාට චෝදනා කෙරෙයි, පුතා ද පියාට චෝදනා කෙරෙයි, බෑයා ද බෑයාට චෝදනා කෙරෙයි, බෑයා ද බිහිනියට චෝදනා කෙරෙයි, බිහිනි ද බෑයාට චෝදනා කෙරෙයි, යහළුවා ද යහළුවාට චෝදනා කෙරෙයි. මේ අනුවාදය යි (චෝදනාව යි), අධිකරණයෙක් නො වෙයි.

එහි කිමෙක් අධිකරණ වේ ද? අනුවාද නො වේ ද යත්: ආපත්තාධිකරණය, කෘත්‍යාධිකරණය, විවාදධිකරණය යන මේ අධිකරණ වෙයි, අනුවාද නො වෙයි.

එහි කවරෙක් අධිකරණයත් අනුවාදයත් වේ ද යත්: අනුවාදධිකරණය අධිකරණ ද වේ අනුවාද ද වේ.

40. ආපත්ති ආපත්තාධිකරණං, ආපත්ති නො අධිකරණං, අධිකරණං නො ආපත්ති, අධිකරණඤ්චෙව ආපත්ති ච, සියා ආපත්ති ආපත්තාධිකරණං, සියා ආපත්ති නො අධිකරණං, සියා අධිකරණං නො ආපත්ති, සියා අධිකරණඤ්චෙව ආපත්ති ච.

තත්ථ කතමං ආපත්ති ආපත්තාධිකරණං? පඤ්චපි ආපත්තික්ඛන්ධා ආපත්තාධිකරණං, සත්තපි ආපත්තික්ඛන්ධා ආපත්තාධිකරණං, අයං ආපත්ති ආපත්තාධිකරණං.

තත්ථ කතමං ආපත්ති නො අධිකරණං? සොතාපත්ති සමාපත්ති, අයං ආපත්ති නො අධිකරණං.

තත්ථ කතමං අධිකරණං නො ආපත්ති? කිච්චාධිකරණං විවාදාධිකරණං අනුවාදාධිකරණං ඉදං අධිකරණං නො ආපත්ති.

තත්ථ කතමං අධිකරණඤ්චෙව ආපත්ති ච? ආපත්තාධිකරණං අධිකරණඤ්චෙව ආපත්ති ච.

41. කිච්චං කිච්චාධිකරණං, කිච්චං නො අධිකරණං, අධිකරණං නො කිච්චං, අධිකරණඤ්චෙව කිච්චඤ්ච සියා කිච්චං කිච්චාධිකරණං, සියා කිච්චං නො අධිකරණං, සියා අධිකරණං නො කිච්චං, සියා අධිකරණඤ්චෙව කිච්චඤ්ච.

තත්ථ කතමං කිච්චං කිච්චාධිකරණං? යා සඞ්ඝස්ස කිච්චයතා කරණීයතා අපලොකනකම්මං ඤත්තිකම්මං ඤත්තිදුතියකම්මං ඤත්තිචතුත්ථකම්මං, ඉදං කිච්චං කිච්චාධිකරණං.

තත්ථ කතමං කිච්චං නො අධිකරණං? ආචරියකිච්චං උපජ්ඣායකිච්චං සමානුපජ්ඣායකිච්චං සමානාචරියකිච්චං ඉදං කිච්චං නො අධිකරණං.

තත්ථ කතමං අධිකරණං නො කිච්චං? විවාදාධිකරණං අනුවාදාධිකරණං ආපත්තාධිකරණං, ඉදං අධිකරණං නො කිච්චං.

තත්ථ කතමං අධිකරණඤ්චෙව කිච්චඤ්ච? කිච්චාධිකරණං අධිකරණඤ්චෙව කිච්චඤ්ච.

40. ආපත්ති වූ ආපත්තාධිකරණයෙකි, ආපත්ති වූ අධිකරණ නො වූ එකෙක, අධිකරණ වූ ආපත්ති නොවූ එකෙක, අධිකරණ ද ආපත්ති ද වූ එකෙක, ඇතැම් ආපත්තියෙක් ආපත්තාධිකරණ වන්නේ ය, ඇතැම් ආපත්තියෙක් අධිකරණ නො වන්නේ ය, ඇතැම් අධිකරණයෙක් ආපත්ති නො වන්නේ ය, ඇතැම් එකෙක් අධිකරණත් ආපත්තිත් වන්නේ ය.

එහි ආපත්ති වූ ආපත්තාධිකරණය කවරේ ද ආපත්තිස්කන්ධ පස ම ආපත්තාධිකරණ යි, ආපත්තිස්කන්ධ සත ම ආපත්තාධිකරණ යි. මේ ආපත්ති ද ආපත්තාධිකරණ ද වූ දැය යි.

එහි කවර දැයෙක් ආපත්ති වේ ද? අධිකරණ නොවේ ද යත්: කෘත්‍යාධිකරණය විවාදධිකරණය අනුවාදධිකරණය යන මේ අධිකරණ වෙයි, ආපත්ති නො වෙයි.

එහි කවර එකෙක් ආපත්ති වේ ද, අධිකරණ නො වේ ද යත්: ශ්‍රෝත ආපත්තිය ද සමාපත්තිය ද යන මෙ ආපත්ති යි, අධිකරණ නො වෙයි.

එහි කවර එකෙක් අධිකරණ වේ ද, ආපත්ති නො වේ ද? යත්: කෘත්‍යාධිකරණය විවාදධිකරණය අනුවාදධිකරණය යන මෙය අධිකරණ යි, ආපත්ති නො වේ.

එහි කවරෙක් අධිකරණත් ආපත්තිත් වේ ද යත්: ආපත්තාධිකරණය අධිකරණ ද ආපත්ති ද වේ.

41. කෘත්‍යය වූ කෘත්‍යාධිකරණයෙකි, කෘත්‍යය වූ අධිකරණ නො වූ යෙකි, අධිකරණ වූ කෘත්‍යය නොවූයෙකි, අධිකරණ ද කෘත්‍ය ද වූයෙකි. ඇතැම් කෘත්‍යයෙක් කෘත්‍යාධිකරණ වන්නේ ය, ඇතැම් කෘත්‍යයෙක් අධිකරණ නො වන්නේ ය, ඇතැම් අධිකරණයෙක් කෘත්‍ය නො වන්නේ ය, ඇතැම් එකෙක් අධිකරණ ද කෘත්‍ය ද වන්නේ ය.

එහි කවර කෘත්‍යයෙක් කෘත්‍යාධිකරණ වේ ද යත්: අපලෝකන කර්ම, ඥප්ති කර්ම, ඥප්තිද්විතීයකර්ම, ඥප්තිචතුර්ථකර්ම යන සංඝයාගේ යම් කෘත්‍ය කරන බවෙක් කටයුතු කරන බවෙක් වේ ද, මේ කෘත්‍ය ද කෘත්‍යාධිකරණ ද වේ.

එහි කවර කෘත්‍යයෙක් අධිකරණ නො වේ ද යත්: ඇදුරන් පිළිබඳ කිස, උපාධ්‍යායයා පිළිබඳ කිස, සමාන උපාධ්‍යායයා පිළිබඳ කිස, සමානාචාර්යා පිළිබඳ කිස යන මේ අධිකරණ නොවූ කෘත්‍යය ය.

එහි කවරෙක් කෘත්‍ය නොවූ අධිකරණයෙක් වේ ද යත්: විවාදධිකරණ අනුවාදධිකරණ ආපත්තාධිකරණ යන මෙය අධිකරණ ය, කෘත්‍ය නො වේ.

එහි කවර එකෙක් අධිකරණයත් කෘත්‍යයත් වේ ද යත්: කෘත්‍යාධිකරණය අධිකරණය ද වේ, කෘත්‍යය ද වේ.

අධිකරණ වූපසමනං

42. විවාදාධිකරණං කතිහි සමථෙහි සම්මති? විවාදාධිකරණං ද්වීහි සමථෙහි සම්මති සම්මුඛාවිනයෙන ච යෙභුය්‍යසිකාය ච.

සියා විවාදාධිකරණං එකං සමථං අනාගම්ම යෙභුය්‍යසිකං එකෙන සමථෙන සම්මෙය්‍ය සම්මුඛාවිනයෙනා ?ති. සියාති'ස්ස වචනීයං. යථා කථං විය? ඉධ භික්ඛූ විවදන්ති ධම්මො ති වා අධම්මො ති වා. විනයො ති වා අවිනයො ති වා, භාසිතං ලපිතං තථාගතෙනාති වා, අභාසිතං අලපිතං තථාගතෙනාති වා, ආචිණ්ණං තථාගතෙනාති වා, අනාචිණ්ණං තථාගතෙනාති වා, පඤ්ඤත්තං තථාගතෙනාති වා, අපඤ්ඤත්තං තථාගතෙනාති වා, ආපත්තීති වා, අනාපත්තීති වා, ලහුකාපත්තීති වා, ගරුකාපත්තීති වා, සාවසෙසාපත්තීති වා, අනවසෙසාපත්තීති වා, දුට්ඨුල්ලාපත්තීති වා, අදුට්ඨුල්ලාපත්තීති වා, තෙ චෙ භික්ඛවෙ භික්ඛූ සක්කොන්ති තං අධිකරණං වූපසමෙතුං, ඉදං වුච්චති භික්ඛවෙ අධිකරණං වූපසන්තං. කෙන වූපසන්තං? සම්මුඛාවිනයෙන.

43. කිඤ්ච තත්ථ සම්මුඛාවිනයස්මිං? සඞ්ඝසම්මුඛතා ධම්මසම්මුඛතා විනයසම්මුඛතා පුග්ගලසම්මුඛතා.

කා ච තත්ථ සඞ්ඝසම්මුඛතා? යාවතිකා භික්ඛූ කම්මප්පත්තා තෙ ආගතා හොන්ති ඡන්දාරහානං ඡන්දො ආහටො හොති, සම්මුඛීභූතා න පටික්කොසන්ති, අයං තත්ථ සඞ්ඝසම්මුඛතා.

කා ච තත්ථ ධම්මසම්මුඛතා විනයසම්මුඛතා? යෙන ධම්මෙන යෙන විනයෙන යෙන සත්ථුසාසනෙන තං අධිකරණං වූපසම්මති අයං තත්ථ ධම්මසම්මුඛතා විනයසම්මුඛතා.

කා ච තත්ථ පුග්ගලසම්මුඛතා? යො ච විවදති, යෙන ච විවදති, උභො අත්ථපච්චත්ථිකා සම්මුඛීභූතා හොන්ති, අයං තත්ථ පුග්ගලසම්මුඛතා.

අධිකරණ සන්හිඳුවීම

42. විවාදධිකරණය ශමථ කීයෙකින් සන්හිඳේද? සම්මුඛාවිනයෙන් ද යෙභුය්‍යසිකායෙන් ද යන ශමථ දෙකින් සන්හිඳේ.

විවාදධිකරණය යෙභුය්‍යසිකා නම් එක් ශමථයට නො පැමිණ සම්මුඛාවිනය නම් වූ එක් ශමථයෙන් සන්හිඳෙන්නේ ය යන්න විය හැකි ද? විය හැක්කැ යි ඔහුට කිය යුතු. ඒ කෙසේ ද යත්: මෙහි මහණහු ධර්මයැ යි හෝ අධර්මයැ යි හෝ විනයයැ යි හෝ අවිනය යැ යි හෝ තථාගතයන් වහන්සේ විසින් වදරන ලද්‍ද යි දෙසන ලද්‍ද යි කියා හෝ තථාගතයන් වහන්සේ විසින් නො වදරන ලද්‍ද යි නො දෙසන ලද්‍ද යි කියා හෝ තථාගතයන් වහන්සේ විසින් පුරුදු කරන ලද්‍ද යි කියා හෝ තථාගතයන් වහන්සේ විසින් පුරුදු නො කරන ලද්‍ද යි කියා හෝ තථාගතයන් වහන්සේ විසින් පනවන ලද්‍ද යි කියා හෝ තථා-ගතයන් වහන්සේ විසින් නො පනවන ලද්‍ද යි කියා හෝ ඇවැතැ යි කියා හෝ නොඇවැතැ යි කියා හෝ ලුහු ඇවැතැ යි කියා හෝ ගුරු ඇවැතැ යි කියා හෝ සාවශෙෂ ඇවැතැ යි කියා හෝ අනවශෙෂ ඇවැතැයි කියා හෝ දුළුල් ඇවැතැ යි කියා හෝ නොදුළුල් ඇවැතැයි කියා හෝ විවාද කෙරෙත් ද, මහණෙනි, ඉදින් ඒ මහණහු මේ අධිකරණය සන්හිඳුවන්නට හැකි වෙත් ද, මහණෙනි, එසේ කලැ මේ අධිකරණය සන්හිඳුවන ලද්‍ද යි කියනු ලැබේ. කිමෙකින් සන්හිඳුවන ලද්දේ ද යත්: සම්මුඛවිනයයෙන් සංසිඳුවන ලද්දේ ය.

43. එහි සම්මුඛාවිනය යනු කිමෙක් ද? සංඝ සම්මුඛතාව, ධර්ම-සම්මුඛතාව විනයසම්මුඛතාව, පුද්ගලසම්මුඛතාව යන මොහු ය.

එහි සංඝසම්මුඛතාව කවර යැ? යම් පමණ භික්ෂු කෙනෙක් විනය කර්‍මයට සුදුසු වෙත් ද, ඔහු ආවාහු වෙත් ද, ඡන්‍දය දීමට සුදුසු මහණුන් ගේ ඡන්‍දය ගෙනෙන ලද්දේ වේ ද, හමු වූ මහණහු ප්‍රතික්‍රෝශ නො කෙරෙත් ද මෙය එහි සඞ්ඝ සම්මුඛතාව වේ. එහි ධර්‍මසම්මුඛතා විනය සම්මුඛතා කවුරු යැ? යම් විනයයෙකින්, යම් ශාස්තෘශාසනයෙකින් ඒ අධිකරණය සංසිඳේ ද, මේ ධර්ම විනය දෙක එහි ධර්මසම්මුඛතා විනයසම්මුඛතා නම් වේ.

එහි පුද්ගල සම්මුඛතා නම් කවර යැ? යමෙකුත් විවාද කෙරේ ද, යමකු හාත් විවාද කෙරේ ද,

ඒ දෙ පසෙහි වූවෝ හමු වූවාහු වෙත් ද, මේ එහි පුද්ගල සම්මුඛතා යි.

එවං වූපසන්තඤ්චෙ භික්ඛවෙ අධිකරණං කාරකො උක්කොටෙති උක්කොටනකං පාචිත්තියං. ඡන්දදායකො ඛීයති ඛීයනකං පාචිත්තියං.

තෙ චෙ භික්ඛවෙ භික්ඛූ න සක්කොන්ති තං අධිකරණං තස්මිං ආවාසෙ වූපසමෙතුං, තෙහි භික්ඛවෙ භික්ඛූහි යස්මිං ආවාසෙ බහුතරා[1] භික්ඛූ සො ආවාසො ගන්තබ්බො. තෙ චෙ භික්ඛවෙ භික්ඛූ තං ආවාසං ගච්ඡන්තා අන්තරාමග්ගෙ සක්කොන්ති තං අධිකරණං වූපසමෙතුං ඉදං වුච්චති භික්ඛවෙ අධිකරණං වූපසන්තං. කෙන වූපසන්තං? සම්මුඛාවිනයෙන. කිඤ්ච තත්‍ථ සම්මුඛාවිනයස්මිං? සඞ්ඝසම්මුඛතා ධම්මසම්මුඛතා විනයසම්මුඛතා පුග්ගලසම්මුඛතා.

44. කා ච තත්‍ථ සඞ්ඝසම්මුඛතා? යාවතිකා භික්ඛූ කම්මප්පත්තා තෙ ආගතා හොන්ති, ඡන්දාරහානං ඡන්දො ආහටො හොති, සම්මුඛීභූතා න පටික්කොසන්ති, අයං තත්‍ථ සඞ්ඝසම්මුඛතා.

කා ච තත්‍ථ ධම්මසම්මුඛතා විනයසම්මුඛතා? යෙන ධම්මෙන යෙන විනයෙන යෙන සත්‍ථුසාසනෙන තං අධිකරණං වූපසම්මති, අයං තත්‍ථ ධම්මසම්මුඛතා විනයසම්මුඛතා.

කා ච තත්‍ථ පුග්ගලසම්මුඛතා? යො ච විවදති, යෙන ච විවදති, උභො අත්තපච්චත්‍ථිකා සම්මුඛීභූතා හොන්ති, අයං තත්‍ථ පුග්ගලසම්මුඛතා. එවං වූපසන්තං චෙ භික්ඛවෙ අධිකරණං කාරකො උක්කොටෙති, උක්කොටනකං පාචිත්තියං, ඡන්දදායකො ඛීයති, ඛීයනකං පාචිත්තියං.

තෙ චෙ භික්ඛවෙ භික්ඛූ තං ආවාසං ගච්ඡන්තා[2] අන්තරාමග්ගෙ න සක්කොන්ති තං අධිකරණං වූපසමෙතුං, තෙහි භික්ඛවෙ භික්ඛූහි තං ආවාසං ගන්ත්වා ආවාසිකා භික්ඛූ එවමස්සු වචනීයා: ඉදං ඛො ආවුසො අධිකරණං එවං ජාතං එවං සමුප්පන්නං, සාධායස්මන්තො ඉදං[3] අධිකරණං වූපසමෙන්තු ධම්මෙන විනයෙන සත්‍ථුසාසනෙන, යථයිදං අධිකරණං සුවූපසන්තං අස්සාති.

1. සම්බහුලා – මජ්ඣසං.
2. ආගච්ඡන්තා – මජ්ඣසං.
3. ඉමං – මජ්ඣසං.

මහණෙනි, මෙසේ සංසිඳුවන ලද අධිකරණය ඉදින් කාරක මහණෙක් (එයට සම්බන්ධ වූ මහණෙක්) උත්කෝටනය කරන්නේ ද, (යළිත් විසඳනු පිණිස මතු කරන්නේ ද), ඔහුට උත්කොටනක පාචිත්තිය ඇවැත වේ. ඡන්දය දුන් මහණෙක් විනිශ්චයට දෙස් නඟයි ද, ඔහුට ඛීයනක පාචිත්තිය ඇවැත වේ.

මහණෙනි, ඉදින් ඒ මහණහු ඒ ආවාසයෙහි දී ඒ අධිකරණය සන්හිඳුවන්නට නොහැකි වන්නාහු නම්, යම් ආවාසයෙක ගණනින් වැඩිතරම් මහණ කෙනෙක් වෙත් නම්, ඒ මහණුන් විසින් එකී ආවාසය කරා යා යුතු වෙයි. මහණෙනි, ඉදින් ඒ මහණහු අතරමඟදී ඒ අධිකරණය සන්හිඳුවන්නට හැකි වන්නාහු නම්, මහණෙනි, මේ අධිකරණය සන්හිඳුවන ලදැයි කියනු ලැබේ. කිමෙකින් සන්හිඳුවන ලද ද යත්: සම්මුඛාවිනයයෙනි.

එහි සම්මුඛාවිනයය කිමෙක් ද? සංඝසම්මුඛතා ධර්මසම්මුඛතා විනයසම්මුඛතා පුද්ගලසම්මුඛතා යන සතර ය.

44. එහි සඞ්ඝසම්මුඛතා නම් කවර යැ? යම් පමණ මහණ කෙනෙක් ඒ විනයකර්මයට සුදුසු නම් ඔහු ආවාහු වෙත් ද, ඡන්දය දීමට සුදුසු මහණුන්ගේ ඡන්දය ගෙනෙන ලද්දේ වේ ද, හමු වූ මහණහු ප්‍රතික්‍රෝශ නො කෙරෙද්ද. (නො වළකාලත් ද) මේ එහි සඞ්ඝ සම්මුඛතා යි.

එහි ධර්මසම්මුඛතා විනයසම්මුඛතා නම් කවුරු යැ? යම් ධර්මයෙකින් යම් විනයයෙකින් යම් ශාස්තෘශාසනයෙකින් ඒ අධිකරණය සංසිඳෙන්නේ ද, මේ එහි ධර්මසම්මුඛතා විනයසම්මුඛතා යි.

එහි පුද්ගලසම්මුඛතා නම් කවර යැ? යමෙකුත් විවාද කෙරෙයි ද, යමක්හු හාත් විවාද කෙරෙයි ද, දෙපසැ වූවෝත් හමු වූවාහු වෙත් ද, මේ එහි පුද්ගලසම්මුඛතා යි. මහණෙනි මෙසේ සංසිඳුවන ලද අධිකරණය කාරක මහණෙක් උත්කෝටනය කරන්නේ ද (යළි මතු කරන්නේ ද) ඔහුට උත්කෝටනක පාචිත්තිය ඇවැත වෙයි, ඡන්දය දුන් මහණ තෙම දෙස් නඟන්නේ නම් ඔහුට ඛීයනක පාචිත්තිය ඇවැත වේ.

මහණෙනි, ඉදින් ඒ මහණහු ඒ ආවාසයට යන්නාහු, අතරමඟදී ඒ අධිකරණය සන්හිඳුවන්නට නො හැකිවන්නාහු නම්, මහණෙනි, ඒ මහණුන් විසින් ඒ ආවාසයට ගොස්, "ඇවැත්නි, මේ අධිකරණය වූකලි මෙසේ උපන, මෙසේ පහළ විය. ඇවැත්නි, යාච්ඤා කරමහ, යම්සේ මේ අධිකරණය මොනොවට සන්හිඳුණේ වන්නේ ද, එසේ ධර්මයෙන් විනයයෙන් ශාස්තෘශාසනයෙන් මේ අධිකරණය සන්හිඳුවත් වා"යි ඒ මහණහු කියයුතු වන්නාහ (ඒ මහණුනට කිය යුතු වන්නේය).

සචෙ භික්ඛවෙ ආවාසිකා භික්ඛූ වුඩ්ඪතරා හොන්ති, ආගන්තුකා භික්ඛූ නවකතරා, තෙහි භික්ඛවෙ ආවාසිකෙහි භික්ඛූහි ආගන්තුකා භික්ඛූ එවමස්සු වචනීයා: ඉධ්ඝ තුම්හෙ ආයස්මන්තො මුහුත්තං එකමන්තං හොථ යාව මයං මන්තෙමාති. සචෙ පන භික්ඛවෙ ආවාසිකා භික්ඛූ නවකතරා හොන්ති ආගන්තුකා භික්ඛූ වුඩ්ඪතරා තෙහි භික්ඛවෙ ආවාසිකෙහි භික්ඛූහි ආගන්තුකා භික්ඛූ එවමස්සු වචනීයා: තෙන හි තුම්හෙ ආයස්මන්තො මුහුත්තං ඉධෙව තාව හොථ යාව මයං මන්තෙමාති.

45. සචෙ පන භික්ඛවෙ ආවාසිකානං භික්ඛූනං මන්තයමානානං එවං හොති: න මයං සක්කොම ඉමං අධිකරණං වූපසමෙතුං ධම්මෙන විනයෙන සත්ථුසාසනෙනාති, න තං අධිකරණං ආවාසිකෙහි භික්ඛූහි සම්පටිච්ඡිතබ්බං.

සචෙ පන භික්ඛවෙ ආවාසිකානං භික්ඛූනං මන්තයමානානං එවං හොති: සක්කොම මයං ඉමං අධිකරණං වූපසමෙතුං ධම්මෙන විනයෙන සත්ථුසාසනෙනාති, තෙහි භික්ඛවෙ ආවාසිකෙහි භික්ඛූහි ආගන්තුකා භික්ඛූ එවමස්සු වචනීයා "සචෙ තුම්හෙ ආයස්මන්තො අම්හාකං ඉදං අධිකරණං යථාජාතං යථාසමුප්පන්නං ආරොචෙස්සථ, යථා ච මයං ඉමං අධිකරණං වූපසමෙස්සාම ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන තථා සුවූපසන්තං භවිස්සති, එවං මය ඉමං අධිකරණං සම්පටිච්ඡිස්සාම. නො චෙ තුම්හෙ ආයස්මන්තො අම්හාකං ඉමං අධිකරණං යථාජාතං යථාසමුප්පන්නං ආරොචෙස්සථ, යථා ච මයං ඉමං අධිකරණං වූපසමෙස්සාම ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන- තථා න සුවූපසන්තං භවිස්සති, න මයං ඉමං අධිකරණං සම්පටිච්ඡිස්සාමාති. එවං සුපරිග්ගහිතං ඛො භික්ඛවෙ කත්වා ආවාසිකෙහි භික්ඛූහි තං අධිකරණං සම්පටිච්ඡිතබ්බං.

46. තෙහි භික්ඛවෙ ආගන්තුකෙහි භික්ඛූහි ආවාසිකා භික්ඛූ එවමස්සු වචනීයා: "යථාජාතං යථා සමුප්පන්නඤ්ච මයං ඉමං අධිකරණං ආයස්මන්තානං ආරොචෙස්සාම. සචෙ ආයස්මන්තා සක්කොන්ති එත්තකෙන වා එත්තකෙන වා අන්තරෙන ඉමං අධිකරණං වූපසමෙතුං ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන තථා සුවූපසන්තං භවිස්සති. එවං මයං ඉමං අධිකරණං ආයස්මන්තානං නියයාදෙස්සාම. නො චෙ ආයස්මන්තා සක්කොන්ති එත්තකෙන වා එත්තකෙනවා අන්තරෙන ඉමං අධිකරණං වූපසමෙතුං ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන. තථා න සුවූපසන්තං භවිස්සති, න මයං ඉමං අධිකරණං ආයස්මන්තානං නියයාදෙස්සාම. මයමෙව ඉමස්ස අධිකරණස්ස සාමිනො භවිස්සාමාති.

මහණෙනි, ඉදින් ආවාසයෙහි වැසි මහණහු වඩා මහලුත් ආගන්තුක මහණහු වඩා නවකත් වෙත් ද, මහණෙනි, ඒ ආවාසවාසී මහණුන් විසින් "ආයුෂ්මත්නි, එසේ නම් අපි යම්තාක් මන්ත්‍රණය කරන්නමු ද ඒ තාක් තෙපි මොහොතක් එක් පසෙක හිඳිවු"යැ යි මෙසේ ආගන්තුක මහණුනට කිය යුතු වන්නේ ය.

45. මහණෙනි, ඉදින් මන්ත්‍රණ කරන්නාවූ ආවාසික මහණුනට "අපි මේ අධිකරණය ධර්මයෙන් විනයයෙන් ශාස්තෘශාසනයෙන් සන්හිඳුවන්නට නො හැකි වන්නමෝ"යි මෙසේ සිතෙක් වන්නේ නම්, ආවාසවාසී මහණුන් විසින් ඒ අධිකරණය (සන්හිඳුවීමට) නො පිළිගත යුතු.

මහණෙනි, ඉදින් මන්ත්‍රණය කරන ආවාසික මහණුනට "අපි මේ අධිකරණය ධර්මයෙන් විනයයෙන් ශාස්තෘශාසනයෙන් සන්හිඳුවන්නට හැකි වන්නමෝ"යි මෙසේ සිතෙක් වන්නේ නම්, "ආයුෂ්මත්නි ඉදින් තෙපි අපගේ මේ අධිකරණය උපන් පරිදි පහළ වූ පරිදි දන්වන්නහු නම්, යම්සේ අපි මේ අධිකරණය ධර්මය වූ පරිදි විනය වූ පරිදි, ශාස්තෘශාසනය වූ පරිදි සන්හිඳුවන්නමෝ නම්, එසේ මොනොවට සන්හිඳුවන ලද්දේ වන්නේ නම්, මෙසේ ඇති කල්හි අපි මේ අධිකරණය පිළිගන්නමු ආයුෂ්මතුනි, ඉදින් තෙපි මේ අධිකරණය උපන් පරිදි පහළ වූ පරිදි අපට නො දන්වන්නහු නම්, යම්සේත් අපි ධර්මයෙන් විනයයෙන් ශාස්තෘශාසනයෙන් මේ අධිකරණය සන්හිඳුවන්නමෝ නම්, එය එසේ මොනොවට සන්හිඳුවන ලද්දෙක් නො වන්නේ නම් එසේ කලැ අපි මේ අධිකරණය නො පිළිගන්නමු"යි ඒ ආගන්තුක මහණුනට කිය යුතු වන්නේ ය. මහණෙනි, මෙසේ ආවාසික මහණුන් විසින් මනාව පිරිසිඳ ගන්නා ලද්දක් කොට, ඒ අධිකරණය පිළිගත යුතු.

46. මහණෙනි, ඒ ආගන්තුක මහණුන් විසින් ආවාසික මහණහු මෙසේ කිය යුතු වන්නාහ (ආවාසික මහණුනට මෙසේ කිය යුතු වන්නේ ය): "උපන් පරිදි හටගත් පරිදි අපි මේ අධිකරණය ආයුෂ්මතුනට දන්වන්නමු. ඉදින් ආයුෂ්මත්හු මෙතෙක් හෝ කෙතෙක් හෝ අතරෙකින් (කලෙකින්) ධර්මයෙන් විනයයෙන් ශාස්තෘශාසනයෙන් මේ අධිකරණය සංසිඳුවන්නට හැකි වන්නාහු නම්, එසේ මොනොවට සන්හිඳුවන ලදුයේ වන්නේ ය. මෙසේ අපි ආයුෂ්මතුනට මේ අධිකරණය පවරන්නමු. ඉදින් ආයුෂ්මත්හු මෙතෙක් හෝ මෙතෙක් හෝ කලෙකින් ධර්මයෙන් විනයයෙන් ශාස්තෘශාසනයෙන් මේ අධිකරණය සන්හිඳුවන්නට නො හැකි වන්නාහු නම්, එසේ මොනොවට සන්හිඳුවන ලද්දෙක් නො වන්නේ නම්, අපි මේ අධිකරණය ආයුෂ්මත්නට නො ම පවරන්නමු. අපි ම මේ අධිකරණයේ ස්වාමීහු වන්නමු" යනු යි.

එවං සුපරිග්ගහිතං ඛො භික්ඛවෙ කත්වා ආගන්තුකෙහි භික්ඛූහි තං අධිකරණං ආවාසිකානං භික්ඛූනං නිය්‍යාදෙතබ්බං. තෙ ච භික්ඛවෙ භික්ඛූ සක්කොන්ති තං අධිකරණං වූපසමෙතුං, ඉදං වුච්චති භික්ඛවෙ අධිකරණං සුවූපසන්තං'ං.

කෙන වූපසන්තං? සම්මුඛාවිනයෙන. කිඤ්ච තත්ථ සම්මුඛා-විනයස්මිං? සඞ්ඝසම්මුඛතා ධම්මසම්මුඛතා විනයසම්මුඛතා පුග්ගල-සම්මුඛතා -පෙ- එවං වූපසන්තං ච භික්ඛවෙ අධිකරණං කාරකො උක්කොටෙති උක්කොටනකං පාචිත්තියං ඡන්දදායකො ඛීයති ඛීයනකං පාචිත්තියං.

උබ්බාහිකාය වූපසමනං

47. තෙහි ච භික්ඛවෙ භික්ඛූහි තස්මිං අධිකරණෙ විනිච්ඡියමානෙ අනග්ගානි[1] චෙව භස්සානි ජායන්ති න චෙතස්ස[2] භාසිතස්ස අත්ථො විඤ්ඤා-යති. අනුජානාමි භික්ඛවෙ එවරූපං අධිකරණං උබ්බාහිකාය වූපසමෙතුං.

දසහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය සම්මන්නිතබ්බො: සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො, යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙ-කල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථං සව්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති. තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා[3] වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති සුවිභත්තානි සුප්පවත්තීනි සුවිනිච්ඡිතානි සුත්තසො අනුව්‍යඤ්ජනසො. විනයෙ ඛො පන ඨිතො[4] හොති අසංහීරො පටිබලො හොති උභො අත්තපච්චත්ථිකෙ අස්සා-සෙතුං සඤ්ඤාපෙතුං නිජ්ඣාපෙතුං පෙක්ඛතුං පසීදිතුං[5] පසාදෙතුං අධි-කරණසමුප්පාදවූපසමකුසලො හොති අධිකරණං ජානාති. අධිකරණසමුදයං ජානාති. අධිකරණනිරොධං ජානාති. අධිකරණනිරොධගාමිනිපටිපදං ජානාති. අනුජානාමි භික්ඛවෙ ඉමෙහි දසහඞ්ගෙහි සමන්නාගතං භික්ඛුං උබ්බාහිකාය සම්මන්නිතුං.

---

1. අනත්තානි - මජ්ඣං.
2. නාචෙකස්ස - මජ්ඣං.
3. ධාතා - මජ්ඣං.
4. ඡෙකො - මජ්ඣං.
5. පසීතුං - වි- මජ්ඣං.

මහණෙනි, මෙසේ මනාව පිරිසිඳ ගන්නා ලද්දක් කොට ආගන්තුක භික්ෂූන් විසින් ඒ අධිකරණය ආවාසික භික්ෂූනට පැවරිය යුතු. ඉදින් ඒ මහණහු ඒ අධිකරණය සන්හිඳුවන්නට හැකි වන්නාහු නම්, මහණෙනි, මේ අධිකරණය මොනොවට සන්හිඳුවන ලදැයි කියනු ලැබේ.

කිමෙකින් සන්හිඳුවනලද්දේ ද යත්: සම්මුඛාවිනයයෙනි. එහි සම්මුඛා විනය නම් කවර යැ? සංඝසම්මුඛතාව ධර්මසම්මුඛතාව විනයසම්මුඛතාව පුද්ගලසම්මුඛතාව යන සතර ය ... මහණෙනි, මෙසේ සන්හිඳුවන ලද අධිකරණයක් ඉදින් කාරක මහණෙක් උත්කෝටනය කරන්නේ ද, ඔහුට උත්කෝටනක පාචිත්තිය ඇවැත වෙයි. ඉදින් ඡන්දදායක මහණෙක් එයට දෙස් නඟන්නේ නම් ඔහුට ඛීයනක පාචිත්තිය ඇවැත වේ.

උබ්බාහිකායෙන් සන්හිඳුවීම

47. මහණෙනි, ඒ මහණුන් විසින් ඒ අධිකරණය විනිශ්චය කරණු ලබන කල්හි කෙළවරක් නැති කතාබස් (කථාප්‍රතිකථාවෝ) උපදින්නාහු ද, මේ කියන ලද වචනයෙහි අර්ථය නොහැඟෙන්නේ ද, මහණෙනි, මෙබඳු වූ අධිකරණය උබ්බාහිකායෙන් සන්හිඳුවන්නට අනුදනිමි.

මහණෙනි, උබ්බාහිකාව පිණිස අඞ්ග දශයෙකින් සමන්විත වූ මහණෙක් සම්මත කටයුතු ය. මහණ තෙම සිල්වත් වෙයි ද, පාතිමොක්ඛසංවර සීලයෙන් හැවුරුණේ, ආචාර ගෝචර දෙකින් යුක්ත වූයේ අල්පමාත්‍ර වූ ද වරදවලැ බිය දක්නා සුලු වූයේ වෙසෙයි ද (1), ශික්ෂා පදයන්හි සමාදන් වැ ගෙන හික්මෙයි ද (2) බොහෝ ඇසූපිරූ තැන් ඇත්තේ වේ ද, ඇසූ පිරූ දෑ සිතින් දරන්නේ, ඇසූ පිරූ දෑ සිතෙහි රැස් කොට ඇත්තේ වෙයි ද (3) ආදියෙහි යහපත් වූ මධ්‍යයෙහි යහපත් වූ, පර්‍යවසානයෙහි යහපත් වූ යම් ධර්ම කෙනෙක් අර්ථ සහිත වූ, ව්‍යංජන සහිත වූ හැම අයුරින් ම පිරිපුන් වූ පිරිසිදු මහ බඹසර මොනොවට පවසත් නම්, එ බඳු වූ ධර්මයෝ ඔහු විසින් බොහෝ සෙයින් අසන ලද්දහු (සිතින) දරණ ලද්දහු වචනයෙන් පුරුදු කරණ ලද්දහු සිතින් පුනපුනා සලකා බලන ලද්දහු, දෘෂ්ටියෙන් මොනොවට පිළිවිදුනා ලද්දහු වෙත් ද (4), ඔහු විසින් උභය පාතිමොක්ඛයෝ විස්තර වශයෙන් මොනොවට ප්‍රගුණ කරණ ලද්දහු, සූත්‍ර වශයෙන් අනුව්‍යංජන වශයෙන් මොනොවට බෙදන ලද්දහු, මොනොවට පිහිටුවන ලද්දහු මොනොවට විනිශ්චය කරණ ලද්දහු වෙත් ද (5), විනයයෙහි තර වැ පිහිටියේ නො හැකුලුනේ වේ ද, තම පසෙහි වූවනටත් විරුද්ධ පක්ෂයෙහි වූවනටත් (කරුණු) හඟුන්වන්නට, කරුණු සිතන්නට, සලකා බලවන්නට, කරුණු තමාත් දකින්නට, දෙ පස ම පහදවන්නට සමර්ථ වෙයි ද (6), අධිකරණ ඉපැදීමෙහි හේතුව සංසිඳුවීමෙහි දක්ෂ වේ ද (7), අධිකරණය දනී ද, අධිකරණයේ හේතුව දනී ද, අධිකරණයේ නිරුද්ධිය දනී ද, අධිකරණ නිරුද්ධිය පිණිස යෑ යුතු මඟ දනී ද, මහණෙනි, මේ අංග දශයෙන් සමන්විත වූ මහණහු උබ්බාහිකාව පිණිස සම්මත කරන්නට අනුදනිමි.

එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බො: පඨමං භික්ඛු යාචිතබ්බො. යාචිත්වා ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අම්හාකං ඉමස්මිං අධිකරණෙ විනිච්ඡියමානෙ අනග්ගානි චෙව භස්සානි ජායන්ති න චෙතස්ස භාසිතස්ස අත්ථො විඤ්ඤායති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමඤ්ච ඉත්ථන්නාමඤ්ච භික්ඛුං සම්මන්නෙය්‍ය උබ්බාහිකාය ඉමං අධිකරණං වූපසමෙතුං. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අම්හාකං ඉමස්මිං අධිකරණෙ විනිච්ඡියමානෙ අනග්ගානි චෙව භස්සානි ජායන්ති න චෙතස්ස භාසිතස්ස අත්ථො විඤ්ඤායති. සඞ්ඝො ඉත්ථන්නාමඤ්ච ඉත්ථන්නාමඤ්ච භික්ඛුං සම්මන්නති උබ්බාහිකාය ඉමං අධිකරණං වූපසමෙතුං. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස ච ඉත්ථන්නාමස්ස ච භික්ඛුනො සම්මුති උබ්බාහිකාය ඉමං අධිකරණං වූපසමෙතුං සො තුණ්හස්ස යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො ච ඉත්ථන්නාමො ච භික්ඛු උබ්බාහිකාය ඉමං අධිකරණං වූපසමෙතුං. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමීති.

තෙ චෙ භික්ඛවෙ භික්ඛු සක්කොන්ති තං අධිකරණං උබ්බාහිකාය වූපසමෙතුං. ඉදං වුච්චති භික්ඛවෙ අධිකරණං වූපසන්තං. කෙන වූපසන්තං? සම්මුඛාවිනයෙන. කිඤ්ච තත්ථ සම්මුඛාවිනයස්මිං? සඞ්ඝසම්මුඛතා[1] ධම්මසම්මුඛතා විනයසම්මුඛතා පුග්ගලසම්මුඛතා -පෙ- එවං වූපසන්තං චෙ භික්ඛවෙ අධිකරණං කාරකො උක්කොටෙති-උක්කොටනකං පාචිත්තියං.

තෙහි චෙ භික්ඛවෙ භික්ඛුහි තස්මිං අධිකරණෙ විනිච්ඡියමානෙ තත්‍රාස්ස භික්ඛු ධම්මකථිකො, තස්ස නෙව සුත්තං ආගතං හොති නො සුත්තවිභඞ්ගො. සො අත්ථං අසල්ලක්ඛෙන්තො ව්‍යඤ්ජනච්ඡායාය අත්ථං පටිබාහති. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන තෙ භික්ඛු ඤාපෙතබ්බා:

1. සඞ්ඝසම්මුඛතා - ඌන. ම. ඉතං.

මහණෙනි, මේ මතු කියන පරිදි සම්මත කටයුතු ය: පළමු කොට මහණ තෙමේ ඉල්ලිය යුතුය. ඉල්ලා ව්‍යක්ත ප්‍රතිබල මහණක්හු විසින් සංඝ තෙමේ මෙසේ දැන්වියැ යුතු:

"වහන්ස, සංඝ තෙමේ මාගේ වචනය අසාවා: අප විසින් මේ නඩුව විනිශ්චය කරණු ලබන කල්හි කෙළවරක් නැති කතාබස් (කථා ප්‍රතිකථා-වෝ) උපදනාහු ද වෙත්. (එයින්) මේ කියන ලද වචනයා ගේ අදහස ද නො හැහෙයි. ඉදින් සංඝයාට පැමිණි කල් ඇත්තේ වී නම් සංඝ තෙමේ මෙනම් මහණහු ද මෙනම් මහණහු ද මේ අධිකරණය සන්හිඳුවන්නට උබ්බාහිකාව පිණිස සම්මත කරන්නේ ය. මේ ඥප්තිය යැ (දැන්වීම යැ).

සංඝ තෙමේ මාගේ වචනය අසාවා. අප විසින් මේ නඩුව විනිශ්චය කරණු ලබන කල්හි කෙළවරක් නැති කතාබස්හු උපදනාහු වෙත්. (එයින් මේ කියන ලද වචනයේ අර්ථ ද නො හැහෙයි. (එ බැවින්) සංඝ තෙමේ මේ නඩුව සන්හිඳුවන්නට උබ්බාහිකාව පිණිස මෙනම් මහණහු ද මෙනම් මහණහු ද සම්මත කෙරෙයි. යම් ආයුෂ්මතකුට මේ නඩුව සන්හිඳුවන්නට උබ්බාහිකාව පිණිස මෙනම් මහණහු ද මෙනම් මහණහු ද සම්මත කිරීම රිසියෙයි ද, හේ නිහඬ වේවා. යමකුට නො රිසියෙයි ද හේ කියාවා.

මේ නඩුව සන්හිඳුවන්නට මෙනම් මහණ ද උබ්බාහිකාව පිණිස සංඝයා විසින් සම්මත විය. සංඝයාට එය රිසි යෙයි. එහෙයින් නිහඬ ය. මෙසේ මෙකරුණ සලකමි. (පිළිගනිමි)" යනු යි

මහණෙනි, ඉදින් ඒ මහණහු උබ්බාහිකායෙන් ඒ නඩුව සන්හි වන්-නට හැකි වන්නාහු නම්, මහණෙනි, මේ නඩුව සන්හිඳුනේ යැ යි යනු ලැබේ. කිමෙකින් සන්හිඳුනේ ද යත්: සම්මුඛාවිනයයෙන් ය. එහි සම්මුඛාවිනයය කිමෙක් ද? ධර්මසම්මුඛතාව විනය සම්මුඛතාව පුද්ගල-සම්මුඛතාව ......මහණෙනි, මෙසේ සන්හිඳුනු නඩුව කාරකයෙක් (ඒ නඩුවට සම්බන්ධ වූයෙක්) යලිදු විසඳනු පිණිස උත්කෝටනය කරන්නේ නම් (මතු කරන්නේ නම්) උත්කෝටනක පචිති ඇවැත් වෙයි.

මහණෙනි, ඉදින් ඒ මහණුන් විසින් ඒ නඩුව විනිසනු ලබන කල්හි එහි ධර්මකථික මහණෙක් වන්නේ නම්, ඔහුට සූත්‍රය (පාතිමොක්ඛය) ප්‍රගුණ ව නොආයේ ද සූත්‍ර විභංගය පුහුණු ව නොම ආයේ ද හේ අර්ථය නොසලකන්නේ ව්‍යංජනච්ඡායායෙන් අර්ථය ප්‍රතිබාහනය කෙරෙයි ද, (එබඳු තැන) ව්‍යක්ත වූ ප්‍රතිබල වූ ඒ මහණහු මෙසේ දැන්වියැ යුත්තාහු ය:

සුණාතු මෙ ආයස්මන්තා. අයං ඉත්ථන්නාමො භික්ඛු ධම්මකථිකො. ඉමස්ස නෙව සුත්තං ආගතං හොති. නො සුත්තවිභඞ්ගො. සො අත්ථං අසල්ලක්ඛෙන්තො ව්‍යඤ්ජනච්ඡායාය අත්ථං පටිබාහති. යදායස්මන්තානං පත්තකල්ලං ඉත්ථන්නාමං භික්ඛුං වුට්ඨාපෙත්වා අවසෙසා ඉමං අධිකරණං වූපසමෙය්‍යාමාති.

තෙ චෙ භික්ඛවෙ භික්ඛූ තං භික්ඛුං වුට්ඨාපෙත්වා සක්කොන්ති තං අධිකරණං වූපසමෙතුං– ඉදං වුච්චති භික්ඛවෙ අධිකරණං වූපසන්තං. කෙන වූපසන්තං? සම්මුඛාවිනයෙන. කිඤ්ච තත්ථ සම්මුඛාවිනයස්මිං? ධම්මසම්මුඛතා විනයසම්මුඛතා පුග්ගලසම්මුඛතා –පෙ– එවං වූපසන්තං චෙ භික්ඛවෙ අධිකරණං කාරකො උක්කොටෙති උක්කොටනකං පාචිත්තියං.

තෙහි චෙ භික්ඛවෙ භික්ඛූහි තස්මිං අධිකරණෙ විනිච්ඡියමානෙ තත්‍රාස්ස භික්ඛු ධම්මකථිකො. තස්ස සුත්තං හි ඛො ආගතං හොති නො සුත්තවිභඞ්ගො. සො අත්ථං අසල්ලක්ඛෙන්තො ව්‍යඤ්ජනච්ඡායාය අත්ථං පටිබාහති. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන තෙ භික්ඛූ ඤාපෙතබ්බා:[1]

සුණාතු මෙ ආයස්මන්තා, අයං ඉත්ථන්නාමො භික්ඛු ධම්මකථිකො. ඉමස්ස සුත්තං හි ඛො ආගතං හොති නො සුත්තවිභඞ්ගො. සො අත්ථං අසල්ලක්ඛෙන්තො ව්‍යඤ්ජනච්ඡායාය අත්ථං පටිබාහති. යදායස්මන්තානං පත්තකල්ලං ඉත්ථන්නාමං භික්ඛුං වුට්ඨාපෙත්වා අවසෙසා ඉමං අධිකරණං වූපසමෙය්‍යාමාති.

තෙ චෙ භික්ඛවෙ භික්ඛූ තං භික්ඛුං වුට්ඨාපෙත්වා සක්කොන්ති තං අධිකරණං වූපසමෙතුං ඉදං වුච්චති භික්ඛවෙ අධිකරණං වූපසන්තං. කෙන වූපසන්තං? සම්මුඛා විනයෙන. කිඤ්ච තත්ථ සම්මුඛා විනයස්මිං? ධම්මසම්මුඛතා විනය සම්මුඛතා පුග්ගලසම්මුඛතා –පෙ– එවං වූපසන්තං චෙ භික්ඛවෙ අධිකරණං කාරකො උක්කොටෙති උක්කොටනකං පාචිත්තියං.

1. ඤාපෙතබ්බො — වි.

"ආයුෂ්මත්හු මාගේ වචනය අසත්වා, මේ මෙනම් මහණ තෙම ධර්මකථික ය, මොහුට සූත්‍රය (උභයමාතෘකාව) ප්‍රගුණ වැ නො ආයේ ය' සූත්‍ර විභඞ්ගය ප්‍රගුණ ව නොම ආයේ ය. හේ අර්ථය නො සලකන්නේ ව්‍යංජනච්ඡායායෙන් අර්ථය ප්‍රතිබාහන කෙරෙයි. ඉදින් ආයුෂ්මත්නට සුදුසු කල් ඇත්තේ වී නම් මෙනම් මහණහු නහාසිටුවා (හෙවත් බැහැර කොට) ඉතිරි වූ අපි මේ අධිකරණය සන්හිඳුවමෝ වා" යනුවෙනි.

මහණෙනි, ඉදින් ඒ මහණහු ඒ මහණහු නහාසිටුවා ඒ අධිකරණය සන්හිඳුවන්නට හැකි වන්නාහු නම්, මහණෙනි, (එසේ කල්හි) මේ අධිකරණය සන්හිඳුනේ යැ යි කියනු ලැබේ. කිමෙකින් සන්හිඳුනේ ද යත්: සම්මුඛාවිනයයෙනි. එහි සම්මුඛාවිනයය කවරේ ද? ධර්මසම්මුඛතාව, විනය සම්මුඛතාව, පුද්ගලසම්මුඛතාව ... යි. මහණෙනි, ඉදින් මෙසේ සන්හිඳුනු අධිකරණය කාරක මහණෙක් උත්කෝටනය කරන්නේ නම් ඔහුට උත්කෝටනක පාචිත්තිය ඇවැත වේ,

මහණෙනි, ඉදින් ඒ මහණුන් විසින් ඒ අධිකරණය විනිසනු ලබන කල්හි එහි ධර්මකථික මහණෙක් වන්නේ නම්, ඔහුට සූත්‍රය (උභය මාතෘකාව) ප්‍රගුණ ව ආයේ වේ නම්, සූත්‍රවිභඞ්ගය ප්‍රගුණ වැ නො ආයේ වේ නම්, හේ අර්ථය නො සලකන්නේ ව්‍යංජනච්ඡායායෙන් අර්ථය ප්‍රතිබාහන කෙරේ නම්, ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණක්හු විසින් ඒ මහණහු මෙසේ දැන්විය යුත්තාහ:

"ආයුෂ්මත්හු මාගේ වචනය අසත්වා, මේ මෙනම් මහණ තෙම ධර්මකථිකයෙක් ය. මොහුට සූත්‍රය (උභය මාතෘකාව) වූ කලි ප්‍රගුණ වැ ආයේ වෙයි, සූත්‍රවිභඞ්ගය ප්‍රගුණ ව නො ආයේ ය. හෙ තෙම අරුත් නො සලකන්නේ ව්‍යංජනච්ඡායායෙන් අරුත බැහැර කෙරෙයි. ඉදින් අයුෂ්මත්නට සුදුසු කල් වී නම් මෙනම් මහණහු නහාසිටුවා (බැහැර කොට) ඉතිරි වූ අපි මේ අධිකරණය සන්හිඳුවමෝ වා" යනුයෙනි.

මහණෙනි, ඉදින් ඒ මහණහු ඒ මහණහු නහාසිටුවා (බැහැර කොට) ඒ අධිකරණය සන්හිඳුවන්නට හැකි වන්නාහු නම්, මහණෙනි, මේ අධිකරණය සන්හිඳුනේ යැ යි කියනු ලැබේ. කිමෙකින් සන්හිඳුනේ ද? යත්: සම්මුඛාවිනයයෙන් ය. එහි සම්මුඛාවිනයය කවරේ යැ? ධර්මසම්මුඛතාව විනය සම්මුඛතාව, පුද්ගල සම්මුඛතාව ......යැ. මහණෙනි, ඉදින් මෙසේ සන්හිඳුනු අධිකරණය කාරක මහණෙක් උත්කෝටනය කරන්නේ වී නම්, ඔහුට උත්කොටනක පාචිත්තිය ඇවැත වේ.

යෙභුය්‍යසිකා විනයං

48. තෙ චෙ භික්ඛවෙ භික්ඛූ න සක්කොන්ති තං අධිකරණං උබ්බාහිකාය වූපසමෙතුං, තෙහි භික්ඛවෙ භික්ඛූහි තං අධිකරණං සඞ්ඝස්ස නිය්‍යාදෙතබ්බං: න මයං භන්තෙ සක්කොම ඉමං අධිකරණං උබ්බාහිකාය වූපසමෙතුං. සඞ්ඝො ඉමං අධිකරණං වූපසමෙතූති. අනුජානාමි භික්ඛවෙ එවරූපං අධිකරණං යෙභුය්‍යසිකාය වූපසමෙතුං.

පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු සලාකගාහාපකො[1] සම්මන්නිතබ්බො. යො න ඡන්දගතිං ගච්ඡෙය්‍ය, න දොසාගතිං ගච්ඡෙය්‍ය, න මොහාගතිං ගච්ඡෙය්‍ය, න භයා ගතිං ගච්ඡෙය්‍ය, ගහිතාගහිතඤ්ච ජානෙය්‍ය -පෙ- එවං ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බො - පඨමං භික්ඛු යාචිතබ්බො. යාචිත්වා බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

"සුණාතු මෙ භන්තෙ සංඝො. යදි සංඝස්ස පත්තකල්ලං, සංඝො ඉත්ථන්නාමං භික්ඛුං සලාකග්ගාහාපකං සම්මන්නෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සංඝො. සංඝො ඉත්ථන්නාමං භික්ඛුං සලාකගාහාපකං සම්මන්නති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො සලාකගාහාපකං සම්මති. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති. සො භාසෙය්‍ය. සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු සලාකගාහාපකො. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී''ති.

තෙන සලාකගාහාපකෙන භික්ඛුනා සලාකා ගාහෙතබ්බා. යථා බහුතරා භික්ඛූ ධම්මවාදිනො වදෙන්ති තථා තං අධිකරණං වූපසමෙතබ්බං. ඉදං වුච්චති භික්ඛවෙ අධිකරණං වූපසන්තං. කෙන වූපසන්තං? සම්මුඛාවිනයෙන ච යෙභුය්‍යසිකාය ච. කිඤ්ච තත්ථ සම්මුඛා විනයස්මිං? සඞ්ඝසම්මුඛතා ධම්මසම්මුඛතා විනයසම්මුඛතා පුග්ගලසම්මුඛතා. කා ච තත්ථ සඞ්ඝසම්මුඛතා? යාවතිකා භික්ඛූ කම්මප්පත්තා තෙ ආගතා හොන්ති. ඡන්දාරහානං ඡන්දො ආහටො හොති, සම්මුඛීභූතා න පටික්කොසන්ති. අයං තත්ථ සඞ්ඝසම්මුඛතා.

---

1. සලාකග්ගාහාපකො - න. ම.

යෙභුය්‍යසිකා විනය

48. මහණෙනි, ඉදින් ඒ මහණහු ඒ අධිකරණය උබ්බාහිකායෙන් සන්හිඳුවන්නට නො හැක්කාහු නම්, මහණෙනි, ඒ මහණුන් විසින් "වහන්ස, අපි මේ අධිකරණය උබ්බාහිකායෙන් සන්හිඳුවන්නට නො හැක්කමු. සංඝ තෙමේ මේ අධිකරණය සන්හිඳුවා වා"යි කියා ඒ අධිකරණය සංඝයාට මෙසේ පැවරිය යුතු. මහණෙනි, මෙ බඳු අධිකරණය යෙභුය්‍යසිකායෙන් සංන්හිඳුවන්නට අනුදනිමි.

අංග පසෙකින් සමන්විත මහණෙක් සලාකාග්‍රාහකයෙක් (සලාකා ගන්වන්නෙක්) කොට සම්මත කට යුතු: යමෙක් ඡන්දයෙන් අගතියට නො යන්නේ ද, ද්වේෂයෙන් අගතියට නොයන්නේ ද, මෝහයෙන් අගතියට නො යන්නේ ද, බියෙන් අගතියට නො යන්නේ ද, ගත් නොගත් සලාකා දන්නේ ද ... මෙබඳු වූ මහණ තෙම සලාකාග්‍රාහාපකයෙක් කොට සම්මත කළ යුතු වේ. මහණෙනි, මෙසේ සම්මත කළ යුතු ය: පළමු කොට මහණ තෙමේ යැදියැ යුතු. යැද ව්‍යක්ත ප්‍රතිබල මහණක්හු විසින් (මෙසේ) සංඝ තෙමේ දන්විය යුතු: "වහන්ස, සංඝ තෙමේ මාගේ වචනය අසාවා ඉදින් සංඝයාට ප්‍රාප්තකාලය වේ නම්, සංඝ තෙමේ මෙනම් මහණහු සලාකා ගන්වන්නකු කොට සම්මත කරන්නේ ය. මේ දන්වීම යැ.

වහන්ස, සංඝ තෙමේ මාගේ වචනය අසාවා. සංඝ තෙමේ මෙනම් මහණහු සලාකාග්‍රාහාපකයකු කොට සම්මත කෙරෙයි. යම් ආයුෂ්මතක් හට මෙනම් මහණහු සලාකාග්‍රාහාපකයකු කොට සම්මත කිරීම රිසියෙන්නේ නම්, හේ නිහඩ වේ වා. යමකුට නො රිසියෙන්නේ හේ හෝ කියාවා.

සංඝයා විසින් මෙනම් මහණ සලාකාග්‍රාහාපකයකු කොට සම්මත විය. සංඝයාට රිසියෙයි. එහෙයින් නිහඬ ය: මෙසේ මෙය සලකමි" යනු යි.

ඒ සලාකාග්‍රාහාපක මහණහු විසින් සලාකා ගැන්වියැ යුතු ය. බහුතර වූ ධර්මවාදී මහණහු කියද්ද, එසේ ඒ අධිකරණය සන්හිඳුවිය යුතු ය.

මහණෙනි, (මෙසේ) මේ අධිකරණය සන්හිඳුණේ යැ යි කියැ යුතු. කිමෙකින් සන්හිඳුණේ ද යත්: සම්මුඛාවිනයයෙන් ද යෙභුය්‍යසිකායෙන් ද යන දෙකෙනි. එහි සම්මුඛාවිනයය කිමෙක් ද? සංඝසම්මුඛතාව, ධර්මසම්මුඛතාව, විනයසම්මුඛතාව, පුද්ගලසම්මුඛතාව යන සතර ය. එහි සංඝ සම්මුඛතා නම් කවරයැ? යම් පමණ මහණ කෙනෙක් කර්මප්‍රාප්ත නම් ඔහු පැමිණියාහු වෙත් ද, ඡන්දය දෙන්නට සුදුසු මහණුන්ගෙන් ඡන්දය ගෙනෙන ලද්දේ වෙයි ද හමු වූ මහණහු ආක්‍රෝශ පරිභව නො කෙරෙත් ද, මේ එහි සංඝසම්මුඛතා නම්.

කා ච තත්‍ථ ධම්මසම්මුඛතා විනයසම්මුඛතා? යෙන ධම්මෙන යෙන විනයෙන යෙන සත්‍ථුසාසනෙන තං අධිකරණං වූපසම්මති, අයං තත්‍ථ ධම්මසම්මුඛතා විනයසම්මුඛතා.

කා ච තත්‍ථ පුග්ගලසම්මුඛතා? යො ච විවදති යෙන ච විවදති උභො අත්‍ථපච්චත්‍ථිකා සම්මුඛීභූතා හොන්ති, අයං තත්‍ථ පුග්ගලසම්මුඛතා.

කා ච තත්‍ථ යෙභුය්‍යසිකා? යා යෙභුය්‍යසිකා කම්මස්ස කිරියා කරණං උපගමනං අජ්ඣුපගමනං අධිවාසනා අප්පටිකොසනා-අයං තත්‍ථ යෙභුය්‍යසිකා.

එවං වූපසන්තඤ්චෙ භික්ඛවෙ අධිකරණං කාරකො උක්කොටෙති උක්කොටනකං පාචිත්තියං. ඡන්දදායකො ඛීයති, ඛීයනකං පාචිත්තියන්ති.

තිවිධ සලාකගාහො

49. තෙන ඛො පන සමයෙන සාවත්‍ථියා එවං ජාතං එවං සමුප්පන්නං අධිකරණං හොති. අථ ඛො තෙ භික්ඛූ අසන්තුට්ඨා සාවත්‍ථියා සඞ්ඝස්ස අධිකරණවූපසමනෙන. අස්සොසුං ඛො අමුකස්මිං කිර ආවාසෙ සම්බහුලා ථෙරා විහරන්ති බහුස්සුතා ආගතාගමා ධම්මධරා විනයධරා මාතිකාධරා පණ්ඩිතා ව්‍යත්තා මෙධාවිනො ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා. තෙ චෙ ථෙරා ඉමං අධිකරණං වූපසමෙය්‍යුං ධම්මෙන විනයෙන සත්‍ථුසාසනෙන, එවමිදං අධිකරණං සුවූපසන්තං අස්සාති. අථ ඛො තෙ භික්ඛූ තං ආවාසං ගන්ත්වා තෙ ථෙරෙ එතදවොචුං: ඉදං භන්තෙ අධිකරණං එවං ජාතං එවං සමුප්පන්නං; සාධු භන්තෙ ථෙරා ඉමං අධිකරණං වූපසමෙන්තු ධම්මෙන විනයෙන සත්‍ථුසාසනෙන යථයිදං අධිකරණං සුවූපසන්තං අස්සාති.

50. අථ ඛො තෙ ථෙරා යථා සාවත්‍ථියා සඞ්ඝෙන අධිකරණං වූපසමිතං, යථා සුවූපසන්තං, තථා තං අධිකරණං වූපසමෙසුං.

එහි ධර්මසම්මුඛතා විනයසම්මුඛතා නම් කවර යැ? යම් ධර්මයෙකින්, යම් විනයයෙකින්, යම් ශාස්තෲශාසනයෙකින් ඒ අධිකරණය සන්හිඳේ ද, මේ එහි ධර්මසම්මුඛතා යැ. විනය සම්මුඛතා යැ.

එහි පුද්ගලසම්මුඛතා නම් කවර යැ? යමෙකුත් විවාද කෙරෙයි ද, යමකු හාත් විවාද කෙරෙයි ද, ඒ තම පංසහි වූ පුහුලාත් විරුද්ධ පක්ෂයෙහි වූ පුහුලාත් යන දෙදෙන හමු වූවාහු වෙත් ද, මේ එහි පුද්ගලසම්මුඛතා යැ.

එහි යෙභුය්‍යසිකාව කවර යැ? යම් යෙභුය්‍යසිකාවෙක් වේ ද, කර්මය පිළිබඳ ක්‍රියාවෙක්, කිරීමෙක්, එළැඹීමෙක් වෙතට එළඹීමෙක්, ඉවසීමෙක් ප්‍රතික්‍රොශ නො කිරීමෙක් වෙයි ද, මේ එහි යෙභුය්‍යසිකාව යැ,

මහණෙනි, මෙසේ සන්හිඳුනු අධිකරණය කාරකයෙත් (එයට) සම්බන්ධ වූ මහණෙක් උත්කෝටනය කරන්නේ ද (ඉදිරියට අදනේ ද) ඔහුට උත්කෝටනක පාචිත්තිය ඇවැත වේ, විනිශ්චයයෙහි ඡන්දය දුන් මහණෙක් ඒ විනිශ්චයට දෙස් කියන්නේ නම් ඛීයනක පාචිත්තිය ඇවැත වේ.

ත්‍රිවිධ සලාකාග්‍රාහය

49. ඒ සමයෙහි වනාහි සැවැත් නුවර මෙසේ පහළ වූ, මෙසේ උපන් අධිකරණයෙක් වෙයි. ඒ කල්හි ඒ මහණහු සැවැත් නුවර සංඝයා ගේ අධිකරණ සන්හිඳුවීමෙන් නො සතුටු වූවාහු ය. ඔහු 'අසෝ ආවාසයෙහි බුහුශ්‍රැත වූ වාචෝද්ගත වැ ආ ආගමධර්මය ඇති, ධර්මධර වූ විනයධර වූ, මාතෘකාධර වූ, පණ්ඩිත වූ ව්‍යක්ත වූ ප්‍රඥ ඇති, ලජ්ජී වූ, කුකුස් කරන්නා වූ ශික්ෂාකාමී වූ බොහෝ තෙරහු වසත් ල, ඉදින් ඒ තෙරහු මේ අධිකරණය ධර්මයෙන් විනයයෙන් ශාස්තෲශාසනයෙන් සන්හිඳුවින්නාහු නම් මෙසේ මේ අධිකරණය මොනොවට සංසිඳුනෙක් වන්නේ යැ'යි ඇසූහ. ඉක්බිති ඒ මහණහු ඒ ආවාසයට ගොස් ඒ තෙරුන් බණවා, "වහන්ස, මේ අධිකරණය මෙසේ පහළ විය., මෙසේ උපන්නේ ය., වහන්ස, යාච්ඤා කරම්හ. තෙරහු ධර්මයෙන් විනයෙන් ශාස්තෲශාසනයෙන් මේ අධිකරණය යම්සේ මොනොවට සන්හිඳුනෙන් වන්නේ ද එසේ මේ අධිකරණය සන්හිඳුවත් වා'යි මෙ බස් කීහ.

50. එ කල්හි ඒ තෙරහු සැවැත් නුවර සංඝයා විසින් ඒ අධිකරණය යම් සේ සන්හිඳුවන ලද්දේ ද, (එහෙයින් ම) මොනොවට සන්හිඳුනේ වේ ද, එසේ ඒ අධිකරණය සන්හිඳුවූහ.

අථ ඛො තෙ භික්ඛූ අසන්තුට්ඨා සාවත්ථියා සඞ්ඝස්ස අධිකරණවූපසමනෙන, අසන්තුට්ඨා සම්බහුලානං ථෙරානං අධිකරණවූපසමනෙන. අස්සොසුං ඛො අසුකස්මිං කිර ආවාසෙ තයො ථෙරා විහරන්ති -පෙ- ද්වෙ ථෙරා විහරන්ති -පෙ- එකො ථෙරො විහරති බහුස්සුතො ආගතාගමො ධම්මධරො විනයධරො මාතිකාධරො පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී ලජ්ජී කුක්කුච්චකො සික්ඛාකාමො. සො චෙ ථෙරො ඉමං අධිකරණං වූපසමෙය්‍ය ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන, එවමිදං අධිකරණං සුවූපසන්තං අස්සාති.

51. අථ ඛො තෙ භික්ඛූ තං ආවාසං ගන්ත්වා තං ථෙරං එතදවොචුං: ඉදං භන්තෙ අධිකරණං එවං ජාතං එවං සමුප්පන්නං, සාධු භන්තෙ ථෙරො ඉමං අධිකරණං වූපසමෙතු ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන, යථයිදං අධිකරණං සුවූපසන්තං අස්සාති.

අථ ඛො සො ථෙරො යථා සාවත්ථියා සඞ්ඝෙන අධිකරණං වූපසමිතං, යථා සම්බහුලෙහි ථෙරෙහි අධිකරණං වූපසමිතං, යථා තීහි ථෙරෙහි අධිකරණං වූපසමිතං, යථා ද්වීහි ථෙරෙහි අධිකරණං වූපසමිතං, යථා සුවූපසන්තං, තථා තං අධිකරණං වූපසමෙසි.

52. අථ ඛො තෙ භික්ඛූ අසන්තුට්ඨා සාවත්ථියා සඞ්ඝස්ස අධිකරණවූපසමනෙන අසන්තුට්ඨා සම්බහුලානං ථෙරානං අධිකරණවූපසමනෙන, අසන්තුට්ඨා තිණ්ණං ථෙරානං අධිකරණවූපසමනෙන, අසන්තුට්ඨා ද්වින්නං ථෙරානං අධිකරණවූපසමනෙන, අසන්තුට්ඨා එකස්ස ථෙරස්ස අධිකරණවූපසමනෙන, යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවතො එතමත්ථං ආරොචෙසුං. භගවා එතදවොච:

නිහතමෙතං භික්ඛවෙ අධිකරණං සන්තං වූපසන්තං සුවූපසන්තං. අනුජානාමි භික්ඛවෙ තෙසං භික්ඛූනං සඤ්ඤත්තියා තයො සලාකගාහෙ ගුළ්හකං සකණ්ණජප්පකං විවටකන්ති.

ඉක්බිති ඒ මහණහු සැවැත්නුවර සංඝයා ගේ අධිකරණ ව්‍යපශමනයෙන් නො සතුටු වූවාහු ය. බොහෝ තෙරවරුන්ගේ අධිකරණ ව්‍යපශමනයෙන් නො සතුටු වූවාහු ය. ඔහු ‘අසෝ නම් ආවාසයෙහි ... තුන් නමෙක් තෙරහු වසත් ලැ යි.... දෙ නමෙක් තෙරහු වසත් ලැ යි, බහුශ්‍රුත වූ වාචෝද්ගත වැ ආ ආගමධර්මය ඇති ධර්මධර වූ විනයධර වූ මාතෘකාධර වූ පණ්ඩිත වූ ව්‍යක්ත වූ ප්‍රඥා ඇති, ලජ්ජී වූ සුළු වරදෙහි ද කුකුස් කරන, ශික්ෂාකාමී වූ එක් තෙර නමෙක් වෙසෙයි. ඉදින් ඒ තෙර නම ධර්මයෙන් විනයෙන් ශාස්තෘශාසනයෙන් මේ අධිකරණය සන්හිඳුවන්නේ නම් මෙසේ මේ අධිරකණය මොනොවට සන්හිඳුනේ වන්නේ යැ’ යි ඇසූහ.

51. එ කල්හි ඒ මහණහු ඒ ආවාසයට ගොස් ඒ තෙරහු බණවා, “වහන්ස, මේ අධිකරණය මෙසේ පහළ විය. මෙසේ උපන්නේ ය, යාච්ඤා කරම්හ, ස්ථවිර තෙමේ මේ අධිකරණය යම්සේ මොනොවට සන්හිඳුනක් වන්නේ ද එසේ ධර්මයෙන් විනයයෙන් ශාස්තෘශාසනයෙන් මේ අධිකරණය සන්හිඳුවාවා’යි මේ වචන කීහ.

එ කල්හි ඒ ස්ථවිර තෙම සැවැත්නුවර යම්සේ සංඝයා විසින් ඒ අධිකරණය සන්හිඳුවන ලද්දේ ද, යම්සේ බොහෝ තෙරවරුන් විසින් (ඒ) අධිකරණය සන්හිඳුවන ලද්දේ ද, යම්සේ තුන් නමක් තෙරුන් විසින් (ඒ) අධිකරණය සන්හිඳුවන ලද්දේ ද, යම්සේ දෙ නමක් තෙරුන් විසින් (ඒ) අධිකරණය සන්හිඳුවන ලද්දේ ද, එසේ ම මොනොවට සංසිඳුනක් වූ පරිද්දෙන් ඒ අධිකරණය සන්හිඳුවී ය.

52. එ කල්හි ඒ මහණහු සැවැත්නුවර සංඝයා ගේ අධිකරණ-ව්‍යපශමනයෙන් නො සතුටු වූවාහු, බොහෝ තෙරුන් ගේ අධිකරණ ව්‍යපශමනයෙන් නො සතුටු වූවාහු, තුන් නමක් තෙරුන් ගේ අධිකරණ ව්‍යපශමනයෙන් නො සතුටු වූවාහු, දෙනමක් තෙරුන් ගේ අධිකරණ ව්‍යපශමනයෙන් නො සතුටු වූවාහු, එක් තෙර නමක ගේ අධිකරණ-ව්‍යපශමනයෙක් නො සතුටු වූවාහු, භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹියාහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේට මෙ පවත් සැල කළාහ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක:

“මහණෙනි, මේ අධිකරණය නිමවන ලද්දෙක, සන්හිඳුනෙක, වෙසෙසින් සන්හිඳුනෙක, මොනොවට සන්හිඳුනෙක. මහණෙනි, ඒ මහණුන් හඳුන්වනු පිණිස ගුළ්හකය, සකණ්ණජප්පකය. විවටකය යන සලාකාගැන්වීම් තුන අනුදනිමි.

කථඤ්ච භික්ඛවෙ ගූළ්හකො සලාකගාහො හොති? තෙන සලාක-ගාහාපකෙන භික්ඛුනා සලාකායො වණ්ණාවණ්ණායො කත්වා එකමෙකො භික්ඛු උපසඞ්කමිත්වා එවමස්ස වචනීයො: අයං එවංවාදිස්ස සලාකා, අයං එවංවාදිස්ස සලාකා, යං ඉච්ඡසි තං ගණ්හාහීති. ගහිතෙ වත්තබ්බො: මා ච කස්සචි දස්සෙසීති. සචෙ ජානාති අධම්මවාදී බහුතරාති, දුග්ගහොති පච්චුක්කඩ්ඪිතබ්බං. සචෙ ජානාති ධම්මවාදී බහුතරාති සුග්ගහොති සාවෙතබ්බං. එවං ඛො භික්ඛවෙ ගූළ්හකො සලාකගාහො හොති.

කථඤ්ච භික්ඛවෙ සකණ්ණජප්පකො සලාකගාහො හොති? තෙන සලාකගාහාපකෙන භික්ඛුනා එකමෙකස්ස භික්ඛුනො උපකණ්ණකෙ ආරොචෙතබ්බං. අයං එවංවාදිස්ස සලාකා, යං ඉච්ඡසි තං ගණ්හාහීති. ගහිතෙ වත්තබ්බො: මා ච කස්සචි ආරොචෙහීති. සචෙ ජානාති අධම්මවාදී බහුතරාති දුග්ගහොති පච්චුක්කඩ්ඪිතබ්බං. සචෙ ජානාති ධම්මවාදී බහුතරාති සුග්ගහොති සාවෙතබ්බං. එවං ඛො භික්ඛවෙ සකණ්ණජප්පකො සලාකගාහො හොති.

කථඤ්ච භික්ඛවෙ විවටකො සලාකගාහො හොති? සචෙ ජානාති ධම්මවාදී බහුතරාති විස්සට්ඨෙනෙව විවටෙන ගාහෙතබ්බො. එවං ඛො භික්ඛවෙ විවටකො සලාකගාහො හොති.

ඉමෙ ඛො භික්ඛවෙ තයො සලාකගාහාති.

සතිවිනයො

53. අනුවාදධිකරණං කතිහි සමථෙහි සම්මති? අනුවාදධිකරණං චතූහි සමථෙහි සම්මති සම්මුඛාවිනයෙන ච සතිවිනයෙන ච අමූළ්හවිනයෙන ච තස්සපාපියසිකාය ච.

සියා අනුවාදධිකරණං ද්වෙ සමථෙ අනාගම්ම අමූළ්හවිනයඤ්ච තස්සපාපියසිකඤ්ච ද්වීහි සමථෙහි සම්මෙය්‍ය සම්මුඛාවිනයෙන ච සතිවිනයෙන චාති? සියාතිස්ස වචනීයං. යථා කථං විය? ඉධ භික්ඛූ භික්ඛුං අමූලිකාය සීලවිපත්තියා අනුද්ධංසෙන්ති, තස්ස ඛො තං භික්ඛවෙ භික්ඛුනො සතිවෙපුල්ලප්පත්තස්ස සතිවිනයො දාතබ්බො.

මහණෙනි, ගුළ්හක සලාකාග්‍රාහය කෙසේවේ ද යත්: ඒ සලකා ගන්වන මහණහු විසින් සලාකාවන් එකක් අනෙකකට වෙනස් වන සේ නිල් ආදි විවිධ පැහැ ඇතියන් කොට, එක් එක් මහණකු කරා එළැඹ, මේ මෙසේ වූ වාද ඇත්තහු ගේ සලාකාව ය, මේ මෙසේ වූ වාද ඇතියහු ගේ සලාකාව ය, යමක් රිසියෙහි නම් එය ගන්නැ'යි මෙසේ කියැ යුතු වන්නේ ය. ගන්නාලද කල්හි 'කිසිවකුටත් මෙය නො දක්වන්නැ' යි කියැ යුතු ය. ඉදින් අධර්මවාදීහු වඩා බොහෝ ඇතැ යි දන්නේ නම්, සලාකා ගැන්ම වරදවා කරණ ලද'යි කියා (දුන් සලාකාවන්) නැවැත එකතු කොට යලිදු ගැන්වියැ යුතු. ඉදින් ධර්මවාදීහු වඩා බොහෝ යැ යි දන්නේ නම් මනාවැ කරණ ලද සලාකා ගැන්මෙකැ යි ඇස්වියැ යුතු. මහණෙනි, මෙසේ ගුළ්හක සලාකා ගැන්වීම වේ.

මහණෙනි, සකණ්ණජප්පක සලාකාග්‍රාහය කෙසේ වේ ද යත්: ඒ සලාකා ගන්වන මහණහු විසින් එක් එක් මහණක්හු ගේ කණට ළං වැ 'මේ මෙ බඳු වාද ඇත්තහු ගේ සලාකාව ය, මේ මෙ බඳු වාද ඇත්තහු ගේ සලාකාව ය, යමක් කැමැත්තෙහි නම් එය ගන්නැ'යි කිය යුතු ය. ගත් කල්හි 'කිසිවකුටත් නො කියන්නැ'යි කිය යුතු ය. අධර්මවාදීහු වඩා බොහෝ යැ යි ඉදින් දන්නේ නම්, නොමනා වැ කරණ ලද සලාකා ගැන්මෙකැ යි (සලාකාවන්) එකතු කොට ගෙන යලිදු සලාකා ගැන්වියැ යුතු. ඉදින් ධර්මවාදීහු වඩා බොහෝ වෙත් යැ යි දන්නේ නම්, 'මනා වැ කරණ ලද සලාකා ගැන්මෙකැ'යි ඇස්විය යුතු. මහණෙනි, මෙසේ සකණ්ණජප්පක සලාකා ගැන්වීම වේ.

මහණෙනි, විවටක සලාකග්‍රාහය කෙසේ වේ ද යත්: ඉදින් ධර්මවාදීහු වඩා බොහෝ යැ යි දන්නේ නම්, සලාකාවන් විසිරුවා විවෘත ලෙසින් (පැනෙන පරිද්දෙන්) ම ගැන්විය යුතු. මහණෙනි, මෙසේ ම විවටක සලාකාග්‍රාහය වෙයි.

මහණෙනි, මොහු වනාහි තුන්සලාකාග්‍රාහයෝ ය යනු යැ.

සතිවිනය

53 අනුවාදධිකරණය ශමථ කීයෙකින් සන්හිඳෙයි ද? අනුවාදධිකරණය සම්මුඛාවිනයෙන් ද සතිවිනයෙන් ද අමූළ්හවිනයයෙන් ද තස්සපාපියාසිකායෙන් ද යන ශමථ සතරින් සන්හිඳෙයි.

අනුවාදධිකරණය අමූළ්හවිනයය ද තස්සපාපියාසිකාව ද යන ශමථ දෙකට නොපැමිණ සම්මුඛාවිනයයෙන් ද සතිවිනයයෙන් ද යන ශමථ දෙකින් සන්හිඳෙන්නේ ය යන්න විය හැකිද? විය හැකි යයි කිය යුතු වන්නේ ය. කෙසේ වූ දැයක් මෙන් ද යත්: මෙහි මහණකුට අමූලක ශීලවිපත්තියෙන් චෝදනා කෙරෙත් නම් මහණෙනි, මහණහු සිහිය වැඩීමට පැමිණි එ මහණහට සතිවිනය දිය යුතු ය.

එවං ච පන භික්ඛවෙ දාතබ්බො: තෙන භික්ඛවෙ භික්ඛුනා සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: මං භන්තෙ භික්ඛූ අමූලිකාය සීලවිපත්තියා අනුද්ධංසෙන්ති. සොහං භන්තෙ සතිවෙපුල්ලප්පත්තො සඞ්ඝං සතිවිනයං යාචාමීති. දුතියම්පි යාචිතබ්බො, තතියම්පි යාචිතබ්බො.

ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො: සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. භික්ඛූ ඉත්ථන්නාමං භික්ඛුං අමූලිකාය සීලවිපත්තියා අනුද්ධංසෙන්ති. සො සතිවෙපුල්ලප්පත්තො සඞ්ඝං සතිවිනයං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො සතිවෙපුල්ලප්පත්තස්ස සතිවිනයං දදෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. භික්ඛූ ඉත්ථන්නාමං භික්ඛුං අමූලිකාය සීලවිපත්තියා අනුද්ධංසෙන්ති. සො සතිවෙපුල්ලප්පත්තො සඞ්ඝං සතිවිනයං යාචති. සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො සතිවෙපුල්ලප්පත්තස්ස සතිවිනයං දෙති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො සතිවෙපුල්ලප්පත්තස්ස සතිවිනයස්ස දානං. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය. දුතියම්පි එතමත්ථං වදාමි -පෙ- තතියම්පි එතමත්ථං වදාමි-පෙ-දින්නො සඞ්ඝෙන ඉත්ථන්නාමස්ස භික්ඛුනො සතිවෙපුල්ලප්පත්තස්ස සතිවිනයො. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමීති..

ඉදං වුච්චති භික්ඛවෙ අධිකරණං වූපසන්තං. කෙන වූපසන්තං? සම්මුඛාවිනයෙන ච සතිවිනයෙන ච. කිඤ්ච තත්ථ සම්මුඛාවිනයස්මිං? සඞ්ඝසම්මුඛතා ධම්මසම්මුඛතා විනයසම්මුඛතා පුග්ගලසම්මුඛතා -පෙ-කා ච තත්ථ පුග්ගලසම්මුඛතා? යො ච අනුවදති, යඤ්ච අනුවදති, උභො අත්තපච්චත්ථිකා සම්මුඛීභූතා හොන්ති. අයං තත්ථ පුග්ගලසම්මුඛතා. කිඤ්ච තත්ථ සතිවිනයස්මිං? යා සතිවිනයස්ස කම්මස්ස කිරියා කරණං උපගමනං අජ්ඣුපගමනං අධිවාසනා අප්පටික්කොසනා ඉදං තත්ථ සතිවිනයස්මිං. එවං වූපසන්තඤ්චෙ භික්ඛවෙ අධිකරණං කාරකො උක්කොටෙති, උක්කොටනකං පාචිත්තියං. ඡන්දදායකො ඛීයති, ඛීයනකං පාචිත්තියං.

මහණෙනි, (සතිවිනය) මෙසේ දිය යුතු ය: මහණෙනි, ඒ මහණහු විසින් සඞ්ඝයා කරා එළැඹ තනිපට සිවුර එකස් කොට පෙරෙවැ උක්කුටුක වැ හිඳ දෙහොත් මුදුන් තබා “වහන්ස, භික්ෂූහු මට අමූලක වූ ශීලවිපත්තිචෝදනායෙන් චෝදනා කෙරෙත්. වහන්ස, ඒ මම් සිහිය වැඩුණු බවට පැමිණියෙම් සඞ්ඝයා ගෙන් සතිවිනය යදිමි'' යි මෙසේ කියැ යුතු වන්නේ ය. දෙවනු ද යැදිය යුතු, තෙවනු ද යැදිය යුතු.

ව්‍යක්ත ප්‍රතිබල මහණක්හු විසින් ‘වහන්ස, සඞ්ඝ තෙමේ මාගේ වචනය අසාවා. භික්ෂූහු මෙනම් මහණහට අමූලක ශීලවිපත්තියෙන් චෝදනා කෙරෙත්. හේ සිහිය වැඩුණු බවට පැමිණියේ, සංඝයා ගෙන් සතිවිනය යදී. ඉදින් සංඝයාට ප්‍රාප්තකාලය වේ නම් සංඝ තෙමේ සිහිවැඩුණබවට පත් මෙනම් මහණහට සතිවිනය දෙන්නේ ය. මේ ඥප්තිය යැ.

වහන්ස, සංඝ තෙමේ මාගේ වචනය අසාවා, මහණහු මෙනම් මහණහට අමූලක ශීලවිපත්තියෙන් චෝදනා කෙරෙත්. සිහිය වැඩුණ බවට පත් හෙ තෙමේ සංඝයා ගෙන් සතිවිනය යදී. සංඝ තෙමේ සිහිය වැඩුණු බවට පත් මෙනම් මහණහට සතිවිනය දෙයි. සිහිය වැඩුණු බවට පත් මෙනම් මහණහට සතිවිනය දීම යම් ආයුෂ්මතක්හට රිසියෙන්නේ නම්, හේ නිහඬ වේවා. යමකුහට නො රිසියෙන්නේ නම් හේ කියාවා, දෙවනු ද මෙ කරුණ කියමි... තෙවනු ද මෙ කරුණ කියමි... සංඝයා විසින් සිහිය වැඩුණු බවට පත් මෙ නම් මහණහට සතිවිනය දෙන ලද්දේ ය. සංඝයාට රිසියෙයි. එහෙයින් නිහඬ ය. මෙසේ මෙය සලකමි''යි, සංඝ තෙමේ දැන්විය යුතු.

මහණෙනි, (මෙසේ) මේ අධිකරණය සන්හිඳුනේ යැ යි කියනු ලැබේ. කිමෙකින් සන්හිඳුනේ ද යත්: සම්මුඛාවිනයයෙනුත් සතිවිනයයෙනුත් ය. එහි සම්මුඛාවිනය කිමෙක් ද යත්: සංඝසම්මුඛතාව ධර්මසම්මුඛතාව විනයසම්මුඛතාව පුද්ගලසම්මුඛතාව... යන මේ යි. එහි පුද්ගල සම්මුඛතාව කවර යැ? යමෙකුත් චෝදනා කෙරෙයි ද?, යමකුටත් චෝදනා කෙරෙයි ද? සිය පසෙහිත් විරුද්ධ පක්ෂයෙහිත් වූවෝ හමුවෙත් ද? මේ එහි පුද්ගල සම්මුඛතාවය යි. එහි සතිවිනය කවර යැ? සතිවිනය කර්මයා ගේ යම් ක්‍රියාවෙක්, කිරීමෙක්, එළැඹීමෙක්, වඩාත් එළැඹීමෙක්, ඉවැසීමෙක්, ප්‍රතික්‍රෝශ නොකිරීමෙක් වෙයි ද, මේ එහි සතිවිනය යි. මහණෙනි, ඉදින් මෙසේ සන්හිඳුණු අධිකරණය කාරක මහණෙක් උත්කෝටනය කෙරෙයි නම්, ඔහුට උත්කෝටනක පාචිත්තිය වෙයි. ඡන්දදායක තෙමේ නින්දා කෙරෙයි ද, ඛීයනක පාචිත්තිය ඇවැත වේ.

අමූළ්හවිනයො

54. සියා අනුවාදාධිකරණං ද්වීහි සමථෙහි අනාගම්ම සතිවිනයඤ්ච තස්සපාපියසිකඤ්ච, ද්වීහි සමථෙහි සම්මෙය්‍ය සම්මුඛාවිනයෙන ච අමූළ්හවිනයෙන චාති? සියාතිස්ස වචනීයං. යථා කථං විය? ඉධ භික්ඛු උම්මත්තකො හොති චිත්තවිපරියාසකතො. තෙන උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං හොති භාසිතපරික්කන්තං. තං භික්ඛූ උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන අජ්ඣාචිණ්ණෙන ආපත්තියා චොදෙන්ති: සරතායස්මා එවරූපිං ආපත්තිං ආපජ්ජිතාති. සො එවං වදෙති: "අහං ඛො ආවුසො උම්මත්තකො අහොසිං චිත්තවිපරියාසකතො. තෙන මෙ උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං භාසිතපරික්කන්තං. නාහන්තං සරාමි. මූළ්හෙන මෙ එතං කතන්ති." එවම්පිනං වුච්චමානා චොදෙන්තෙව 'සරතායස්මා එවරූපිං ආපත්තිං ආපජ්ජිතාති' තස්ස ඛො භික්ඛවෙ භික්ඛුනො අමූළ්හස්ස අමූළ්හවිනයො දාතබ්බො.

එවඤ්ච පන භික්ඛවෙ දාතබ්බො: තෙන භික්ඛවෙ භික්ඛුනා සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා වුඩ්ඪානං භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: 'අහං භන්තෙ උම්මත්තකො අහොසිං චිත්තවිපරියාසකතො. තෙන මෙ උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං භාසිතපරික්කන්තං. මං භික්ඛූ උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන අජ්ඣාචිණ්ණෙන ආපත්තියා චොදෙන්ති. සරතායස්මා එවරූපිං ආපත්තිං ආපජ්ජිතාති. ත්‍යාහං එවං වදාමි: අහං ඛො ආවුසො උම්මත්තකො අහොසිං චිත්තවිපරියාසකතො. තෙන මෙ උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං භාසිතපරික්කන්තං. නාහන්තං සරාමි. මූළ්හෙන මෙ එතං කතන්ති. එවම්පි මං වුච්චමානා චොදෙන්තෙව: සරතායස්මා එවරූපිං ආපත්තිං ආපජ්ජිතාති. සොහං භන්තෙ අමූළ්හො සඞ්ඝං අමූළ්හවිනයං යාචාමීති. දුතියම්පි යාචිතබ්බො -පෙ- තතියම්පි යාචිතබ්බො -පෙ-

අමූළ්හවිනය

54. අනුවාදධිකරණය සතිවිනයය ද තස්සපාපියාසිකාව ද යන ශමථ දෙකට නොපැමිණ සම්මුඛාවිනයයෙන් ද අමූළ්හවිනයයෙන් ද යන ශමථ දෙකින් සන්හිඳෙන්නේ ය යන්න විය හැකි ද? විය හැකියැ යි කියයුතු වන්නේ ය. කෙසේ ද යත්: මෙහි මහණෙක් සිත් පෙරළියට පැමිණි උමතුවෙක් වෙයි. සිත් පෙරළියට පැමිණි ඒ උමතු මහණහු විසින් ශ්‍රමණ සාරුප්‍ය නොවූ බොහෝ කියුම් කැරුම් ද කරණ ලද්දේ වෙයි. උමතු වැ සිත් පෙරළියට පැමිණ කළ දෑ හේතු කොට ගෙන 'ආයුෂ්මත් තෙමෙ මෙබඳු ඇවැතකට පැමිණියා සිහි කෙරේවා''යි මහණහු එ මහණහට ඇවැතින් චෝදනා කෙරෙත්. ''ඇවැත්නි, මම සිත් පෙරළියට පත් උමතුවෙකිම් වීමි. උමතු වූ සිත් පෙරළියට පැමිණි ඒ මා විසින් කායික වාචසික වශයෙන් බොහෝ ශ්‍රමණසාරුප්‍ය නොවූ දෑ කරණ ලදි. එය මම සිහි නො කරමි. සිහි මුළා වූ මා විසින් එය කරණ ලදැ''යි හේ මෙසේ කියයි. ඔහු විසින් මෙසේ කියනු ලබන්නාහු ද ඔහු ඒ මහණහට ''ආයුෂ්මත් තෙමේ මෙ බඳු ඇවැතකට පැමිණියා සිහි කෙරේවා''යි චෝදනා කෙරෙත් ම ය. මහණෙනි, නොමුළා වූ ඒ මහණහට අමූළ්හවිනය දිය යුතු ය.

මහණෙනි, එය මෙසේ ම දිය යුතු: ඒ මහණහු විසින් සංඝයා වෙත එළැඹ, උතුරුසඟ එකස් කොට වැඩිමහළු මහණුන්ගේ පා වැඳ උක්කුටුක වැ හිඳ දොහොත් මුදුන් තබා ''වහන්ස, මම සිත් පෙරළියට පත් උමතු-වෙකිම් වීමි. උමතුවූ සිත් පෙරළියට පත් ඒ මා විසින් මහණුනට නො සරුප් වූ කායික වූ ද වාචසික වූ ද බොහෝ වරද කරණ ලද්දේ ය. මහණහු උමතු වූ සිත් පෙරළියට පත් මා විසින් කළ වරද හේතු කොට ගෙන මහණහු මට, 'ආයුෂ්මත් තෙමෙ මෙ බඳු ඇවැතකට පැමිණියා සිහි කෙරේවා'යි මට චෝදනා කෙරෙත්. 'ඇවැත්නි, මම උමතු වූ සිත් පෙරළියට පැමිණියෙකිම් වීමි. උමතු වූ සිත් පෙරළියට පැමිණි ඒ මා විසින් වචනයෙන් කියන ලද්දවූ ද, කයින් කරණ ලද්දවූ ද යි බොහෝ ශ්‍රමණ සාරුප්‍ය නොවූ වරද දෑ කරණ ලදි. ඒ දෑ මම සිහි නො කෙරෙමි. සිහිමුළා වූ මා විසින් ඒ දෑ කරණ ලදැ'යි ඔවුනට මම මෙසේ කියමි. මෙසේ කියනු ලබන්නාවූ ද ඔහු මට 'ආයුෂ්මත් තෙමේ මෙ බඳු ඇවැතකට පැමිණියා සිහි කෙරේ වා' යි මට චෝදනා කෙරෙත් ම ය. වහන්ස, ඒ මම සිහිමුළාව නැත්තෙම් සංඝයා ගෙන් අමූළ්හවිනයය ඉල්ලමි''යි මෙසේ කියැ යුතු වන්නේ ය. දෙවෙනි වර ද මෙසේ ඉල්ලිය යුතු... තෙවෙනි වර ද ඉල්ලියැ යුතු...

ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො: සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං ඉත්‍ථනාමො භික්ඛු උම්මත්තකො අහොසි චිත්තවිපරියාසකතො. තෙන උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං භාසිතපරික්කන්තං. තං භික්ඛු උම්මත්තකෙන චිත්තවිපරියාසකතෙන අජ්ඣාචිණ්ණෙන ආපත්තියා චොදෙන්ති: සරතායස්මා එවරූපිං ආපත්තිං ආපජ්ජිතාති. සො එවං වදෙති: 'අහං බො ආවුසො උම්මත්තකො අහොසිං -පෙ-' සො අමූළ්හො සඞ්ඝං අමූළ්හවිනයං යාචති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්‍ථනාමස්ස භික්ඛුනො අමූළ්හස්ස අමූළ්හවිනයං දදෙය්‍ය. **එසා ඤත්ති.**

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො: අයං ඉත්‍ථනාමො භික්ඛු උම්මත්තකො අහොසි චිත්තවිපරියාසකතො -පෙ- සො එවං වදෙති: 'අහං ඛො ආවුසො උම්මත්තකො අහොසිං චිත්තවිපරියාසකතො -පෙ- සො අමූළ්හො සඞ්ඝං අමූළ්හවිනයං යාචති. සඞ්ඝො ඉත්‍ථනාමස්ස භික්ඛුනො අමූළ්හස්ස අමූළ්හවිනයං දෙති. යස්සායස්මතො ඛමති ඉත්‍ථනාමස්ස භික්ඛුනො අමූළ්හස්ස අමූළ්හවිනයස්ස දානං. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය දුතියම්පි එතමත්‍ථං වදාමි -පෙ-තතියම්පි එතමත්‍ථං වදාමි -පෙ-.

දින්නො සඞ්ඝෙන ඉත්‍ථනාමස්ස භික්ඛුනො අමූළ්හස්ස අමූළ්හවිනයො. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී එවමෙතං ධාරයාමීති.

ඉදං වුච්චති භික්ඛවෙ අධිකරණං වූපසන්තං. කෙන වූපසන්තං? සම්මුඛාවිනයෙන ච අමූළ්හවිනයෙන ච. කිඤ්ච තත්‍ථ සම්මුඛාවිනයස්මිං? සඞ්ඝසම්මුඛතා ධම්මසම්මුඛතා විනයසම්මුඛතා පුග්ගලසම්මුඛතා. කිඤ්ච තත්‍ථ අමූළ්හවිනයස්මිං? යා අමූළ්හවිනයස්ස කම්මස්ස කිරියා කරණං උපගමනං අජ්ඣුපගමනං අධිවාසනා අප්පටික්කොසනා, ඉදං තත්‍ථ අමූළ්හවිනයස්මිං, එවං වූපසන්තඤ්ච භික්ඛවෙ අධිකරණං කාරකො උක්කොටෙති, උක්කොටනකං පාචිත්තියං. ඡන්දදායකො ඛීයති, ඛීයනකං පාචිත්තියං.

ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණකු විසින් සංඝ තෙමේ මෙසේ දැන්විය යුතු: ''සංඝ තෙමේ මාගේ වචනය අසාවා, මේ මෙනම් මහණ තෙම සිත් පෙරළීමට ගිය උමතුවෙක් විය, සිත් පෙරළීමට ගිය උමතු වූ ඔහු විසින් කායික වූ ද වාචසික වූ ද අශ්‍රාමණක වූ බොහෝ වරද කරණ ලද්දේ ය. මහණහු ඒ මහණහට සිත්පෙරළීමට ගිය උමතු වූ ඔහු විසින් කරණ ලද වරදින් ඇවැතින් 'ආයුෂ්මත් තෙමේ මෙබඳු වූ ඇවැතකට පැමිණියා සිහි කෙරේවා'යි චෝදනා කෙරෙත්, හෙ තෙමේ 'ඇවැත්නි,... උමතුවීමි'... යි මෙසේ කියයි. හේ සිහිමුළාව නැත්තේ සංඝයා ගෙන් අමූළ්හවිනය ඉල්ලයි. ඉදින් සංඝයාට ප්‍රාප්තකාල වේ නම්–

සංඝ තෙමේ සිහිමුළාව නැත්තා වූ මෙනම් මහණහට අමූළ්හවිනයය දෙන්නේ ය. මේ ඥප්තිය යි.

වහන්ස, සංඝ තෙමේ මගේ වචනය අසාවා, මේ මෙනම් මහණ තෙම සිත් පෙරළියට ගිය උමතුවෙක් විය... හේ 'ඇවැත්නි, මම සිත් පෙරළියට ගිය උමතුවෙකිම් වීමි... සිහිමුළාවෙන් තොරවූ හේ සංඝයා ගෙන් අමූළ්හවිනයය ඉල්ලයි. සංඝ තෙමේ සිහිමුළාව නැත්තා වූ මෙනම් මහණහට අමූළ්හවිනයය දෙයි. මුළාව නැත්තාවූ මෙනම් මහණහට අමූළ්හවිනයය දීම යම් ආයුෂ්මතක්හට රිසියෙන්නේ නම් හේ නිහඬ වේවා. යමකුට නො රිසියෙන්නේ නම්, හේ කියාවා, දෙවෙනි වරද මෙ කරුණ කියමි...

සංඝයා විසින් සිහිමුළාවෙන් තොර වූ මෙනම් මහණහට අමූළ්හවිනයය දෙන ලද්දේ ය. සංඝයාට රිසියෙයි. එහෙයින් නිහඬ ය, මෙසේ මෙය සලකමි''යනු යි.

මහණෙනි, මේ අධිකරණය සන්හිඳුනේ යැ යි කියනු ලැබේ. කිමෙකින් සන්හිඳුනේ ද යත්: සම්මුඛාවිනයෙන් ද අමූළ්හවිනයයෙන් ද යන දෙකිනි. එහි සම්මුඛාවිනයය කවර යැ? සංඝසම්මුඛතාව ධර්මසම්මුඛතාව, විනය සම්මුඛතාව, පුද්ගලසම්මුඛතාව යන සතර යැ.

එහි අමූළ්හවිනය කවර යැ? අමූළ්හවිනයකර්මයා ගේ යම් ක්‍රියායෙක්, කිරීමෙක්, එළැඹීමෙක්, අභ්‍යුපගමනයෙක්, ඉවැසීමෙක්, අප්‍රතික්‍රෝශනයෙක් වේ ද, මේ එහි අමූළ්හවිනය යැ. මහණෙනි, මෙසේ සන්හිඳුණු අධිකරණය කාරක මහණෙක් උත්කෝටනය කරන්නේ ද, ඔහුට උත්කෝටනක පාචිත්තිය ඇවැත වේ. ඡන්දදායක තෙමේ (මේ අධිකරණ ව්‍යුපශමයයට) නින්ද කරන්නේ ද, ඔහුට ඛියනක පාචිත්තිය ඇවැත වේ.

තස්සපාපියසිකා

55. සියා අනුවාදාධිකරණං ද්වෙ සමථෙ අනාගම්ම සතිවිනයඤ්ච අමූළ්හවිනයඤ්ච ද්වීහි සමථෙහි සම්මෙය්‍ය සම්මුඛාවිනයෙන ච තස්සපාපියසිකාය චාති? සියාතිස්ස වචනීයං.

යථා කථං විය? ඉධ භික්ඛු භික්ඛුං සඞ්ඝමජ්ඣෙ ගරුකාය ආපත්තියා චොදෙති, සරතායස්මා එවරූපිං ගරුකං ආපත්තිං ආපජ්ජිතා පාරාජිකං වා පාරාජිකසාමන්තං වා'ති.

සො එවං වදෙති: න ඛො අහං ආවුසො සරාමි එවරූපිං ගරුකං ආපත්තිං ආපජ්ජිතා පාරාජිකං වා පාරාජිකසාමන්තං වාති.

තමෙනං සො නිබ්බෙඨෙන්තං අතිවෙඨෙති. 'ඉඞ්ඝායස්මා සාධුකමෙව ජානාහි, යදි සරසි එවරූපිං ගරුකං ආපත්තිං ආපජ්ජිතා පාරාජිකං වා පාරාජිකසාමන්තං වාති.

සො එවං වදෙති: න ඛො අහං ආවුසො සරාමි එවරූපිං ගරුකං ආපත්තිං ආපජ්ජිතා පාරාජිකං වා පාරාජිකසාමන්තං වා. සරාමි ච ඛො අහං ආවුසො එවරූපිං අප්පමත්තිකං ආපත්තිං ආපජ්ජිතාති.

තමෙනං සො නිබ්බෙඨෙන්තං අතිවෙඨෙති: 'ඉඞ්ඝායස්මා සාධුකමෙව ජානාහි: යදි සරසි එවරූපිං ගරුකං ආපත්තිං ආපජ්ජිතා පාරාජිකං වා පාරාජිකසාමන්තං වා'ති.

සො එවං වදෙති: 'ඉමං හි නාමාහං ආවුසො අප්පමත්තිකං ආපත්තිං ආපජ්ජිත්වා අපුට්ඨො පටිජානිස්සාමි. කිම්පනාහං එවරූපිං ගරුකං ආපත්තිං ආපජ්ජිත්වා පාරාජිකං වා පාරාජිකසාමන්තං වා පුට්ඨො න පටිජානිස්සාමී'ති.

සො එවං වදෙති: ඉමං හි නාම ත්වං ආවුසො අප්පමත්තිකං ආපත්තිං ආපජ්ජිත්වා අපුට්ඨො පටිජානිස්සසි. කිම්පන ත්වං එවරූපිං ගරුකං ආපත්තිං ආපජ්ජිත්වා පාරාජිකං වා පාරාජිකසාමන්තං වා පුට්ඨො න පටිජානිස්සසි? ඉඞ්ඝායස්මා සාධුකමෙව ජානාහි. යදි සරසි එවරූපිං ගරුකං ආපත්තිං ආපජ්ජිතා පාරාජිකං වා පාරාජිකසාමන්තං වාති.

තස්සපාපියාසිකා

55. අනුවාදධිකරණය සතිවිනයය ද අමූළ්හවිනයය ද යන ශමථ දෙකට නොපැමිණ, සම්මුඛාවිනයයෙන් ද තස්සපාපියාසිකායෙන් ද යන ශමථ දෙකින් සංසිඳෙන්නේ ය යන්න විය හැකි ද? විය හැකියැ යි කිය යුතු වන්නේ ය.

කෙසේ ද යත්: මෙහි මහණෙක් මහණකුට සඟමැදදී ''ආයුෂ්මත් තෙමේ පරිජි ඇවැතකට හෝ පරිජියට සාමන්ත (දුකුළා හෝ ථුලසි) ඇවැතකට හෝ මෙබඳු ගරු ඇවැතකට පැමිණියා සිහි කෙරේවා'යි ගරු ඇවැතෙකින් චෝදනා කරයි.

ඒ (චුදිත) මහණ තෙම 'ඇවැත්නි, පරිජි ඇවැතට හෝ පරිජියට සාමන්ත (දුකුළා හෝ ථුලසි) ඇවැතකට හෝ මෙබඳු ඇවැතකට පැමිණියා මම සිහි නො කරමි යි කියයි.

ඒ (චෝදක) මහණ තෙම 'එසේ නම් ආයුෂ්මත් තෙමේ පරිජි හෝ පරිජියට සාමන්ත (දුකුළා හෝ ථුලසි) ඇවතකට හෝ පැමිණියෙමි'යි සිහි කෙරෙහි නම් මනාකොට ම එය දැනගන්නැ' යි යථොක්ත චුදිත මහණහු වඩාත් චොදනායෙන් වෙළයි.

ඒ චුදිත මහණතෙම 'ඇවැත්නි, පරිජි ඇවැතට හෝ පරිජියට සාමන්ත ඇවැතකට හෝ මෙසේ වූ ඇවැතකට පැමිණියෙමි'යි මම් නො ම සිහි කරමි. ඇවැත්නි, එනෙකුදු වුවත් මෙබඳු වූ අල්පමාත්‍ර ඇවැතකට පැමිණියෙමි යි සිහි කෙරෙමි යි මෙසේ කියයි.

එසේ වී නම්, ආයුෂ්මත් තෙමේ 'පරිජි ඇවැතට හෝ පාරාජික-සාමන්ත ඇවැතකට හෝ මෙසේ වූ ගරු ඇවැතකට පැමිණියෙමි'යි ඉදින් සිහි කෙරෙහි නම් එය මනාකොට ම දැනගන්නැ'යි චොදක මහණ තෙමේ යථොක්ත චොදනා වෙළමෙන් මිදෙන්නට සැරසෙන මහණහු වඩාත් දැඩි කොට වෙළයි.

'ඇවැත්නි, මම් මෙ නම් අල්පමාත්‍ර ඇවැතකට පැමිණ නො විචාරණ ලද්දෙම් ප්‍රතිඥා කරන්නෙමි. කිමෙක් ද? පරිජිඇවතට හෝ පරිජි ඇවැතට සාමන්ත වූ ඇවැතකට හෝ මෙබඳු වූ ගරු ඇවැතකට පැමිණ විචාරණ ලද්දෙම් ප්‍රතිඥ නො කරන්නෙම් ද?'යි ඒ චුදිත මහණ මෙසේ කියයි.

එවිට ඒ චෝදක මහණ තෙම 'ඇවැත්නි, ඔබ මෙනම් වූ අල්පමාත්‍ර ඇවැතකට පැමිණ, නොවිචාරණ ලද්දෝ එය ප්‍රතිඥ කරන්නහු ය, (එසේ කල්හි) පරිජි හෝ පරිජියට සාමන්ත ඇවතකට හෝ මෙබඳු ගරු ඇවැතකට පැමිණ කිමෙක් ද? විචාරණ ලද්දහු ප්‍රතිඥා නො කරන්නහු ද? එබැවින් ඉදින් පරිජියකට හෝ පරිජියට සාමන්ත ඇවැතකට හෝ මෙසේ වූ ගරු ඇවැතකට පැමිණියෙම්'යි ඉදින් සිහි කරවු නම්, එය මොනොවට ම දැනගන්නැ' යි මෙසේ කියයි.

සො එවං වදෙති සරාමි ඛො අහං ආවුසො එවරූපිං ගරුකං ආපත්තිං ආපජ්ජිතා පාරාජිකං වා පාරාජිකසාමන්තං වා දවා මෙ එතං වුත්තං, රවා මෙ එතං වුත්තං. නාහං සරාමි එවරූපිං ගරුකං ආපත්තිං ආපජ්ජිතා පාරාජිකං වා පාරාජිකසාමන්තං වාති.

56. තස්ස ඛො තං භික්ඛවෙ භික්ඛුනො තස්සපාපියසිකා කම්මං කාතබ්බං. එවඤ්ච පන භික්ඛවෙ කාතබ්බං. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමො භික්ඛු සඞ්ඝමජ්ඣෙ ගරුකාය ආපත්තියා අනුයුඤ්ජියමානො අවජානිත්වා පටිජානාති, පටිජානිත්වා අවජානාති, අඤ්ඤෙනඤ්ඤං පටිචරති, සම්පජානමුසා භාසති, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො තස්සපාපියසිකා කම්මං කරෙය්‍ය. එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං ඉත්ථන්නාමො භික්ඛු සඞ්ඝමජ්ඣෙ ගරුකාය ආපත්තියා අනුයුඤ්ජියමානො අවජානිත්වා පටිජානාති, පටිජානිත්වා අවජානාති, අඤ්ඤෙනඤ්ඤං පටිචරති, සම්පජානමුසා භාසති. සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො තස්සපාපියසිකාකම්මං කරොති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො තස්සපාපියසිකාකම්මස්ස කරණං, සො තුණ්හස්ස. යස්ස නක්ඛමති සො භාසෙය්‍ය. දුතියම්පි එතමත්ථං වදාමි -පෙ- තතියම්පි එතමත්ථං වදාමි -පෙ- කතං සඞ්ඝෙන ඉත්ථන්නාමස්ස භික්ඛුනො තස්සපාපියසිකාකම්මං. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමී''ති.

ඉදං වුච්චති භික්ඛවෙ අධිකරණං වූපසන්තං. කෙන වූපසන්තං? සම්මුඛාවිනයෙන ච තස්සපාපියසිකාය ච. කිඤ්ච තත්ථ සම්මුඛාවිනයස්මිං? සඞ්ඝසම්මුඛතා ධම්මසම්මුඛතා විනයසම්මුඛතා පුග්ගලසම්මුඛතා -පෙ- කා ච තත්ථ තස්සපාපියසිකාය? යා තස්සපාපියසිකා කම්මස්ස කිරියා කරණං උපගමනං අජ්ඣුපගමනං අධිවාසනා අපටික්කොසනා, අයං තත්ථ තස්සපාපියසිකාය. එවං වූපසන්තං චෙ භික්ඛවෙ අධිකරණං කාරකො උක්කොටෙති. උක්කොටනකං පාචිත්තියං. ඡන්දදායකො ඛීයති, ඛීයනකං පාචිත්තියං

(එවිට) ඒ චුදිතක මහණ තෙම ''ඇවැත්නි, පරිජි ඇවැතකට හෝ පරිජියට සාමන්ත ඇවැතකට හෝ මෙබඳු වූ ගරු ඇවැතකට පැමිණියෙමි යි මා කීවා සිහි කෙරෙමි ඇවැත්නි, එය මා විසින් කෙළි පිණිස කියන ලදී, එය මා විසින් විහිළු පිණිස කියන ලදී. පරිජි ඇවැතකට හෝ පරිජියට සාමන්ත ඇවැතකට හෝ මෙබඳු ඇවැතකට මම පැමිණියෙමි'යි කියා නම් නො ම සිහි කෙරෙමි' යි මෙසේ කියයි.

56. මහණෙනි, එසේ කියන ඒ මහණහට තස්සපාපියාසිකා කර්මය කළ යුතු. මහණෙනි, මෙසේ වනාහි එය කළ යුතු: ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණක්හු විසින්

''වහන්ස, සංඝ තෙමේ මගේ වචනය අසා වා. මේ මෙනම් මහණ තෙම සඟ මැදදී ගරු ඇවැතින් ප්‍රශ්න කරණු ලබන්නේ අවඥ කොට (වරද නො පිළිගෙන) ප්‍රතිඥා කෙරෙයි (නැවැත පිළිගනියි). ප්‍රතිඥා කොට (එසේ ය වරදට පැමිණියෙමි යි පිළිගෙන) අවඥ කෙරෙයි (ක්‍රීඩා වශයෙන් එසේ කීයෙමි යි යන ආදි බසක් කියා නොපිළිගනී හෝ වරද යටපත් කෙරෙයි). එකෙකින් අනෙකක් වසාලයි. (වරදට පැමිණියෙමි යි) දන්නේ ම බොරු කියයි. ඉදින් සංඝයාට සුදුසු යැ යි හැඟෙන්නේ නම්, සංඝ තෙමේ මෙනම් මහණහට තස්සපාපියාසිකා කර්මය කරන්නේ ය. මේ ඥප්තිය යි.

වහන්ස, සංඝ තෙමේ මගේ වචනය අසාවා. මේ මෙනම මහණ තෙම සඟමැදදී ගරු ඇවැතෙකින් අනුයොග කරණු ලබන්නේ, අවඥා කොට ප්‍රතිඥ කෙරෙයි ප්‍රතිඥා කොට අවඥා කෙරෙයි අන් කරුණෙකින් අනෙකක් වසාලයි, දැන දැන මුසවා බෙණෙයි, සංඝ තෙමේ මෙනම් මහණහට තස්සපාපියාසිකා කර්මය කෙරෙයි. මෙනම් මහණහට තස්සපාපියාසිකා කර්මය කිරීම යම් ආයුෂ්මතක්හට රිසියෙයි නම්, හේ නිහඬ වන්නේය, යම් ආයුෂ්මතක්හට නො රිසියෙයි නම් හේ කියාවා. දෙවනු ද මෙ කරුණ කියමි ... තෙවනු ද මෙ කරුණ කියමි... සංඝයා විසින් මෙනම් මහණහට තස්සපාපියාසිකාකර්මය කරණ ලදී. සංඝයාට රිසියෙයි, එහෙයින් නිහඬ ය. මෙසේ මෙ කරුණ දරමි'' යනුයි.

මහණෙනි, මේ අධිකරණය (මෙසේ) සන්සිඳුනේ යැ යි කියනු ලැබේ. කිමෙකින් සන්සිඳුනේද? යත්: සම්මුඛාවිනයයෙන් ද තස්සපාපියාසිකායෙන් ද යන දෙකිනි. එහි සම්මුඛාවිනයය කවර යැ? සංඝසම්මුඛතාව, ධර්මසම්මුඛතාව, විනයසම්මුඛතාව, පුද්ගල සම්මුඛතාව යන සතර යි ... එහි තස්සපාපියාසිකාව කවර යැ? තස්සපාපියාසිකාකර්මයා ගේ යම ක්‍රියාවෙක්, කිරීමෙක්, එළැඹීමෙක්, අධ්‍යෙෂණයෙක්, ඉවැසීමෙක්, අප්‍රතිෂෙධනයෙක් වේ ද, මෙය එහි තස්සපාපියාසිකාව යැ. මහණෙනි, ඉදින් මෙසේ සංසිඳුනු අධිකරණය කාරක මහණෙක් උත්කෝටනය කරන්නේ ද, උක්කොටනක පාචිත්තිය ඇවැත වේ. ඡන්දදායක මහණෙක් නිඳා කෙරෙයි ද, ඔහුට ඛීයනක පාචිත්තිය වෙයි.

පටිඤ්ඤාතකරණං

57. ආපත්තාධිකරණං කතිහි සමථෙහි සම්මති? ආපත්තාධිකරණං තීහි සමථෙහි සම්මති සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච තිණවත්ථාරකෙන ච.

සියා ආපත්තාධිකරණං එකං සමථං අනාගම්ම තිණවත්ථාරකං ද්වීහි සමථෙහි සම්මෙය්‍ය සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන චාති? සියා'තිස්ස වචනීයං. යථාකථං විය? ඉධ භික්ඛු ලහුකං ආපත්තිං ආපන්නො හොති. තෙන භික්ඛවෙ භික්ඛුනා එකං භික්ඛුං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා වුඩ්ඪානං භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා එවමස්ස වචනීයො: අහං ආවුසො ඉත්ථන්නාමං ආපත්තිං ආපන්නො. තං පටිදෙසෙමී'ති. තෙන වත්තබ්බො: 'පස්සසී?'ති. 'ආම පස්සාමී'ති. 'ආයතිං සංවරෙය්‍යාසී'ති.

ඉදං වුච්චති භික්ඛවෙ අධිකරණං වූපසන්තං. කෙන වූපසන්තං සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච. කිඤ්ච තත්ථ සම්මුඛාවිනයස්මිං? ධම්මසම්මුඛතා විනයසම්මුඛතා පුග්ගලසම්මුඛතා -පෙ- කා ච තත්ථ පුග්ගලසම්මුඛතා? යො ච දෙසෙති, යස්ස ච දෙසෙති, උභො සම්මුඛීභූතා හොන්ති, අයං තත්ථ පුග්ගලසම්මුඛතා කිඤ්ච තත්ථ පටිඤ්ඤාතකරණස්මිං? යා පටිඤ්ඤාතකරණස්ස කම්මස්ස කිරියා කරණං උපගමනං අජ්ඣුපගමනං අධිවාසනා අපටික්කොසනා, ඉදං තත්ථ පටිඤ්ඤාතකරණස්මිං. එවං වූපසන්තං චෙ භික්ඛවෙ අධිකරණං පටිග්ගාහකො උක්කොටෙති උක්කොටනකං පාචිත්තියං.

58. එවං චෙ තං ලභෙථ ඉච්චෙතං කුසලං. නො චෙ ලභෙථ තෙන භික්ඛවෙ භික්ඛුනා සම්බහුලෙ භික්ඛූ උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා වුඩ්ඪානං භික්ඛූනං පාදෙ වන්දිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්සු වචනීයා: 'අහං භන්තෙ ඉත්ථන්නාමං ආපත්තිං ආපන්නො, තං පටිදෙසෙමී'ති. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන තෙ භික්ඛූ ඤාපෙතබ්බා: 'සුණන්තු මෙ ආයස්මන්තා. අයං ඉත්ථන්නාමො භික්ඛු ආපත්තිං සරති. විවරති. උත්තානිකරොති දෙසෙති. යදායස්මන්තානං පත්තකල්ලං අහං ඉත්ථන්නාමස්ස භික්ඛුනො ආපත්තිං පටිග්ගණ්හෙය්‍යන්ති.''

ප්‍රතිඥාතකරණය

57. ආපත්ත්‍යාධිකරණය සමථ කීයෙකින් සන්සිඳෙයි ද? යත්: ආපත්ත්‍යාධිකරණය සම්මුඛාවිනයයෙන් ද ප්‍රතිඥාතකරණයෙන් ද තිණවත්ථාරකයෙන් ද යන සමථ තුනින් සන්සිඳේ.

ආපත්ත්‍යාධිකරණය තිණවත්ථාරක නම් වූ එක් සමථයකට නො පැමිණ සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද යන සමථ දෙකින් සන්සිඳෙන්නේ ය යන්න විය හැකි ද? විය හැකි යැයි කියයුතු වන්නේ ය. කෙසේ යත්: මෙහි මහණෙක් ලුහු ඇවතකට පැමිණියේ වෙයි. මහණෙනි, ඒ මහණහු විසින් එක් මහණකු කරා එළඹ උතුරු සඟ එකස් කොට වැඩිමහලු මහණුන්ගේ පා වැඳ උක්කුටුක වැ හිඳ දෙහොත් මුදුන්හි කොට, "ඇවැත්නි, මම මෙ නම් ඇවැතකට පැමිණියෙමි, එය දෙසමි"යි මෙසේ කිය යුතු වන්නේ යැ, ඔහු විසින් (අනිත් මහණහු විසින්) 'ඇවැත දක්හිදැ?'යි කියැ යුතු. එසේ ය, දකිමි'යි පළමු මහණහු විසින් කියැ යුතු. 'මත්තෙහි සංවර වඩව'යි දෙවැනි මහණහු විසින් කියැ යුතු,

මහණෙනි, මේ අධිකරණය (මෙසේ) සන්සිඳුනේ ය යි කියනු ලැබේ. කිමෙකින් සන්සිඳුනේ ද? යත්: සම්මුඛාවිනයයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද යන දෙකිනි. එහි සම්මුඛාවිනයය කවර යැ? ධර්මසම්මුඛතාව විනය සම්මුඛතාව පුද්ගලසම්මුඛතාව යන තුන ය... එහි පුද්ගල සම්මුඛතාව කවර යැ: යමෙක් ඇවැත දෙසා නම්, හේ මහණ ද යමකුට ඇවැත දෙසා නම් ඒ මහණ ද යන දෙදෙනා හමු වූවාහු වෙත් ද, මෙය එහි පුද්ගලසම්මුඛතාව යැ. එහි පටිඤ්ඤාතකරණය නම් කවර යැ? පටිඤ්ඤාත කරණ කර්මයාගේ යම් ක්‍රියාවෙක් කිරීමෙක්, එළැඹීමෙක්, අධ්‍යෙෂණයෙක්, ඉවැසීමෙක්, අප්‍රතිෂෙධනයෙක් වේ ද, මේ එහි පටිඤ්ඤාතකරණය යි. මහණෙනි, ඉදින් මෙසේ සන්සිඳුනු අධිකරණයක් ප්‍රතිග්‍රාහක මහණ තෙමේ (යළිත් සන්සිඳවනු පිණිස) උත්කොටනය කෙරෙයි ද (ඉදිරියට අදී ද) ඔහුට උත්කොටනක පාචිත්තිය ඇවැත වේ.

58. මහණෙනි, මෙසේ ඒ අධිකරණය සමථය ලබන්නේ නම්, ඒ මැනැවැ. ඉදින් නොලබන්නේ නම්, මහණෙනි, ඒ මහණහු විසින් බොහෝ මහණුන් කරා එළැඹ උතුරු සඟ එකස් කොට, වැඩිමාලු මහණුන්ගේ පා වැඳ උක්කුටුක වැ හිඳ, දෙහොත් මුදුනැ නඟා "වහන්ස, මම මෙ නම් ඇවැතට පැමිණියෙම් වෙමි. එය දෙසමි"යි මෙසේ කියයුතු වන්නාහ. ව්‍යක්ත ප්‍රතිබල මහණක්හු විසින් "ආයුෂ්මත්හු මගේ වචනය අසත්වා. මේ මෙනම් මහණ ඇවැත හෙළි කරයි, ඇවැත පෙහෙළි කරයි. ඇවැත දෙසයි. ඉදින් ආයුෂ්මත්නට සුදුසු කල් ඇත්තේ යැ යි හැඟේ නම්, මම මෙනම් මහණහුගේ ඇවැත පිළිගන්නෙමි"යි මහණහු දැන්විය යුත්තාහ.

තෙන වත්තබ්බො 'පස්සසී?'ති. 'ආම පස්සාමී'ති. 'ආයතිං සංවරෙය්‍යාසී'ති.

ඉදං වුච්චති භික්ඛවෙ අධිකරණං වූපසන්තං. කෙන වූපසන්තං? සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච. කිඤ්ච තත්‍ථ සම්මුඛාවිනයස්මිං? ධම්මසම්මුඛතා විනයසම්මුඛතා පුග්ගලසම්මුඛතා -පෙ- කා ච තත්‍ථ පුග්ගලසම්මුඛතා? යො ච දෙසෙති, යස්ස ච දෙසෙති, උභො සම්මුඛීභූතා හොන්ති, අයං තත්‍ථ පුග්ගලසම්මුඛතා. කිඤ්ච තත්‍ථ පටිඤ්ඤාතකරණස්මිං? යා පටිඤ්ඤාතකරණස්ස කම්මස්ස කිරියා කරණං උපගමනං අජ්ඣුපගමනං අධිවාසනා අපටික්කොසනා, ඉදං තත්‍ථ පටිඤ්ඤාතකරණස්මිං. එවං වූපසන්තඤ්චෙ භික්ඛවෙ අධිකරණං පටිග්ගාහකො උක්කොටෙති, උක්කොටනකං පාචිත්තියං.

59. එවඤ්චෙ තං ලභෙථ ඉච්චෙතං කුසලං නො චෙ ලභෙථ, තෙන භික්ඛවෙ භික්ඛුනා සඞ්ඝං උපසඞ්කමිත්‍වා එකංසං උත්තරාසඞ්ගං කරිත්‍වා වුඩ්ඪානං භික්ඛූනං පාදෙ වන්දිත්‍වා උක්කුටිකං නිසීදිත්‍වා අඤ්ජලිං පග්ගහෙත්‍වා එවමස්ස වචනීයො: "අහං භන්තෙ ඉත්‍ථන්නාමං ආපත්තිං ආපන්නො, තං පටිදෙසෙමී"ති. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අයං ඉත්‍ථන්නාමො භික්ඛු ආපත්තිං සරති විවරති උත්තානී කරොති දෙසෙති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං ඉත්‍ථන්නාමස්ස භික්ඛුනො ආපත්තිං පතිගණ්හෙය්‍යන්ති. තෙන වත්තබ්බො 'පස්සසී?'ති. 'ආම පස්සාමී'ති. 'ආයතිං සංවරෙය්‍යාසී'ති.

ඉදං වුච්චති භික්ඛවෙ අධිකරණං වූපසන්තං. කෙන වූපසන්තං? සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච. කිඤ්ච තත්‍ථ සම්මුඛාවිනයස්මිං? සඞ්ඝසම්මුඛතා ධම්මසම්මුඛතා විනයසම්මුඛතා පුග්ගලසම්මුඛතා -පෙ- එවං වූපසන්තඤ්චෙ භික්ඛවෙ අධිකරණං පටිග්ගාහකො උක්කොටෙති, උක්කොටනකං පාචිත්තියං. ඡන්දදායකො ඛීයති ඛීයනකං පාචිත්තියං.

ඒ ප්‍රතිග්‍රාහක මහණහු විසින් ඇවැත දක්නෙහි ද?' යි ඉතර මහණට කියයුතු. 'එසේ යැ, දකිමි'යි දෙශක මහණහු විසින් කියැ යුතු. 'මත්තෙහි සංවර කරව'යි ප්‍රතිග්‍රාහක මහණහු විසින් කියැ යුතු.

මහණෙනි, (මෙසේ) මේ අධිකරණය සන්සිඳුනේ යැ යි කියනු ලැබේ. කිමෙකින් සන්සිඳුනේ ද? යත්: සම්මුඛාවිනයයෙන් ද ප්‍රතිඥතකරණයෙන් ද යන දෙකිනි. එහි සම්මුඛාවිනය කවර යැ? ධර්මසම්මුඛතාව, විනයසම්මුඛතාව, පුද්ගලසම්මුඛතාව යන තුන යැ... එහි පුද්ගලසම්මුඛතාව කවර යැ? යමෙක් ඇවැත දෙසයි ද, යමකුටත් දෙසයි ද, මේ දෙසක ප්‍රතිග්‍රාහක දෙදෙනා හමු වූවාහු වෙත් ද, මේ එහි පුද්ගල සම්මුඛතාව යැ. එහි ප්‍රතිඥතකරණය කවර යැ? ප්‍රතිඥත කරණ කර්මයා ගේ යම් ක්‍රියායෙක්, කිරීමෙක්, එළැඹීමෙක්, අධ්‍යෂණයෙක්, ඉවැසීමෙක්, අප්‍රතිෂෙධනයෙක් වේ ද, මේ එහි ප්‍රතිඥතකරණය යැ. මහණෙනි, ඉදින් මෙසේ සන්සිඳුනු අධිකරණය ප්‍රතිග්‍රාහක මහණ තෙම නැවැත සන්සිඳුවනු පිණිස ඉදිරියට අදනේ ද, ඔහුට උත්කොටනක පාචිත්තිය ඇවැත වේ.

59. ඉදින් මෙය මෙසේ ලබන්නේ නම් ඒ මැනව. ඉදින් නො ලබන්නේ නම්, මහණෙනි, ඒ මහණහු විසින් සංඝයා කරා එළැඹ, උතුරුසඟ එකස් කොට වැඩිමාලු මහණුන්ගේ පා වැඳ උත්කුටුක වැ හිඳ දෙහොත් මුදුන් තබා ගෙන, ''වහන්ස, මම මෙ නම් ඇවතට පැමිණියෙමි. එය දෙසමි' යි මෙසේ කියැ යුතු වන්නේ ය. ව්‍යක්ත ප්‍රතිබල මහණක්හු විසින් ''වහන්ස, සංඝ තෙමෙ මගේ වචනය අසාවා, මේ මෙනම් මහණ ඇවැත සිහි කරයි, හෙළි කරයි, පෙහෙළි කරයි, දෙසයි. ඉදින් සංඝයාට සුදුසු කල් වී යැයි හැඟේ නම්, මම මෙනම් මහණහුගේ ඇවැත පිළි ගන්නෙමි'යි සංඝ තෙමෙ දන්වියැ යුතු. ඒ ප්‍රතිග්‍රාහක මහණ විසින් 'ඇවැත දකිහි ද?'යි කියැ යුතු. 'එසේ ය, දකිමි'යි දෙශකයා විසින් කියැ යුතු. 'මත්තෙහි සංවරය වඩව'යි ප්‍රතිග්‍රාහකයා විසින් කියැ යුතු.

මහණෙනි, (මෙසේ) මේ අධිකරණය සන්සිඳුනේ යැ'යි කියනු ලැබේ. කිමෙකින් සන්සිඳුනේ ද යත්: සම්මුඛාවිනයයෙන් ද ප්‍රතිඥාතකරණයෙන් ද යන දෙකිනි, එහි සම්මුඛාවිනයය කවර යැ? සංඝසම්මුඛතාව ධර්මසම්මුඛතාව විනයසම්මුඛතාව පුද්ගලසම්මුඛතාව යන සතර යැ... මහණෙනි, ඉදින් මෙසේ සන්සිඳුනු අධිකරණය ප්‍රතිග්‍රාහක තෙමේ උත්කොටනය කරන්නේ නම් ඔහුට උත්කොටනක පාචිත්තිය ඇවැත වේ. ඡන්දදායක මහණ ඛිඥ කරන්නේ නම් ඔහුට ඛීයනක පාචිත්තිය ඇවැත වේ.

තිණවත්ථාරකං

60. සියා ආපත්තාධිකරණං එකං සමථං අනාගම්ම පටිඤ්ඤාතකරණං ද්වීහි සමථෙහි සම්මෙය්‍ය සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන චාති? සියාතිස්ස වචනීයං. යථාකථං විය? ඉධ භික්ඛූනං භණ්ඩනජාතානං කලහජාතානං විවාදපන්නානං විහරතං බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං හොති භාසිතපරික්කන්තං. තත්‍ර චෙ භික්ඛූනං එවං හොති 'අම්හාකං ඛො භණ්ඩනජාතානං කලහජාතානං විවාදපන්නානං විහරතං බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං භාසිතපරික්කන්තං. සචෙ මයං ඉමාහි ආපත්තිහි අඤ්ඤමඤ්ඤං කාරෙස්සාම, සියාපි තං අධිකරණං කක්ඛළත්තාය වාළත්තාය භෙදාය සංවත්තෙය්‍යා'ති. අනුජානාමි භික්ඛවෙ එවරූපං අධිකරණං තිණවත්ථාරකෙන වූපසමෙතුං.

එවඤ්ච පන භික්ඛවෙ වූපසමෙතබ්බං: සබ්බෙහෙව එකජ්ඣං සන්නිපතිතබ්බං. සන්නිපතිත්වා ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො: "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අම්හාකං භණ්ඩනජාතානං කලහජාතානං විවාදපන්නානං විහරතං බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං භාසිතපරික්කන්තං. සචෙ මයං ඉමාහි ආපත්තිහි අඤ්ඤමඤ්ඤං කාරෙස්සාම. සියාපි තං අධිකරණං කක්ඛළත්තාය වාළත්තාය භෙදාය සංවත්තෙය්‍ය. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉමං අධිකරණං තිණවත්ථාරකෙන වූපසමෙය්‍ය ඨපෙත්වා ථුල්ලවජ්ජං, ඨපෙත්වා ගිහිපටිසංයුත්තන්ති.

එකතො පක්ඛිකානං භික්ඛූනං ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සකො පක්ඛො ඤාපෙතබ්බො: "සුණන්තු මෙ ආයස්මන්තා අම්හාකං භණ්ඩනජාතානං කලහජාතානං විවාදපන්නානං විහරතං බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං භාසිතපරික්කන්තං. සචෙ මයං ඉමාහි ආපත්තිහි අඤ්ඤමඤ්ඤං කාරෙස්සාම සියාපි තං අධිකරණං කක්ඛළත්තාය වාළත්තාය භෙදාය සංවත්තෙය්‍ය, යදායස්මන්තානං පත්තකල්ලං අහං යා චෙව ආයස්මන්තානං ආපත්ති, යා ච අත්තනො ආපත්ති ආයස්මන්තානඤ්චෙව අත්ථාය අත්තනො ච අත්ථාය සඞ්ඝමජ්ඣෙ තිණවත්ථාරකෙන දෙසෙය්‍යං ඨපෙත්වා ථුල්ලවජ්ජං, ඨපෙත්වා ගිහිපටිසංයුත්තන්ති. අථාපරෙසං එකතො පක්ඛිකානං භික්ඛූනං ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සකො පක්ඛො ඤාපෙතබ්බො: "සුණන්තු මෙ ආයස්මන්තා. අම්හාකං භණ්ඩනජාතානං-පෙ-සඞ්ඝමජ්ඣෙ තිණවත්ථාරකෙන දෙසෙය්‍යං ඨපෙත්වා ථුල්ලවජ්ජං, ඨපෙත්වා ගිහිපටිසංයුත්තං"ති.

---

1. අථාපරෙසං – වි – ත. එජසං. අධිකං

තිණවත්ථාරකය

60. ප්‍රතිඥාතකරණ නම් වූ එක් සමථයකට නො පැමිණ සම්මුඛා විනයයෙන් ද තිණවත්ථාරකයෙන් ද යන සමථ දෙකින් ආපත්‍යධිකරණය සන්සිඳෙන්නේය යන්න විය හැකි ද? විය හැකි යැ යි කිය යුතු වන්නේ ය. කෙසේ ද? යත්: මෙහි හටගත් අරගල ඇති වැ හටගත් කලහ ඇති වැ විවාදයට පැමිණියන් වැ වසන මහණුන් විසින් වාචසික වූ ද කායික වූ ද බොහෝ වරද කරන ලදුයේ වෙයි. ඉදින් එහි මහණුනට හටගත් අරගල ඇති වැ හටගත් කලහ ඇති වැ විවාදයට බටුවන් වැ වසන අප විසින් වාචසික වූ ද කායික වූ ද බොහෝ වරද කරණ ලදුයේ වෙයි. ඉදින් අපි මේ ඇවැත්වලින් උනුනට පිළියම් කරවන්නමෝ නම් ඒ අධිකරණය රළු බව පිණිස, සැඩ බව පිණිස, බිඳීම පිණිස පවතිනු විය හැකියැ' යි මෙසේ සිතෙක් වෙයි. මහණෙනි, මෙබඳු අධිකරණය තිණවත්ථාරකයෙන් සන්සිඳුවන්නට අනුදනිමි:

තවද මහණෙනි, මෙසේ එය සන්සිඳු විය යුතු; සියලු මහණුන් ම එක් තැනකට රැස් විය යුතු. එක්රැස් වැ ව්‍යක්ත ප්‍රතිබල මහණක්හු විසින් "වහන්ස, සංඝ තෙමේ මගේ වචනය අසා වා, උපන් අරගල ඇති ව, උපන් කලහ ඇති ව, විරුද්ධවාදයට බැසගත්තන් ව වසන අප විසින් වාචසික වූ ද කායික වූ ද ශ්‍රමණසාරූප්‍ය නොවූ බොහෝ දැ කරණ ලද්දේ ය. ඉදින් අපි මේ ඇවත්වලින් ඔවුනොවුනට පිළියම් කරවන්නමෝ නම්, ඒ අධිකරණය රළුබව පිණිස, සැඩබව පිණිස, භේදය පිණිස පවතිනු ද හැකි වන්නේ ය, ඉදින් සංඝයාට සුදුසු කලැ යි හැඟෙන්නේ වී නම් සංඝ තෙමේ (පරිජි සඟවෙසෙස් යන) දළ වරද හැර, ගිහින් ගැරහුම් ආදීන් ගෘහසත්ප්‍රතිසංයුක්ත වරද ද හැර (සෙසු ඇවැත් හා සම්බන්ධ වූ) මේ අධිකරණය තිණවත්ථාරකයෙන් සන්සිඳුවන්නේ ය.

එක් පක්ෂයකට අයත් මහණුන් අතුරෙන් ව්‍යක්ත ප්‍රතිබල මහණකු විසින් "ආයුෂ්මත්හු මා ගේ වචනය අසත්වා. උපන් අරගල ඇති වැ උපන් කලහ ඇති වැ විරුද්ධවාදයට බැසගත්තන් වැ වසන අප විසින් වාචසික වූ ද කායික වූ ද අශ්‍රාමණක වූ බොහෝ දැ කරණ ලද්දේ වෙයි. ඉදින් අපි මේ ඇවැත්වලින් ඔවුනොවුනට පිළියම් කරවන්නමෝ නම්, ඒ අධිකරණය රළුබව පිණිස සැඩබව පිණිස භේදය පිණිස පවතිනු ද විය හැක්ක. (ඒ හෙයින්) ඉදින් ආයුෂ්මත්නට සුදුසු කල් යැ යි හැඟෙන්නේ වී නම්, ආයුෂ්මතුන්ගේ යම් ඇවැත් වේ නම් තමා ගේ යම් ඇවැත් වේ නම් ථුල්ල වරද ද ගෘහිප්‍රතිසංයුක්ත ආපත්ති ද හැර සෙසු සියලු ඇවැත් ආයුෂ්මත්නට වැඩ පිණිසත් තමාට වැඩ පිණිසත් සහ මැද දී තිණවත්ථාරක යෙන් දෙසන්නෙමි"යි ස්වකීය පක්ෂය දැන්වියැ යුතු යැ. ඉක්බිති අන් එක් පක්ෂයක් ගත් මහණුන් අතුරෙන් ව්‍යක්ත ප්‍රතිබල මහණකු විසින් "ආයුෂ්මත්හු මාගේ වචනය අසත්වා. උපන් අරගල ඇති... ථුල්ල වරද ද ගෘහිප්‍රතිසංයුක්ත ආපත්ති ද හැර සෙසු සියලු ඇවැත්... සහ මැද දී තිණවත්ථාරකයෙන් දෙසන්නෙමි"යැ යි සවකීය පක්ෂය දැන්විය යුතු.

එකතො පක්ඛිකානං භික්ඛූනං ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අම්හාකං භණ්ඩනජාතානං -පෙ- බහුං අස්සාමණකං අජ්ඣාචිණ්ණං -පෙ- සචෙ මයං ඉමාහි ආපත්තීහි අඤ්ඤමඤ්ඤං කාරෙස්සාම. සියාපි තං අධිකරණං කක්ඛළත්තාය වාළත්තාය භෙදාය සංවත්තෙය්‍ය. යදි සඞ්ඝස්ස පත්තකල්ලං අහං යා චෙව ඉමෙසං ආයස්මන්තානං ආපත්ති යා ච අත්තනො ආපත්ති ඉමෙසඤ්චෙව ආයස්මන්තානං අත්ථාය අත්තනො ච අත්ථාය සඞ්ඝමජ්ඣෙ තිණවත්ථාරකෙන දෙසෙය්‍යං ඨපෙත්වා ථුල්ලවජ්ජං, ඨපෙත්වා ගිහිපටිසංයුත්තං. **එසා ඤත්ති.**

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අම්හාකං භණ්ඩනජාතානං -පෙ- අහං යා චෙව ඉමෙසං ආයස්මන්තානං ආපත්ති, යා ච අත්තනො ආපත්ති ඉමෙසඤ්චෙව ආයස්මන්තානං අත්ථාය අත්තනො ච අත්ථාය සඞ්ඝමජ්ඣෙ තිණවත්ථාරකෙන දෙසෙමි ඨපෙත්වා ථුල්ලවජ්ජං, ඨපෙත්වා ගිහිපටිසංයුත්තං. යස්සායස්මතො ඛමති අම්හාකං ඉමාසං ආපත්තීනං සඞ්ඝමජ්ඣෙ තිණවත්ථාරකෙන දෙසනා ඨපෙත්වා ථුල්ලවජ්ජං, ඨපෙත්වා ගිහිපටිසංයුත්තං, සො තුණ්හස්ස යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

දෙසිතා අම්හාකං ඉමා ආපත්තියො සඞ්ඝමජ්ඣෙ තිණවත්ථාරකෙන ඨපෙත්වා ථුල්ලවජ්ජං, ඨපෙත්වා ගිහිපටිසංයුත්තං. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමීති.

අථාපරෙසං එකතො පක්ඛිකානං භික්ඛූනං ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. අම්හාකං භණ්ඩනජාතානං -පෙ- සඞ්ඝමජ්ඣෙ තිණවත්ථාරකෙන දෙසෙය්‍යං ඨපෙත්වා ථුල්ලවජ්ජං, ඨපෙත්වා ගිහිපටිසංයුත්තං. **එසා ඤත්ති.**

එක් පක්ෂයකට අයත් මහණුන් අතුරෙන් ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණක්හු විසින්,

"වහන්ස, සංඝ තෙමේ මා ගේ වචනය අසාවා. උපන් අරගල ඇති... අප විසින්... බොහෝ අශ්‍රාමණක දෑ කරණ ලද්දේ වෙයි... ඉදින් අපි ඔවුනොවුනට මේ ඇවැත්වලින් පිළියම් කරවන්නමෝ නම් ඒ අධිකරණය රළුබව පිණිස, සැඩබව පිණිස, භෙදය පිණිස පවතිනු ද විය හැකි ය. ඉදින් සංඝයාට සුදුසු කල් වේ යැයි හැඟේ නම් මම ඝුලු වරද ද හැර, ගෘහීප්‍රතිසංයුක්ත ආපත්ති ද හැර, මේ ආයුෂ්මතුන් ගේ සෙසු යම් ඇවැත් වේ නම් තමා ගේ ද සෙසු යම් ඇවැත් වේ නම්, ඒ හැම මේ ආයුෂ්මත්වරුනට වැඩ පිණිස ද තමාට වැඩ පිණිස ද සහ මැද දී තිණවත්ථාරකයෙන් දෙසන්නෙමි. මේ ඥප්තිය යැ.

සංඝ තෙමේ මා ගේ වචනය අසාවා. උපන් අරගල ඇති... අප විසින්... බොහෝ අශ්‍රාමණක දෑ කරන ලද්දේ වෙයි.... මම ඝුලු වරද ද හැර, ගෘහීප්‍රතිසංයුක්ත ආපත්ති ද හැර, මේ ආයුෂ්මතුන් ගේ සෙසු යම් ඇවැත් වේ නම්, තමා ගේ ද සෙසු යම් ඇවැත් වේ නම්, ඒ හැම මේ ආයුෂ්මත්වරුනට වැඩ පිණිස ද තමාට වැඩ පිණිස ද සහමැද දී තිණවත්ථාරකයෙන් දෙසෙමි. ඝුලුවරද ද හැර, ගෘහීප්‍රතිසංයුක්ත ආපත්ති ද හැර සෙසු මේ සියලු ඇවැත් අප සහ මැද දී තිණවත්ථාරකයෙන් දෙසීම යම් ආයුෂ්මතකු හට රිසියෙන්නේ නම් හේ නිහඬ වේවා, යම් ආයුෂ්මතකු හට නො රිසියෙන්නේ වී නම් හේ කියාවා.

අප විසින් ඝුලු වරද ද හැර, ගෘහීප්‍රතිසංයුක්ත ඇවැත් ද හැර සෙසු මේ සියලු ඇවැත් සහමැද දී තිණවත්ථාරකයෙන් දෙසන ලද්දේ ය. සංඝයාට රියිවෙයි. එ හෙයින් නිහඬ යැ. මෙසේ මෙය සලකමි" යැ යි සංඝ තෙමේ දැන්විය යුතු.

ඉක්බිති අන් එක් පක්ෂය ගත් මහණුන් අතුරෙන් ව්‍යක්ත ප්‍රතිබල මහණක්හු විසින්,

"සංඝ තෙමේ මා ගේ වචනය අසා වා. උපන් අරගල ඇති...අප විසින් ...වරද කරන ලද්දේ ය... ඝුලු වරද හැර ගෘහීප්‍රතිසංයුක්ත ආපත්ති ද හැර සෙසු... සියලු ඇවැත් සහමැද දී තිණවත්ථාරකයෙන් දෙසන්නෙමි. මේ ඥප්තිය යැ.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අම්හාකං භණ්ඩනජාතානං -පෙ- අහං යා චෙව ඉමෙසං ආයස්මන්තානං ආපත්ති, යා ච අත්තනො ආපත්ති, ඉමෙසං චෙව ආයස්මන්තානං අත්ථාය අත්තනො ච අත්ථාය සඞ්ඝමජ්ඣෙ තිණවත්ථාරකෙන දෙසෙමි. ඨපෙත්වා ථුල්ලවජ්ජං ඨපෙත්වා ගිහිපටිසංයුත්තං -පෙ- යස්සායස්මතො ඛමති සො තුණ්හස්ස යස්ස නක්ඛමති සො භාසෙය්‍ය. දෙසිතා අම්හාකං ඉමා ආපත්තියො සඞ්ඝමජ්ඣෙ තිණවත්ථාරකෙන ඨපෙත්වා ථුල්ලවජ්ජං. ඨපෙත්වා ගිහිපටිසංයුත්තං. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී. එවමෙතං ධාරයාමීති.

61. ඉදං වුච්චති භික්ඛවෙ අධිකරණං වූපසන්තං. කෙන වූපසන්තං? සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච. කිඤ්ච තත්ථ සම්මුඛාවිනයස්මිං?

සඞ්ඝසම්මුඛතා ධම්මසම්මුඛතා විනයසම්මුඛතා පුග්ගලසම්මුඛතා. කා ච තත්ථ සඞ්ඝසම්මුඛතා? යාවතිකා භික්ඛූ කම්මප්පත්තා තෙ ආගතා හොන්ති ඡන්දාරහානං ඡන්දො ආහටො හොති. සම්මුඛීභූතා න පටික්කොසන්ති. අයං තත්ථ සඞ්ඝසම්මුඛතා.

කා ච තත්ථ ධම්මසම්මුඛතා විනයසම්මුඛතා? යෙන ධම්මෙන යෙන විනයෙන යෙන සත්ථුසාසනෙන තං අධිකරණං වූපසම්මති, අයං තත්ථ ධම්මසම්මුඛතා විනයසම්මුඛතා.

කා ච තත්ථ පුග්ගලසම්මුඛතා? යො ච දෙසෙති, යස්ස ච දෙසෙති, උභො සම්මුඛීභූතා හොන්ති, අයං තත්ථ පුග්ගලසම්මුඛතා.

කිඤ්ච තත්ථ තිණවත්ථාරකස්මිං? යා තිණවත්ථාරකස්ස කම්මස්ස කිරියා කරණං උපගමනං අජ්ඣුපගමනං අධිවාසනං අපටික්කොසනං ඉදං තත්ථ තිණවත්ථාරකස්මිං.

එවං වූපසන්තං ච භික්ඛවෙ අධිකරණං පටිග්ගාහකො උක්කොටෙති උක්කොටනකං පාචිත්තියං. ඡන්දදායකො ඛීයති, ඛීයනකං පාචිත්තියං.

කිච්චාධිකරණං කතිහි සමථෙහි සම්මති? කිච්චාධිකරණං එකෙන සමථෙන සම්මති සම්මුඛාවිනයෙනාති.

සමථක්ඛන්ධකො නිට්ඨිතො චතුත්ථො.

වහන්ස, සංඝ තෙමේ මා ගේ වචනය අසාවා. උපන් අරගල ඇති... මේ ආයුෂ්මතුන්ගේ යම් ඇවැත් වේ ද, තමා ගේ යම් ඇවැත් වේ ද, ඝූල වරද ද හැර, ගෘහීප්‍රතිසංයුක්ත ආපත්තිය ද හැර සෙසු මේ සියලු ඇවැත් මේ ආයුෂ්මතුන් හට වැඩ පිණිස ද තමාට වැඩ පිණිස ද සහ මැදදී තිණවත්ථාරකයෙන් දෙසමි.... යම් ආයුෂ්මතකු හට රිසියෙහි ද හේ නිහඬ වේ වා, යමකුට නොරිසියෙයි ද හේ කියාවා.

අප විසින් ඝූල වරද ද හැර ගෘහීප්‍රතිසංයුක්ත වරද ද හැර සෙසු මේ සියලු ඇවැත් සහමැද දී තිණවත්ථාරකයෙන් දෙසන ලද්දේ ය. සංඝයාට රිසියෙයි, එ හෙයින් නිහඬ ය, මෙසේ මෙය සලකමි''යැ යි සංඝ තෙමේ දැන්වියැ යුත්තේ ය.

61. මහණෙනි, මේ අධිකරණය සන්හිඳුනේ යැ යි කියනු ලැබේ. කිමෙකින් සන්හිඳුනේ ද යත්: සම්මුඛාවිනයයෙන් ද තිණවත්ථාරකයෙන් ද යන දෙකෙනි. එහි සම්මුඛාවිනයය කවර යැ? සංඝ සම්මුඛතාව ධර්ම සම්මුඛතාව විනයසම්මුඛතාව පුද්ගලසම්මුඛතාව යන මේ ය. එහි සංඝ සම්මුඛතාව කවරයැ? යම් පමණ මහණහු කර්‍මප්‍රාප්තයෝ නම් ඔහු හැම ආවාහු වෙත් ද, ඡන්දය දෙනුවට සුදුස්සන් ගේ ඡන්දය ගෙනෙන ලද්දේ වේ ද, හමු වූ මහණහු ප්‍රතිෂෙධනය නො කෙරෙත් ද මේ එහි සංඝසම්මුඛතාව යි.

එහි ධර්‍ම සම්මුඛතා විනය සම්මුඛතා කවර යැ? යම් ධර්‍මයෙකින් යම් විනයයෙකින් යම් ශාස්තෘ-සාසනයෙකින් ඒ අධිකරණය සන්හිඳෙයි ද, මෙය එහි ධර්‍මසම්මුඛතා විනයසම්මුඛතා යැ

එහි පුද්ගලසම්මුඛතා කවර යැ? යමෙකුත් ඇවැත දෙසයි ද යමකුටත් දෙසයි ද, ඒ දෙදෙනාම හමුවූවාහු වෙත්, මේ එහි පුද්ගල සම්මුඛතා යැ.

එහි තිණවත්ථාරකය කවර යැ? තිණවත්ථාරකකර්‍මයා ගේ යම් ක්‍රියායෙක්, කිරීමෙක්, එළැඹීමෙක්, අධ්‍යෙෂණයෙක්, ඉවැසීමෙක්, අප්‍රතිෂෙධනයෙක් වේ ද, මේ එහි තිණවත්ථාරකය යි.

මහණෙනි, මෙසේ සන්හිඳුනු මේ අධිකරණය ඉදින් ප්‍රතිග්‍රාහක මහණෙක් ඉදිරියට අදනේ ද, ඔහුට උත්කොටනක පාචිත්තිය ඇවැත වේ. මේ කර්‍මයට ඡන්දය දුන් මහණෙක් මෙහි සන්හිඳීමට නින්ද කෙරේ ද ඔහුට ඛීයනක පාචිත්තිය ඇවැත වේ.

කෘත්‍යාධිකරණය ශමථ කීයෙකින් සන්හිඳේ ද කෘත්‍යාධිකරණය සම්මුඛාවිනය සංඛ්‍යාත එක් ශමථයෙකින් සන්හිඳෙ යි.

සතරවනු සමථකඛන්ධකය නිමියේ ය.

චූලවග්ගපාළි

විසෙසපදනුක්කමණිකා

චූළවග්ගපාළි

සඤ්ඤානාමානුක්කමණිකා

මුද්‍රණය :
තිසර මුද්‍රණාලය, 137, දුටුගැමුණු වීදිය, දෙහිවල